


Enid Blyton
THIRD YEAR AT MALORY TOWERS
මැලෝරි ටවර්ස්
බාලිකා විදුහල
3
චන්ද්‍ර අනගිරත්න

# 1

# මැලෝරි ටවර්ස් විදුහලට අලුත් ශිෂ්‍යාවක්

ඩැරල් සිය ඇඳුම් පෙට්ටිය ඇසිරීම සඳහා සිය මවට උදව් වෙමින් සිටියාය. ඇයගේ බාල සොයුරිය වන ෆෙලිසිටි ඒ දෙස බලා සිටියේ, අක්කා යන පාසැලට තමාට කවදා යන්නට ලැබේදෝයි සිතමිනි.

"හිත හදා ගන්න, ෆෙලිසිටි, සැප්තැම්බර් මාසෙ දි පුළුවන් ඔයාටත් මගෙ ඉස්කෝලෙට එන්න," යයි ඩැරල් කීවාය. "නැද්ද - අම්මා?"

"මං හිතනවා - එහෙම," යයි මව උත්තර දුන්නාය. "මිස් ග්‍රේලිං කීවේ ඒ වෙන කොට ඉඩ තියෙයි කියලා. ඒක නෙවේ, ඩැරල්, මේ ඔක්කොම පොත් ගෙනියන්න ඕනෑ ද? ට්‍රන්ක පෙට්ටිය බර වැඩි වෙනවා නේ."

"ඔව්, අම්මා, ඔක්කොම ගෙනියන්න ඕනෑ. මගෙ රෝලර් - ස්කේට්ස් දෙක ගෙනියන්නත් ඕනෑ. දැන් අපිට ඉඩ දීලා තියෙන්නේ, පිට්ටනියේ ලිස්සලා යන්න. ඒක හරි ම විනෝදයි."

"හරි - එහෙනං," යයි (ඩැරල්ගේ මව වන) රිවර්ස් මහත්මිය කීවාය. "හැබැයි, ට්‍රන්ක පෙට්ටියේ භාගයක් එළියට ගන්න ඕනෑ - ඒ සපත්තු දෙක අඩියට දන්න. ආ - දුවගෙ නිදන කාමරේට දගන්න සෙරෙප්පු දෙකේ නම ලියුව ද?"

"නෑ - බැරි වුණා! අනේ, ෆෙලිසිටි, හොඳ ළමයා වගේ ඒ වැඩේ මට කරලා දෙන්නකෝ. මොනව හරි දේක නම ගහලා නොතිබ්බොත් මේට්‍රන්ට හරියට තරහා යනවා."

පෑනක් ගෙන ඒම සඳහා ෆෙලිසිටි දුව ගියාය. ඇයගේ වයස එකොළහකි. ඩැරල්ට දන් අවුරුදු දහ හතර ය. ෆෙලිසිටිට මැලෝරි ටවර්ස් පාසැලට යන තෙක් ඉවසුමක් නැත. ඩැරල් කියන හැටියට මුළු බ්‍රිතාන්‍යයේ තිබෙන හොඳ ම පාසැල එය වේ!

"අපට අර අලුත් ළමයා කාර් එකේ දගෙන යන්න නොතිබ්බා නම් කියලා මට හිතෙනවා," යි ඇඳුම් පෙට්ටියට බර වෙමින් ඩැරල් කීවාය. "මොකද්ද, අම්මා, එයාගෙ නම කීවේ? මට ඒක කොච්චරවත් අමතක වෙනවා."

"සෙරෙල්ඩා," යි මව පිළිතුරු දුන්නාය. "සෙරෙල්ඩා බ්‍රාස්."

"දෙයියනේ! එයා කොයි වගේ කෙල්ලක් ද දන්නෙ නෑ?"

"හොඳට ඇති! එයා ඇමරිකන් ගර්ල් කෙනෙක් කියලා දුව අහලා තියෙනවා නේ. එයාගෙ ආච්චි ඉංග්‍රීසි. ආච්චි තමා එයාව එංගලන්තෙට ගෙන්නාගෙන මැලෝරි ටවර්ස් යවන්න කටයුතු ලෑස්ති කරලා තියෙන්නේ. පුදුමයි - එයාට මේ විගහට ඒ ඉස්කෝලෙ ලැබුණු එක!"

"එයා කොයි වගෙද දන්නෙ නෑ! අම්මා එයා දකලා තියෙනව ද?"

"නෑ, ෆොටෝ එකක් විතරක් දකලා තියෙනවා. ෆොටෝ එකේ හැටියට අවුරුදු විස්සක පෙනුමක් තිබුණාට, මං හිතන්නෙ - එයාගෙ දන් වයස පහළොවක් ඇති!"

"පහළොවයි? එහෙනං එයා මගෙ පන්තියේ නෙවෙයි. ඊට ඉහළ පන්තියට දයි. අනේ - අම්මා, සැලී, කම්මුල්ගාය හැදිලා - වෙන් කරලා තියෙන කාලෙ තව ඉවර නෑ. එයා ඉස්කෝලෙට එන්න කල් යයි."

ඩැරල්ගේ හොඳ ම මිතුරිය සැලී හෝප් ය. සාමාන්‍යයෙන්, නිවාඩුවෙන් පසු දෙදෙනා ම ආපසු පාසැලට යන්නේ එකට



ය. එක්කෝ ඩැරල්ගේ පියා තම මෝටර් රථයෙන් දෙදෙනා ම පාසැලට ගෙන ගොස් බාර දෙයි. එසේත් නැත්නම්, සැලීගේ පියා ඒ කාර්ය ඉටු කරයි. එහෙත් නිවාඩු කාලේ දී කම්මුල්ගෙඩි සැදුණු සැලී නියමිත වෙන් කර තබන කාලය අවසන් වන තෙක් ගෙදර රැඳී සිටිය යුතු ය.

"දුව සැලීට ඉස්කෝලේ තොරතුරු දන්වලා ලියුම් එවන්න." රිවර්ස් මහත්මිය කීවාය. "ආ - ෆෙලිසිටි හොඳ ලස්සණට සෙරෙප්පු දෙකේ නම ලියලා තියෙන්නේ! ඩැරල්, හිදගන්න යන කොට දගන්න ජැකට් එක ගන්න ද? ආ - ඔව්, මේ තියෙන්නේ. ආ - දන් මක්කොම හරි වගේ. කෝ ඇඳුම් ලැයිස්තුව? ඉන්න මං කියවලා බලනකං - මොනවා හරි ලියන්න අමතක වුණා ද කියලා."

"සැලී අසනීප නොවී හිටියා නං, අපට සෙරෙල්ඩා දගෙන යන්න වෙන්නෙ නෑ නේ - කාර් එකේ ඉඩ නැති හන්ද. මට නං හිතෙනවා - එයා අපට අල්ලන්නෙ නැති වෙයි කියලා. දන් අපි කෝන්වෝල් යන ගමන් මං මොනව ද එයා එක්ක කතා කරන්නෙ?"

"ඇයි, දෙයියනේ, මැලෝරි ටවර්ස් ගැන කතා කරන්න බැරුවයැ?" රිවර්ස් මහත්මිය කීවාය. "ඇයි, දුව ගෙදර ආව ම පැය ගණන් ඉස්කෝලෙ ගැන කියවන්නෙ?"

ඇඳුම් පෙට්ටිය අසුරා අවසන් වීමෙන් පසු සාමාන්‍යයෙන් කෙරෙන පරිදි යතුර සෙවීම ආරම්භ විය. නිවාඩු කාලයේ දී එය අස්ථාන ගත වීම සාමාන්‍යයෙන් සිදු වන්නකි.

"අම්මා මගෙ සෞඛ්‍ය වාර්තාව අත්සන් කළා ද? කෝ ඒක? මගෙ හයිට් පේප් එකක් ද? හරි, තියෙනවා. මේ පාරවත් අයිරින්ට එයාගෙ හෙල්ත් සර්ටිෆිකේට් එක මතක් වෙයි ද මන්ද!"

ෆෙලිසිටි කෙතර සිනාවක් පෑවාය. මේ ලෝකේ සිහියක් නැති අයිරින්ගේ වැඩ ගැන ඇසීමට ඇ ආශා කළාය. අයිරින් තම සෞඛ්‍ය වාර්තාව අමතක නොවන සේ ගෙදර දී සියලු ආරක්ෂා කටයුතු යොදන්නීය; එහෙත් පාසැලේ සෞඛ්‍යාගාරයට ගිය කල සෑම විට දස අතේ එය සොයන්නීය.

පසු දින ඩැරල්ගේ පියා වන රිවර්ස් මහතා මැලෝරි ටවර්ස් කරා මෝටර් රථය පදවන්නට වූයේය. රිවර්ස් මහත්මිය ඉදිරි අසුනේ වූ අතර, ඩැරල් පසු පස අසුනේ වාඩි වී සිටියාය. එය ජනවාරි මාසයේ පැහැබර ශීත උදයකි. පාසැලට හා නේවාසිකාගාරයට අවශ්‍ය සියලු දේ පෙර දිනයේ ම ලකලෑස්ති කරන ලද්දෙන්, ඔවුන්ට උදේ පාන්දරින් ම ගමන් ආරම්භ කිරීමට පුළුවන් විය. මෝටර් රථයට නැඟීමට පෙර ඩැරල් සිය නැඟණිය සමග ගෙවත්ත වටේ ඇවිද, අවසන් වරට සියල්ල බලා කුකුල් කොටුවෙන් පවා සමු ගත්තාය.

"සැප්තැම්බර් මාසේ මං නංගිට ආයුබෝවන් කියන්න ඕනෙ නෑ. දන් මං සමුගන්නම්. හොඳට ක්‍රීඩාවලට පුහුණු වෙන්න. එතකොට නංගී අපෙ ඉස්කෝලෙට ආවා ම මට ආඩම්බර වෙන්න පුළුවන්."

වික දුරක් ගිය කල ඩැරල් කර වටා සාලුව ඔතා ගත්තේ ශීත සුළං තද නිසා ය. වැඩි වේලා යන්නට මත්තෙන් අතරමග දී සෙරෙල්ඩාගේ නිවසට ගොස් ඇය ද පසුපස අසුනට නංවා ගන්නට ඔවුනට ඇත.

සැතැපුම් පණහක් ඈතින් පිහිටි සෙරෙල්ඩා වසන නිවස ලොකු එකකි. එය ඇයගේ ආච්චිගේ ය. ඇයගේ ආච්චි රිවර්ස් මහත්මියගේ මවගේ කිට්ටු මිතුරියකි. අතරමග දී සෙරෙල්ඩා ද මෝටර් රථයේ දමා ගෙන පාසැලට ගෙන යන ලෙස රිවර්ස් මහත්මියට කීවේ ඇයගේ මව ය.

"ඩැරල්ටයි සෙරෙල්ඩටයි ඉස්කෝලෙ ළඟට යනකං මග දිගට කතාවේ යෙදෙන්න පුළුවන් නේ. ඩැරල්ට පුළුවන් මැලෝරි ටවර්ස් ගැන එයාට කියලා දෙන්න," යයි ඩැරල්ගේ ආච්චි කීවාය. "අලුත් රටක අලුත් නුහුරු නුපුරුදු ඉස්කෝලෙකට යන කොට සෙරෙල්ඩට අමුතු ගතියක් දනේවි!"

එහෙත් ඩැරල්ට එසේ නොදන්නා කෙනකු සමග බලෙන් කතාවට වැටෙන්නට කැමත්තක් නොවීය. සැලී කාර් එකේ දමාගෙන යෑමට නොලැබීම ගැන ඇයට ඇති වූයේ දුකකි. සෙරෙල්ඩාගේ නම ඇසූ පමණින් ම ඩැරල්ට ඇය ගැන ප්‍රිය



ගතියක් ඇති වූයේ නැත. එය ඇයගේ නියම නම ද? මට ද එම නමට කැමැත්තක් නොදක්වන බවක් ඈ සිතුවාය.

"මේ කියන්නේ කොටිං!" යයි රිවර්ස් මහතා නාම පුවරුවක් බලා කීවේය. "මේ හරිය නේ ඒ ඇමරිකන් ළමයා ඉන්නේ?"

"ඔව්," යයි රිවර්ස් මහත්මිය අතේ තුබූ කාඩ් පතක් දෙස බලා කීවාය. "පල්ලිය ළඟින් දකුණට හරවලා, කන්ද උඩට ගිහිල්ලා, මුදුනෙදි ආයෙත් දකුණට හරවලා ගියා ම සුදු පාට ගාපු විශාල ගෙයක් හම්බු වෙයි. සෙරෙල්ඩා ඉන්නෙ, අන්න ඒ ගෙදර."

ඔවුහු ඒ ගෙදර කරා ගියහ. එය ඇත්තෙන් ම මන්දිරයකි. ප්‍රධාන මෙහෙකරු දොර විවෘත කෙළේය. කඩිසර පෙනුමෙන් යුත් තරමක වයසක ස්ත්‍රියක් දුවගෙන ඉදිරියට ආවාය. ඒ සෙරෙල්ඩාගේ ආච්චි ය.

"ආ - කොච්චර දෙයක් ද ආ එක! සෙරෙල්ඩා, ඔය ළමයා ලෑස්ති ද? මෙන්න ඒ අය ඇවිල්ලා."

සෙරෙල්ඩා පෙනී සිටියේ නැත. රෑ වෙන්නට කලින් පාසැලට යා යුතු බැවින්, කෝපි බොන්නට නතර විය නොහැකි බව රිවර්ස් මහත්මිය කීවාය.

"සෙරෙල්ඩා ලෑස්ති නම්, අපිට මෙහෙම ම යන්න පුළුවන්," යයි රිවර්ස් මහතා පැවසුයේ ඇයගේ ප්‍රමාදය ගැන අමනාපයෙන් යුතුව ය. ඇය ඔවුන් බලාපොරොත්තුවෙන් සූදානම් වී සිටියා නම් හොඳ ය. ඔහු මෝටර් රථයෙන් බැස පසු පසට ගොස්, ඩිකිය විවෘත කර, ඇයගේ බඩු-මුට්ටු දැමීමට සූදානම් විය.

"සෙරෙල්ඩා, විගහට එන්න!" යයි යළිත් හඬ ගැසූ ආච්චි ප්‍රධාන මෙහෙකරු අමතා ඇය ගැන විමසුවාය. "කොහෙද මේ ළමයා?"

විනාඩි කිහිපයකට පසු ඈ ආවාය. ඇයගේ පෙනුම දුටු ඩැරල්ට ඒ සෙරෙල්ඩා යයි සිතා ගත හැකි නොවීය! තඹ වන් හිස කෙස් ඇති, උස හීන්දෑරි මේරූ පෙනුමක් ඇති කෙල්ලකි. ඈ ඇයගේ දිලිසෙන කොණ්ඩය උඩට රෝල් කර හිස මුදුනේ

බැඳ තිබුණි. හිස වටා වූ කොණ්ඩයේ රැලි උරහිස් දක්වා කඩා වැටී තිබුණේය.

චැරල් නෙත් අයා ඇය දෙස බලා සිටියාය. මේ කවුද? ඇය චිත්‍රපටියක රඟපාන්නියක් වැනි ය. ඈ තොල්වල සායම් ද අතුල්ලා ගෙන සිටියාය.

අවුරුදු විස්සක පෙනුමක් ඇති ඇය සෙරෙල්ඩා විය හැකි ද? ඈ කම්මැලි සිනාවක් පා ඔවුන් කරා ආවාය.

"කොහෙද සෙරෙල්ඩා - මෙච්චර වෙලා හිටියේ? අපි මේ බලාන ඉන්නවා," යි ඇයගේ ආච්චි කීවාය.

"සොරි," යයි ඈ ඇදලා කතා කළාය. ආච්චි ඇය රිචර්ඩ්ස් පවුලට හඳුන්වා දුන්නාය. රිචර්ඩ්ස් මහතා නොඉවසිලි ගතියක් දක්වා සිටියේය. ඔහු කිසි සේත් රස්තියාදු වීමට කැමැත්තෙක් නොවේ. එමෙන් ම සෙරෙල්ඩාගේ පෙනුම ද ඔහුගේ හිතට ඇල්ලුවේ නැත.

චැරල්ට ද ඇයගේ මෝස්තර හිත් ගත්තේ නැත. සෙරෙල්ඩා අවුරුදු දහසයක් හෝ දහතක් හෝ විය හැකි කෙල්ලකි. ඇය සමග මෙම ගමනේ දී කුමක් කතා කළ හැකි වේ ද?

"ආ - මේ ඉස්කෝලේ තොප්පිය දාගන්න," යයි ආච්චි ඇය අතට පාසැල් තොප්පිය දෙන ගමන් කීවාය.

"මොනවා? මේ තොප්පිය දාගන්න? ඊ - යා, මං නං කවදාවත් ඕක දාගන්නෙ නෑ."

ඇය එය කළ යුතු බව පවසා සිටීමට චැරල් ඉදිරිපත් වූයේ නැත. ඇයට දිව බැඳුණු ගතියක් දැනිණ. සෙරෙල්ඩා වයසට වඩා පැහී ඇති බව ඇයට පෙනිණ. ඇයගේ පෙනුම ද, කොණ්ඩා මෝස්තරය ද, තමා ගැන ඇති විශ්වාසය ද, ලොකුවට කතා කරන ආකාරය ද ඇයගේ සිත් ගත්තේ නැත. ඇය තමාට ගැළපෙන්නේ නැත!

සෙරෙල්ඩා කිසිදු කුලැටි ගතියකින් තොර ව මෝටර් රථයට නැග චැරල් ළඟින් වාඩි වූවාය. "සෙරෙල්ඩා, දැන් හොඳට මතක තියාගන්න, මේ යන්නෙ ඉංග්‍රීසි ඉස්කෝලෙකට කියලා,



ඉංග්‍රීසි විදිහට ඉගෙන ගන්න - ඒ විදිහට ජීවත් වෙන්න පුරුදු වෙන්න," යයි ආච්චි රථය තුළට එබිකම් කර කීවාය. "ඔය ලිප්ස්ටික් මකලා දාන්න දරුවා. මං කොච්චර කීව ද ඔය ස්ටයිල් මෙහාට අල්ලන්නෙ නෑ කියලා. ඔයා හිතන්නේ අවුරුදු දහ අටක ගෑණු ළමයෙක් විදිහටයි. නමුත් තමන් තව ම ඉස්කෝලේ යන ගෑනු ළමයෙක්. එතකොට - "

සෙරෙල්ඩා සහ ඇයගේ ආච්චි අතර සංවාදයට තව සෑහෙන වේලාවක් ගත වනු ඇතැ යි දැනී රිචර්ඩ්ස් මහතා මෝටර් රථය හෙමිහිට ඉදිරියට ඇද්දීය. රිචර්ඩ්ස් මහත්මිය "ගුඩ් බායි!" යයි තීරණාත්මක හඬින් ප්‍රකාශ කළේ කතාව කෙළවර කිරීමටය. නැත්නම්, කොයි වේලේ එතැනින් පිටවීමට ලැබේද යි ඇයට සැකයක් ඇති විය.

රථය පෙරට ඇදී ගියේ සෙරෙල්ඩාගේ ආච්චි පාරේ සිට තව දුරටත් යමක් කියමින් සිටියදී ය. රිචර්ඩ්ස් මහතා සැනසුම් සුසුමක් හෙළා රිචර්ඩ්ස් මහත්මිය දෙස ඇස් කොනෙන් බැලීය. ඈ එයට පිළිතුරු බැල්මක් හෙළුවාය. දෙදෙනා අතර හුවමාරු වූ බැලුම්වලින් චැරල්ගේ හිතට ද සහනයක් ඇති විය. තමා මෙන් ම තම දෙගුරුන් ද සෙරෙල්ඩා ගැන හිතන්නේ එක ම විදිහට බව ඇයට තේරුම් ගියේය.

"ඔයා ඇඳුම් මස්සොම ගත්ත ද?" යි ඇය සෙරෙල්ඩාගෙන් විමසුවේ ඇය හා කුමක් හෝ කතා කළ යුතු යයි සිතා ය.

"ආ - ඔව්, තැන්ක්ස්!" යයි සෙරෙල්ඩා පිළිතුරු දුන්නේ හිස මුදුනේ රෝල් කර තුබූ කොණ්ඩයට අත තබා බලා ය. ඉන්පසු නිශ්ශබ්දතාවයක් ඇති විය. චැරල් ඊළඟට ඇසිය යුතු ප්‍රශ්නය ගැන හිත වෙහෙසන්නට වූවාය.

"මං ඔයාට අපෙ මැලෝරි ටවර්ස් ගැන යමක් කියන්න ද?" යි ඈ අවසානයේ ඇසුවාය.

"ඔව් - කියන්න," යයි සෙරෙල්ඩා නිදිමත ගතියෙන් යුතු ව කීවාය. "කොහොම ද අපේ ටීචර්?"

"ඔයා මගෙ පංතියට එන එකක් නෑ. මොකද - ඔයාට දැන් පහළොවක් ඇති නේ? එහෙම නේ?"

"දැන් මට දැනගන්න ඕනෑයි," සෙරෙල්ඩා යළිත් කොණ්ඩය හරිගැස්සුවාය. "ඔව්, මං හිතනවා මාව ඔයාගෙ පංක්තියට වැටෙන එකක් නෑ කියලා. ඔයා එච්චර ලොකු නෑ නේ?"

"මාත් ඔයෙ පන්තියේ අනිත් අය වගේ ම ලොකුයි," යයි පැවසූ ඩැරල් තමා ද සෙරෙල්ඩා සේ විකාර ලෙස කොණ්ඩා මෝස්තරයක් දමීමොත් උසට දිස් වේ යයි තමාට ම සිතා ගත්තාය.

ඉන්පසු ඩැරල් මැලෝරි ටවර්ස් ගැන කියන්නට වූවාය. එය ඇයගේ ප්‍රියතම මාතෘකාව වූයෙන් ඇ කියාගෙන කියාගෙන ගියාය. විදුහල් ගොඩනැගිල්ලේ හතර කොනේ කුලුණු හතර ගැනත්, මැද පිහිටි පිට්ටනිය ගැනත්, ගල්පර අතර පිහිටි පිහිනුම් තටාකය ගැනත්, මුහුදු රැල්ල නගින විට - වඩදියට - එය පිරෙන හැටි ගැනත්, ග්‍රීෂ්ම කාලයේ බාලිකාවන් එහි බැස පිහිනමින් නාන හැටි ගැනත් ඇ කියා සිටියාය.

"අපි නිදාගන්න ඩෝමිටරි තියෙන්නේ ඒ කුලුනු හතරේ. එනකොට අපෙ කොමන් රූම්ස් - ඒ කියන්නේ අපි පංක්තියේ නැති කොට විවේකයෙන් පසු වෙන කාමර තියෙන්නේත් ඒ කුලුනුවල. අපේ කණ්ඩායම භාර ගුරුවරිය මිස් පොට්ස්. ඒක නෙවේ, ඔයා අයිති මොන කණ්ඩායමට ද?"

ඒකට සෙරෙල්ඩාගෙන් පිළිතුරක් ලැබුණේ නැත. ඩැරල් ඇය දෙස අමනාපයෙන් හා තරහින් යුතු ව බැලුවාය. සෙරෙල්ඩා තද නින්දේ ය! ඩැරල් කී දෙයින් එක වචනයක් හෝ ඇයට ඇසුණේ නැත. හොඳයි!



## 2

# ආපසු පාසැල වෙත

තම ආදරණීය මැලෝරි ටවර්ස් විදුහල් මාතාව ගැන තමා විස්තර කරමින් සිටිය දී නින්දට වැටුණු සෙරෙල්ඩා ගැන කුපිත වූ ඩැරල්, සෙරෙල්ඩා අකැමැත්තෙන් මෙන් යළි අවදි වූ පසු, ඒ සම්බන්ධයෙන් කිසිවක් නොදෙඩීමට ඉටා ගත්තාය.

මේ අතර, නින්දේ පසු වූ මෙම ඇමරිකානු බාලිකාව දෙස ඇ හොඳින් බැලුවාය. ඇය ඇත්තෙන් ම පියකරු වූ නමුත්, ඇයගේ කේශ කලාපය ලස්සණ රන්වන් පාටක් දරා සිටියේ නැත. ඇයගේ අගට යෙදෙන නම වන (පිත්තල යන අරුත ඇති) "බ්‍රාස්" යන්න ඇයට නියමෙට ගැළපෙන බව ඩැරල් සිතුවාය. ඇයගේ කොණ්ඩය පිත්තල පාට ය. එය සායම් පොවන ලද්දක් දැයි ඩැරල් සැක කළාය. එහෙත් එසේ කිරීමට ඇයට හේතුවක් නැත. ඇමරිකානු කෙල්ලන් ඉක්මනින් හැදී වැඩෙන අය විය යුතු යයි ඩැරල් සිතුවාය.

"මෙයා මැලෝරි ටවර්ස් එන්නේ මොකටද," යි ඩැරල් ඇයගේ පූයර ගාන ලද මුහුණේ රෝස පාට ගල්වන ලද කම්මුල් හා වක් වූ ඇස් බැම් දෙස බලා සිතුවාය. "මෙයා නම් අපෙ ඉස්කෝලෙට කොහෙත් ම සුදුසු නෑ. ග්වෙන්ඩොලින් නම් මෙයාට කැමැති වෙයි, මං හිතන්නේ. සෙරෙල්ඩා වගේ ආටෝප දලා විසි විස්තර කරන කෙල්ලන්ට වහ වැටෙන එක එයාගෙ පුරුද්ද නේ!"

රිවර්ස් මහත්මිය පිටුපස අසුනේ සැපට නිද සිටින සෙරෙල්ඩා දැක තම දියණිය දෙස බලා සිනාසුණාය. ඩැරල් පිළිතුරු සිනාවක් පෑවාය. සෙරෙල්ඩාගේ මව සහ පියා කෙබඳු අය විය හැකි දැයි සිතන්නට වූ ඩැරල් සෙරෙල්ඩා වැනි දියණියක සිටීම' ඔවුන්ට වධයක් විය හැකි යයි ද සිතුවාය.

සෙරෙල්ඩාගේ පෙනුම මෙසේ විකාර වුව ද, ඇයගේ ගතිගුණ යහපත් විය හැකි බවත්, ඇය කොන් නොකර, ඇයට එංගලන්තයට ගැලපෙන හැටියට හැඩ ගැසීමට උදව් කළ යුතු බවත් ඈ සිතුවාය. ඇමරිකාව වගේ විශාල රටක ගැනු ළමයින්ට මෙසේ නිදහසේ හැදෙන්නට ඉඩ ලැබීම නිසා ඔවුන් විගහට ලොකු මහත් වී ලොකු අයගේ ආභාෂය ලබනවා විය හැකි බව ද ඇයගේ කල්පනාවට ආයේය.

"ඒ වුණාට, සෙරෙල්ඩාට දන් දහසයට කිට්ටු හන්ද, එයා මගේ පන්තියට දන එකක් නෑ. එයාට ඉහළ පංක්තියක් ලැබේවි. එතකොට මට එයා ආශ්‍රය කරන්න ලැබෙන එකක් නෑ වැඩිය. එයා අපේ නේවාසිකාගාරෙට අයිති වෙන එකෙකුත් නෑ. මිස් පොට්ස් එයා ගැන මොනවා හිතයි ද මන්ද!" ඩැරල් තව දුරටත් කල්පනා කළාය. "මිස් පොට්ස්ට හැම දෙයක් ම හරියට තියෙන්න ඕනෑ. හරියට කෙරෙන්න ඕනෑ. ඔය බොරු අනම් - මනම් මිස් පොට්ස්ට අල්ලන්නෙ නෑ," යනුවෙන් ඩැරල්ගේ සිතිවිලි ඒ මහත පුෂ්ටිමත් පාලිකාව කෙරෙහි ද ඇදී ගියේය. ඉන්පසු ඇය සිතුවේ අට වැනි පන්තිය හෙවත් තම පංක්තිය භාර ගුරුවරිය ගැන ය. ඩැරල් දනට එක වාරයක් මෙම පන්තියේ ඉගෙනගෙන ඇත.

"මිස් පීටර්ස්! දෙයියනේ, සෙරෙල්ඩා අපෙ පන්තියේ ඉන්නවා දක්කොත් එහෙම එයාට කලන්නෙ හැදෙයි!" යයි ඩැරල්, පෙනුමෙන් පිරිමියකු වැනි, සැර කටහඬක් ද ඇති තම පංක්තිය භාර ගුරුවරිය සිහින් මවා ගන්නට වූවාය. "සෙරෙල්ඩා අපෙ පන්තියට නොවැටෙන එක පාඩුවක්! මං ආසයි මිස් පීටර්ස් සෙරෙල්ඩා එක්ක අල්ලන හැටි බලන්න!"

මැලෝරි ටවර්ස් කරා මෝටර් රථය ළඟා වූ විට ඩැරල් මහන්සියට පත් ව සිටියාය. ආහාර ගැන්ම සඳහා රථය අතරමග දෙපොළක නතර කරනු ලැබිණ. අවදි වූ සෙරෙල්ඩා රිවර්ස් මහතාට හා මහත්මියට කතා කළේ ලොකු අයකු කතා කරන තරම් ගාම්භීර අන්දමිනි. ඇයට එංගලන්තය "පුදුම" රටක් ලෙස පෙනුණු බවත්, එයට යම් යම් දේ ඉගැන්විය හැකි බවට ඇය සිතන බවත් ඇයගේ කතා විලාසයෙන් පෙනුණි.



රිවර්ස් මහත්මිය ඇයට ආචාරශීලී හා මිත්‍රශීලී වූවාය. ඇය කාටත් එසේ ය. සෙරෙල්ඩා වැනි පුහු ආටෝපයෙන් යුතු අය නොඉවසන රිවර්ස් මහතා ඇය නොතකා තම දියණිය සමග කතාවේ යෙදුණේය.

මෝටර් රථය යළි පණ ගැන්වී වේගයෙන් ඇදී යද්දී සෙරෙල්ඩා ඩැරල් අමතා, "ඔයාගෙ තාත්තා වනර්ෆුල්!" යයි කීවාය. (හොඳයි, ලස්සණයි, පුදුමයි යන අර්ථයෙන් 'වන්ඩර්ෆුල්' යන ඉංග්‍රීසි වචනය සෙරෙල්ඩාගෙන් උච්චාරණය වන්නේ 'වනර්ෆුල්' ලෙස ය.) "ලොකු ඇස් දෙකයි, ඉස්සරහට පිම්බිලා තියෙන ඇස් බැමියි වනර්ෆුල්!"

ඩැරල්ට සිනා ගියේය. සෙරෙල්ඩා කී දෙය තම පියාට කියන්නට ඇයට සිතුණු නමුදු, ඊට අවස්ථාවක් පැදුණේ නැත.

"මට ඔයාගෙ ඉස්කෝලෙ ගැන යමක් කියන්නකෝ," යයි ඩැරල් නිහඬ ව සිටිනු දුටු සෙරෙල්ඩා ඉල්ලා සිටියාය.

"මං දනටමත් ඔයාට කියලා තියෙන්නේ," යයි ඩැරල් මුරණ්ඩු හඬින් කීවාය. "ඒ විස්තර අහගෙන ඉන්න තරම් රසවත් නැති හන්ද නේ ඔයාට නින්ද ගියේ!"

"ආ! ඒක හරි නරක දෙයක් නේ," යයි සෙරෙල්ඩා වරද පිළිගන්නා අයුරින් කීවාය.

"කොහොම වුණත්, ආයෙත් සැරයක් මට කියන්න වේලාවක් නෑ - අපි දන් ඉස්කෝලෙට ම ඇවිල්ලා!" යයි ඩැරල් පැවසුවේ කවදත් පුරුදු පරිදි කාලෙකට පසු මැලෝරි ටවර්ස් දකින විට ඇති වන ප්‍රීතියෙන් බබළන ඇස් ඒ දෙස යොමාගෙන ය.

මෝටර් රථය පාසැල් ගොඩනැගිල්ලේ ප්‍රධාන දොර ඉදිරියෙන් නතර කරනු ලැබිණ. ඩැරල්ට හැම විට ම හැඟෙන්නේ මෙය මාළිගාවක මහ වහල්කඩක් ලෙස ය. දන් දන් ඒ අසල තව තවත් වාහන එක් රොක් වෙයි. එක් එක් වයසේ බාලිකාවෝ එහෙ-මෙහෙ දුවලති. ඔවුන් අත ගමන් මලු සහ ලැක්රෝස් පිති ය.

"දන් බහිමු! එන්න, සෙරෙල්ඩා!" යි ඩැරල් කීවාය. "ආපහු ඉස්කෝලෙට එන්න ලැබෙන එක කොච්චර දෙයක් ද! හලෝ

- බෙලින්ඩා! අා - අයිරින් ඔයාගෙ හෙල්ත් සර්ටිෆිකේට් එක ගෙනාව ද? හලෝ - ජීන්, සැලී ගැන ඔයාට ආරංචි ද? අසනීප වෙලා - එයාට තව ටික දවසක් ගෙදර ඉන්න වෙයි, සව් නේ!"

සෙරෙල්ඩා ඩැරල්ට පසු ව මෝටර් රථයෙන් බිමට බසිනු ජීන්ගේ නෙතට ලක් විය. ඈ තම ඇස් අදහා ගත නොහැකිව මේ අමුතු රුව දෙස බලා සිටියාය. සෙරෙල්ඩා තවමත් පාසැල් කොප්පිය පැළඳ නැත. ඇයගේ කොණ්ඩය උරහිස පහළට කඩා වැටී තිබුණි. හිස මුදුනේ අඹරවන ලද කෙස් රැල්ල සන්ධ්‍යා හිරු එළිය වැදී දිස්නය දෙන්නට විය.

"දෙයියනේ, අර කවුද? ඔයාගෙ නෑදෑයෙක් ද?" ජීන් ඇසුවාය.

"ඉහි - ඉහි," යනුවෙන් සිනා හඬ නැඟූ ඩැරල්, "අනේ - නෑ, එයා අලුත් ගර්ල් කෙනෙක්!" යයි පිළිතුරු දුන්නාය.

"නෑ! එයා මොකට ද මෙහෙ - මැලෝරි ටවර්ස් ආවෙ? චිත්‍රපටියක රඟපාන්න ද?"

ඩැරල් ඉන්පසු තම මිතුරියන් අතර එහෙ-මෙහෙ ගැවසෙන්නට වූවාය. ඈ ප්‍රීතියෙන් කුල්මත් ව සිටියාය. රිවර්ස් මහතා ට්‍රන්ක් පෙට්ටි රථයෙන් බිමට ගත් කල, පාසැල් සේවකයෙක් ඒවා ඇතුළට ගෙන ගියේය. ඩැරල් මේ අවස්ථාවේ සෙරෙල්ඩාගේ ට්‍රන්ක පෙට්ටියේ ලේබලය දුටුවාය. එහි ලියා තිබුණේ "නෝත් ටවර්" කියා ය.

"දෙයියනේ, එයත් අපේ ශිෂ්‍ය නිවාසයේමයි!" ඩැරල් සුසුමක් හෙළුවාය. "හලෝ - ඇලීෂියා, නිවාඩු කාලේ කොහොම ද?"

ඇලීෂියා ඇය ළඟට ආවාය. ඇයගේ ඇස් කාන්තිමත් ව බැබළිණ. "නියමයි! දෙයියනේ අර කවුද?"

"අලුත් ගර්ල් කෙනෙක්! මට පුදුම නෑ - ඔයා පුදුම වෙලා බැලුවට. මටත් එයා ඉස්සරෝම දකින විට ඇස් අහකට ගන්ට හිතුණෙ නෑ. හිතන්න බෑ නේ?"

"ආන් බලන්න - අපේ ආදරණීය ග්වෙන්ඩොලීන් පුරුදු පරිදි අම්මගෙ බෙල්ල බදගෙන අඬනවා," යයි ඇලීෂියා කීවාය.



ග්වෙන්ඩොලින්ගේ මව දුවගෙන් සමුගනිමින් තම ඇස්වල පිරුණු කඳුළු පිස දමන සැටි ද ඇලීෂියාගේ නෙතට ලක් විය.

"ඔව්මයි, එතකොට ග්වෙන්ඩොලින්ගේ (ගෙදර දී උගන්වන) මිස් වින්ටරුත් ඒ එක්ක ම ඉන්නේ," යි ඩැරල් කීවාය. "ග්වෙන් තරක් වෙන එක අහන්න දෙයක් යැ! අම්මගෙ චූටි පැටියා! මිස් වින්ටර්ගේ හුරතල් පැටියා! අපි එයා මෙහෙදි හදලා ගත්තට වැඩක් නෑ, නිවාඩු කාලෙදි එයා ආයෙත් බබා වෙනවා."

සෙරෙල්ඩාගේ දර්ශනය දුටු ග්වෙන්ඩොලින් පුදුමයෙන් ගැස්සී සිටියාය. ඇයගේ මුහුණ ආලෝකමත් වූයේ බලාපොරොත්තු සහිතව ය. ඇලීෂියා ඩැරල්ට වැලමිටෙන් ඇන්නාය.

"ග්වෙන්ඩොලින් සෙරෙල්ඩාට වන්දනාමාන කරන්නයි යන්නේ. බලන්න ‑ ඒකට ලෑස්ති වෙන හැටි මූණෙන් ම පේනවා. සෙරෙල්ඩාට අඩු ම ගානේ එක වහලියක් හරි ඉන්නවා - කැමැත්තෙන් ම ඉදිරිපත් වෙන!"

ග්වෙන්ඩොලින් පිය මවට හා වින්ටර් මෙනෙවියට යමක් කීවාය. ඒ දෙදෙනා ම සෙරෙල්ඩා දෙස බැලුවෝය. එහෙත් ග්වෙන්ඩොලින් තරම් ඒ දෙදෙනා සෙරෙල්ඩා අගය කළ බවක් ප්‍රදර්ශනය නොවීය.

"ගුඩ් - බායි, ඩාලිං!" යයි ග්වෙන්ඩොලින්ගේ මව කීවේ තවමත් ඇස්වල කඳුළු පිස දමමිනි. "දුව ගෙදෙට්ට ලියන කොට හොඳාක් ලියන්න."

එහෙත්, පිය මවගේ වදන් ගැන ග්වෙන්ඩොලින් එ තරම් උනන්දුවක් නොදක්වූවාය. ඇය උනන්දු වූයේ සෙරෙල්ඩා ගැන බලා ගන්න කවුරුවත් ඉන්නවා දැයි දැනගැන්මට ය. ඇය ළඟට ගොස් ඇය හා මිත්‍ර වී ඇයට පාසැල පුරා කැන්දා පෙන්විය හැකි නම්? ඩැරල් ඇය සමඟ සිටිනා බව ග්වෙන්ඩොලින්ට පෙනී ගියේය. තමා එතැනට ගිය හොත් ඩැරල් තමාට හරස් වන බවට ග්වෙන්ඩොලින්ට සැකයක් නොවීය.

කලබලයෙන් ඇවිස්සී දඟලන බාලිකාවන් දෙස සෙරෙල්ඩා ආශාවෙන් බලා සිටියාය. ඈ ද ඔවුන් මෙන් දුඹුරු පාට කබායකින්, දුඹුරු පාට දිගු මේස්වලින් හා දුඹුරු පාට සපත්තු

වලින් සැරසී සිටිය ද මවුන්ට වඩා වෙනස් ව කැපී පෙනෙන්නට සමත් වූවාය. තමා වෙත කුතුහලයෙන් යුතු ව බලා සිටියවුන් ගැන ඇයට සොඳිසියක් නොවීය.

තම මව සහ පියා පිටත් ව යාමට සැරසෙනු දුටු වැරල් වහා ම සවුන් වෙත දුව ගියාය.

"දුව මෙහෙ ආව ගමන් කවුරුත් එක්ක කුලුපගවෙලා, හැම දේට ම හුරු වෙලා, ගෙදර වගේ පහසුවෙන් දඟලන්න පුරුදු වෙලා ඉන්න එක කොච්චර එකක් ද!දන් දුව පුංචි ළමයින්ගෙන් කෙනෙක් නෙවේ නේ!අනික් ළමයි දිහා බැලුව ම මයෙ දුවත් දන් ලොකු ළමයෙක්," යයි ඇයගෙන් සමුගන්නා ගමන් මව කීවාය.

"ඔව්, මං හිතනවා - දන් මං බබෙක් නෙවේ - ලොකු ළමයෙක් කියලා. එහෙනං, අම්මටයි තාත්තටයි ගුඩ් බායි! වෙනද වගේ මං ඉරිදට ලියන්නම්. නංගිට කියන්න - මං මතක් කරා කියලා, ඉස්කෝලෙත් එන්න එන්න හොඳයි කියලා කියන්න - අම්මා!"

මෝටර් රථය පිටත් ව ගියේය. එය නොපෙනී යන තෙක් වැරල් අත වැනුවාය. තම පිටට කවුදෝ තට්ටු කරන බව දනී ඇ හැරී බැලුවාය. තමා ළඟ සිටියේ අයිරීන් ය.

"වැරල්, අනේ එන්නකෝ - මයෙත් එක්ක මේට්‍රන් ළඟට යන්න. මට මගෙ හෙල්ත් සර්ටිෆිකේට් එක හොයා ගන්න බෑ නේ."

"අයිරීන්, මට ඔයා නං විශ්වාස කරන්න බෑ. කෝ මගෙ බෑග් එක? ආ - මේ තියෙන්නේ. හරි, මං එන්නං."

වැරල්ට හදිසියේ ම සෙරෙල්ඩා මතක් විය. "ආ - නේ, මට සෙරෙල්ඩා අමතක ම වුණා නේ! එයත් එන්නෙ අපෙ නෝත් ටවර් එකට නේ. මං එයා එහෙ එක්කං යන්න ඕනෑ. නැත්තං, එයාට අතරමං වුණු ගතියක් දනෙයි. මං දන්නවා - මට කොහොම ද දනුණෙ කියලා - මුලින් ම මං මෙහෙ ආපු දවසෙ. කවුරුත් කතා කර කර. හිනා වෙවී හිටියා මට මතකයි. නමුත්, මං ඒ කවුරුවත් දනගෙන හිටියෙ නෑ."



ඇය වහා ම සෙරෙල්ඩා ළඟට ගිය නමුත්, සෙරෙල්ඩා නිසිදු එකියක් නොවූකී ව හුරු පුරුදු නැතක සඳු වන්නාක් මෙන් වටපිට බලමින් සිටියාය. ඇයගේ රතු පාට දෙකොල් අතර මඳ සිනාවක් රැඳී තිබුණි. තමා වටේ සිදු වන දේවලින් ඇය තෘප්තියක් ලබන බව ඇයගේ සන්සුන් ගතියෙන් පෙනී ගියේය.

වැරල් ළං වීමට පෙර වෙනත් ළමයෙක් සෙරෙල්ඩාට කතා කළාය. ඒ ග්වෙන්ඩොලින් ය.

"ඔයා අලුත් ළමයෙක් ද? මං හිතනවා ඔයා නෝත් ටවර් එකේ කියලා. ඔයා මයෙත් එක්ක එනවා නම් හැම තැන ම පෙන්වන්නම්."

"එා - මිරු නේ! ඔයා කොච්චර හොඳ ද!" යි සෙරෙල්ඩා පුරුදු පරිදි ඇද-සැද කීවාය.

"අර බලන්න! ග්වෙන්ඩොලින් දන්ම ම ඔයාගෙ ඇගේ එල්ලිලා!අනේ ඇත්තට, සෙරෙල්ඩා වගේ කෙනෙක් අහු වුණොත්, අන් අරියෑ! සෙරෙල්ඩා, ඔයා එන්න අපි එක්ක. අපි ඔයාව මේට්‍රන් ළඟට එක්කං යන්නං." වැරල් කීවාය.

"මං එයා ගැන බලාගන්නම්, වැරල්," යයි සිය නිල් පාට මලානික ලොකු ඇස් වැරල් වෙත හෙලා ග්වෙන්ඩොලින් පැවසුවාය. "ඔයා හිතිල්ලා සැලී ගැන බලන්න!"

"සැලී දන් ම එන්නෙ නෑ," යි වැරල් කීවාය. එයා ලෙඩ හැදිලා - තව ටික දවසක් ගෙදර ම ඉන්න ඕනෑ. මං සෙරෙල්ඩා ගැන බලන්නං. එයා මෙහෙ අඬගහගෙන ආවෙත් මං."

"එහෙනං, ඔය දෙන්න ම මාව එක්කං යන්න," යයි සෙරෙල්ඩා කොමළ හඬින් කීවාය. ඇ ග්වෙන්ඩොලින් වෙත කොමළ සිනාවක් පෑවාය. ග්වෙන්ඩොලින් ඇයගේ අත වටා අතක් යවා ඇය ශාලාව තුරා ගෙන ගියාය.

ඇලිෂියා සමච්චල් සිනාවක් පා, "ග්වෙන් එයා සඳහට ම අපෙන් භාරගන්න ලැස්ති වගේ," යයි කීවාය. "නමුත් සෙරෙල්ඩා ඉහළ පන්තියකට දමීමොත් දෙන්නට ඇත් වෙන්න වෙනවා. එයාට දහ අවුරුදු විතර පේනවා."

මේ අතර, අයිරීන්ගේ කෙඳිරිල්ල ඔවුන්ට ඇසුණේය. "ඕ - අයිරීන්, මට නං විශ්වාස කරන්න බෑ, ඔයා මේ පාරත් හෙල්ත් සර්ටිෆිකේට් එක අමතක කරා කියලා. හැම වාරෙක ම ඒක අමතක කරන්න පුළුවන්නෙ කාට ද!" ඩැරල් කීවාය.

"ඕං එහෙම තමා," අයිරීන් කීවාය. "අනේ එන්නකෝ, මගෙ එක්ක මේට්‍රන් ළඟට යන්න."

තිදෙනා ම පාලිකාව ළඟට ගියහ. ඩැරල් සහ ඇලිෂියා සිය සෞඛ්‍ය වාර්තා ඇයට භාර දුන්හ. පාලිකාව අයිරීන් දෙස බැලුවාය.

"මේ පාරත් ඒක හොයා ගන්න නෑ, මේට්‍රන්. මං හිතන්නෙ - නැති වෙලා කියලයි. මට ඒක ගෙනාවා කියලා වත් මතක නෑ. වෙනද නම් මට මතක් වෙනවා අම්මා ඒක මට භාර දෙන එක වත්. මේ පාර ඒක වත් මට මතක නෑ. මට දන් එන්න එන්න හොඳට ම අමතක වෙනවා." අයිරීන් කන්කෙඳිරි ගාන්නට වූවාය.

"අයිරීන්, ඔය ළමයගෙ අම්මා මාව හම්බු වෙන්න ඇවිල්ලා දන් විනාඩි දහයක් නෑ. එයා ම මට අයිරීන්ගේ හෙල්ත් සර්ටිෆිකේට් එක භාර දීලා ගියා. අයිරීන් දන් මෙතැනින් යන්න. නැත්නං, ඔය ළමයා හන්ද මගෙ ඔළුව නරක් වෙලා - ඒක නැති වෙන්නෙ මගෙ අතින්!" පාලිකාව පැවසුවාය.

ග්වෙන්ඩොලීන් සෙරෙල්ඩා කැඳවාගෙන පාලිකාව වෙත ආවාය. පාලිකාව තම ඇස් අදහා ගත නොහැකි ව ඔවුන් දෙස බැලුවාය. "මේ කවුද? ආ - සෙරෙල්ඩා බ්‍රාස් නේ! ඔය ළමයා නෝත් ටවර් හොස්ටල් එකට. මේක ද ඔබේ සෞඛ්‍ය වාර්තාව? ග්වෙන්ඩොලීන් - මෙයත් ඔය ළමයගෙ ඩෝමිටරියෙමයි. එහෙ ගෙනියලා, ඇඳුම් මාරු කරලා, කෑමට යන්න ලෑස්ති වෙන්න කියන්න."

ඩැරල් ඇලිෂියාට තියවා සිටියාය. ඇලිෂියා ඇයට ඇහැක් ගැහුවාය. පාලිකාව හෙට සෙරෙල්ඩාට අද මෙන් යහපත් නොවනු ඇත!



"එන්න යන්න, කිසිං අපෙ නයිට් ඩ්‍රෙස් ඇරලා - ටූත්බ්‍රෂ් දේ ගමු. මට හිතෙනවා, ගොඩාක් ජාති ඔයාට කියන්න," යයි ඇලිෂියා ඩැරල්ට කීවාය.

# 3

## පළමු සන්ධ්‍යාව

"තවත් අලුත් ළමයි එනවා කියලා ඔයාට ආරංචි ද?" ඩැරල් ඇලිෂියාගෙන් ඇසුවාය.

"ඔව්, තව එක්කෙනෙක් ඉන්නවා - විල්හෙල්මිනා කියලා. එයා එන්නෙ - හෙට. මගෙ මල්ලී කෙනෙක් එයාගෙ මල්ලී කෙනෙක්ව දන්නවා. විල්හෙල්මිනා අපිහෙ එනවා කියලා මගෙ මල්ලි දනගත්තයින් පස්සෙ එයා විස්ල් කරලා කීවා බිල් තියෙනවා ඉඳී! කියලා."

"කවුද බිල් කියන්නෙ?"

"විල්හෙල්මිනාට ම තමා," යයි තම පොඩි මල්ලෙන් ඇඳුම් එළියට ගනිමින් ඇලිෂියා කීවාය. "ඒ ගර්ල්ට සහෝදරයො හත් දෙනෙක් ඉන්නවා! හිතන්න - හත් දෙනෙක් කීවා ම ලේසි ද කියලා! හත් දෙනයි! එතකොට එයා තමා පවුලේ එකම ගැහැණු ළමයා."

"දෙයියනේ!" සහෝදරයන් හත් දෙනකු සිටීම කෙසේද වේ යයි ඩැරල් සිතන්නට වූවාය. තමාට එක් සහෝදරයෙක් හෝ නොසිටී. ඇලිෂියාට තුන් දෙනෙක් සිටිති. එහෙත් හත් දෙනෙක්!

"මං හිතන්නෙ - එයත් හාගෙට පිරිමි ළමයෙක් වගේ ඇති!"

"ඔව්, එහෙම තමා," යයි ඇලිෂියා උත්තර දුන්නාය. "ආ - කෝ මගෙ බ්‍රෂ් එක? මට මතකයි, මං ඒක දාගත්තා."

"ආන් බලන්න - මාළිස්!" ඩැරල් කීවාය. ඇලිෂියා ඒ දෙස

මැසුවාය. මාවිස් සිය වාරයේ මෙම පාසැලට බැඳුණු අලුත් ලමයෙකි. කම්මැලි හා ආත්මාර්ථකාමී මාවිස් එ තරම් සාර්ථක ශිෂ්‍යාවක් නොවී. ඇයගේ කටහඬ තියුණු ය, මිහිරි ය, ලස්සන ය. සංගීතය සඳහා පුහුණු කරන ලද තිත් මිහිරි කටහඬකි, ඇයට ඇත්තේ.

මාවිස් සිය කටහඬ ගැන හා ගායිකාවක වශයෙන් අනාගතයේ දී කරන්නට බලාපොරොත්තු දේ ගැන ආඩම්බරයෙන් සිටින්නීය. "මං ඔපෙරා ගායිකාවක් වුණා ම, මං මිලාන් නුවර සින්දු කියනවා; මං නිව්යෝර්ක් නුවරත් සින්දු කියනවා. මං ලොකු ලොකු නගරවල සින්දු කියනවා," ආදී වශයෙන් ඈ නිතර ම පම්පෝරියේ යෙදෙන්නීය.

ඇයගේ අනාගත බලාපොරොත්තු ඇසීම අන් අයට මහත් කන්දෙස්සිරියාවක් වී ඇත. කෙසේ වුව ද, ඇයගේ තියුණු මිහිරි කටහඬට කවුරුත් ආශා කරති. එම හඬ පාසැලේ රැස්වීම් ශාලාව පුරා විහිදී යාමට තරම් ප්‍රබල ය. පාසැලේ කුඩා බාලිකාවන් පවා කුල්මත් කිරීමට තරම් ලයාන්විත පියකරු මිහිරි කටහඬකි ඇයට ඇත්තේ.

"හැබැයි, එයාගෙ කටහඬ හොඳ හින්ද ම එයා හිතන් ඉන්නේ එයා හැම අතින් ම සර්ව සම්පූර්ණයි කියලයි. වැරැද්ද ඒකයි," කියා පසු ගිය වාරයේ දී ජීන් කිහිප සැරයක් ම කියා ඇත. මෙම (අට වැනි) පංක්තියේ ශිෂ්‍ය නායිකාව ජීන් ය. ඇය සෘජු ලෙස නොවළහා කතා කරන ශිෂ්‍යාවකි. "එයා හිතන්නේ නෑ - එයා තවමත් පාසැල් ශිෂ්‍යාවක් කියලා; පාසැලේ වැඩ කරන්න තියෙනවා කියලා; ඉගෙන ගන්න තියෙනවා කියලා; වගකීමක් තියෙනවා කියලා; සෙල්ලං කරන්න තියෙනවා කියලා. එයා කොච්චර වත් තමංගෙ කටහඬ ගැන ආඩම්බර වෙලයි, ඒ ගැන හිත හිතයි ඉන්නේ. අපි ඒක දන්නවා. ඔය වගේ මෝඩ අදහස් තියෙන කෙනෙකුට ලස්සන කටහඬක් තියෙන එක මොන අපරාධයක් ද!"

වැරල් මාවිස්ට කැමැති නැත. ඉදිරියට එන මාවිස් දෙස බලා සිටි ඇයට අතෘප්තිමත්, අහංකාරපරවශ, සිහින් කළු ඇස්

සහ ලොකු කටක් ඇති මුහුණක් පෙනුණේය. [illegible] දෙසට [illegible] සිනුහී.

"මාවිස්ට තියෙන්නෙ කටහඬයි පුහු ගර්වයයි විතරයි. වෙන මොකවත් නෑ," යයි ඈ ඇලිම්යාට කීවාය. "මං එහෙම කියන එක හරි නෑ. හැබැයි, මං කියන්නෙ ඇත්ත."

"ඔව්," යයි පවසා ඇලිම්යා ද මාවිස් දෙස උනන්දුවෙන් බැලුවාය. "කොහොම වුණත්, ඔය ලස්සන කටහඬ හින්ද එයාට හොඳ අනාගතයක් තියෙයි. ලෝකෙ ම වශී කරන්න වුණත් එයාට බැරි වෙන එකක් නෑ. ඒක ම වැරැද්ද - එයා ඒක දන් ම ම දන්න එකයි."

"ජෙවන්ෆොලින් දන් පෙරෙල්ඩා පස්සෙ වහවැටිලා දගලන එකේ, මාවිස්ගෙ ඇගේ ඇඹිල්ලෙන එක නතර කරයි ද දන්නෙ නෑ," වැරල් කීවාය.

යම් කිසි විශේෂ දක්ෂකමක් හෝ ලස්සනක් හෝ විත්-පොහොසත්කමක් හෝ වැදගත්කමක් හෝ ඇති අය පස්සේ යාම ජෙවන්ෆොලින්ගේ පිළිත ය. පසුගිය වාරයේ ඈ මෝඩ තිවට ලෙස මාවිස් පස්සේ ගියාය. පසු ගිය අවුරුද්දේ ඈ වැන්තිගේ ඇගේ දවටි දවටි සිටියාය. කොතෙකු තම මිතුරිය ලෙස තෝරා ගත යුත්තේ තමාට සැලසෙන අයකු බව [illegible] ගැන්මට තරම් නුවණක් ඇයට නැත. වැරල් ඇලිට කැමති මන්ද කියා හෝ වැන්ති පුංචි මේරි ලූට කැමති මන්ද කියා හෝ කවුරුත් අවංක විශ්වාස කටයුතු ජීන්ට කැමති මන්ද කියා හෝ තේරුම් ගැන්මට ශක්තියක් ඇයට නැත.

"හෝ - මෝඩි!" වැරල් ඇසුවාය. "මං තව ම එයා දන්නෙ නෑ."

මේරි ඇලිම්යාගේ ගම් මිතුරියයි. ඈ ද ඇලිම්යා මෙන් විනෝදකාමී දඟ ශිෂ්‍යාවකි. දෙදෙනාගේ ම තව එක වාරේ පැර ය. එහෙත් මේරි උතුරු [illegible] අයත් නැත. ඇලිම්යාට එය තාප්පයකි. එහෙත් විදුහල්පතිනිය එක ශ්‍රේණි [illegible] මේ දෙදෙනා ම එක ම [illegible] තරම් දුරදර්ශී වූවාය. දෙදෙනා ම කිසිදු වග-කොදමීමට තරම් [illegible] විභාගයක් නැති ව, ඇතුල්වූවෙන් හා විනෝදකාමී ව

විහිළුකාර අන්දමින් කටයුතු කිරීමට පැදී-පැදී සිටින්නක් වූ බැවින් ඒ දෙදෙනා අතර මිත්‍රත්වය ඇයගේ මනාපයට හේතු නොවීය.

"ඉතින් වාගෙ මැද වෙනකන් එන එකක් නෑ," යි ඇලීෂියා දුකින් කීවාය. "එයාට තක්කල් කැස්ස හැදිලා තියෙන්නෙ මේ දෙදි හිතන්න - සති හයක් යනකං එයාට එන්න ලැබෙන්නෙ නෑ. මට ඒකයි ආරංචි වුණේ."

"ඕයාට එයා නැති ව හරි වැඩේ තමා! මට ඉන්න වෙන්නෙත් සැලී නැති ව." චැරල් පැවසුවාය.

"කෙට්ටියි සැලියි එනකං අපි දෙන්නා එකට ඉමු." ඇලීෂියා කීවාය. චැරල් හිස වනා එකඟත්වය ප්‍රකාශ කළාය. ඇලීෂියා හාස්‍යජනක හා විනෝදකාමී වන බැවින්, ඇය ඇසුරු කිරීම චැරල්ට සතුටට හේතු වේ. ඇලීෂියාගේ කට සැර වුව ද, බුද්ධිමත් ලෙස ඇ වචන මෙහෙයවන්නීය. සිනා උපදවන දේ කිරීමෙහි හා බිණීමෙහි ඇ දක්ෂ ය. ඇයගේ මොළය හොඳ නිසා, නොයෙකුත් විකාර වැඩ කළ ද, පන්තියේ ඉහළ ම සිටීමට ඇ සමත් වන්නීය.

"හමුත්, මං එහෙම එයා වගේ නටන්න ගියොත් මං පන්තියේ පල්ලෙහාට ම බහී," යයි චැරල් සිතුවාය. "මගෙ මොළෙත් හොඳ වුණාට මං ඒක පාවිච්චි කරන්න ඕනැ - හැම වෙලේ ම. ඇලීෂියාගේ මොළේ පාවිච්චි කළේ නැතත්, හොඳට වැඩ කරනවා!"

මේරි ලූ ද ආවාය. ඇ දන් ගිය වාරේට වඩා ටිකක් ලොකු මහත් වී සිටින්නීය. එහෙත් තවමත් ඇ පුරුදු පරිදි බියගුලු ගතියක් දක්වයි. "හලෝ - චැරල්, ඔයා කොහෙත් ද සෙරෙල්ඩා හොයා ගත්තේ?" යයි ඇ ඇසුවාය. "මං අහගෙන එයා ඔයාලගෙ කාර් එකේ ආවා කියලා. එයා කොච්චර වයස ද? දහ අටක්?"

"නෑ, දහසයකට කිට්ටුයි." චැරල් කීවාය. "මින්, ග්වෙන්ඩොලින් දනටමත් එයාගෙ ඇගේ එල්ලිලා! එයාට ලැජ්ජාවක් නෑ. සෙරෙල්ඩා දක්ක ම මිස් පොට්ස් මොනවා කියයි කියල ද ඔයා හිතන්නේ?"



කණ්ඩායම් භාර ගුරුවරිය වන පොට්ස් මෙනෙවිය, පාලිකාව මෙන් ම, අනම්-මනම් විකාරවලට කැමති නැත. පාසැලේ බොහෝ ශිෂ්‍යාවෝ ඇයගෙන් ඉගෙනගෙන සිටින්නාහ. ඇය උගන්වන්නේ පහළ පංක්තියට ය. ඔවුහු ඇය ප්‍රිය කරති. ඇයට ගරු කරති. ග්වෙන්ඩොලින් සහ මාවිස් වැනි කිහිප දෙනෙක් පමණක් ඇයට බිය වෙති. පොට්ස් මෙනෙවිය ඔවුන්ගේ පුහු ශෝභනය, ගර්වය හා පුරාජේරුව හෙළා දකින්නේ සම්බච්චලයෙන් යුතුව ය.

විහිළුවෙන්-තහළුවෙන් හා කතා-බහෙන් පසුවීමට සැලී නොමැති ව චැරල්ට පාළුවක් දනිණ. ඇ ඇලීෂියා සමග පහළට බැස්සාය. බෙලින්ඩා උඩට නැග්ගාය.

"කෝ සැලී, චැරල්? මං නිවාඩු දවස්වල හොඳ ස්ට්‍රෝබ්‍රි විකක් ඇන්ද. මං සර්කස් බලන්න ගියා. මං සර්කස් එකේ හුහාක් දේ චිත්‍රයට නැගුවා. පොතක් පිරෙන්න ම ඇන්ද. ඔයා බලන්න එපායැ මං කවටයෝ ඇඳලා තියෙන හැටි!"

"අනේ - අපිට පෙන්නන්නකෝ ඒ පොත අද ම," යයි චැරල් උනන්දු වූවාය.

බෙලින්ඩාගේ චිත්‍ර ගැන කවුරුත් උනන්දුවක් දක්වති. ඇ ඉතා දක්ෂ ලෙස චිත්‍ර අඳින්නියකි. ඇ ඊට සහජ දක්ෂතාවයක් ඇත්තියකි. එහෙත් මාවිස් මෙන් සිය සහජ හැකියාව ගැන ඇය උදම් අනන්නියක් නොවේ. ඇය ඒ ගැන නිතර ම හිතන්නේ හෝ කතාකරන්නේ හෝ නැත; අනාගත සිහින දකින්නේ නැත. ඇ ප්‍රමුඛ වශයෙන් ආදර්ශමත් යහපත් ශිෂ්‍යාවකි. චිත්‍රකර්මය ගැන ඇය සිත යොදවන්නේ දෙවැනුව ය.

"අයිරින් දක්ක ද?" ඇලීෂියා ඇසුවාය. බෙලින්ඩා හිස වැනුවාය. අයිරින් බෙලින්ඩාගේ මිතුරියයි. දෙන්නා ජාඩියට මූඩිය මෙන් පැහෙන බව කවුරුත් දනිති. අයිරින් සංගීතයට හා ගණිතයට දක්ෂ ය. එහෙත් අන් දේ ගැන සිහි කල්පනාවෙන් අඩු ය. බෙලින්ඩා චිත්‍රකර්මයෙහි දක්ෂ ය. ඇය අයිරින් හා සම වන්නේ අමතකවීමේ ලක්ෂණයෙන් ය. මුළු පංක්තිය ම මේ දෙදෙනාගෙන් හොඳ හැටි විනෝදයක් ලබති.

"ඔයා සෙරෙල්ඩා දන්නද?" යි ඩැරල් මඳ සිනාවක් පා ඇසුවාය. එද හවස තායෝන් ප්‍රශ්නය වුයේ එයයි. "සෙරෙල්ඩා දන්න ද?" සෙරෙල්ඩා වැනි කෙල්ලක මීට පෙර කවුරුත් දැක නැත.

එද රාත්‍රී ආහාර වේලාවේ මහත් සේ සද්ද බද්ද ඇති වුයේය. සවුරුත් කුතුහලයෙන් පසු වූහ. මැම්සෙල් දුපොං උතුරු කුලුන භෝජනාගාරයට අයත් අට වැනි පංක්තියේ ළමයින් වාඩි වූ මේසය දෙස ඇස් දල්වා බැලුවාය.

"ඔය ළමයි නිවාඩු කාලය හොඳින් ගත කරන්න ඇති නේ?" ඇ සැමගෙන් විමසා සිටියාය. "ඔය ළමයි නාටා බලන්න යන්න ඇති. සංදර්ශන - සර්කස් එහෙම බලන්න යන්ට ඇති? දන් ඉතින් මහන්සි වෙලා ඉගෙන ගන්න සූදානමෙන් නේ ඉන්නේ? දන් ඉතින් මයෙන් එක්ක හොඳට ප්‍රන්ස පරිවර්තන එහෙම කරන්න පුළුවන්. නෙස්පා (එහෙම නේ)?"

මේසය වටා වූ ළමුන්ගෙන් කෙඳිරිලි හඬක් නැගිණ. "නෑ - මැම්සෙල්! අපි මේ වාරේ ප්‍රෙන්ච් ට්‍රාන්ස්ලේට් නොකර ඉමු. දැපිට ප්‍රන්ස භාෂාව දන් අමතක වෙලා!"

අලුත් මුහුණක් දක්නට ඇත්ද යි මැම්සෙල් මේසය වටා සෝදිසි බැල්මක් හෙළුවාය. ඈ අලුත් ළමයින්ට වැඩියෙන් ආදරයක් දක්වීමට වග බලාගන්නාය. ඈ සෙරෙල්ඩා දක ගැස්සී සිටියාය. එය ඇත්තෙන් ම පුදුම දර්ශනයකි. සෙරෙල්ඩා යළිත් කොණ්ඩා මෝස්තරය දමාගෙන සිටියාය. අඹරන ලද කෙස් රොද හිස් මුදුනේ බැබළිණ. තොල් රතු වී තිබුණි. කම්මුල්වල අමතර රෝස පැහැයකි.

"මේ ළමයා මේ ලැස්ති වෙලා ඉන්නේ චිත්‍රපටියක රඟපාන්න ද?" ඈ තමාට ම කියා ගත්තාය. "ඕ - ලා - ලා - මෙයා මොකද මේ - මෙහෙ ඇවිල්ලා තියෙන්නේ? මෙයා බාලිකාවක් නෙවේ, අවුරුදු විස්සක විතර තරුණියක් නේ! මිස් ග්‍රේලිං මේ ළමිස්සි මොකට මෙහාට ගන්න ද? මෙයා මැලෝරි ටවර්ස් වලට සුදුසු නෑ."

සෙරෙල්ඩා කිසිදු අපහසුවක් නොමැති ව ගෙදර ඉන්නාක්



මෙන් පසු වූවාය. ඇය රාත්‍රී ආහාරය ගත්තේ නිවී සැනසිල්ලේ ය. ඇය වාඩි වී සිටියේ ග්වෙන්ඩොලින් ළඟ ය. ග්වෙන්ඩොලින් ඇය කතාවට පටලවා ගන්න වෙර දරුවා ය. එහෙත් මාවිස් මෙන් උජාරුවට කතා කිරීමට කැමති අයකු නොවේ - සෙරෙල්ඩා. ඈ ආචාර සම්පන්න ලෙස කෙටියෙන් ග්වෙන්ඩොලින්ට පිළිතුරු දුන්නාය.

"ඔයා දිගට ම ජීවත් වුණේ ඇමරිකාවේ ද? ඔයා එංගලන්තෙට කැමති ද?"

"මං කියන්නෙ - එංගලන්තෙ වනර්ෆුල්!" යයි ඈ හය වන වතාවටත් කීවාය. (ලස්සණයි, හොඳයි, පුදුමයි, අගෙයි ආදී තේරුමක් ගෙන දෙන 'වන්ඩර්ෆුල්' යන ඉංග්‍රීසි වචනය සෙරෙල්ඩා උච්චාරණය කරන්නේ 'වනර්ෆුල්' යනුවෙනි.) "ඔයාලගෙ පිටිසර පළාත් හරි 'වනර්ෆුල්'. පරණ ගොඩනැගිලිත් එහෙමයි. මං හිතනවා - ඉංග්‍රීසි මිනිස්සුත් හරි 'වනර්ෆුල්' කියලා."

"සෙරෙල්ඩා හරි වනර්ෆුල් නේ ද?" යි ඇලිෂියා පහත් හඬින් ඩැරල්ට කියා සිටියාය. "වනර්ෆුල්!"

බොහෝ ශිෂ්‍යාවන් දුර බැහැර සිට පැමිණ වෙහෙසට පත් ව සිටියෙන්, පළමු රාත්‍රියෙහි සැමට ම කලින් ම නින්දට යාමට ඔවුන්ට සිදු විය. රාත්‍රි ආහාරය අවසන් වීමට පෙර පවා සමහරු ඇනුම් අරින්නට වූහ.

එද රෑ අටට පමණ නින්දට යාමට ඇති බව ග්වෙන්ඩොලින් පැවසූ කල සෙරෙල්ඩා පුදුමයට පත් වූවාය. "ඒක අදට විතරයි. හෙට ඉඳන් අට වැනි පන්තියේ ඉන්න අපි නිදන්ට යන්නෙ රෑ නවයටයි."

"නවයට?" සෙරෙල්ඩා මවිත වී ඇසුවාය. "අපේ රටේ නම්, අපි නිදගන්න යන්නේ අපට ඕනෑ වෙලාවට. මං නං මච්චර කලින් නිදන්න යන්නෙ නෑ."

"ඇයි - ඔයා කාර් එක ඇතුළෙ සැපට නිද ගත්තෙ! ඒ නිසා ඔයාට දන් මහන්සිත් ඇති නේ!" යයි ඩැරල් ඇගේ හොඳනී කීවාය.

රාත්‍රී ආහාරයෙන් පසු කවුරුත් පොදු කාමරයට ගොස් තම තමන්ට වෙන් වූ ලොකර් (රාක්ක) තෝරා ගත්හ; ඊට පසු කතාවෙන් ද, සිනාවෙන් ද, වාද-විවාදයෙන් ද යුතුව වික වෙලාවක් ගත කළහ. ඉන්පසු ගීත කිහිපයක් ගයන්නට වූහ.

මෙහි දී ඉස්මතු වූයේ මාවිස්ගේ හඬයි. එය ඇත්තෙන් ම අගය කළ යුතු මිහිරි හඬකි. මාවිස් වැනි වයසේ තරමට වත් නොවැඩුණු කෙල්ලකගෙන් එවන් ප්‍රබල තියුණු මිහිරි කටහඬක් නිකුත්වීම ඇත්තෙන් ම පුදුමයකි. ඇයගේ හඬට ඉඩ දී විකින් වික අනික් අය නිහඬ වන්නට පටන් ගත්හ; ඇයට කන් දෙන්නට වූහ. මාවිස් දිගින් දිගට ම ගී ගැයුවාය. ඈ තමාගේ හඬට ම ඇලුම් කළාය.

"වනර්ෆුල්!" යයි ගී හඬ නතර වූ පසු හයියෙන් අත්පුඩි ගසමින් සෙරෙල්ඩා කීවාය. "නි - යමයි!"

මාවිස් සතුටට පත් වූවාය. "මං ඔපෙරා ගායිකාවක් වුණා ම - " යයි ඇය යමක් කියන්නට පටන් ගත් නමුත්, සෙරෙල්ඩාගේ කතාවෙන් එයට බාධා පැමිණියේය.

"ආ - ඔයා ඔපෙරා සිංගර් කෙනෙක් වෙන්න ද යන්නේ? ඒක හොඳයි. මං නං ෆිල්ම්ස්වලට සම්බන්ධ වෙන්නයි අදහස."

"ෆිල්ම්ස්?" ග්වෙන්ඩොලින් ඇස් මහත් කර ඇසුවාය. "ඔයා කියන්නේ - ඔයා චිත්‍රපටි නිළියක් වෙන්න යනවා කියල ද?"

"ඔව්, මං දනටමත් හොඳට රඟපානවා. මං ගෙදෙද්දි නිතර ම වගෙ රඟපානවා. මම අපෙ නාට්‍ය සංගමයටත් බැඳිලා ඉන්නේ. ගිය අවුරුද්දේ - අපෙ ඉස්කෝලේ තිබුණු ෂේක්ස්පියර්ගේ මැක්බත් නාට්‍යයෙත් මං රඟපෑවා - මැක්බත් ආර්යාව විදිහට. ඒක නම් මං කියන්නේ - "

"වනර්ෆුල්!" යයි ඇලිෂියා, අයිරින් සහ බෙලින්ඩා එකට කීහ. සෙරෙල්ඩා පිනාසුණාය.

"මං හිතනවා, මං කතා කරන කොට ඔයාලට වැඩිය ටිකක් වෙනස් කියලා," යයි ඈ නිහතමානී ලෙස කීවාය.

"ඔයාට කොච්චර හොඳට රඟපාන්න පුළුවන් ද' කියලා



පෙන්නන්න මොනවදීන් අවස්ථාවක් පැදෙව්. මේ වාගේදී ම," යි ග්වෙන්ඩොලින් කීවාය. "අපේ පන්තියට කියනවා 'රෝමියෝ - ජුලියට්' රඟපාන්න. ඔයාට පුළුවන් ජුලියට් වෙන්න."

"ඒක තීරණය කරන්න ඕනෙ මිස් හිබර්ට්," යයි මතු වූයේ ඩැෆ්නිගේ හඬ ය. ජුලියට්ගේ භූමිකාව රඟපෑම සඳහා ඩැෆ්නි දහවත් සිහින මවමින් සිටී. "මිස් හිබර්ට් තමා අපේ ඉංග්‍රීසි ටීචර්. රහසකාට - "

"ඇඳුම්වලට යන්ට වෙලාව හරි, ළමයිනේ," යයි පොට්ස් මෙනෙවියගේ හඬ දොර ළඟින් ඇසිණ. "දැන් වෙලාව අටයි! හරි දැන් යං - ඉක්මනට. නැත්නම්, හෙට උදේ ඇහැරෙන්න බැරි වෙයි."

# 4

# සෙරෙල්ඩාගේ පංක්තිය

පසු දින පංක්ති යාම කාටත් විනෝදයක් වූයේය. අට වැනි පංක්තියේ ළමුන් සමග සෙරෙල්ඩා ද එම පංක්ති කාමරයට ගියාය. මෙම කාමරයට එක් පැත්තකින් මැද මිදුල ද අනික් පැත්තෙන් ඈත මුහුදු දර්ශනය ද හොඳින් පෙනේ.

"සෙරෙල්ඩා යන්න ඕනෑ නව වෙනි පන්තියට," යයි ජීන් කීවාය. "එයාට අපෙත් එක්ක ඉන්න ලැබෙන්නෙ නෑ."

"මාත් හිතන්නෙ එහෙමයි. මගෙ වයස වැඩියි නේ," යි සෙරෙල්ඩා කීවාය.

ජීන් ඇය දෙස බලා, "සෙරෙල්ඩා, මං ඔයාට පොඩි අවවාදයක් දෙන්නං. ඔයාගෙ පන්තියේ උගන්වන මිස් විලියම්ස් ඔයාගෙ ඔය හෙයා ස්ටයිල් එකට කැමති වෙන එකක් නෑ. ලිප්ස්ටික් ගාගෙන ඉන්නවට කැමති වෙන එකෙකුත් නෑ. ඔය කොණ්ඩා මෝස්තරේ වෙනස් කරලා, තොල් සායම් පිහලා

දලා යනවා නම් හොඳයි. ඔයා එහෙම නොකළොත්, මිස් විලියම්ස්ගෙන් විතරක් නෙවේ, ඒ පංක්තියේ ළමයින්ගෙනුත් හොඳ රැන් එකක් ලැබෙයි," යයි කීවාය.

"ඔයා කියන දේ ඇයි මං කරන්නේ?" යයි සෙරෙල්ඩා ඇසුවේ අභිමානවත් ලෙස ය. ඇ තමාගේ පෙනුම ගැන මහත් ලොකුවට සිතුවාය. ඒ සම්බන්ධයෙන් මේ පුංචි ඉංග්‍රීසි ළමයින්ගෙන් ගුණ දැනමුතුකම් අසන්නට ලැබීම මදි-පුංචිකමක් ලෙස ඇ සිතුවාය.

"හරි, මං මේ පංක්තියේ ශිෂ්‍ය නායිකාව. ඒ හින්දයි, ඔයාගෙ ම හොඳට මං මේ ටික කීවෙ. මට ඕනෙ ඔයා අමාරුවෙ වැටෙන එකෙන් බේරන්නයි."

"නමුත්, සෙරෙල්ඩගෙ කොණ්ඩෙ ලස්සණයි," යයි ග්වෙන්ඩොලින් කීවේ තමා මෙහි ආ මුල් දිනයේ තම රන්වන් කෙස් කලඹ උරහිස මත කඩා හැලෙන සේ ලිහාගෙන ඉන්නට ඉඩ නොදී, පස්සට කර පීරා දෙකට බෙද ගොතාගෙන සිටීමට සිදුවීම ගැන තමාට ඇති වූ සිත් තැවුල යළිත් ඉස්මතු වීම මත ය.

ග්වෙන්ඩොලින්ගේ උම්බෑ හඬ කවුරුත් ගණන් ගත්තේ නැත.

"හරි, ජීන් ඔයාට බොහොම ස්තූතියි! කොහොම වුණත්, මං කැමති නෑ ඔය පුංචි ඉංග්‍රීසි ගෑණු ළමයි වගේ බලු නගුටක් බැඳගෙන ඉන්න," යයි සෙරෙල්ඩා ගරු-සරු නැති ව කම්මැළි ගතියෙන් කීවාය. "කොහොමත්, මං ඔයාලා වගේ ඉන්න කැමති නෑ. ඔයාලාගේ පෙනුම හරි නෑ. මට හිතෙනවා - ඔයාලව නැව ගස්වලා ගන්න මට ඉඩ ලැබෙනවා නම් කියලා. එතකොට ඔය අයත් ලස්සණට ඉඳීවි."

තමා බෙහෙවින් පියකරු බව දත් ඩැෆ්නිට මෙම කතාව රිසි නොවිය. "ඔයා වගෙ පඹයෙක් විදිහට ඉන්න කවුරුත් කැමති නැහැ! ඔයාට ඔයාගෙ ම රූපෙ පේනවා නම් - තේරෙයි!" යයි ඈ සාවංඥ ලෙස පැවසුවාය.

"මං අද උදේ මගේ මූහුණ කන්නාඩියෙන් බලා ගත්තා," යයි ඊට පිළිතුරු වශයෙන් සෙරෙල්ඩා පැවසුවාය.



"අපේ ඉංග්‍රීසි කියමනක් තියෙනවා, ඔබ රෝමයේ ඉන්න කොට රෝම වැසියෙක් වගෙ ඉන්න ඕනෑ, කියලා." ජීන් සන්සුන් හඬින් කීවාය.

"නමුත්, මං මේ ඉන්නෙ රෝමයේ නෙවේ නේ!"

"නෑ තමා. ඒ වගේ ම, එහෙම නොවුණ එක තමා දුක! තව විනාඩි තුනකින් මිස් විලියම්ස් ඔයාව දක්කම - ඔයාට ම හිතෙයි ඔයා රෝමයේ හිටියා නම් හොඳයි කියලා. දන් ඉතිං, ඒකෙන් කමක් නෑ. දන් ඔයා හොඳ හිතින් එනා පංක්ති කාමරේට යන්නකෝ." ඇලීෂියා පුරුදු පරිදි කෙළින් ම වදින්නට කීවාය. "මිස් විලියම්ස් තව විනාඩි හයෙන් පංක්තියට එයි. අපෙ ටීචර් මිස් පීටර්ස් වුණත් එහෙමයි, දන් එයි. මිස් පීටර්ස් ඔයාව දක්කොත් කලන්තෙ හැදිලා වැටෙයි - බය වෙලා!"

සෙරෙල්ඩා ඇලීෂියා කී දෙය විහිළුවට ගෙන තියවා ගෙන තම පංක්ති කාමරය සොයාගෙන ගියාය. ඇය එහි දොර ළඟට ගිය කල විලියම්ස් මෙනෙවිය ද යුහුසුලු ව සිය පංක්ති කාමරයට ආවාය. දෙදෙනා දොර අසල දී එකට හමු වූහ.

සෙරෙල්ඩා තම පංක්තියේ ශිෂ්‍යාවක බව විලියම්ස් මෙනෙවිය නොසිතුවාය. සෙරෙල්ඩාගේ වැඩිහිටි පෙනුම නිසා ය ඒ. විලියම්ස් මෙනෙවිය වරක් දෙවරක් ඇස් පෙඩි ගසා, ඇය කවුද යි මතක් කරන්නට වුවාය. ඇය සහකාර ගුරුවරියක් ද?

"ආ - ඉන්න - පොඩ්ඩක් - ඔබ - මිස් - මිස් - කවුද - "

"මං සෙරෙල්ඩා!" ගුරුවරිය ශිෂ්‍යාවන්ට "මිස්" කියා කතා කිරීම ගැන පුදුම වී සෙරෙල්ඩා උත්තර දුන්නාය.

"මිස් සෙරෙල්ඩා," යයි විලියම්ස් මෙනෙවිය ඇය ඇමතුවේ තවමත් ඇත්ත තේරුම් ගත නොහැකිව ය. "මාව හම්බු වෙන්ට ද ආවේ, මිස් සෙරෙල්ඩා?"

සෙරෙල්ඩා තවත් විමතියට පත් වූවාය. "නෑ - මේ - එහෙම ම නෙවේ. මට කීවෙ - මේ පන්තියට එන්න කියලයි. මාව තවයේ පන්තියට දනවා කියලයි - මේ - ".

"දෙයියනේ, පන්තියේ ළමයෙක් වෙන්න බෑ!"

"එහෙම තමයි," යයි සෙරෙල්ඩා උත්තර දුන්නේ ගැටලුවක විසඳුම යයි සිතාගෙන ය. "ඇයි මට වැරදුණා ද? මේක තාමත් ප්‍රශ්නය නොවෙයි ද?"

"ආ - මේක තවමත් ප්‍රශ්නය තමා," යයි විලියම්ස් මෙනෙවිය සිනිඳුව දුන්නේ කරුණු අවබෝධ කර ගනිමිනි. "තමුන් ඔය ළමයට ඔය විදිහට පන්තියට එන්න බැ. ඔය මොනවා ද ඔළුව උඩ තියෙන්නේ?"

සෙරෙල්ඩා තවත් විස්මයට පත් වූවාය. තමා වැරදීමකින් තොප්පියක් පැළඳගෙන සිටින්නේ ද? ඇ හිස අත ගා බැලුවාය. එහි තොප්පියක් නොවීය.

"මගේ ඔළුව උඩ මොකුවත් නැ."

"මොකද නැත්තේ? ඔය තියෙන්නේ. මේ මොකද්ද?" කියා විලියම්ස් මෙනෙවිය, චිත්‍රපට නිළියකගේ කොණ්ඩා මෝස්තරයක් අනුකරණයෙන් සෙරෙල්ඩා සිය හිස මත කොණ්ඩය අමුරවා, තරනුවා කටු ගසා රෝලක් සේ තද කර බැඳ තිබූ තැනට අත තබා ඇසුවාය.

"ආ - ඒක - ඒක මගේ කොණ්ඩය," යයි සෙරෙල්ඩා උත්තර දුන්නේ විලියම්ස් මෙනෙවියට මිල්මාද දයි සිතමිනි. "ඒ මගෙ ම කොණ්ඩය, මිස් විලියම්ස්. මම කොණ්ඩෙ ලස්සන හැටිය පස්සට රෝල් කරලා කටු ගහලා තියෙන්නේ."

විලියම්ස් මෙනෙවිය කිසිත් නොදොඩා සෙරෙල්ඩාගේ හිස මුදුනේ රෝල් කරන ලද පිත්තල පාට කොණ්ඩය දෙසත්, ගෙල දක්වා එල්ලී වැටෙන පෙන්ඩල්‍ර? සහිත කොණ්ඩය දෙසත් කිසිත් නොදොඩා බලාගෙන සිටියාය. එමෙන් ම, රතුපාට ගාන ලද තොල් දෙක දෙස ද ඇ විමතියෙන් නෙත් යොමාගෙන සිටියාය. සෙරෙල්ඩාගේ ඒක් වූ ඇස් බැම් ස්වාභාවික ඒවා ද, අලවන ලද කෘත්‍රිම ඒවා ද කියා දැනගැන්මට ඇ පෝදිසිමත් වූවාය.

"හරි - සෙරෙල්ඩා, මට ඔය ළමයා ඔය විදිහට මගෙ පන්තියට භාර ගන්න බැ. ඔය හිස් මුදුනෙ රෝල ගලවලා දාන්න. ඒක පස්සට පීරලා බැඳ ගන්න. ඔය තොල් පිරිසිදු කර



ගන්න. ඒ කරලා විනාඩි පහකින් පංති කාමරේට එන්න," යි විලියම්ස් මෙනෙවිය නීති දැම්මාය.

මෙසේ කියා ඇය දෙර වසාගෙන පංති කාමරයට ඇතුළු වූ පසු සෙරෙල්ඩා ඒ දෙස රවා ගෙන සිටියාය. ඇ හිස මුදුනේ කොණ්ඩා රෝලට තට්ටු කර බැලුවාය. එහි ඇති වරද කුමක් ද? එම කොණ්ඩා මෝස්තරය නිසා තමාගේ පෙනුම තමා වැඩියෙන් ම ආශා කරන ලූසී ලැන්ස්ටන් නමැති නිළියගේ රුවට සම වන්නේ නැද්ද?

සෙරෙල්ඩා රවා ගත් අයුරින් ම කල්පනා කරන්නට වූවාය. "හරි ම ඉස්කෝලයක් තමා මේක? කෙල්ලෝ කොච්චර වත් මේසේ ඉගෙන ගත්තත්, එකියකට වත් තමන්ගේ කොණ්ඩේ හරියට ලස්සනට බැඳ ගන්න බැ. කිසි ම කෙල්ලක් ස්ටයිල් එකට නැ! ස්මාට් නැ! නිකං ගමේ කුමාරියො වගේ වුම්මාගෙන ඉන්න මෝඩියෝ!" ඇ තමාට ම ඇසෙන්නට හඬ නගා කතා කර ගත්තාය.

තමා කොණ්ඩා මෝස්තරය ගලවා නොදම්මොත් විලියම්ස් මෙනෙවිය විදුහල්පතිනියට පැමිණිලි කර සිටිය හැකි ය. ශෙලි මෙනෙවිය ගැනත්, ඇය තමා අමතා කී වචන කිහිපය ගැනත් සෙරෙල්ඩා පැහැදී සිටියාය. ශෙලි මෙනෙවිය කී දේ ඇ මතක් කරන්නට වූවාය. හදවත තුළ අවංක භාවයත් කරුණාවත් වර්ධනය කර ගැන්මටත්, සිහි නුවණින් කටයුතු කිරීමටත්, ගුණ යහපත් කමින් හා විශ්වාසවන්ත භාවයෙන් යුක්ත වීමටත්, ලොවට පිළිගත හැකි ස්ත්‍රියක සේ නිර්මල වීමටත් ඇ කීවාය. එමෙන් ම අනාගතයට ප්‍රයෝජනවත් වන පරිදි තමාට එංගලන්තයෙන් යමක් ඉගෙන ගත හැකි බවත්, එමෙන් ම තමා හොඳ සිහි බුද්ධියෙන් හා අවබෝධයෙන් යුතු ව කටයුතු කරන්නේ නම්, තමාට ද ඉංග්‍රීසි ශිෂ්‍යාවන්ට යමක් ඉගැන්විය හැකි බවත් විදුහල්පතිනිය කීවාය.

ඒ බව මතකයට නංවා ගත් සෙරෙල්ඩා, "මං ප්‍රින්සිපල්ව හරස් කර ගන්න හොඳ නැ," යි තමාට ම කියාගෙන නේවාසිකාගාරයට ගියාය. "කෝ මේ - අපි නිදන ඩෝමිටරිය? මට ඒක හොයා ගන්නත් බැ!"

කෙසේ හෝ ශයනාගාරය සොයා ගත් ඈ එහි ගොස් කන්නාඩිය දෙස බලාගෙන කොණ්ඩා මෝස්තරය ගලවා දැම්මාය. ඇය එය කළේ දඩි හිත් අමාරුවෙන් යුතුව ය. බොහෝ වේලා ගත කර උදේ සකස් කර ගත් ලස්සණ කොණ්ඩය මෙසේ මොහොතකින් ගලවා දැමීමට සිදු වීම ඇත්තෙන් ම දුකකි. ඈ කොණ්ඩය පස්සට පීරා, දෙකට බෙදා, උරහිස පුරා වැක්කෙරෙන්නේ නැති වන සේ රිබන් පටි දෙකකින් බැඳ ගත්තාය.

එක් වර ම ඇයගේ පෙනුම ළා බාල විය. ඈ තොල් සායම් ද ඉවත් කළාය. ඉන්පසු ඈ කන්නාඩිය දෙස බලාගෙන, "සෙරෙල්ඩා, දන් ඔබ නිකම් ම වාම්, ඔපයක් නැති කෙල්ලක්!" යයි තමාට ම කියා ගත්තාය. "තාත්තා එහෙම මාව දක්කොත්, අඳුරා ගන්න එකක් නෑ!"

එහෙත්, ඇත්තෙන් ම, සෙරෙල්ඩාගේ පෙනුම පෙරට වඩා පියකරු වූයේය. ඈ ප්‍රසන්න ගතියෙන් හෙබි ළා බාල කෙල්ලක් වූවාය. ඇයගේ මුහුණට ස්වාභාවික සුන්දරත්වයක් මතු වී ආයේය. ඈ හෙමින් හෙමින් සිය පංක්ති කාමරය කරා ආවාය. එහි දෙරට තට්ටු කළ යුතු ද නැද්ද යන්න පවා ඇයට කල්පනා කර බැලීමට සිදු විය. ඉංග්‍රීසි පාසැලක ක්‍රියා කලාපය ඇමරිකානු පාසැලකට වඩා කොතරම් වෙනස් ද! ඈ දෙරට තට්ටු කිරීමට තීරණය කළාය.

"ඇතුළට එන්න!" යයි විලියම්ස් මෙනෙවිය හඬ නැඟුවාය. ඇය මේ වන විට සෙරෙල්ඩා ගැන අමතක කර සිටි බැවින්, දෙරට තට්ටු කරන හඬ ඇයට බාධාවක් සේ දනිණ. සෙරෙල්ඩා ඇතුල් වූවාය. ඇය කොතරම් වෙනස් වී සිටියා ද යත්, විලියම්ස් මෙනෙවියට ඇය අඳුරා ගැන්මට හැකි නොවීය.

"මොනව ද මේ ළමයට ඕනේ?" ඈ සෙරෙල්ඩාගෙන් විමසා සිටියාය. "පණිවුඩයක් ඇරන් ද ආවේ?"

"නෑ!" සෙරෙල්ඩාට මෙය ප්‍රහේලිකාවක් විය. "මම මේ - නව වෙනි පන්තියේ! නැද්ද?"

"නමාගේ නම මොකද්ද?" කියා ඇසූ විලියම්ස් මෙනෙවිය නම් ලැයිස්තුව අතට ගෙන බලන්නට වූවාය.



විලියම්ස් මෙනෙවියට පිස්සු බව සෙරෙල්ඩාට දන් හොඳට ම විශ්වාස ය. "මං කලින් කීවේ - මං සෙරෙල්ඩා!"

"ආ - හේ - මේ සෙරෙල්ඩා ද?" ඇය දෙස පුදුමයෙන් යුතු ව බැලූ විලියම්ස් මෙනෙවිය පැවසුවාය. "කොණ්ඩෙ හින්ද මෙච්චර වෙනසක් ඇති වෙයි කියලා කවුද හිතුවේ! ඇවිල්ලා වාඩි වෙන්න! අර තියෙන්නේ ඔය ළමයගෙ පුටුව."

පංක්තියේ ළමයි ව්‍යාකුලත්වයටත්, විනෝදයටත් පත් වූහ. මෙම පන්තියේ වූයේ මහන්සි වී ඉගෙන ගන්නා පහළොස් වැනි වියේ පසු වන ශිෂ්‍යාවන් ය. මේ අවුරුද්දේ ඔවුන්ට පෙනී සිටීමට ඇති විභාගය ඉතා වැදගත් ය.

"හෝ - බලන්න, ඔය ළමයගෙ වයස කීය ද සෙරෙල්ඩා?" ගුරුවරිය ලැයිස්තුව පරීක්ෂා කරමින් ඇසුවාය.

"දහසයට කිට්ටුයි."

"ආ - එහෙනං, ඔය ළමයට මේ පන්තියේ වැඩ ලේසි වෙයි. අනිත් අතට, සෙරෙල්ඩා එංගලන්තෙ ඉස්කෝලෙකට ආවෙ මේ ඉස්සරෝම හන්ද, හුඟක් අලුත් දේවල් තියෙයි - ඉගෙන ගන්න."

සෙරෙල්ඩා පංක්තිය පීරා බැලුවාය. ඔවුන් මහන්සි වී උනන්දුවෙන් උගෙන ගන්නා හැටි ඇයගේ මවිතයට හේතු වූයේය. තමාටත් වැරල්, ඇලීෂියා හා බෙලින්ඩා ආදි අව වන පංක්තියේ ළමයින් සමග ඉගෙන ගන්නට ඇත්නම් යයි ඈ සිතුවාය. ඔවුන් සිටින්නේ කොතරම් සැහැල්ලුවෙන් හා විනෝදයෙන් ද!

වැරල් ඉගෙන ගන්නා අව වන පංක්තිය මේ මුල් දිනයේ පළමුවෙන් ම යෙදී සිටියේ කාල සටහන් සැදීමෙහි හා එක් එක් වැඩ පිළිබඳ ලැයිස්තුව සකස් කිරීමෙහි ය. ළමයින් අතර පොත් බෙදා දීම ද සිදු විය. පංක්තිය භාර ගුරුතුමිය වූ පීටර්ස් මෙනෙවිය පිරිමියකු වැන්න. ඈ උස ය. ඇයගේ කටහඬ ගොරෝසු ය. ඇයගේ කොණ්ඩය කොටට කපා ඇත. බාලිකාවෝ ඈ ප්‍රිය කළහ. කෙසේ වුව ද, ඇය තමන්ට පිරිමි ළමයින්ට මෙන් සලකන්නේ නැත් නම් හොඳ යයි සමහරවිට ඔවුහු සිතූහ. විවෘත හදවතක් ඇති ඈ විවෘත ලෙස සිනාසීමට පුරුදු ව සිටියාය. නිවාඩු කාලයේ ඇය නිතර ම මෙන් යෙදී සිටියේ

අසුන් පිට යාමෙහි ය. මැලෝරි ටවර්ස්හි දී සෙනසුරාදා උදේ වරුවේ අසුන් පිට යාම පුහුණු කිරීම ඇය භාරයෙහි විය.

"මං හිතන්නේ - සොරෙල්ඩා ගවුම් අඳින්න කැමති නැතුවා ඇති. එයා අශ්වයෝ පිට යන්න අඳින බම්බු කකුල් තියෙන දිග කලිසම් ඇඳගෙන පන්තියට ආවෙ නැත්නම් ඇති!" යි ඇලීෂියා අට වැනි පංතියේ ළමුන් පිනා ගස්සමින් සිහිප වරක් කියා ඇත.

"මිස් පීටර්ස්, අලුත් ළමයා - විල්හෙල්මිනා රොබින්සන් එන්නෙ කවද්ද? මං එයාටත් පොත් පෙට්ටි එකක් තියන්න ද?" පංතියේ ප්‍රධාන ශිෂ්‍යාව වූ ජීන් ඇසුවාය.

"අද උදේ එයි - මං හිතන හැටියට," යි පීටර්ස් මෙනෙවිය පැවසුවාය. "එයයි එයාගෙ සහෝදරයො රෑවුවයි මොන මොනවා හරි අසනීපෙකට ගෙදෙට්ට ම වෙලා ඉන්නවා ඇති! මිස් ග්‍රේලිං කමා කීවෙ - එයා අද උදේ එනවා කියලා. මං හිතන්නේ කාර් එකෙන් එයි!"

විවේකයෙන් පසු අටේ පංතියේ බාලිකාවෝ පැය භාගයක් සඳහා මැහුම් කාමරයට වී සිටියහ. විල්හෙල්මිනා රොබින්සන්ගෙ ආශ්චර්යමත් සම්ප්‍රාප්තිය ඔවුන් දුටුවේ එහි සිට ය.

ඔවුන්ට පළමුවෙන් ම අසුන්ගේ කුර ගැටෙන හඬ ඇසුණේය. එය අසුන් සමූහයකගේ කුර හඬක් වූයේය. ඇලීෂියා වහා ම ජනේලය ළඟට ගියාය. ඇය සිතුවේ අසුන් පිට යාමේ පුහුණුවක් පැවතෙන බව ය.

"ආ - තේ, අර බලන්න! කවුද අර එන්නේ?" යි ඇ විමතියට පත් ව කෑගැසුවාය.

පංතියේ සියල්ලෝ ජනෙල් ළඟ රොක් වූහ. තැන්පත්, කරුණාවන්ත මැහුම් ගුරුවරිය වූ ඩොනලි මෙනෙවිය ඔවුන්ට එතරම් තදින් විරුද්ධ නොවූවාය. "ළමයිනේ, ඔය මොනව ද කරන්නේ?"

"මිස් ඩොනලි, ඇවිල්ලා බලන්නකෝ!" යයි ඇලීෂියා කී කල ඈ ද කවුළුව අසලට ගියාය. ඈ දුටුවේ කළු අසකු පිට නැග ගත් දැරියක දුටුවාය. ඇය සමග එක් එක් අසු පිට නැග



ගත් පිරිමි ළමෝ හත් දෙනෙක් වූහ. ඔවුහු අවුරුදු අටේ සිට දහ අට දක්වා වයස්වල සිටියෝ වූහ. ඔවුහු අසුන්ට කස් සරමින්, සිනාසෙමින් හා හඬ නගමින් පාසැල් භූමියේ ඉදිරියට ආහ.

"දෙයියනේ, ඒ විල්හෙල්මිනා වාගේ!" බැරල් කීවාය. "එයා එක්ක එන්නෙ එයාගෙ සහෝදරයෝ හත් දෙනා. ඒ අයත් මැලෝරි ටවර්ස්වල ඉගෙන ගන්න එනව ද දන්නෑ!"

"හරි විදිහට තේ ඉස්කෝලෙට එන්නේ!" යයි ඡෙරොන්කොලින් කීවාය. "ඔය විදිහට අශ්වයෝ පිට නැගලා එනකං! විල්හෙල්මිනා පවුලේ අය හරි පුදුම කට්ටියක් නේ!"

# 5

## විල්හෙල්මිනාගේ සම්ප්‍රාප්තිය

අවාසනාවට මෙන්, ඒ වෙලාවේ ම ඊළඟ පංතිය සඳහා සීනුව නාද වූයේය. එහෙයින් මෙම අශ්වාරෝහකයන්ට පිළිගැනීම සිදු වූයේ කෙසේ දැයි බලා ගැනීමට මෙම පංතියේ ශිෂ්‍යාවන්ට වරම් නොලැබුණි. ග්‍රේලිං මෙනෙවිය අශ්වාරෝහකයන් වෙත පැමිණියේ ද? විල්හෙල්මිනා පාසැලට කෙසේ ගොඩ වෙයි ද? ඇය සළු පෙළ හරහා ගාලාවට අසු මෙහෙයවන අන්දම බැරල් හිනින් බලා ගත්තාය.

"බලන්න, ඉස්කෝලෙට අශ්වයා පිටින් එන හැටි," යයි ඇලීෂියා පැවසුවාය. "එයා අශ්වයා මෙහෙ තියා ගනියි, මං හිතන්නේ. දැනටමත් දෙන්නෙක් එහෙම කරනවා නේ. සහෝදරයෝ හත් දෙනත් එක්ක තල් ඇණියක් වගේ එන්න - අනේ මේ ළමයෙක්!"

විල්හෙල්මිනා කෙබඳු කෙල්ලක දැයි කිසිවකුට හෝ මැහුම් කාමරයේ සිට පැහැදිලි ව බලා ගත හැකි නොවීය. අසුන් පිට ආ සියල්ලන් ම කකුල් තද දිග කලිසම් වලින් හෙවත්

අශ්වාරෝහක ඇඳුමින් සැරසී සිටි හෙයින්, ඇය කොල්ලන් හත් දෙනාගෙන් වෙන් කර අඳුරා ගැන්ම කාටත් අපහසු වූයේය. නවක ශිෂ්‍යාවගේ සම්ප්‍රාප්තිය ගැන කුතුහලයෙන් යුතු ව කතා කරමින් බාලිකාවෝ ආපසු සිය පංක්ති කාමරයට ගියහ. විල්හෙල්මිනා ද පන්තියේ වැදගත් තැනක් ගනු ඇත!

"මට නං එයා ගැන බය හිතෙනවා," යයි අහිංසක මේරි ලූ කිවාය.

"මෝඩ වෙන්න එපා," යයි මාවිස් පැවසුවාය. ඇ සැම විට ම මේරි ලූ සමච්චලයට ලක් කරන්නීය. "ඔයා මොකට ද එයාට බය වෙන්නෙ? ඔය කොල්ලො වගේ ඉන්න දඟකාර කෙල්ලො මට පෙන්නන්න බෑ. මං දන්නවා එයත් ගැනු-කොල්ලෙක්! එයා - බලන්න - අශ්වයොයි බල්ලොයි ගැන මිසක් වෙන මොනවත් ගැන හිතන එකක් නෑ. එයා ළඟ ඒ සත්තුන්ගෙ ගඳත් ඇති! ඔය සත්තුන් ගැන පිස්සුවෙන් මැරෙන්න හදන අය ළඟ එහෙම තමා."

"මිස් පීටර්ස් ළඟ එහෙම ගඳක් නෑ," යි ඩැරල් කිවාය.

"ආ - මිස් පීටර්ස් ද! මං ආශාවෙන් ඉන්නෙ - එයාගෙ පන්තියෙන් අයින් වෙන්න ලැබෙන්නෙ කවද්ද කියලා. එයා හරි තදයි - හැම දේට ම."

ඩැරල් හඬ නගා සිනාසුණාය. පීටර්ස් මෙනෙවිය සාමාන්‍යයෙන් හයියෙන් කතා කරන එඩිතර කාන්තාවකි. එහෙත් ඇ හොඳ හිත ඇත්තියකි. මාවිස් වැනි අයට ඇයගෙන් අනුකම්පාවක් නොලැබෙන බව සැබව. ඇය ඇලීෂියාගේ සහ බෙට්ටීගේ දඟකාර හා ප්‍රයෝගකාර විකාර වැඩවලට ද කැමති නැත. එනිසා පසු ගිය වාරයේ දී පංක්තිය සිනස්සන අන්දමේ කවරකු හෝ අමාරුවේ දමන ප්‍රයෝගවල යෙදීමට ඒ දෙන්නාට අවකාශයක් ලැබුණේ නැත.

එද උදේ විල්හෙල්මිනා පන්ති ආවේ නැත. එහෙත් දහවල් කෑමට සිසුවියන් එද්දී අභ්‍යන්තර මාර්ගයේ පාලිකාව තමා එන තුරු බලා සිටිනු ජීන් දුටුවාය. පාලිකාව සමග වූයේ පාසැල් නිල ඇඳුමෙන් සැරසුණු පිරිමි ළමයකු වැනි අයෙකි.



"ජීන්, ඔය ළමයා නේ අටේ පන්තියේ ශිෂ්‍ය නායිකාව? එහෙනං මේ විල්හෙල්මිනා ගැන බලන්න. මෙයා දවල් කෑමට එක්ක යන්න. මෙයාට ඊයෙ එන්න බැරි වෙලා - අසනීපෙන් පස්සෙ ගෙදර ඉන්න ඕනෑ දවස් ගණන සම්පූර්ණ නැති හන්ද. විල්හෙල්මිනා - මේ - ජීන්, ඔය ළමයගෙ පන්තියේ ශිෂ්‍ය නායිකාව." පාලිකාව කිවාය.

"හලෝ," යයි එක හැඩයට පිහිටි සුදු දත් පෙළ දක්වා, මුවට සිනාවක් නංවා, විල්හෙල්මිනා ජීන්ට කතා කළාය. ජීන් එක් වර ම ඇය ගැන පැහැදුණාය.

විල්හෙල්මිනා කොණ්ඩය කපා සිටියේ කොල්ලකුගේ මෙන් කොටට ය. එම කොණ්ඩයේ පොඩි රැලි ගතියක් ද තිබුණේය. ඇයගේ මුහුණ හතරැස් ය. එය ද කොල්ලකුගේ මෙනි. නාහසය දිග ය, වකුටු ය. කට ලොකු ය. ඇස් දුඹුරු පාට ය. මුහුණේ තැන තැන ලප ය.

"හලෝ, මං දැක්කා ඔයා අශ්වයෙක් පිට නැඟලා එනවා." ජීන් පැවසුවාය.

"ඔව්, මගේ සහෝදරයො හත් දෙනත් මයෙ එක්ක ආවා. අම්මා ඒකට කොහෙත් ම කැමති වුණේ නැහැ. අම්මට ඕනෑ වුණේ ඩැඩී එක්ක මෙහෙ එන්න, කාර් එකේ මාව දාගෙන. අපි ඊට ඉස්සර වෙලා අපෙ අශ්වයන්ගෙ පිට උඩ නැඟලා ආවා."

"ආ - නේ, ඇත්තට! ඔය පවුලේ හැමෝට ම අශ්වයා ගානේ ඉන්නවා ද?"

"ඔව්, අපට ලොකු අශ්ව ඉස්තාල තියෙනවා. තාත්තා රේස් අශ්වයොත් ඇති කරනවා. මෙහෙම බෝඩිං ඉස්කෝලෙකට මං කවදවත් ගිහිං නෑ. කොහොම ද මෙහෙ? මගෙ හිතට ඇල්ලුවෙ නැත්තං, මං මගෙ තන්ඩර්ගෙ පිට උඩට පැනලා යන්ට යනවා."

ජීන් ඇය දෙස බැලුවේ ඇය කියන දේ ඇත්තට ම අදහස් කරනවා දයි සැකයෙනි. ඇය සිනාසී තම අතේ තීන්ත සෝද ගැන්මට නාන කාමරයට ගියේ විල්හෙල්මිනා ද කැටුව ය.

"මැලෝරි ටවර්ස් හරි හොඳ ඉස්කෝලයක්. ඔයා මෙහාට කැමති වෙයි."

"මට දුව ලැබෙයි ද නැමද ම මගේ අශ්වයා - තන්වර් මිට නැගලා ටවුමක් ගහන්න?" යයි විල්හෙල්මිනා ඇසුවේ ලොකු නාන කාමරයේ අනෙක් කෙළවරේ සිනා හඬ නංවමින් අත් සෝදා ගන්නා දෙස බලා ය. "මං ඔයාට කියන්නේ, මට තන්වර් අරන් එන්න ඉඩ නොදුන්නා නං, මං මෙහෙ එන්නෙ නැහැ. මගෙ පාඩම් කිහිපයක් මිස් වුණත්, මම ඌ බලාගන්න ඕනැ. ඌ කැමැති නැහැ - වෙන කවුරුවත් ඌ බලාගන්නවාට."

"ඔයා මීට ඉස්සර ඉස්කෝලේ ගිහිල්ලා නැද්ද?" යි මෙම කතා-බහට ඇහුම්කන් දීගෙන සිටි බෙලින්ඩා ඇසුවාය.

"නැ, මගෙ සහෝදරයන් තුන් දෙනෙකුට උගන්නන්න ආව ගුරුවරයගෙන් මාත් ඉගෙන ගත්තා. අපේ ගෙවල් තිබ්බුව ඉස්කෝලයක් නැ. අපි ටවුමෙන් හුඟක් ඈතයි ඉන්නේ. මං හිතනවා - මං පන්තියේ අන්තිමයා වෙලා ඉඳීවි - මෙහෙ."

ඇය මෙසේ නිහතමානී ලෙස කතා කිරීම ගැන බෙලින්ඩා පැහැදුණාය. "නැ - ඔයා එහෙම වෙන එකක් නැ," කියා ඇය වටපිට බැලුවේ ග්වෙන්ඩොලින් අසලක ඇත්ද යි දනගැනීම සඳහා ය. ඈ ළඟ ම සිටියාය. "ග්වෙන්ඩොලින් ඉන්නකං ඔයාට පන්තියේ අන්තිමයා වෙන්න ලැබෙන එකක් නැහැ!"

"මේ, ඔය වගේ නැත කතා කියන්නෙපා," යයි ග්වෙන්ඩොලින් තම අලුත් ළමයකු ඉදිරියේ සමච්චලයට ලක් වීම ගැන උරණ ව පැවසුවාය.

"මුල දී ඔයාට මෙහෙ ලොකු අමුත්තක් දනෙයි," යයි ජීන් කීවාය. "සාමාන්‍යයෙන් ගෙදර ඉඳන් යන ඉස්කෝලෙකට හරි ඔයා ගිහිල්ලා තිබුණා නම් එච්චර වෙනසක් දනෙන එකක් නැහැ. කොහොත් ම ඉස්කෝලේ ගිහිං නැති හන්ද ඔයාට මේ බෝඩිං ඉස්කෝලෙ මුල දී නුහුරු වෙන්න පුළුවන්, විල්හෙල්මිනා."

"මං ඔයාට බඩුවක් කියන්න, ඔයා තරහා වෙන්නෙ නැ නේ?" විල්හෙල්මිනා ජීන් දෙස වුවමනාවෙන් බලා ඇසුවාය.

"ඒ මොකක් ද?" ජීන් මහත් උනන්දුවෙන් ඇසූ කල එයට ලැබෙන පිළිතුර අසා ගන්න අනිත් ළමෝ ළං වූහ. විල්හෙල්මිනා ඔවුන් දෙස ද වුවමනාවෙන් බැලුවාය.



"මගෙ මුළු ජීවිතේට ම කවුරුවත් විල්හෙල්මිනා කියන නමින් මට කතා කරනවා මං අහලා නැ. ඒක හරි පැරැ නමක්. කවුරුත් මට කියන්නේ බිල් කියලා. මය විලියම් බිල් කියලා සමහරුන්ට කෙටි නම් තියෙන්නේ? ආන්න - ඒ වගෙ මගෙ සහෝදරයෝ මට දපු නම තමා බිල්. ඔය කට්ටිය මට විල්හෙල්මිනා කිව්වොත් මට ලොකු අපහසුවක් දනෙයි."

"තමාට කියනු ලබන විකට නාමය කෙනෙක් ලෙහෙසියෙන් හෙළි නොකරයි. විකට නම් යොදනු ලබන්නේ හුරු පුරුදු අයට ය. එහෙත් විල්හෙල්මිනා තම ආරූඪ නාමය මුල් හමුවේ දී ම මෙහි බාලිකාවන්ට හෙළි කිරීමට තරම් නිහතමානී වූවාය. මේ ගැන සිය අදහස ප්‍රකාශ කිරීමට ග්වෙන්ඩොලින් කට ඇරිය නමුත්, ඊට පෙර බෙලින්ඩා කතා කළාය.

"හොඳයි, අපි ඔයාට බිල් කියලා කියන්නම්. ඔයාට විල්හෙල්මිනා කියන නම ගැළපෙන්නෙ නැ තමා. ඔයා නම් බිල් කෙනෙක් ම තමා. ඩැරල්, ජීන්, මොකද කියන්නේ?"

"ඔව්," ඔවුහු එක් වර එකඟ වූහ. මෙම තැඩි දඩි පෙනුමෙන් යුතු, අවංක, චාම් ගති පැවතුම් ඇති නවක ශිෂ්‍යාව කාගේත් සිත් ගත්තාය. බිල් යන නම ඇයට අගේට ගැළපේ. ඇත්තෙන් ම අන් කිසි නමක් එතරම් හොඳින් ඇයට නොගැළපේ.

"එහෙනං, බොහොම ස්තුතියි! හුඟාක් ම ස්තුතියි! මට දන් පුළුවන් මාව බඳුකිස්ම කාල් විල්හෙල්මිනා කියන නමෙන් කියලා අමතන කරන්න."

මාවිස් සහ ග්වෙන්ඩොලින් බලාගෙන සිටියේ ඔවුන් මෙය අනුමත නොකරන විලාශයෙනි. මේ අලුත් ළමයකුට, ඇයට අවශ්‍ය නිසා ම, පුරතල් විකට නමක් පටබැඳිය යුත්තේ මන්ද? ඩැරල් ද එය අනුමත නොකරන බවක් මුහුණෙන් දක්වා සිටියාය. ගැහැනු ළමයකු පිරිමි නමක් හිමි කර ගන්නේ කෙසේ ද? පිරිමි ළමයකු සේ පෙනුමක් දරා සිටින්නේ කෙසේ ද?

සෙරෙල්ඩා ද නාන කාමරයට ආවාය. දන් ඇයගේ හිස මුදුනේ රෝල් කරන ලද මෝස්තරය නැත. ජීන් ඇය දෙස විමතියෙන් යුතු ව බැලුවාය.

"දෙයියනේ, සෙරෙල්ඩා! ඔයාට මේ මොකද වෙලා තියෙන්නෙ? අවුරුදු දහයකින් බාල වෙලා වාගේ! මං හිතනවා, මිස් විලියම්ස්ට ඔයා හිටිය හැටි දකලා වියරු වැටෙන්ට ඇති! නැද්ද?"

"එයා කොහොමත් වියරුවෙන් තමා හිටියෙ. ඇත්තෙන් ම පිස්සුවෙන්! මට හොඳට ම බය හිතුණා. මං කැමතියි ඔයාලගෙ විවර් - මිස් පීටර්ස්ට."

ඇ බිල් දෙස පුදුමයෙන් බලා සිටියාය. බිල් කිසිදු චකිතයකින් තොර ව සෙරෙල්ඩා වෙත පිළිතුරු බැල්මක් හෙලා සිටියාය. දෙදෙනා ඔවුනොවුන්ගේ හිස සිට දෙපතුල දක්වා පරීක්ෂා කළහ.

"ඔයා පිරිමි ළමයෙක් ද? ගෑනු ළමයෙක් ද? මට හිතන්න බෑ!"

"මගේ නම බිල්. විල්හෙල්මිනා නියම නම. නමුත් මං පාවිච්චි කරන්නෙ බිල් කියන නම. ඔයාගෙ නම මොකද්ද?"

"සෙරෙල්ඩා. මට කොට නමක් නැහැ. ඔයා ඇයි කොණ්ඩෙ ඔය විදිහට කියාන ඉන්නේ?"

"ඔයාගෙ විදිහට කියාගන්න බැරි හින්ද." බිල් කීවාය.

සෙරෙල්ඩා යළිත් බිල් දෙස විමසිලිමත් බැල්මක් හෙලා සිටියේ අදහා ගත නොහැකි සේ ය.

"මං ඔයා වගේ ගෑනු ළමයෙක් කවදවත් දකලා නෑ. ඔයා නං වනර්ෆුල්! එංගලන්තෙ අය නම් හරි ම වනර්ෆුල්!"

"ඔහොම කියන කොට හැමෝ ම හිතයි ඔයාගෙ අම්මා ඉංග්‍රීසි නෙවෙයි කියලා," යයි ඩැරල් අදහස් දක්වූවාය. "ඔයා අම්මත් එක්ක දිගට ම ජීවත් වුණා නේ? නමුත් ඔයා හැසිරෙන්නෙ ජීවිතේට ම ඉංග්‍රීසි ජාතිකයෙක් නොදක්කා වගේ."

"මගේ අම්මා හැදිලා තියෙන්නේ ඇමරිකන් විදිහට. මට තේරෙන්නෙ නෑ - අම්මට හිතුණේ මොකද කියලා මාව එංගලන්තෙට එවන්න. මට හිතෙනවා, බිල්, ඔයාව ඇමරිකාවට ගෙනියන්න. එහෙ අයට ඔයාව දක්කම පුදුම හිතෙයි. ඔයා නම් - "



"වනර්ෆුල්!" යයි බාලිකාවෝ එක් වර හඬ නැංවූහ. සෙරෙල්ඩා සිනාසුණාය.

සීනුව නාද විය. "කෑම ලෑස්තියි!" බෙලින්ඩා කෑගැසුවාය. "මට නං බඩගිනියි. උදේ කෑම හරි ම සවුත්තුයි."

"ඔව්, හරි සවුත්තුයි!" යයි කවුරුත් කීහ. එහෙත් සියල්ලෝ ම උදේ ආහාරය සඳහා තලප, කිරි, පාන්, බිත්තර සහ මාමලේඩ් ඉතිරි නොකර අනුභව කළහ. ආහාර කොතරම් හොඳ වුවත්, "හරි සවුත්තුයි" කීමට ඔවුහු පුරුදු වී සිටියහ. එහෙත් පිටස්තරයකු ඉදිරියේ ඔවුන් පවසන්නේ "නියමයි" කියා ය.

බාලිකාවෝ භෝජන ශාලාවට ගියහ. සෙරෙල්ඩා අට වැනි පංක්තියේ ළමුන් සමග වාඩි වූයේ නව වන පන්තියේ දී ඇයට දක්නම් පැමට නොහැකි වූ නිසා හවගත් ලැජ්ජාව නිසා ය. විලියම්ස් මෙනෙවිය ඇයට කතා කළාය.

"සෙරෙල්ඩා, ඔය ළමයා වාඩි වෙන්ට ඕනෙ මේ මේසෙට. කෝ බලන්ට - කොණ්ඩේ!"

සෙරෙල්ඩා විලියම්ස් මෙනෙවියට තම මුහුණ පරීක්ෂා කිරීමට ඉඩ දුන්නාය. ඇය වාසනාවට මෙන් කොණ්ඩා මෝස්තරය දමා හෝ තොල් සායම් අතුල්ලා හෝ සිටියේ නැත. විලියම්ස් මෙනෙවිය තමා අවුරුදු හයේ ළමයකු මෙන් සැලකීම ගැන ඇයට තරහා ගියේය. එහෙත් උණු උණුවේ මේසයට ආ මස් හා එළවළු බඳුන් දුටු කල ඇයගේ හිත පිනා ගියේය. මෙම ඉංග්‍රීසි ආහාරවලට ඇය ඉතා කැමති ය. ඒවා "වනර්ෆුල්" නොවේ. ඉතා හොඳ දේවලට මැලෝරි ටවර්ස් ළමයි කියන්නේ "විසාර්ඩ්" කියා ය.

ඩැරල් එද රෑ පැලිට ලියුමක් ලීවාය. එහි ඇ බිල් හා සෙරෙල්ඩා ගැන ද විස්තර සඳහන් කළාය.

"බිල් නම් නියමයි. එයාගෙ නියම නම විල්හෙල්මිනා. එයා පිරිමි ළමයෙක් වාගෙ කොණ්ඩෙ හොඳට ම කොටට කපලා තියෙන්නේ. මුහුණත් පිරිමි ළමයෙකුගෙ වාගෙයි. එය ඉස්කෝලෙට ආවෙ අශ්වයා පිටින්. එයාට සහෝදරයො හත් දෙනෙක් ඉන්නවා.

එයා හිතට එන දේ සැඟවෙන්නෙ නැතුව කියනවා. අපි හැමදෙනාගේ එයාට කැමතියි."

"ඒ වුණාට අනේ, සෙරෙල්ඩා හරියට හිතට ගන්නෑ, උඹලෑ එයා හිතාමතේ විහිළුවට තිළියක් වෙන්නයි. එයාට සොයාගත්ත පුළුවන් ය. එයාට හිතට අල්ලන මිනෑ, ම දේකට එයා කියන්නේ වහාම්පුළ් කියලයි. එයා ලොකු කොන්සට් පෝස්ටරයක් දාගනයි මෙහෙ ආවේ. ඒ වුණාට පන්තියෙ හැරියන්නෙ ඒක ගලවලා දම්මට පස්සෙයි. සෙරෙල්ඩා ලිප්ස්ටික් ගාගෙන ආවා. එවත් එයාව පිහලා දන්න වුණා - පන්තියේ ටිවර් මිස් විලියම්ස් විරුද්ධ වුණු හන්ද. එයාගෙ වැඩ හන්ද අපි හරි විනෝදයක් ලබනවා. හමුත් එයා අපෙ පන්තියේ නෙවේ. එයාගෙ වයස දහයට කිට්ටු හන්ද එයා තවයෙ පන්තියේ ඉන්නේ. අද උදේ සෙරෙල්ඩා ඉස්සරෝම පන්තිකාමරයට ගියා ම මිස් විලියම්ස්ට කලන්තෙ හැදෙන්න ඇති, එයාගෙ ස්ටයිල් දැකලා. සැලී, ඔයා පුළුවන් තරම් ඉක්මනින් එන්න. මෙච්චර කල් ම පාසැල් ආවෙ නෑ. දැනට ඔය දෙන්න ම නැති හන්ද ඇලිම්යයි මායි කිට්ටු වෙලා ඉන්නවා. හමුත් ඔයා නැති පාඩුව එයින් මට මහහැරෙන්නෙ නෑ. ඔයාගෙන් වගේ ඇලිම්යාගෙන් මට ධෛර්යයක් ලැබෙන්නේ නෑ. එයා දක්ෂ කට්කාරකම් වලටයි, දඟ වැඩ වලටයි නේ. මං ඔයා බලාපොරොත්තුවෙන් ඉන්නවා."

සඳුදෝ දොරෙන් ඇතුලට ඔළුව දම්මාය. "මේ, විල්හෙල්මිනා ඉන්නවා ද? මෙයුත් විල්හෙල්මිනාට කතා කරනවා, විල්හෙල්මිනා!"

කිසිවෙක් එයට ප්‍රතිචාර නොදක්වූහ. "විල්හෙල්මිනා!" යළිත් එම හඬ නැගිණි. "මේ ඔය අලුතෙන් ආව එක්කෙනා විල්හෙල්මිනා නේ ද?"

බිල් කියවමින් සිටි පොත පසෙක තබා, "ආ - ඔව්, ඒ මං තමා! මට අමතක වුණා, මං මෙයුන්ට කියන්ට ඕනෑ මට බිල් කියලා කියන්න කියලා," යයි කීවාය.

ඈ කාමරයෙන් පිට වූවාය. කාටත් සිනා ගියේය. "අනේ -



බිල්! එයා මෙයුංට කතා කරලා, එයාට බිල් කියලා කතා කරන්න කීවා ම, මෙයුන්ගෙ මූහුණ වෙනස් වෙන හැටි බලන්න මට හරි ආසයි," යයි මෙලින්ඩා කීවාය.

# 6

## බිල් සහ තන්ඩර්

ගත වූයේ දින කිහිපයක් වුව ද, වැරල්ට දැනුණේ සති පාසැලට අවුත් සති ගණනක් ගෙවී ගොස් ඇති සේ ය. ගෙදර ලෝකයට බොහෝ දුර ය. ඇයට පෙලිසිටි මතක් වූ කල දුක සිතුණි. පෙලිසිටි ගෙදර සිට පාසැල් යන්නීය. නේවාසිකාගාර ජීවිතය ගැන ඈ කිසිත් නොදන්නීය. මෙහි දී කවුරුත් එකට අවදි වෙති; එකට ආහාර ගනිති; සවස එකට සෙල්ලම් කරති; විනෝද වෙති; රාත්‍රී එකට ඇඳන්වලට යති.

විල්හෙල්මිනා හෙවත් බිල් මුල් දින කිහිපයේ පසු වූයේ සැහෙන නිස්සබ්දතාවයකින් යුතුව ය. වැරල් සිතුවේ ඇය ගෙදර මතක් වී කනගාටුවෙන් පසු වන බව ය. මැලෝරි ටවර්ස් හි ජීවිතය විනෝද ජනක ය; කම්මැළිකමෙන් තොර ය. සාමාන්‍යයෙන් මෙහි කවුරුත් පසු වන්නේ සතුටින් ය. කනස්සල්ලට හා ශෝකයට කාලයක් මෙහි ඉතිරි වන්නේ නැත.

කෙසේ වුව ද, බිල් මනස්තාපයෙන් පසු වන බවක් වැරල්ට පෙනී ගියෙන්, "ඔයාට ගෙදර මතක් වෙලා දුක හිතෙනවා ද?" යි ඈ බිල් සමග කොරිඩෝරයක් දිගේ ගමන් කරමින් සිටිය දී ඇසුවාය.

"අනේ නෑ - මං දුක් වෙන්නේ අශ්වයෝ ගැන හිතලා," යයි ඇයගේ පිළිතුර විය. "අපේ ගෙදර ඉන්න අශ්වයෝ මස්සගෙටෝම මං හරි ආදරෙයි. මං කොච්චරවත් උන් ගැන හිත හිතයි මේ ඉන්නේ. මට මතක් වෙනවා අපෙ බියුටි, ජිවාර්,

බිලැකී, වෙල්වට්, එතකොට - මිචිනයිට්, මලට්, ලේඩිබර්ඩ් - එතකොට මේ - "

"දෙයියනේ, ඔයාට කොහොම ද ඔච්චර නම් මතක තියෙන්නේ?"

"මට කොහොමත් ඒවා අමතක කරන්න බෑ" යි බිල් තැන්පත් ශාන්ත ගතියෙන් යුතු ව පැවසුවාය. "මම මැලෝරි ටවර්ස්වලට ආසයි. මං ඒක දන්නවා. නමුත්, මට අපේ අශ්වයෝ ලේසියෙන් අමතක කරන්න බෑ. උන්ගේ කුර හඬ, උන්ගේ සද්දය මට ඇහෙන්නා ඇහෙන්නා වාගේ. උන් ළඟට ගියා ම උන් ආදරේට හොම්බ අතුල්ලන හැටි අපේ ඇඟේ, මට දැනෙනවා දැනෙනවා වාගේ. ඔයාට මේවා තේරෙන්නේ නැතුවා ඇති, ඩැරල්. මං මෝඩයි කියලා ඔයාට හිතෙයි. මං ඒක දන්නවා. මං මගේ සහෝදරයෝ තුන් දෙනෙක් එක්ක හැමදා ම උදේ අපේ අශ්වයෝ පිට නැගලා අපේ ගුරුවරයගෙ ගෙදෙට්ට යනවා - හැතැප්ම හතරක් එතකොට අපි අශ්වයෝ පිට නැගලා එහෙ - මෙහෙ කඳු පල්ලම්, තැනිතලා ආදියේ කොච්චර සංචාරයේ යෙදෙනවා ද!"

"ඒ වුණාට, ජීවිතේ පුරා ම එහෙම ම කර කර ඉන්න බෑ නේ." ඩැරල් උපදේශාත්මක වුවාය. "කොහොම වුණත්, නිවාඩු කාලේ ඔයාට පුළුවන් නේ ආයෙත් ඒ විදිහට ඉන්න. අනික, ඔයාට තන්ඩර් මෙහෙ ගේන්න ලැබුණු එක කොච්චර වාසනාවක් ද!"

"ආන්න, ඒක හන්ද තමයි මං මැලෝරි ටවර්ස් එන්න කැමති වුණේ. මට තන්ඩර් මෙහෙ ගේන්න ඉඩ දුන්නෙ නැත්නං, මං මෙහෙ එන්නෙ නෑ. ඩැරල්, දන් මේ පති අන්නෙ හින්ද හොඳයි. දන් පන්ති යන්න නෑ නේ. එතකොට, ආයෙත් ලබන සුමානෙ පන්තිවලට යන්ට වුණා ම, මුළු දවසෙ ම තන්ඩර් බලන්ට යන්ට නොලැබුණාම. - මොනවා වෙයි ද! මිස් පීටර්ස් ඉඩ දෙන්නෙ නෑ නේ - මට මගෙ තන්ඩර් පන්ති කාමරේ පිටි පස්සෙන් බැඳලා තියන්න. ඌ හොඳට ඉදියි!"

ඩැරල් හින් තියුණු හඬින් සිනාසුණාය. "ඕ - බිල්, ඔයාට



පිස්සු! මාත් කැමතියි තන්ඩර් අපෙ පන්ති කාමරේ ඉන්නවා නම්! එතකොට ඌ මැම්සෙල්ට බෝරිහත් දෙයි. එතකොට මැම්සෙල් කියයි ඌට - ප්‍රන්ස භාෂාවෙන් බෝරිහත් දෙන්න කියලා!"

"එයා එහෙම කරන එකක් නෑ. එයා අශ්වයන්ට කැමති නෑ. ඒ බව එයා මට කිව්වා. එයා අශ්වයන්ට හරි බයයි. බලන්ට අනේ! මං නං හිතන්නෙ නෑ - අශ්වයන්ට බය වෙන තරම් මෝඩයෝ ලෝකෙ ඉන්නවා කියලා."

අට වැනි පන්තියේ ළමයින් අතුරින් බොහෝ දෙනෙක් බිල්ගේ තන්ඩර් බැලීම සඳහා ගියහ. අශ්වයන් ගැන එ තරම් යමක් නොදන සිටි ඩැරල්ට මෙම සතාගේ වැඩි අරුමයක් දක්නට ලැබුණේ නැත. ඌ ආදරයෙන් බිල් පිළිගත්තේ මන්දහේෂාවකිනි. සතුටින් මෙසේ නාහයෙන් පිම්බ ඌ සිය වෙල්වට් මෙන් සිනිඳු නාහය ඇයගේ අතේ නැම්මට යොමු කර සිය ආදරය ඇයට නොමඳ ව පුද කෙළේය.

මාවිස්, ග්වෙන්ඩොලින්, ඩැෆ්නි සහ මේරි ලූ ඌ ළඟට ගියේ නැත. තන්ඩර් දවැන්ත කළු අශ්වයෙකි. ඌ එක්කෝ පයින් ගසනු ඇතැයි ද, නැත්නම් හපනු ඇතැයි ද මවුහු බිය වූහ. අනික් අය ආදරයෙන් උගේ ඇඟ පිරිමදින්නට වූහ.

සෙරෙල්ඩා ඌට කිසිදු බියක් නොදක්වූවාය. ඇය ඌට දක්වූයේ ආදරයකි. "ගී - මූ නම් හරි වනර්ෆුල්!" යයි ඇ කීවාය. "ඒ වුණාට මුගේ පිට උඩ නැගලා යන්න මය බම්බු කලිසම්වලට බහින්න සිදු වෙන එකයි දුක! නැද්ද විල්හෙල්මිනා?"

බිල් මුහුණ පැහිරි කර ඇය දෙස බැලුවාය. තමාගේ සම්පූර්ණ නමින් හඳුන්වනු ලැබීමට ඇය කැමති නැත. "මං හිතනවා - ඔයා ආසා ඇති ලොකු කඩා හැලෙන සායක් තියෙන ගවුමක් ඇඳගෙන, කොණ්ඩේ කඩාගෙන, ඇඟිලිවල මුදු දාගෙන, කකුල්වල මිණිගෙඩි එල්ලාගෙන, බැන්බෙරි ක්‍රොස් දක්වා අශ්වයා පිට යන්න තියෙනවා නම්!" කියා බිල් ඇයට තිසි පිළිතුරු දුන්නාය.

සෙරෙල්ඩාට මෙම විස්තරයෙන් කියවුණු පැරණි ඉංග්‍රීසි ළමා

තතාව තේරුණේ නැත. ඈ පුරුදු කම්මැලි සිනාවෙන් බිල සංග්‍රහ කළාය.

"ඔයා ඔහොම රවන කොට හරි ම වන්ඩර්ෆුල්!" යයි ඈ කීවාය.

"නට වහගන්න!" කියා බිල් පැත්තකට හැරුණාය. පෙරෙල්ඩාගේ සමච්චල් ආකල්පය හා මෛත්‍රී ගතිය ඇයගේ සිත් ගත්තේ නැත. පෙරෙල්ඩා, අනික් අතට, අන් අය තමාට කොපමණ සමච්චල් කළත්, සිනාසුණත්, පල් එක දම්මක් ලෙහෙසියෙන් තරහා ගන්නා අයෙක් නොවේ. මාවිස්ට තම සුළු දේකට පවා හිත අමාරු වේ.

ඇය මෙසේ හැසිරීමෙන් අන් අය තුළ ඇති කරන්නේ බාල මෝඩ නොමේරූ හැඟීමක් ය. එයින් අන් අය අපහසු තත්ත්වයකට පත් වෙති. ඈ හිතා-මතා ම අන් අයට වඩා තමා මේරූ බවක් ප්‍රදර්ශණය කරයි. අන් අයගේ ඇඳුම් හා කොණ්ඩා මෙන් ම ඔවුන් කැමති ක්‍රීඩා ද හිත් අයුරින් සමච්චලයට ලක් කරන ඈ චිත්‍රපට නිළියන් ගැන උනන්දුවක් නොදක්වීම ද කෙනකුගේ දුර්වලකමක් ලෙස සලකයි.

කෝපයට පත් නොවන ඈ නිර්ලෝභී කරුණාවන්ත අයෙකි. ඒ නිසා ඇය කොන් කර සිටීම ද පහසු කාර්යයක් නොවේ. ග්වෙන්ඩොලින්, ඇත්තෙන් ම, ඇය තදින් ම ප්‍රිය කළාය. මේ අලුත් යෙහෙළිය නිසා ඈ මාවිස් අමතක කළාය. තමා ගැන ලොකුවට සිතාගෙන සිටින අනාගත ඔපෙරා ගායිකාව වූ මාවිස් මෙයින් කෝපයට පත් වූවාය.

සඳුදයින් ආරම්භ වූයේ පළමු සම්පූර්ණ පාසැල් සතියයි. ගුරුවරියන්ගෙන් සැහැල්ලුකමක් දැන් බලාපොරොත්තු විය නොහැකි ය. වැඩ අතපසු කිරීමට බාලිකාවන්ට දැන් අවකාශයක් නැත. "දැන් වැඩ කරන්න! කවුරුත් මහන්සි වෙලා වැඩ කරන්න ඕනෑ!" යයි පීටර්ස් මෙනෙවිය කීවාය. "මේක එච්චර දිග වාරයක් නෙවේ. ඒ වුණාට, කවුරුත් හොඳට මහන්සියෙන් වැඩ කරලා හොඳ ප්‍රතිඵල පෙන්නන්න ඕනෑ - වෙන වාරවලට වැඩිය සතියක් දෙකක් අඩු වුණාට."



අට වැනි පංක්තියට අයත් වූයේ උතුරු කුලුන නේවාසිකාගාරයේ ළමුන් පමණක් නොවේ. අනිත් කුලුනු තුනේ නේවාසිකාගාරවල පදිංචි ළමුන්ගෙන් ද අට වැනි පංක්තියට අයත් වූවෝ සිටියහ. ඒ නිසා මෙම පංක්තිය සෑහෙන්න විශාල ය. මෙහි ඉගෙනීමේ මට්ටම ඉහළ ය. පීටර්ස් මෙනෙවිය ශිෂ්‍යාවන්ට තදින් සිටී.

ඉගෙනීමට දුර්වල මාවිස් ගිය වාරයේ පීටර්ස් මෙනෙවියගේ සිත් ගත්තේ නැත. එහෙත් එය පළමු වාරය වූ බැවින් ඈ මාවිස්ට ඒ තරම් සැර නොවූවාය. එහෙත් දැන් පංක්තියේ ශිෂ්‍යාවන් මෙන් ඈ ද මාවිස්ගේ "මං ඔපෙරා ගායිකාවක් වුණාම - " යන ගිරා හඬ අසා හෙම්බත් ව සිටින්නීය. මාවිස් ඔපෙරා ගායිකාවක් වුණත් නැතත් පංක්තියේ වැඩ හරියට කළ යුතු බවට දැඩි ස්ථාවරයක සිටීමට පීටර්ස් මෙනෙවිය ඉටා ගත්තාය.

"මාවිස්, ඔයා පරෙස්සම් වෙන්න ඕනෑ," යයි ග්වෙන්ඩොලින් ඇයට අවවාදාත්මක ව පැවසුවේ උදේ පීටර්ස් මෙනෙවිය මාවිස් දෙස බලාගෙන සිටි ආකාරයෙන් ඇයගේ සිත තේරුම් ගෙන ය. "මට ඒ බැල්ම හොඳට තේරෙනවා. ඔයා කටහඬ ටිකත් අමතක කරලා දාලා, පාඩම් ගැන දැන් හිත යොදුවොත් හොඳයි!"

"මට ඔයාගෙ උපදෙස් ඕනෑ වුණා ම මං ඔයාට කියන්නම්," යයි මාවිස්ගේ පිළිතුර විය. "මං ඔය මිස් පීටර්ස්ගෙ සැරට බය වෙන්නෙ නෑ - ඔයා බය වුණාට. මිස් පීටර්ස්ට හරි වෙන කාට හරි ගැති වෙලා මගේ මැලෝරි ටවර්ස් ජීවිතය කාලකණ්ණි කර ගන්ට මං යන්නෙ නෑ. ඔයාට ඕන නම් එයා කියන හැටියට ඔයාගෙ කාලේ නාස්ති කරලා, අනාගතේ තමන්ට තියෙන තැන නැති කරගන්න!"

ග්වෙන්ඩොලින්ට බෙහෙවින් හිත් අමාරු විය. වෙනත් බොහෝ මෝඩ දුර්වල අය මෙන් ඈ තමා ගැන ඕනෑවට වඩා ලොකුවට හිතාගෙන සිටියාය. ගෙදර දී ඕනෑවට වඩා සුරතල් කරනු ලැබීම නිසා ද ඈ තමා ගැන ඕනෑවට වැඩියෙන් සිතන්නට පුරුදු වූවාය.

"ඔයා ඔය විදිහට කතා කරනවා නම්, මට ඔයා එක්ක මිත්‍රකම් පවත්වන්න බෑ," යයි ඇ කොඳුරා සිටියාය.

"එහෙනං, ගිහිල්ලා - සෙරෙල්ඩාගෙ පස්සෙ එල්ලෙන්න," යයි මාවිස් උත්තර දුන්නේ හින් සැරේ කතා කරන්නට අමතකවය.

"මාවිස්, ග්වෙන්ඩොලින් එක්ක කසු - කුසු ගෑවා ඔය හොඳට ම ඇති," යි පීටර්ස් මෙනෙවිය හඬ දුන්නාය. "තව සැරයක් කොඳුරනවා ඇහුණොත්, විවේක කාලෙත් පන්තිය ඇතුළේ ඉන්න වෙයි."

මෙම සඳු දිනයේ ද පංක්තියේ වැඩ ගැන හිත යොමු කර සිටීමට බිල්ට පුළුවන් නොවීය. ඈ ජනේලයෙන් එළිය බලා ගත් වන ම සිටියාය. ඇයගේ හිත ඈතට දුව ගොස් තිබුණි. පීටර්ස් මෙනෙවිය ඉගැන්වූ කිසිවකට ඇය ඇහුම්කන් දුන්නේ නැත.

"විල්හෙල්මිනා!" පීටර්ස් මෙනෙවිය ගුගුළා සිටියාය. "මම ඔය ළමයටයි කතා කරන්නේ."

බිල් තවමත් තමාගේ ලෝකයේ ය. ඇයට කිසිත් නැසුණේය. කාමරයේ අන් කිසිවකු නොමැති ව තමා පමණක් තනියෙන් සිටින්නා සේ සිතා, බිළිඳකු කරවි කරන්නා මෙන් ඇය සිහින් මිහිරි හඬක් නැගුවේ පංක්තියේ කවුරුත් කුල්මත් කරමිනි.

පීටර්ස් මෙනෙවිය මහත් පුදුමයට පත් වූවාය. බාලිකාවෝ කෙකර සිනා හඬ නැංවූහ. ඩැරල් බිල් සිටි ස්වභාවය තේරුම් ගත්තාය. මෙම සුරතල් හඬ බිල්ගෙන් නිකුත් වනු මීට පෙර ඩැරල් අසා ඇත. තන්ඩර් අසු බිල්ගේ උරහිස මත සිය නහසය පිරිමදින විට ය, බිල් එයින් කුල්මත් වී මෙම කිති කැවෙන හඬ නංවන්නේ!

"දන් එයා සිහින දකින්නේ තන්ඩර් එක්ක ඉන්නවා කියලයි." ඩැරල් කල්පනා කළාය. "එයා දන් ඉන්නෙ අපි එක්ක පන්තියේ නෙවේ, තන්ඩර් එක්ක ඉස්තාලේ!"

"විල්හෙල්මිනා! ඔය ළමයට මොකද වෙලා තියෙන්නේ? කන් ඇහෙන්නේ නැද්ද?" යි ගුරුවරිය යළිත් වරක් බිල්ට කතා



කළේ ඇය ඇත්තෙන් ම යම් අසනීපයකින් පෙළෙන්නේ දැයි බියට පත්ව ය. එහෙත් එය ද බිල්ට ඇසුණේ නැත.

ග්වෙන්ඩොලින් බිල්ගේ පිටට ඇඟිල්ලෙන් ඇන්නාය. බිල් උඩ ගියාය! ඇය ග්වෙන්ඩොලින් දෙස රවා බැලුවේ සොඳුරු දවල් සිහිනයකට බාධා කරමින් තමා බිය ගන්වා අවදි කිරීම සම්බන්ධයෙන් ඇය කෙරෙහි ඇති කර ගත් කෝපයෙන් යුතුව ය. ග්වෙන්ඩොලින් හිස ගස්සා ඇයට පීටර්ස් මෙනෙවිය දක්වා සිටියාය.

"ඒ ඇති, ග්වෙන්ඩොලින්," යයි ගුරුවරිය ඇයගේ ක්‍රියාව අනුමත කළාය. "විල්හෙල්මිනා, කරුණාකර මට ඇහුම්කන් දෙනවා ද? මං දන් සෑහෙන වෙලාවක් ඔය ළමයට කතා කළා."

"ඇත්තට ම? එහෙනං, මට කනගාටුයි!" යයි බිල් කීවාය. "එහෙත මිස් මට විල්හෙල්මිනා කියලා කතා කරා ද දන්නෙ නෑ. මට බිල් කියලා කතා කරනවා නම්, මට උත්තර දෙන්න කල්පනා වෙනවා."

ඇය කී දේ අනුමත නොකරන විලාශයෙන් පීටර්ස් මෙනෙවිය විස්මිප්ත ව බලාගෙන සිටියාය. කොතරම් අවශේෂ ළමයෙක් ද මේ!

"ඉදිරියේ දී මං කියන හැම දේට ම හොඳින් ඇහුම්කන් දෙන්න ඕනෑ - විල්හෙල්මිනා. මං ඔය ළමයට මොන නමකින් වත් කතා කරන්න ඕනෑ වෙන්නෙ නෑ. ඔය ළමයා ගරු-සරු නැති විදිහට මගෙන් ඉල්ලා හිටින්න හොඳ නෑ - තමංට බිල් කියලා කතා කරන්න කියලා."

බිල් මවිත වී බලා සිටියාය. "ඔ, මිස් පීටර්ස්, මං එහෙම ගරු-සරු නැති වුණේ නෑ. මට කනගාටුයි මං ඇහුම්කන් නොදුන්නට. මම තන්ඩර් ගැන හිත හිතයි හිටියේ!"

"තන්ඩර්?" පීටර්ස් මෙනෙවිය පුදුම වී ඇසුවාය. "තන්ඩර්" යන නම තබා, බිල් අසතු මෙහි ගෙනවිත් ඇති අව හෝ ඇය දන සිටියේ නැත. "මේ වගේ හොඳට ඉර පායලා තියෙන

දවසක ඔය ළමයා මොකද තන්ඩර් ගැන හිතන්නේ? මට හිතෙන්නේ, ඔය ළමයා හරි මෝඩයි කියලයි!"

"අද වගේ පායන දවසක නමා මං තන්ඩර් ගැන හිතන්න ඕනේ, මිස්!" යයි බිල් පැවසුයේ ආශාවෙන් නෙත් දල්වාගෙන ය. "හිසං හිතලා බලන්න - තන්ඩර් පැන පැන යන හැටි - කළු හෙල් තරහා - "

කවුරුත් සිනා හඬ පාලනය කර ගැන්මට තැත් කළහ. විල්හෙල්මිනා කතා කරන්නේ තම අසු (තන්ඩර්) ගැන මිස, ගුරුවරිය අදහස් කළ තන්ඩර් (අකුණු) ගැන නොවන බව කවුරුත් දත්හ. පීටර්ස් මෙනෙවියට දැනුණේ විල්හෙල්මිනා කිසිදු ගරු-සරුවක් නැති ව තමාට කතා කරන බවක් ය.

"ඔය ඇති, විල්හෙල්මිනා! ඔය හෙණ ගැනයි, ලයිට්නිං (විදුලි කෙටීම) ගැනයි ආයෙ කතා කරන්න ඕනෙ නෑ!" ඈ තරහා ගොස් කීවාය.

"ඕ, මිස් කොහොම ද දැනගත්තේ මගෙ ජෝර්ජ් අයියගෙ අශ්වයාගෙ නම 'ලයිට්නිං' කියලා?" යයි බිල් සතුටින් පුදුම ඇසුවේ, ගුරුවරිය කතා කරන්නේ අශ්වයන් ගැන යයි සද්භාවයෙන් සිතා ය.

විල්හෙල්මිනා ගරුසරු නැතිවාක් මෙන් ම මෝඩියක ද බව පීටර්ස් මෙනෙවිය තිර වශයෙන් සිතුවා ය. ඈ ශිෂ්‍යාව දෙස නපුරු බැල්මක් හෙළුවාය.

"ඔය ළමයා පොත පෙරලාගෙන ද ඉන්නේ - තිස් තුන් වැනි පිටුවට? මං හිතන්නේ නෑ! විල්හෙල්මිනා, ඔය ළමයා මේ පාඩම ඉගෙන ගන්නේ කොහොම ද - හරියට පිටුව වත් පෙරලා ගන්නේ නැතුව?"

බිල් ඉක්මනින් තිස් තුන් වැනි පිටුව පෙරලා ගත්තාය. ඈ තන්ඩර් අමතක කරන්නට උත්සාහ කළාය. එම අදිටන නිසා "ටක්!" යන හඬක් ඇයගේ මුවින් පිට විය. ඇලිෂියා සහ අයිරීන් ඔවුනොවුනට නියවා ගත්තාහ.

"අශ්ව වලිප්පුව!" යයි කොඳුරා සිටි ඇලිෂියා, පීටර්ස්



මෙනෙවිය කළු ලෑල්ල දෙස හැරුණු විට, සෙල්ලම් අශ්වයකු පදින අයුරින් පුටුවේ ඉස්සරහටත් පස්සටත් වැනෙන්නට වූවාය. මෙය මුළු පංක්තියට ම විනෝදය ගෙන දෙන්නක් වූයේය.

ඩැරල් සතුටින් ඉපිල ගියාය. ආපසු පාසැල් ජීවිතය ආරම්භ කිරීම කොතරම් විනෝද ජනක ද! පංක්තියේ වාඩි වී ඉගෙන ගන්නා ගමන්, මෙසේ විනෝදයක් ලැබීම හා පීටර්ස් මෙනෙවිය එක එක ශිෂ්‍යාවන් අල්ලාගෙන වැරදි සොයන හැටි බලා සිටීම කොතරම් සුන්දර අත්දැකීමක් ද! සැලී නැම්බිණ නොසිටීම ගැන ඇයගේ හිතට දුක ය. එහෙත් ඇලිෂියා නිසා පාළුවක් නැත.

"ඇලිෂියාට කියන්න ඕනෑ, එයාගෙ ට්‍රික් එකක් දන්න කියලා," යි ඩැරල් සිතුවාය. "හුඟාක් කාලෙකින් ඒ වගේ විනෝදයක් ලබන්න හම්බු වුණේ නෑ!"

# 7

## අටේ පන්තියේ පොදු කාමරයේ

මේම වාරයේ මුල් සතිය හා දෙවැනි සතිය පැහැබර වුව ද, අධික ශීතලෙන් යුක්ත වූයේය. පොදු කාමරයේ උණුසුම ගෙන දෙන උපකරණය ළඟ ආසන අල්ලා ගැන්ම සඳහා බාලිකාවෝ පොරකෑහ. ශීතල දරා ගැන්මට අපොහොසත් වුවත් අතර උඩින් ම සිටියේ ග්වෙන්ඩොලින්, මාවිස් සහ ඩැෆ්නි ය. ව්‍යායාමයන් හි යෙදීමට කම්මැලි වූයේ ද ඔවුන් ය. එනිසා නිතර ශීතවිසප්පු සහ සෙම්ප්‍රතිශ්‍යාව වැළඳුණේ ද ඔවුන්ට ය.

බිල්ට කොහෙත් ම ශීතල ප්‍රශ්නයක් නොවිය. වර්ෂයේ මුල වුව ද, ඇයගේ හම අව් රශ්මියට දුඹුරු පාට ගැහී තිබුණේය. ඩැරල් සහ ඇලිෂියා ශීතලට කැමති ය. සවස් වරුවේ ලැක්රොස් ක්‍රීඩාවේ යෙදීමට ඔවුන් පිට්ටනියට ගියේ මහත් ආශාවෙන් ය.

පන්දු ඇල්ලීම පුරුදුවීම සඳහා ඔවුහු අනික් අයට වඩා විනාඩි දහයකට කලින් පිට්ටනියට ගියහ. ග්වෙන්ඩොලින්ට මෙය තේරුම් ගත හැක්කක් නොවිය. ශීතල දරා ගැනීමේ පොදු අපහසුතාවය මත ඈ සහ මාවිස් යළිත් මිත්‍රත්වයක් ඇති කර ගත්හ. ඔවුහු දෙදෙනා එකතු වී ඩැරල් සහ ඇලිෂියා සරදමට ලක් කළහ.

තව වැනි පන්තියට අයත් වීම නිසා, අට වැනි වසරේ ශිෂ්‍යාවන් හා ගැවසීමට සෙරෙල්ඩාට වැඩි අවකාශයක් ලැබුණේ නැත. එනිසා ඇයගේ හොඳ ම මිතුරිය වීමට තමා තුළ තිබුණු ආශාව අත්හැරීමට ග්වෙන්ඩොලින්ට සිදු වූයේය. සෙරෙල්ඩාට තව වැනි පංක්තිය එපා වී ඇති බව ඩැරල්ට තේරුම් ගියේය. සෙරෙල්ඩා ඉඩ ලැබුණු සෑම අවස්ථාවක ම අට වැනි පංක්තියේ පොදු කාමරයට රිංගා ගෙන ඩැරල්ගේ සහ අන් අයගේ ඇසුර ලැබීමට අමතක නොකළාය. පොතක් හෝ ග්‍රැමෆෝන් තැටියක් හෝ ඉල්ලා ගන්නා බවක් අඟවමින් ඈ නිතොර එම පොදු කාමරයට ආවාය.

"තව ම විශේෂ මිතුරියක් හම්බු වුණේ නැද්ද?" යි එක් සවසක ඩැරල් ඇයගෙන් විමසුවාය.

සෙරෙල්ඩා සිය කොණ්ඩයේ එල්ලෙන වකුටු කෙස් රොදක් ඇඟිල්ලක පටලවාගෙන යළි එය තුබු පරිදි ප්‍රවේශමෙන් තැන්පත් කළාය. "නෑ, තවයේ පන්තිය මට අල්ලන්නේ නෑ. ඒකෙ ඉගෙන ගන්න අය හිතන්නෙ මං දක්ෂ මදි කියලයි. මං ලැක්රෝස් ක්‍රීඩාවට උනන්දුවක් දක්වන්නෙ නෑ කියලා පන්තියේ අය මැරෙන්ට හදනවා - හරියට ලෝකේ අවසානය අත ළඟයි කියලා හිතාන වගේ."

"ඔයා උස හන්ද, ඔයාට ලැක්රෝස් ටීම් එකේ හොඳ තැනක් තියෙයි නේ. ඔයාට ලෙහෙසියෙන් ම බෝල අල්ලන්න පුළුවන් වෙයි නේ? ඔයාට දුවන්නත් පුළුවන් නේ?"

"දුවන්න? මට දුවන්න ඕනෙ නෑ," යි පුදුමයට පත් වූ සෙරෙල්ඩා කීවාය. "කවුද අර ක්‍රීඩා නායිකාව? ආ - මේ - මොලී රොනල්ඩ්සන් නේ? මං අහන්නේ ඔයා එහෙම ගෑනු



ළමයෙක් දකලා තියෙනව ද? එයා අශ්වයෙක් වාගෙ ලොකු වුණාට, දක්ෂ නෑ කියලයි මට පේන්නේ. කෑගහලා පිට්ටනිය පුරා ම තටනවා - හරියට පිස්සු හැදුණා වගේ."

ඩැරල් සිනාසුණාය. "මොලී රොනල්ඩ්සන් කියන්නේ අපට මෙච්චර කල් හිටිය ක්‍රීඩා නායිකාවන් අතුරින් හොඳ ම අයගෙන් කෙනෙක්. අපි කවදාවත් නැති තරම් මැච් දිනුවා, එයා නායක තනතුරට පත් වුණාට පස්සේ. ටීම් එකට හොඳ ම අය තෝරලා ගන්න එයාට තියෙන්නෙ පුදුම හපන්කමක්. මට එක ටීම් එකෙකට හරි රිංගාගන්න පුළුවන් නම්, ඒ සන්තෝසෙට මට නින්ද යන්නෙ නැති වෙයි."

"එහෙම - ද?" සෙරෙල්ඩා පුදුමයෙන් ඇද-හැද ඇසුවාය. "ග්වෙන්ඩොලින් මුහුණේ ලප හද ගන්න ආසයි. මට එහෙම ලපයක් හැදුණොත්, එදට මට නින්ද යන්නෙ නැති වෙයි. මගෙ නියපොත්තක් කැඩුණොත්, එදට මට නින්ද යන්නෙ නැති වෙයි. නමුත් මේ ලෝකෙ තියෙන මොන ම ක්‍රීඩාවකට හරි සම්බන්ධ වෙන්න ලැබුණා කියලා මගෙ වටිනා නින්දට බාධාවක් ඇති වෙන්නෙ නෑ!"

"ඔයා අමුතු විදිහේ කෙල්ලක්, සෙරෙල්ඩා!" යයි ඇය වෙත විමසිලිමත් බැල්මක් හෙළා ඩැරල් කීවාය. "ඔයාගෙ හොඳ ම කාලෙ ඔයා නිකං නාස්ති කර ගන්නවා. මං කියන්නේ - ඔයාගෙ වයසෙ ඉංග්‍රීසි කෙල්ලෝ ලබන විනෝද ඔයා ලබන්නේ නෑ. ඔයා ඔයාගෙ කොණ්ඩෙ ගැනයි, මුහුණ ගැනයි, නියපොතු ගැනයි හැම ගණන් කාලෙ නාස්ති කරනවා. ලැක්රෝස් ක්‍රීඩාවටයි, ඇවිදින්න යන්නයි, ජිම්නේසියම් එකටයි කාලෙ යොදලා විනෝද වෙන්නෙ නැතුව."

"ජිම් එකේ කාලෙ නාස්ති කරන්න? ඒක තවත් එකක් මට තේරුම් ගන්න බැරි - ඔයාලා ඇයි මෙච්චර ආශාවෙන් දාලන්නෙ කියලා."

මේ අතර, එතැනට පැමිණි ග්වෙන්ඩොලින් සෙරෙල්ඩා කී දේ අසා එයට එකඟත්වය ප්‍රකාශ වන සේ හිස වනන්නට වූවාය.

"මටත් ඒක තේරුම් ගන්න බෑ," යි ඇ බැගෑරුම් ස්වරයෙන් කීවාය. "ජිම් එකයි, ක්‍රීඩායි අනිවාර්ය කරලා තියෙන එක මහ අපරාධයක්! ඒවා නැති වුණා කියලා මට නම් ගානක් නෑ."

"ආදරණීය ග්වෙන්ඩොලින්, ඔයාට ඒ ගානක් නැත්තේ මං කියන්ට ද - ඔයා ඒවාට දුර්වල හින්දයි, ඔයා ජිම් එකටයි පිට්ටනියටයි ගියා ම හොඳට ම සවුත්තු වෙන හින්දයි," ඇලීෂියා අනුකම්පාවෙන් තොර ව කට දැම්මාය. "සෙරෙල්ඩා එහෙම නෙවෙයි. මට හොඳට ම විශ්වාසයි, එයාට ක්‍රීඩාවලට දක්ෂකමක් තියෙනවා කියලා. නමුත් එයාගෙ ප්‍රශ්නෙ ඒවා තමන්ට අවශ්‍ය නෑ - ගැළපෙන්නෙ නෑ කියලා හිතන එකයි."

අන් ළමයකු නම් මෙයට විරුද්ධ ව කතා කරනු ඇත. එහෙත් සෙරෙල්ඩා සිනාසී කරබාගෙන සිටියාය. ග්වෙන්ඩොලින් තමා ක්‍රීඩාවලට අදක්ෂ බවට සමච්චලයට ලක් වූ බැවින් ඇලීෂියා දෙස රවාගෙන සිටියාය.

"හොඳ රැවිල්ලක් ඔයාට තියෙන්නේ, ග්වෙන්," යයි චිත්‍ර කටු සටහන් පොත අතැති ව එතැනට පැමිණි බෙලින්ඩා කීවාය. "මං ඔයා ඔය ඉන්න හැටියට ම ඇන්දට කමක් නැද්ද? තියෙන රැවිල්ල!"

ග්වෙන්ඩොලින් තවත් තදින් ඔරවාගෙන එතැනින් ඉවත් වූවාය. බෙලින්ඩාගේ චිත්‍ර ගැන ඇ දනී. ඇ ඒවාට බිය වූවාය. තමා රවාගෙන සිටින අන්දම දක්වෙන චිත්‍රයක් පොදු කාමරය පුරා අතින් අත යන සැටිත්, එය බලා එක එක්කෙනා සිනාසෙන සැටිත් දකිමට ඇයට අවශ්‍ය වූයේ නැත. බෙලින්ඩා කටු සටහන් පොත වසා, බලාපොරොත්තු සුන් වූ විලාශයක් අතිශයෝක්තියෙන් දක්වා සිටියාය.

"අනේ, ග්වෙන්ඩොලින් ගියා! කොච්චර ලස්සණ රැවිල්ලක් ද ඒ! කමක් නැහැ - මං පස්සෙ දවසක එයාගෙ රැවිල්ල බලාගෙන අඳින්නම්කෝ!"

"මෑගෙයෝ!" කියා තමාට ම හෙමින් කියා ගත් ග්වෙන්ඩොලින් මාවිස් ළඟින් වාඩි වූවාය. බෙලින්ඩාගෙන් සහ ඇයගේ පැන්සලෙන් තමා ප්‍රවේශම් විය යුතු බව ඇ වටහා ගත්තාය.



බෙලින්ඩා යමක් ඇඳීමට සිතට ගත හොත් එය ඇඳ මිස නතර නොවන බව කවුරුත් දනිති.

"දැන් ඔයා ඔයාලගෙ තවයේ පන්තියේ කොමන් රූම් එකට යන්න," යයි ජීන් සෙරෙල්ඩාට කීවාය. "ඔයා අපෙ එක්ක ඉන්නවාට ඔයාලා පන්තියේ අය කැමති වෙන එකක් නැහැ. ඒ අය අපට වඩා ඉහළයි නේ! ඔයා අයිති ඒ පන්තියට නේ, සෙරෙල්ඩා!"

"මං දන්නවා ඒක. නමුත් මං මගෙ පන්තියට කැමති නැහැ." සෙරෙල්ඩා නැගිටිමින් කීවාය.

"ඒ කියන්නේ ඔයාලෑ පන්තිය 'වනර්ෆුල්' නෑ කියන එක ද?" ඇලීෂියා සමච්චල් කළාය.

සෙරෙල්ඩා උරහිස් සලා ඇහට නොදනී යන්න ගියාය. "එයා තමන්ගෙ පෙනුම ගැනයි, චිත්‍රපටි නිළියක් වීම ගැනයි නොසිතා, වෙන දේවල් ගැන හිත යොදවනවා නම්, ඒ වාගේ ම - ඉගෙනීමේ කටයුතු ගැනයි ක්‍රීඩා ගැනයි උනන්දු වෙනවා නම් - එයා ලොකු ළමයෙක් හන්ද - එයාගෙ පන්තිය එයාට එපා වෙන එකක් නෑ," යයි පුරුදු සාමාන්‍ය ඥානයෙන් යුතුව ජීන් ප්‍රකාශ කළාය. "ඒ වුණත් එයාට කියලා වැඩක් නෑ. එයා කොහොමත් මේ ඉස්කෝලෙට ගැළපෙන්නේ නෑ."

අයිරින් එතැනට ආවාය. ගීතයක කොටසක් මුමුණමින් ඇය ආවේ නැති වූ යමක් හොයාගෙන ය. "ටම්ටි - ටා - ටී - ටම්ටි - ටා - ටී - ටූ!" එය ඇය විසින් නිර්මාණය කරන ලද තනුවකි. ළමෝ ඇය දෙස බලා මවුනොවුන්ගේ මුහුණු බලා ගත්හ.

"මේ හැන්ද යාමේ - ඔබ කොයි බලා ද මේ යන්නේ - අයිරින්?" ඇලීෂියා පුරුදු සරදම් ලීලාවෙන් ඇසුවාය.

"කොහෙවත් නෑ. මං මේ මගෙ මියුසික් පොත හොයනවා. මට ඒකේ ලියන්න ඕනෑ - මං දැන් හදපු ටියුන් එක. ටම් - ටි - ටා - ටි - ටම් - ටි - ටා - ටි - ටූ!"

"වා - මරු නේ! නමුත්, ඇයි ඔයා ඔය කොප්පියයි කෝට් එකයි දාගෙන ඉන්නෙ - කොහෙවත් යන්නෙ නැත්නම්?" ඇලීෂියා

වුණුවාය.

"දෙයියනේ! මං එහෙම ද?" කියා අයිරින් එක අතකින් තොප්පිය ද අනිත් අතින් කබාය ද අත ගා බැලුවේ විමතිය වට පත් වෙමිනි. "මං කොයි වේලෙ ද මේවා ඇඳ ගත්තේ? මං මේවා ගැලෙව්වෙ නැද්ද? හවස ඇවිදින්න ගිහිල්ලා ඇවිල්ලා ගලවන්නයි හිටියෙ? එහෙනං මං ගලවලා නෑ!"

"ඉත් බොහෝ වේලාවේ ඔයා ඔවා ඇඳගෙන හිටියෙ නෑ. එහෙම ඇඳගෙන හිටියා නම්, මිස් පොටිස් මොනවා හරි නොකියා ඉන්න එකක් නෑ. ඔයා නම් මහා පිස්සු හටනක්!" යයි ඇලිෂියා පැවසුවාය.

"ආ - හරි, දන් මං දන්නවා මොනව ද වුණේ කියලා." අයිරින් තොප්පිය හා කබාය පිටින් ම පුටුවක වාඩි වී කීවාය. "මං උඩට ගියා - අලුත් ස්ටොකිංස් දෙකක් ගන්න. මං මගෙ අලුත් වුනුත් එක ගැන හිත හිතයි ගියේ. ස්ටොකිංස් වෙනුවට තොප්පිය එළියට අරන් මං දගෙන තියෙනවා. ඊට පස්සෙ මං කෝට් එකත් දගෙන තියෙනවා. හරි වැඩේ! දන් මං ගිහිල්ලා - මේවා ගලවලා - මගෙ ස්ටොකිංස් හොයාගෙන - මේ වුනුත් එකත් ලියලා දන්න ඕනෑ."

"හරි, ඔයා යන්න ඕනෙ නෑ: මං මේ දෙක ගිහිං තියලා ස්ටොකිංස් දෙක අරන් එන්නං," යයි බෙලින්ඩා කීවේ තනුව ලියා තබන තෙක් අයිරින්ට කිසිවක් සිහි කල්පනාවෙන් යුතු ව කරන්නට නොහැකි බව දනගෙන ය.

"ඇත්තට - ඔයාට පුළුවන් ද!" කියා අයිරින් සතුටින් කබාය හා තොප්පිය ගලවා ඇය අතට දුන්නාය. ඩැරල් සිනාසුණාය. බෙලින්ඩා අයිරින්ට නොදෙවැනි සිහි කල්පනාවක් නැති තැනැත්තියකි. අයිරින්ගේ දුව්‍ය ඇයගේ අල්මාරිය තෙක් බෙලින්ඩාට ගෙන යා හැකි නම් එය පුදුමයකි. ඇයට අයිරින්ගේ ස්ටොකිංස් මතක් වේ නම්, එය ඊටත් වඩා පුදුමයකි!

තොප්පිය හා කබාය රැගෙන බෙලින්ඩා පිට වූවාය. අයිරින් තම තනුව යළි මුමුණන්නට වූවාය. මාවිස් එය මිහිරි හඬින් ගයන්නට වූවාය.



"බොහොම හොඳයි. ඔයා ගායනා කරන කොට මගෙ තනුව දෙගුණයක් ලස්සණ වෙනවා, මාවිස්," යයි අයිරින් සතුටින් පැවසුවාය. "දවසක මං වුනුත් එකක් හදන්නකෝ ඔයාගෙ කටහඬට ගැළපෙන්න."

"මං ඒක ගායනා කරනවා නිව් යෝක්වලදී," යයි මාවිස් ආඩම්බරයෙන් පැවසුවාය. "ඊසෙත් ඔයා ප්‍රසිද්ධියට පත් වෙයි - අයිරින්. මං ඔපෙරා ගායිකාවක් වුණා ම - මං - "

"ඔයා ඔපෙරා ගායිකාවක් වුණා ම - මාවිස්, ඔයා දනට වඩා උද්ධච්ච වෙයි. ඒක හින්ද ඒක වෙන එකක් නැති වෙයි - මං හිතන්නේ," යයි ඇලිෂියාගේ තියුණු හඬ නිකුත් වූයේය.

"ජීන්, ඔයාට බැයි ද ඇලිෂියාගේ මේ අවකැපෙන කතා නතර කරන්න," යයි රතු වූ මුහුණින් යුතු ව මාවිස් ඉල්ලා සිටියාය. ඇ කෝපයෙන් දවෙන්නට වූවාය. "මං උද්ධච්ච නෑ. මගෙ කටහඬ ලස්සණ වුණාට මං වැරදිකාරයායැ? ඒක මට උත්පත්තියෙන් ම ලැබුණු වාසනාවක්! මං ඒ වාසනාව මුළු ලෝකෙට ම බෙදනවා - මං ලොකු වුණා ම."

"ඇලිෂියාගේ කට සැරයි තමා. ඒ වගේ ම, මාවිස්, ඔයා එයාගෙන් ඉල්ලලා නේ අහගත්තේ!" යයි ජීන් කීවාය.

මාවිස් අමනාපයෙන් නිහඬ වූවාය. ග්වෙන්ඩොලීන් ඇයට අනුකම්පාව පෑවාය. ඒ, ඇය ද ඇලිෂියාගේ කටින් පහර කා පුරුදු ඇති බැවිනි. පැත්තකට වී මේස් එකක් එලෙමින් සිටි මේරි යූ මේ කිසිවකට නොගැටී නිහඬ ව සිටියාය.

"කෝ - බෙලින්ඩා?" ඩැරල් ඇසුවාය. "එයා මොකෝ හුඟක් වෙලා ගන්නේ ඔයාගෙ ස්ටොකිංස් හොයන්න - අයිරින්?"

"එයා එහෙම තමා," යයි මේ වන විට සිය ස්ටොකිංස් අමතක කර සිටි අයිරින් පිළිතුරු දුන්නාය. "එයා ඒවා හොයාගෙන ආවෙ නැත්නම්, මට ම ගිහිල්ලා හොයාගෙන එන්නයි වෙන්නේ. රෑ කෑමට ඉස්සර මං හොඳ කුට්ටමක් දගන්න ඕනෑ."

මැඩම්සෙල් කව්ලුඩ්ගේ අඩි උස සපත්තුවලින් හඩ නංවාගෙන එතැනට ආවාය. ඇය අත කබායක් සහ තොප්පියකි!

"අයිරින්, මේවා ඔය ළමයගෙ!" යයි ඇ අවලාද නැගුවාය. "මං මීට ඉස්සර තුන් වතාවක් ඔය ළමයගෙ එක එක දේ එක එක තැන්වල තිබිලා මෙහෙම ගෙනත් දීලා තියෙනවා. මේ පාර මං කළු පොඩ්ඩෙන් තරප්පු පෙළේ ලිස්සලා වැටෙනවා - ඔය ළමයා මේවා පඩි උඩ දාලා ඇවිත් තියෙන හන්ද!"

අයිරින් කිසිවක් කර කියා ගත නොහැකි තත්ත්වයෙන් බලාගෙන සිටියාය. "පඩි උඩ?"

"ඔව්, පඩි උඩ තමා දාලා තිබ්බෙ - මාව ලෙස්සලා වට්ටන්න! මං පල්ලෙහාට බහින කොට හොඳ වෙලාවට දැක්කා. [illegible] ගමන් මං හිතුවෙ, 'මේ මොනව ද? කවුරු හරි පඩි [illegible] අසනීප වුණා ද?' කියලා. උඩට ආවම මං දැනගත්තා [illegible] අයිරින්ගෙ දේවල් තමා කියලා - ආයෙත් සැරයක්. [illegible] ගැන මං හොඳට ම කලකිරිලා ඉන්නේ, අයිරින්! [illegible] දඬුවම් ලකුණක් දෙනවා මං, මේ නොසැලකිල්ලට."

"අනේ එපා, මැඩම්සෙල්!" යයි අයිරින් බිය වී පැවසුවාය. දඬුවම් ලකුණ මුළු පංක්තියට ම බලපාන්නකි. "මැඩම්සෙල්, මං ඇත්තට ම කනගාටු වෙනවා."

"එක දඬුවම් ලකුණයි!" කියා මැඩම්සෙල් "ටකස් - ටකස්" ගා අඩි උස සපත්තු බිම හප්පාගෙන යන්නට ගියාය.

"බෙලින්ඩා කරපු දෙයක්!" අයිරින් දුක් වුවාය. "එයාට මොනවා වෙලා ද මගෙ තොප්පියයි කෝට් එකයි තරප්පු පෙළ උඩ තිබ්බෙ?"

මේ අවස්ථාවේ බෙලින්ඩා පෙරළා ආවාය. ඇය පිළිගත්තා ලද්දේ ප්‍රශ්න කිහිපයක් සමග ය. "මෝඩි, ඔයා හන්ද අපෙ පන්තියට ම දඬුවම් ලකුණක් ලැබුණා! අයිරින්ගේ කෝට් එකටයි තොප්පියටයි ඔයා මොනව ද කළේ? ඒවා තරප්පු පෙළ උඩ තිබිලා - මැඩම්සෙල්ට හම්බු වෙලා - මෙහාට ගෙනත් දුන්නා - දඬුවම් ලකුණකුත් එක්ක."



"දෙයියනේ!" බෙලින්ඩා බියට පත් ව පැවසුවා ය. "මට දන් මතකයි. මං ඒවා ඇරගෙන තරප්පු පෙළ දිගේ උඩට ගියා. එතකොට මගෙ පෑන්සල බිමට වැටුණා. මම ඒවා බිම තියලා, පෑන්සල ඇහිඳ ගත්තා. මට ඒවා අමතක වෙලා තියෙනවා. මට හරි කනගාටුයි, අයිරින්."

"දන් කමක් නෑ," යි කියා අයිරින් කබාය හා හිස් වැස්ම දෙගත්තාය. "දන් මං-ම ඒවා අරං ගිහිං තියන්නං. මං ඒවා ඇඳගෙන ම යන්නං, අතරමග අමතක නොවෙන්න."

ඇය ටික වේලාවක් යන තෙක් ආපසු ආවේ නැත. රාත්‍රී ආහාරය සඳහා සීනුව නාද විය. ගුනු ගුනු ව අස්-පස් කළ බාලිකාවෝ භෝජනාගාරය කරා යාමට සූදානම් වූහ.

"කෝ - අයිරින්?" යයි ජීන් නොඉවසිල්ලට පත් ව ඇසුවාය. "එයා - ඇත්තට ම - කුඩුවක දාලා තියන්නයි ඕනෙ. නැත්නම් එයා කොහෙද කියලා අපට හොයා ගන්න විදිහක් නෑ."

"මේ එන්නෙ - අයිරින්," කියා ඩැරල් හයියෙන් සිනාසුණාය. "අයිරින් ඔයා තව ම තොප්පියයි කෝට් එකයි දාගෙන නේ ඉන්නේ! ඔයා හින්ද අපිට හිනාවෙලා මැරෙන්නයි වෙලා තියෙන්නේ. අනේ - ඇලිෂියා, විගහට ඔය දෙක අයිරින්ගේ ඇඟෙන් ගලවලා උඩට ගිහිං තියලා එන්න! එහෙම නැත්නම්, අපට තවත් දඬුවම් ලකුණක් ලැබෙයි."

## 8

## සෙරෙල්ඩාට නරක කාලයක්

වාරයේ මුල් සති දෙක තුන සෙරෙල්ඩාට නරක කාලයක් විය. තව වන පන්තියේ වුව ද අන් ශිෂ්‍යාවන්ට වඩා ඇ වයසින් වැඩි වුවාය. ඒ නිසා එම පන්තියේ වැඩ ඇයට ලෙහෙසි වීමට තිබුණි. එහෙත්, අවාසනාවට මෙන්, ඇ එහි අන් ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපන මට්ටමට වඩා පසුපසින් සිටියාය.

මෙය සෙරෙල්ඩාට දඩි පසුබෑමක් විය. මහත් සේ වෙහෙසී හැඩ - වැඩ දමා, ලොකු ළමයකුගේ පෙනුමක් දරාගෙන, අන් අය බාල මෝඩියන් ලෙස හිතාගෙන කැපී පෙනෙන්නට දැනු ඇයට පන්තියේ වැඩ බැරි වීම ලැජ්ජාවට කාරණයක් වූයේය. උදාහරණයක් වශයෙන්, ඇයගේ ගණිත දැනුම පංක්තියේ මට්ටමට වඩා බෙහෙවින් පහළින් වූයේය.

"මේ ළමයා මේ වගේ ගණන් කලින් කරලා නැද්ද?" විලියම්ස් මෙනෙවිය පුදුම වී ඇසුවාය. එතකොට - වීජ ගණිතය? ජ්‍යාමිතිය? ගණිතය? ඒවායේ මුල් පාඩම් වත් ඔය ළමයට තේරෙන්නේ නැ වගේ නේ?"

"අපි ඇමරිකාවේ දී අපේ පාඩම් මෙහෙ විදිහට නොවේ කරන්නේ," යයි සෙරෙල්ඩා නිදහසට කරුණු දක්වූවාය. "අපි මෙච්චර වෙහෙසෙන්නේ නෑ. මං කවදවත් ඇල්ජිබ්‍රා - ජියෝමෙට්‍රිවලට කැමති නෑ. ඒ හින්ද, මං ඒවා ගැන උනන්දු වුණේ නෑ."

විලියම්ස් මෙනෙවිය මහත් අප්‍රසාදයට පත් වූවාය. "ඇමරිකාව ළමයින්ට ඉගැන්වීමට මෙච්චර නොසැලකිලිමත් වෙනවා ද? එහෙම නැත්නම්, සෙරෙල්ඩා මෙච්චර ම මෝඩ ද?" ඇ සිතුවාය.

"ඔය ළමයා දුර්වල මැත්ස්වලට විතරක් නෙවෙයි, හැම දේට ම දුර්වලයි, සෙරෙල්ඩා! ඔය ළමයා ගිය ඉස්කෝලෙ දි ව්‍යාකරණ ඉගෙන ගත්තෙ ම නැද්ද?"

සෙරෙල්ඩා හොඳට කල්පනා කරන්නට වූවාය. "මං හිතන්නෙ - අපි කරා වෙන්ඩ ඇති! මං හිතන්නේ, ව්‍යාකරණ උගන්නපු ගුරුවරයට අපි එච්චර හොඳින් ඇහුම්කන් දෙන්ට නැතුව ඇති! මං හිතනවා අපි පන්තියේ සෙල්ලං කර කර ඉන්න ඇති!"

"ඉතිහාස පාඩම් කළේ ම නැද්ද - ඔය ළමයා? මං දන්නවා - එහෙ ඉතිහාසය මෙහෙ ඉතිහාසයට වඩා වෙනස් කියලා. නමුත්, මෙහෙ ඉතිහාසය උගන්වන මිස් කාටින් කියන්නේ, ඔය ළමයා තමන්ගේ රටේ ඉතිහාසයේ වත් මොකවත් ම දන්නේ නෑ කියලයි. ඇමරිකාව ලොකු වැදගත් රටක්! ඒ රටේ ඒ ලස්සණ ඉතිහාසෙන් මොකවත් ම දන්නෙ නෑ කියන එක කොච්චර ලැජ්ජාවක් ද ඔය ළමයට!"

සෙරෙල්ඩාට කර කියා ගත හැකි යමක් නොවීය. තමා මීට පෙර ගිය පාසැලෙන් ඉගෙන ගත් යමක් ගැන ඇ කල්පනා කරන්නට වූවාය. තමා වඩාත් උනන්දු වූ විෂය කුමක් ද කියා ඇ සිතන්නට වූවාය. ආ - නාට්‍ය පංක්තිය!

"අපි ශේක්ස්පියර්ගේ නාට්‍ය හුඟාක් කළා, මිස් විලියම්ස්," යයි ඇ කීවාය. "හී - මං ශේක්ස්පියර්ට හරි ආසයි. එයා වන්ඩර්ෆුල්! මං රඟපෑවා ලේඩි මැක්බත්ගෙ චරිතෙ. මං ඒ චරිතෙ රඟපෑව හැටි දක්කා නම් - "

"ඔව්, මට හිතන්න පුළුවන්. නමුත් ඔය ළමයාට ලේඩි මැක්බත් වගේ රඟපානවාට වැඩිය යමක් කරන්න තියෙනවා අධ්‍යාපනය හදරන කොට. සෙරෙල්ඩා, තමන්ගෙ පන්තියේ වැඩ අල්ලා ගන්න ඔය ළමයා හුඟාක් මහන්සි වෙලා ඉගෙන ගන්න ඕනෑ. මට පුළුවන් ඔය ළමයට ඉස්කෝලෙන් පස්සෙ අමතර පාඩම් උගන්වන්න, ඔය ළමයා කැමති නම්. මැම්සෙල් කියනවා, එයා වුණත් එයාගෙ විවේක වේලාවල ඔය ළමයට වෙන ම උගන්වන්න ලෑස්තියි කියලා - ඔය ළමයගෙ ප්‍රන්ස දැනුම හොඳට ම මදි කියලා."

සෙරෙල්ඩා තවත් බය වූවාය. දැනටමත්, මේ එක එක පාඩම් වර්ග හා ක්‍රීඩා ඇයට දරා ගත නොහැකි තරම් වැඩි ය. මේ හැම දෙයක් ම ඇයට කරන්නට සිදු ව ඇත්තේ අමාරුවෙන් හා නොසතුටිනි. ඒ මදිවට, තවත් අමතර පාඩම්වල යෙදෙන්නට සිදු වුවහොත්? ඇය භ්‍රාන්ත වී බලා සිටි ආකාරයට විලියම්ස් මෙනෙවියට හිතා ගියේය.

"හරි සෙරෙල්ඩා, අමතර පාඩම් දීලා ඔය ළමයට දැනට වැඩි බර පටවන්න මං කැමති නැහැ. ඔය ළමයා ඇත්තට ම මහන්සි අරං, තවත් උනන්දු වෙලා, පාසැල් වැඩවලට වැඩි අවධානයක් යොමු කරනවා නම් - ඔය මුහුණට - එතකොට නියපොතු වලට - කොණ්ඩෙට එහෙම වැඩි අලංකාරයක් දෙන්න මහන්සි වෙනවට වැඩිය - මං හිතන්නේ ඒක ඔය ළමයගෙ දියුණුවට හොඳයි කියලයි."

සෙරෙල්ඩාට මේ කියමන හිතට ඇල්ලුවේ නැත. ඇය උත්සාහ

ගන්නේ - ඉගෙන ගන්නේ - ප්‍රසිද්ධ චිත්‍රපට නිළියක් වීමට ය. එතකොට මේ වීජ ගණිතයෙන්, රේඛා ගණිතයෙන් හා ත්‍රිකෝණමිතියෙන් ඇති පලය කුමක් ද? මේවාට කාලය නාස්ති කිරීමෙන් ඇති වැඩක් නැත. තමාට හොඳ මොළයක් ඇත. අඩු ම වශයෙන් ඇ එසේ සිතන්නීය. වරදකට ඇත්තේ ඇමරිකානු පාසැල්වල හා ඉංග්‍රීසින්ගේ පාසැල්වල ඇති වෙනසයි! ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම ද වෙනස් ය. ඇමරිකාවේ ජීවිතය මෙහි ජීවිතයට වඩා පහසු ය.

ඇ තම දිගු, පොලිෂ් කරන ලද, ලස්සණට කපා ගන්නා ලද නියපොතු හා අත් දෙස බැලුවාය. විලියම්ස් මෙනෙවිය තමා ලැජ්ජාවට පත් කර තමාට කලේ මදි පුංචිකමක් බව ඇ සිතුවාය. සෙරෙල්ඩාට එය දරා ගත හැකි නොවීය. මේ පුංචි දරදඬු ඉංග්‍රීසි කෙල්ලන්ට වඩා දවසක තමා ඉහළින් සිටිනු ඇත. මේ ළමයින් දන්නේ මොනවා ද!

ඇය මෙසේ සිතමින් මුරණ්ඩු ලෙස පසු වුවා මිස, කතා කලේ නැත. ඇය හදන්න බැරි ළමයකු බව සිතමින් විලියම්ස් මෙනෙවිය සිය පොත් හා කඩදසි අතට ගත්තාය.

"හරි - අදට ඔච්චරයි. අද ඉඳන්, සෙරෙල්ඩා, හිතට අරන් ඉගෙන ගන්න ඕනැ. පන්තියේ අනිත් ළමයින් ගැනත් හිතන්න ඕනැ. හොඳට හිතේ තියා ගන්න - තමන් කරන අභ්‍යාස වැඩ තමන්ට ආයෙත් කරන්න කියලා ආපහු ලැබුණා ම, ඒ එක්කම මුළු පන්තියට ම දඬුවම් ලකුණක් ලැබෙනවා! තේරුණා ද? දැනටමත් ඔය ළමයා පන්තියට දඬුවම් ලකුණු ගොඩාක් [illegible] තියෙනවා!"

මෙම දඬුවම් ලකුණු මහා මෝඩ දෙයක් ලෙස සෙරෙල්ඩා සැලකුවාය. පුද්ගලික වශයෙන් තමාට එවන් ලකුණු සතියකට විස්සක් තිහක් ලැබුණත් කමක් නැත. එහෙත් පංක්තියේ අනිත් ළමයින් ඒවාට කොහෙත් ම කැමති නැත.

මේ දඬුවම් ලකුණු සම්බන්ධයෙන් පංක්තියේ ශිෂ්‍ය නායිකාව වූ ලූසී සෙරෙල්ඩාට කතා කළාය. "මේ බලන්න - සෙරෙල්ඩා, මේ දඬුවම් ලකුණු ලැබෙන එක නතර කරන්න බැරි ද? මේ



වාරෙට අපිට දවස් භාගෙ නිවාඩු දෙකක් ලැබෙන්න තියෙනවා. හැබැයි, දඬුවම් ලකුණු හතළිහකට වඩා ලබන පංක්තියේ ළමයින්ට ඒ දවස් භාගේ නිවාඩු දෙක අහිමි වුණොත්, ඔයාට ලේසි වෙන්නේ නෑ! ආන්න ඒක මතක තියා ගන්න!"

පංක්තිය භාර ගුරුවරිය වන විලියම්ස් මෙනෙවියගෙන් ද, ශිෂ්‍ය නායිකාව වූ ලූසිගෙන් ද, ඉනපසු අට වැනි පංක්තියේ සිව, පැඩ හොඳ නිසා, ඉහළ දමන ලද ශිෂ්‍යත්වලාභී එලන්ගෙන් ද මෙසේ එක එක කතා ඇසූ සෙරෙල්ඩා මුහුණ දුන්නේ, ඇත්තෙන් ම, නරක කාලයකට ය.

එද රෑ නියපොතු පොලිෂ් කර සුදු දමන ගමන් සෙරෙල්ඩා සිතන්නට වූයේ, "දන් මොනවා කරන්නත් කාලය මදි," යි කියා ය. "මං මගෙ කොණ්ඩෙ ගැන බලන්න ඕනැ. ෂෑම්පූ දලා [illegible] හරි වෙලාවක් තේ යන්නේ. මගේ මූණේ පාට ගැනත් මං සැලකිලිමත් වෙන්ට ඕනැ. මගෙ නියපොතු ලස්සණට තියා ගන්නත් ඕනැ. මේවා කරා ම මට විනාඩියක් වත් ඉතුරු වෙන්නෙ නෑ. කොහොම වුණත්, ඉස්කෝලේ වැඩ ගැනත් මං හිත යොදවන්න ඕනැ. මං මෙහෙම සවුත්තු වෙනවා කියන්නේ මගෙ රට - ඇමරිකාව සවුත්තු කරනවා කියන එකයි. මට වැඩිය මේ ඉංග්‍රීසි ළමයි හැම දෙයින් ම ඉහළින් ඉන්න එක මට දරා ගන්න බැරි දෙයක්!"

මේ අනුව, අධ්‍යාපන කටයුතු ගැන සැලකිල්ලක් දක්වීමට සෙරෙල්ඩා ඇත්තෙන් ම වෙර දරුවාය. එහෙත් ඇගේ ආඩම්බරකම නිසා, හැඩ වැඩ දමා ලොකුවට පෙනෙන්නට සිටින්නට ඇයට ඇති ආශාව තුනී කර ගැන්මට ද ඇ කැමති නොවූවාය. ඉංග්‍රීසි ළමයින් හෙළා දකිනු වෙනුවට, තමා සියලු අංශයන්ගෙන් ඔවුන්ට වඩා ඉහළින් සිටින බව පෙන්වීමට ඇ දිරි ගත්තාය.

නව වැනි පංක්තියේ ළමයින් රඟ දක්වීමට යන නාට්‍යයේ රඟපා තම හැකියාවන් ප්‍රදර්ශනය කිරීමට සෙරෙල්ඩා බලාපොරොත්තු ව සිටියාය. එහෙත්, අවාසනාවකට මෙන්, එය ප්‍රන්ස නාට්‍යයකි. ඇයගේ ප්‍රන්ස දැනුම මැඩ්මසෙල්ගේ ප්‍රසාදයට කොහෙත් ම පාත්‍ර වූයේ නොවේ.

"ගන්න දෙයක් නෑ!" යි මැම්සෙල් දූපොං සෙරෙල්ඩාගේ ප්‍රන්ස දනුම ගැන කතා කරද්දී, මැම්සෙල් රූෂියර්ට කීවාය. මේ කාරණය සම්බන්ධයෙන් පමණක් ප්‍රන්ස ගුරුවරියෝ දෙදෙන එකග වූහ. අනෙක් කාරණා සම්බන්ධයෙන් දෙදෙනා නිතර ම දරන්නේ ප්‍රතිවිරුද්ධ අදහස් ය. සෙරෙල්ඩා ගැනත්, ඇයගේ වැඩ ගැනත් පුදුමයට පත් ව, ඔවුහු දෙදෙන පැයක් පමණ කාලයක් කතා කරමින් සිටියහ. "එයා නම් ගන්න දෙයක් නැති ළමයෙක්!" දෙදෙනාගේ එක ම අදහස එය විය.

සෙරෙල්ඩා දඬුවම් ලකුණු පහළොවක් ලබා ගැනීමට සමත් වූ පසු, කරන ලද අභ්‍යාසයන්ගෙන් අඩක් බැගින් දිගින් දිගට ම යළිත් කිරීම සඳහා ආපසු ඇය වෙත එවනු ලැබූ පසු හා ඒවා හරිහැටි කිරීමට ඇය අසමත් වූ පසු, විලියම්ස් මෙනෙවිය ශ්‍රේලිං මෙනෙවිය හමු වීමට ගියාය.

"සෙරෙල්ඩා බ්‍රාස් කොහෙත් ම නවයේ පන්තියට සුදුසු නෑ," යි ඈ විදුහල්පතිනියට කියා සිටියාය. "එයාගෙ දුර්වලකම් නිසා පන්තියට ලැබෙන නරක ලකුණු හින්ද මුළු පන්තිය ම අප්සෙට් ගහලා ඉන්නේ. වැරැද්ද තියෙන්නේ, එයා තමන්ගෙ රූපෙ ලස්සණ කර ගන්න කොච්චර කාලයක් ගන්නවා ද කියලා මුළු පන්තිය ම දන්න එකයි. එයා තව ටිකක් පාඩම් වලට කාලෙ ගත කරනවා නම්, මුළු පන්තියට ම යහපතක් කියලා ළමයි දන්නවා. මම පුළුවන් තරම් සෙරෙල්ඩාට අවවාද කළා. මං කියන්නෙ නෑ - ඒ ළමයා සම්පූර්ණයෙන් ම නරකයි කියලා, මිස් ශ්‍රේලිං. නමුත් ඒ ළමයා මෝඩ විදිහටයි හැදිලා තියෙන්නේ; වැරදි විදිහටයි හැදිලා තියෙන්නේ. දන් අපි මොනව ද කරන්නේ?"

"එයාට අමතර වශයෙන් පාඩම් කියලා දුන්නොත් හොඳයි කියලා ඔබ හිතනව ද? එයාට දන් දහසයයි. ඒ හින්ද ඔය පන්තියේ වැඩට එයා දක්ෂ වෙන්න ඕනෑ. ඇමරිකාවෙ ඉස්කෝලෙන් එයා ගෙනාපු රිපෝට් එක හොඳයි." ශ්‍රේලිං මෙනෙවිය අදහස් දක්වූවාය.

"මං හිතන්නේ නෑ - එයාට අමතර ඉගැන්වීම් වලින් වැඩක් වෙයි කියලා. එයාට එතකොට ඉගෙන ගන්න එක එපා වෙයි.



වෙලා තියෙන්නේ, මේ පන්තිය එයාට ලොකු වැඩි එකයි. අවේ පන්තියට වත් එයා සුදුසු නෑ කියලයි මට පේන්නේ. එයාගෙ වැරැද්ද - තමං ගැන ලොකුවට හිතලා, අනිත් අය පහත් කරලා හිතන එකයි. ළමයි ඒකට කැමති නෑ."

"ඇත්තවශයෙන් ම - ළමයි හරි," යයි ශ්‍රේලිං මෙනෙවිය එකඟ වූවාය. ඉන්පසු විනාඩියක් පමණ ඇය නිශ්ශබ්ද ව සිටියේ බලාපොරොත්තු සුන් වූ විලාශයෙනි. ඇමරිකානු ළමයකු මෙහි සිටීම ඉංග්‍රීසි ළමයින්ට යහපතක් වේ යයි ද, ඉංග්‍රීසි ළමයින්ගෙන් ඇයට යහපතක් වේ යයි ද ඈ මුලදී සිතුවාය. එහෙත් සිතූ දේ නොසිදු විය.

"ඔව්, ඒ ළමයා අට වෙන පන්තියට දමු!" යයි කෙළවර ඈ කීවාය. "ඒක එයාට ලැජ්ජාවට කාරණයක් බව මං දන්නවා. එයාට දුක හිතෙන්න පුළුවන්. ඒ වුණාට ඒක එයාට යහපතක්. සෙරෙල්ඩා මයෙ ළඟට එවන්නකෝ."

"බොහොම ස්තුතියි, මිස් ශ්‍රේලිං," කියා විලියම්ස් මෙනෙවිය පිට ව ගියේ සෙරෙල්ඩා වැඩි දුරටත් තමාගේ හිසරදයක් නොවන බව දනගැන්මෙන් ඇති කර ගත් සැහැල්ලු සිතින් යුතුව ය. සෙරෙල්ඩා අවාසනාවන්ත ලෙස තම පන්තියට ගෙන දුන් නරක ලකුණු මකා දැමීමට දන් ඇයට පුළුවන. පංක්තියේ ළමයි ඉන් සැනසුමක් ලබනු ඇත. තමාගේ පංක්තියේ ළමයින් හොඳින් මහන්සි වී ඉගෙන ගන්නා අය වීම ඇයගේ ආඩම්බරයට හේතු වී ඇත. අපකීර්තිය හැර අන් කුශලතාවයක් ගෙන නොආ ශිෂ්‍යාවගෙන් මිදීමට ලැබීම ගැන ඈ සතුටු වූවාය.

"කොහොම වුණත්, සෙරෙල්ඩා එච්චර ම නරක ළමයෙක් නෙවේ," යයි සාධාරණ අදහස් ඇති විලියම්ස් මෙනෙවිය සිතුවාය. "එයා මේ පන්තියට සුදුසු නෑ. අටේ පන්තියේ දී එයාට වැඩ ලේසි වෙයි!"

ඈ සෙරෙල්ඩා විදුහල්පතිනිය ළඟට පිටත් කර හැරියාය. මුලින් ම මැලෝරි ටවර්ස් ආ දිනවල තමා කිසි ම ගුරුවරියකට බිය නැති බවට හිතා ගත් සෙරෙල්ඩා ශ්‍රේලිං මෙනෙවිය ළඟට ගියේ ගැහෙන හදවතින් යුතුව ය. විදුහල්පතිනිය සිය සැප පහසු විසිත්ත කාමරයේ සිටියාය.

සෙරෙල්ඩා එම කාමරයට ඇතුල් වී ඇයගේ මේසය ඉදිරියෙන් සිටගෙන සිටි කල, ඈ ලියමින් සිටි දෙය නතර කර හිස ඔසවා බැලුවාය. දැන් සෙරෙල්ඩාගේ පිත්තල පාට කොණ්ඩය සාමාන්‍ය අයුරින් පීරනු ලැබ ඇත. එහෙත් එය හැඩ දමා සකසා තිබුණි. මුහුණේ වත්සුනු තවරා ඔප් නංවා තිබුණි. නියපොතු ද හොඳින් පොලිෂ් කර තිබුණි.

"සෙරෙල්ඩා, මං ඔය ළමයව ගෙන්නුවෙ - ඔය ළමයට කියන්න - තමා නව වැනි පන්තියට සුදුසු නෑ කියලා," යයි ශ්‍රේලිං මෙනෙවිය කෙළින් ම මාතෘකාවට බැස්සාය. එය ඇයගේ සාමාන්‍ය පිළිවෙත වේ. සෙරෙල්ඩාගේ මුහුණ රතු විය.

"ඔය ළමයා ඒ පන්තියේ වැඩිමල් ම ළමයා හන්ද මට මේ ගැන කනගාටුයි. නමුත් දැන් ඉන්න පන්තියේ වැඩ තමන්ට අමාරුයි. අමතර පාඩම්වල යෙදුණත්, අනිත් ළමයින්ගේ මට්ටමට එන්න පුළුවන් දැනුමක් තමාට නෑ. අනිත් එක, ඔය නව වෙනි පංක්තියේ ළමයි ඉගෙන ගන්නේ ප්‍රසිද්ධ විභාගෙකට වාඩි වෙන්න. ඒ විභාගෙට කියන්නේ "ස්කූල් සර්ටිෆිකේට්" විභාගය කියලයි. එතකොට ඔය ළමයා පන්තියට අරන් දීලා තියෙන දඬුවම් ලකුණු ප්‍රමාණය අනික් ළමයින්ට අවාසිදායකයි. ඒ අය ඒක ඉවසන්නෙ නෑ."

සෙරෙල්ඩා තවත් රත් වූවාය. තමා මෙසේ කැලඹීමට පත්වීම ගැන ඈ තමාට ම වෛරයක් ඇති කරගත්තාය. නව වැනි පන්තියේ මෝඩියන් ගැන තමා ඇඟ ලේ රත් කර ගත්තේ කුමට ද?

"ඒ හින්ද, මං හිතනවා ඔය ළමයා අටේ පන්තියට ගියා ම ලෙහෙසියෙන් ඉගෙනගනී කියලා. නවයේ පන්තියේ ළමයි තරම් අටේ පන්තියේ ළමයි පාඩම් ගැන හුඟාක් මහන්සි වෙලා වැඩ කරන්නෙ නෑ. ඒ පන්තියේ සැහැල්ලුවෙන් සන්තෝසෙන් ඉගෙනීමේ යෙදෙන්න පුළුවන් - ඔය ළමයට."

සෙරෙල්ඩාට මෙය මරු පහරක් මෙන් විය. පංක්තියක් පහළට යාම කොතරම් අවනම්බුවක් ද! තමා අට වැනි පංක්තියේ ළමයින්ගේ ඇසුරට කැමති බව සත්‍යයකි. එමෙන් ම තමා දැන්



සිටින පංක්තියේ ශිෂ්‍යාවන් තමා සමඟ සම්බන්ධකම් නොපවත්වන බව ද සත්‍යයකි. එහෙත් පංක්තියකින් තවත් පංක්තියකට පහළ වැටීම කොතරම් ලැජ්ජාවට කරුණක් ද! ගෙදර අය කුමක් කියනු ඇත් ද! එමෙන් ම තම ඉංග්‍රීසි ජාතික මිත්තණිය මව්තයටත් දුකවත් පත් වනු ඇත.

"ඕ, මිස් ශ්‍රේලිං, හී - මං නං ඒකට කැමති නෑ," යයි ඈ කැලඹීමෙන් යුතු ව කීවාය. ඈ කමිස බොත්තමක් ගලවා යළිත් වසා දම්මාය; තමා කලේ කුමක් දැයි නොදැන යළිත් එම බොත්තම ගැලෙව්වාය.

"ඔය බොත්තම ගලවන්න එපා, සෙරෙල්ඩා" යි ශ්‍රේලිං මෙනෙවිය පැවසුවාය. "මං හිතනවා - අටේ පන්තියේ ටික දවසක් ගත කළා ම - තමන්ට ම පහසුවක් දනෙයි කියලා. හෙට දවසෙ ම ඔය ළමයා ඒ පන්තියට යන්න. මං මිස් පීටර්ස්ට කියන්නං. සෙරෙල්ඩා අද රෑ ම තමන්ගේ දේවල් ඒ පන්ති කාමරේට මාරු කරන්න!"

"නමුත්, මිස් ශ්‍රේලිං, මට එහෙම කරන්න කියන්න එපා!" යයි සෙරෙල්ඩා බැගෑපත් වූවාය. මෙය ඇයට අවනම්බුවකි; මදි පුංචිකමකි; ඇය කැමති නැති දෙයකි. "මට මෙහෙ - මේ ඉංග්‍රීසි ඉස්කෝලෙ හරි අලුත්; හරි අමුතුයි; පාඩම් - එතකොට - "

"ඔව්, මට ඒ ඔක්කොම තේරෙනවා. ඒ හින්ද ම තොවුණත් - ඒකත් එක කාරණයක් තමා, තමන්ට ලෙහෙසියෙන් තේරුම් ගන්න පුළුවන්, ලෙහෙසියෙන් වැඩ කරලා ඉගෙන ගන්න පුළුවන් පංක්තියකට යන එක. මං දන්නවා, ඔය ළමයට ලොකු පන්තියක වැඩ කරන්න අමාරුයි කියලා. සෙරෙල්ඩට මං කියන්නේ - අටේ පන්තියෙනුත් පහළට වැටෙන්න වැඩ සිද්ධ කර ගන්න එපා කියලයි. මතකයි නේ? සෙරෙල්ඩා අයිති ලොකු බලවත් රටකට. එතකොට මෙහෙ ඉන්න ඒ රටේ එක ම නියෝජිතයා තමා නේ! ඒ නිසා හොඳට ඉගෙනගෙන හොඳ ළමයෙක් වෙන්න බලන්න. මං දන්නවා - ඔය ළමයට පුළුවන් කියලා."

මෙම අවසන් කියමන් ටික සෙරෙල්ඩාගේ හිතට වැදුණි. ඔී! තමා මේ පෙනී සිටින්නේ ඇමරිකාව වෙනුවෙන් ය. නැද්ද? ඇය එංගලන්තයේ හිටියත් ඇය අයිති ඇමරිකාවට ය. අනවශ්‍ය කලබලයක් නොකර අටේ පන්තියට යන එක හොඳ යයි ඇ සිතුවාය. එහි ළමයින් තමාට විහිළු-තහළු කළත්, තමාට ඇත්තේ කිසිත් ගණන් නොගෙන සිටීමට ය. තමා හොඳින් ඉගෙන ගත යුතු ය. නැත්නම්, තවත් පහළට වැටෙනු ඇත!

"දන් සෙරෙල්ඩා යන්න!" යයි විදුහල්පතිනිය කී කල ඇ කාමරයෙන් පිට වූවාය. ඇ දිරිමත් ලෙස දොරෙන් පිට වී යනු ශ්‍රේලිං මහත්මිය බලාගෙන සිටියාය. චිත්‍රපට නිළියක් වීමට බලාපොරොත්තු ව සිටිනා සෙරෙල්ඩා ලෙස නොව සාමාන්‍ය පාසැල් ශිෂ්‍යාවක වන සෙරෙල්ඩා ලෙස ඇයට තමා ම දක ගත හැකි නම්, ඇය කොතරම් හොඳ ළමයකු විය හැකි ද!

## 9

## ක්‍රීඩා පිටියේ දී

ශ්‍රේලිං මෙනෙවිය පිටර්ස් මෙනෙවිය තමාගේ කාමරයට ගෙන්වාගෙන, සෙරෙල්ඩා අටේ පන්තියට එන බව දන්වා සිටියාය.

"එයාට ඒක අමාරු කාර්යක් වෙයි," යයි පිටර්ස් මෙනෙවිය කීවාය. "මං කියන්නේ වැඩ නෙවෙයි - මොකද කොහොමත් සෙරෙල්ඩාට අටේ වැඩ වුණත් ලේසි වෙන එකක් නැහැ. මං කියන්නේ - ලැජ්ජාව."

"සමහරවිට ඔය අමාරු දේවල් වුණත්, එයාට හොඳක් වෙන්න පුළුවන්," යයි ශ්‍රේලිං මෙනෙවිය කී කල පිටර්ස් මෙනෙවිය හිස සලා එය පිළිගත්තාය.

බාලිකාවන් මැලෝරි ටවර්ස් එන්නේ පාඩම් ඉගෙන ගැනීම සඳහා පමණක් ම නොවේ. ඔවුන්ට තවත් බොහෝ දේ මෙහි



දී ඉගෙන ගැන්මට ඇත. අවංකභාවය, සාධාරණත්වය, ගුණ - යහපත්කම, කරුණාව, එඩිතරකම ආදී යහ ගුණයන් ද ඔවුන්ට මෙහි දී පුහුණු කළ හැකි ය. සමහරවිට පංක්තියේ පාඩම්වලට වඩා එවන් හැඩගැසීම් ඔවුන්ට ප්‍රයෝජනවත් වනු ඇත.

"සෙරෙල්ඩා අටේ පන්තියට එන්න ඉස්සර, ඒ පන්තියේ ළමයින්ට ඒ ගැන කලින් ම යමක් කියා සිටින එක හොඳයි කියලා මිස් පිටර්ස් හිතනව ද?" ශ්‍රේලිං මෙනෙවිය ඇසුවාය. "ඔය පන්තියෙත් ළමයෙක් දෙන්නෙක් ඉන්නවා - ග්වෙන්ඩොලින් වාගේ - එයාට කරුණාවන්ත නොවෙන්න පුළුවන්. ඒ නින්ද, පන්තියේ ළමයින්ට වචනයක් දෙකක් කලින් ම කියලා තිබ්බොත් හොඳයි නේ?"

"ඔව්, ඒක හොඳයි," යයි පිටර්ස් මෙනෙවිය පැවසුවාය. "කොහොමත්, සෙරෙල්ඩා එක්ක ලේසි වෙයි කියලා මං හිතන්නෙ නෑ, මිස් ශ්‍රේලිං. එයාගෙ හරි විකාර අදහස් තියෙනවා. මුළු කාලෙ ම යොදවන්නෙ හැඩ-වැඩ වෙන්න. මය වගේ ගැනු ළමයි මට කැමති වෙන එකක් නෑ - මං ටිකක් තද වැඩි හන්ද."

"ඒක හොඳයි. එතකොට ඒ ළමයා හැදිලා එයි. මිස් පිටර්ස්ට පුළුවන් ඒ ළමයා හදලා ගන්ඩ. සෙරෙල්ඩගෙ හොඳ පැත්තකුත් තියෙනවා. එයා හිනාවෙලා යමක් පිළිගන්න පුළුවන් විදිහේ - සැහැල්ලු විදිහට යමක් සලකන විදිහේ කෙනෙක්. මං හිතනවා එයා හදලා ගන්න පුළුවන්. කෝකටත් පන්තියෙ ළමයින්ට වචනයක් දෙකක් කියලා තියන්නකෝ. වැඩියෙන් කියන්ට යන්න එපා!"

එද හවස අටේ පන්තියේ ළමයින් විමතියට පත් කරමින් පිටර්ස් මෙනෙවිය 'වචනයක් - දෙකක්' කතා කළාය.

"මං මේ ළමයින්ට කියන්න කැමතියි, මේ පන්තියට අලුතෙන් ළමයෙක් එනවා. ඒ වෙන කවුරුවත් නෙවේ - සෙරෙල්ඩා බ්‍රාස්!"

ග්වෙන්ඩොලින් මේ අසා තදින් හුස්ම ඉහළට ඇද ජයග්‍රාහී ලෙස වටපිට බැලුවාය. එහෙත් ඇය සතුටු වූයේ සෙරෙල්ඩාගේ

ඇඳ වැටීම නිසා නොව, මෙම ඇමරිකානු බාලිකාව තමාට වඩාත් කිට්ටුවීම සම්බන්ධයෙනි. ඇය තමාගේ පංක්තියේ දී සහ තම පංක්තියේ පොදු කාමරයේ දී කිට්ටුවෙන් ආශ්‍රය කිරීමට ලැබීම භාග්‍යයක් සේ ඇ සැලකුවාය. දැන් තමාට හිතේ හැටියට ඇයගේ ඇගේ ඇලී-ගැලී සිටිය හැකි ය. දැන් තමාට ඇයගේ මිතුරිය විය හැකි ය.

පීටර්ස් මෙනෙවිය ග්වෙන්ඩොලීන්ගේ මුහුණෙහි ආලෝකය දුටුවේ වැරදි විදිහට ය. "ග්වෙන්ඩොලීන්, ඉහළ පංක්තියක වැඩ කරන්න බැරි ව පහළට වැටෙන ළමයෙක් ගැන ඔහොම සන්තෝෂ වෙන්න හොඳ නැහැ. මං හිතනවා......"

"ඕ, මිස් පීටර්ස්," යයි මුහුණ වේදනාත්මක හැඟීමෙන් පුරවාගෙන ග්වෙන්ඩොලීන් පිළිතුරු දුන්නාය. "මං ඒ වගේ කියලා හිතන්න එපා. මං සෙරෙල්ඩාට කැමතියි. මං සන්තෝෂ වෙන්නෙ එයා අපෙ පන්තියට එන එක ගැනයි. මං එයා ආදරයෙන් පිළිගන්න කැමතියි."

ඇය කී දෙය පිළිගත හැකි ද නැත් ද කියා පීටර්ස් මෙනෙවියට විශ්වාසයක් නොවීය. ඇ සාමාන්‍යයෙන් ග්වෙන්ඩොලින් විශ්වාස නොකළාය; ඇය ප්‍රිය නොකළාය. කෙසේ වුව ද, ඇයට සැකයේ වාසිය දීමට පීටර්ස් මෙනෙවිය තීරණය කළාය.

"සෙරෙල්ඩා මොනවත් කියන්නේ නැත්නම්, එයාගෙන් අහන්න යන්නත් එපා," යි ඇ පංක්තියට කීවාය. ඇ ඉන්පසු තියුණු බැල්මක් ඇලීෂියා වෙත හෙළුවාය. ඇලීෂියා පෙරළා ඇය දෙස බැලුවාය. සෙරෙල්ඩාට වදේ ගැහීමට අදහසක් ඇයට නොවීය. එහෙත් ඇයගේ කපටි මොළයට කල්පනා වූයේ සෙරෙල්ඩාට සිදු වූ මෙම අවනම්බුව ඇයට හොඳ පාඩමක් වන බව ය; ඇයගේ ලොකුකමට කදිම ගර්හාවක් වන බවත් ය.

සවස් වරුවෙහි පන්ති අවසන් වූ පසු, පැය භාගයක ලැක්රෝස් ක්‍රීඩා පුහුණුව ආරම්භ විය. අටේ ළමෝ පිට්ටනිය කරා දිව ගියහ. අන්තිමට ගියේ පුරුදු පරිදි ග්වෙන්ඩොලින් ය. මාවිස් ඇය ළඟින් වූවාය. ක්‍රීඩා උපදේශිකාව මේ දෙදෙනා



ගැන කලකිරී සිටියාය. ළමුන්ගේ කතා-බහේ ප්‍රධාන මාතෘකාව වූයේ සෙරෙල්ඩා ය.

"දෙයියනේ, පන්තියෙන් ඔය විදිහට පහළ දානවා කියන එක ගැන හිතන්න. පව්, සෙරෙල්ඩා! එයාට හරි හිතේ අමාරුව ඇති!" අයිරින් කීවාය.

"ඔව්, එයාට හරියට ලැජ්ජා හිතෙනවා ඇති," යයි මේරි ශු පැවසුවාය. "මට ඔහොම දෙයක් වුණොත් කොහොම හිතෙයි ද කියලා මං දන්නවා. මට ආයෙ කාගෙවත් මුහුණ බලන්නවත් නොහිතෙයි."

"මං හිතන්නෙ - දැන් නවයෙ පන්තියෙ අයට සන්තෝස ඇති," යයි ජීන් කීවාය. "එලන් මට කීවා, කවරදවත් නොලැබුණ විදිහට එයාලයි පන්තියට දඬුවම් ලකුණු ලැබුණා කියලා - සෙරෙල්ඩා නිසා! අපි හිතමු එයා අපටත් එතරම් ම පරිත්‍යාගයක් නොකරයි කියලා. ඔය අයිරිනුයි, බෙලින්ඩයි සිහියක්-පතක් නැති ව කරන දේවලින් මිසක් මෙච්චර කල් අපට එහෙමත් තරක ලකුණු ලැබිලා නෑ."

"මං හිතන්නේ - අපි සෙරෙල්ඩත් එක්ක හොඳින් ඉමු කියලයි." ග්වෙන්ඩොලින් ප්‍රකාශ කළාය. "අපි එයාට පෙන්නමු, එයා අපෙ පන්තියට ආව එක ගැන අපි කොච්චර සන්තෝෂ ද කියලා."

මාවිස් ග්වෙන්ඩොලින් දෙස මුහුණ ඇඹුල් කරගෙන බැලුවාය. සෙරෙල්ඩා මෙහි ආ කල තමාට ග්වෙන්ඩොලින්ගේ මිත්‍රත්වය අහිමි වන බව ඇ දත සිටියාය. අන් කිසිවකුට මාවිස් හා මිතුරු වීමට අවශ්‍ය හා අවකාශයක් නොවීය. ග්වෙන්ඩොලින් වුව ද ඇයට එතරම් ලොකු මිතුරියක් නොවූවාය. එහෙත් ඇය කියන දේ හා කොඳුරන දේ අසාගෙන සිටීමට හෝ ග්වෙන්ඩොලින් ඉවසනසුලු ගතියෙන් යුතු වූවාය.

"සෙරෙල්ඩාගේ යම් යම් වැරදි තිබුණත්, එයා තරහා ගන්නේ නැති කරුණාවන්ත ළමයෙක්," යයි ඩැරල් පැවසුවාය. "ඔව්, මාත් එකග වෙනවා - අපි එයා පිළිගෙන, එයා අපෙත් එක්ක ඉන්න එක ගැන අපි සතුටුයි කියලා පෙන්නන එකට."

මේ අනුව අවේ බාලිකාවෝ සෙරෙල්ඩා සමග හොඳින් සිටීමටත්, ඇයගේ හිතේ අමාරුව තුනී කිරීමටත් එකහත්වයකට පැමිණීමට තරම් ගුණ යහපත් වූහ.

ඇය පසු දින උදයේ මුහුණ රතු කරගෙන, හිස පහතට එල්ලාගෙන, කඳුළු නෙත්වල පුරවාගෙන එන අයුරු ඔවුනට මැවී පෙනෙන්නට විය.

අභිංසක සෙරෙල්ඩා ඔවුන් තමා හොඳින් පිළිගැනීම ගැන කොතරම් සතුටු වෙයි ද!

"ඩැරල්! ඩැරල් රිවර්ස්!! මෙහාට එන්න. මං ඔයාට කැච් කිහිපයක් එවන්නං. අල්ලන්න," යයි ක්‍රීඩා ගුරුවරිය අඬගැසුවාය. ඩැරල් ඇය වෙත දුව ගියාය. ඇයට හොඳට දුවන්නට පුළුවන. එමෙන් ම ඇ ලැක්රෝස් ක්‍රීඩාව ප්‍රිය කළාය. පාසැල් ලැක්රෝස් ක්‍රීඩා කණ්ඩායමට අයත් වීමට ඇ පුල පුලා සිටියාය. එහෙත් අවේ ළමයකුට එම කණ්ඩායමට සම්බන්ධ වීමට ඉඩ ලැබෙන්නේ ඇය ලොකු නම් හා සවිමත් නම් පමණි.

"ඔය ළමයා හොඳට අල්ලනවා, ඩැරල්!" ක්‍රීඩා උපදේශිකාව කීවාය. "ළඟදී ම ඩැරල්ට පුළුවන් වීම් එකට බැඳෙන්න. තුන් වැනි මැච් ටීම් එකේ රනර් විදිහටයි කැවර් විදිහටයි ඩැරල්ට තැනක් තියේවි."

ඩැරල් ආඩම්බරයෙන් බැබළෙන්නට වූවාය. තමාට ප්‍රධාන කණ්ඩායමට බැඳෙන්නට ලැබුණොත් යයි ඇ සිහින දුටුවාය. අම්මා සහ තාත්තා සතුටු වන අන්දමත්, තමා පෙලිසිටිට තම හපන්කම් හුවා දක්වන අන්දමත් ඇ හිතින් මවා ගත්තාය. "අපි බාවෙස්ටර් එක්ක තරග කරන කොට මාත් වීම් එකේ හිටියා. මං හොඳට දිව්වා. මං ගෝල් එකකුත් ගත්තා!" යයි ඇයට එවිට පැවසීමට පුළුවන.

තවත් බෝලයක් ඇල්ලීමට දුව යද්දී ඇ මෙසේ සිහින ලොවක පසු වූවාය. පුළුවන් සෑම විනාඩියක ම මෙසේ මහන්සි වී පුහුණු වූව හොත්, එමෙන් ම මොලී රොනල්ඩ්සන්ගෙන් අමතර පුහුණුව ලබාගත හොත් තමාට තම අරමුණ ඉටු කර ගත හැකි බව ඇ සිතුවාය. ක්‍රීඩා නායිකාව වන මොලී, ඕනෑ ම



අලුත් ක්‍රීඩිකාවියක තමාගෙන් ඉල්ලා සිටිය හොත්, එසේ පුහුණුව ලබා දීමට තමා කැමති බව ප්‍රකාශ කර ඇත.

එහෙත් මොලීගේ වයස අවුරුදු දහ හතකි. ඩැරල්ගේ වයස දහ හතරකි. ඩැරල් මොලී දුටුවේ තමාට වඩා හුගාක් ඉහළ, දුරස්ථ, මහේශාඛ්‍ය කෙනකු ලෙස ය. එහෙත් මොලී තමා ගැන එහෙම හිතුවේ නැත.

මොලී මහන්සි වී, මුහුණ රතු කරගෙන, එහෙත් සතුටින් ක්‍රීඩා පිටියෙන් පිටත් ව යන සැටි බලාගෙන සිටි ඩැරල් හිතට ධෛර්යය ගෙන ඇය ළඟට දුව ගියාය.

"ප්ලීස්, මොලී - මට බඩුවක් අහන්න පුළුවන් ද? මම කවදහරි මැච් ටීම් එහෙකට බැඳෙන්න ආසයි. මම කැච් කරලා හොඳට පුරුදු වුණොත් - මට පුළුවන්කමක් තියෙයි ද? එතකොට මට මොලීගෙන් ඉගෙන ගන්න පුළුවන් වෙයි ද හරියට ක්‍රීඩා කරන හැටි?" ආදි වශයෙන් ඇ බියෙන් බියෙන් තම ආශාව ඇයහට ප්‍රකාශ කර සිටියාය. මේ අවස්ථාවේ මහන්සියට වඩා චකිතය නිසා ඩැරල් බිට්රූට් අලයක් සේ ලේ පාට ගැසී සිටියාය. ඇයට ක්‍රීඩා නායිකාව දෙවියකු සේ පෙනිණ.

මොලී සිනාසී ඩැරල්ගේ පිටට තට්ටු කළාය. "හොඳ ළමයා! මං ඊයෙ ජෝන්ට කිවේ ඩැරල් හොඳට සෙල්ලං කරනවා කියලා. තව ටිකක් වැඩියෙන් කෝච් කළා ම ඩැරල් හුගාක් හොඳට සෙල්ලං කරයි. මං අමතර පුහුණුව ලබා දෙන වේලාවල් මං දන්වන්නංකෝ. එතකොට ඩැරල්ට පුළුවන් තමන්ට විවේක තියෙන වේලාවල්වලට ඇවිල්ලා ප්‍රැක්ටිස් කරන්න."

මොලී මෙසේ පැවසූ කල, හිසේ මලක් පිපුණා සේ සතුටට පත් ඩැරල්, "ම් - තැන්ක් යූ, මොලී! මට පුළුවන් හැම වේලේ ම මං එන්නං!" යයි කියා ඉහ-වහා ගිය සතුට නිසා වැඩි දුරටත් කතා කර ගත නොහැකි ව, මුහුණ රතු කර ගෙන දුව ගියාය. මොලී ඇත්තෙන් ම ඩැරල් හොඳට සෙල්ලම් කරන හැටි බලා ඒ බව ජෝන් සමග කියා ඇත. ඩැරල් සතුටින් උඩ පැන පැන ගියේ මුව පොව්වකු සේ ය. ඇ කොරිඩෝරයේ කොනක දී මැම්සෙල්ගේ ඇගේ ද හැප්පුණාය. තව ටිකක්

තයියෙන් හැප්පුණා නම්, මැම්සෙල් බිම ඇදගෙන වැටෙන්නට ද තිබුණි.

"මොකද්ද මේ ළමයට වෙලා තියෙන්නේ?" යයි අඩි උස සපත්තු 'ටකස් - ටකස්' ගා බිම ගසා ඇගේ සමබර රැක ගත් මැම්සෙල් කිත්තිය අල්ලාගෙන නොවැටී බේරුණාය. "ඩැරල්, මොන කල්පනාවෙන් ද පැන පැන ආවේ - කැලේ සතෙක් වගේ!"

"ඔ - මැම්සෙල්, සොරි!" යයි ඩැරල් සිය කනගාටුව ප්‍රකාශ කළේ ද හිතේ පිරී සතුට අමතක නොකර ය. "මං ඇත්තෙන් ම හිතලා හැප්පුණේ නෑ, මැම්සෙල්. මොලී රොනල්ඩ්සන් කිව්වා, මට ලැක්රෝස් පුහුණු වෙන්න වැඩියෙන් කෝච් කරනවා කියලා. හිතන්නකෝ - කවද හරි මං තුන් වැනි කණ්ඩායමට ගන්නයි යන්නේ!"

මොලී ඩැරල්ට අමතර පුහුණුවක් දීම ගැනත්, ලැක්රෝස් ක්‍රීඩාව ගැනත් තමාගේ කිසි ම සතුටක් නැති බව ප්‍රකාශ කිරීමට මැම්සෙල් කට ඇරිය නමුත්, ඩැරල්ගේ සතුටින් දිලෙන ඇස් දුටු කල ඇය එසේ නොකියා සිටියේ ඇය ඩැරල් ප්‍රිය කළ නිසා ය.

"මං ඒ ගැන හරි සන්තෝසයි, මගෙ පැටියෝ," යයි ඈ සිනාසී කීවාය. "ඒක ඔය ළමයට ලොකු නම්බුවක්. ඒ වුණාට මීට පස්සෙ ඔහොම දුවගෙන ඇවිල්ලා මේ දුප්පත් මැම්සෙල්ගෙ ඇඟේ හැප්පිලා බිම වට්ටන්න යන්න එපා - හොඳේ! මගෙ පපුව තව ම ගැහෙනවා - පැටර් - පිටි ගාලා!"

"පැටර් - පිටි නෙවේ, මැම්සෙල්, පිටර් - පැට්," යයි ඇය නිවැරදි කොට ඩැරල් සිනා සිසී දුවගෙන ගියාය.

මොලී කී දේ ඈ සිය මිතුරියන්ට ද කීවාය. ක්‍රීඩාවලට අකැමති අය හැර අන් අය එය අගය කළහ. අට වැනි පංක්තියේ කිසිවකුට ලැක්රෝස් කණ්ඩායමකට බැඳෙන්නට මෙතෙක් ලැබී නැත. ජීන් සහ සැලී ඊට උත්සාහ කර ඇතත් ඔවුන් සාර්ථක වී නැත.



"එහෙත් බිල් හැම විනාඩියෙ ම අශ්වයා ළඟට දුවනවා. මෙහෙත් අයිරීන් එයාගෙ අලුත් වියුත් එක ප්‍රැක්ටිස් වෙන්න පියානෝ එක ළඟට දුවනවා. මාවිස් තව පැත්තකින් ඔපෙරා ගායිකාවක් වෙන්න කොහෙ හරි මුල්ලකට වෙලා කටහඬ ලස්සන කර ගන්න ප්‍රැක්ටිස් වෙනවා. දැන් ඩැරල් උදේ ඉඳන් රෑ වෙනකන් බෝල අල්ලන්න පිට්ටනියට දුවනවා. ඔය විදිහට ගියා ම අපෙ කොමන් රූම් එක ලස්සනට පාළුවට යයි!" කියා ඇලීෂියා පැවසුවේ, මොලී ඩැරල් කැලසිල්ලට ගැනීම සම්බන්ධයෙන් සැහෙන ඉරිසියාවකින් ද යුක්තව ය.

"පාළුව අරින්න මෙහාට සෙරෙල්ඩා එනවා නේ!" යයි ඩැරල් උත්තර දුන්නාය.

පසු දින සෙරෙල්ඩා අටේ පන්තියට ආවාය. ඇය අත පැන්සල් පෙට්ටිය ද පාට පෙට්ටිය ද විය. අනෙක් දුවා ඇය ඊට පෙර දින මෙම පංක්ති කාමරයට මාරු කර තිබුණි. ඇය පංක්ති කාමරයට ඇතුල් වූයේ කිසිත් ගණනකට නොගත් සේ ය.

පංක්තියේ ළමයි ඇයට වෙනසක් නොකළහ. "සෙරෙල්ඩා, ඔයා සැලීගේ පුටුවේ වාඩි වෙන්න, එයා එනකං," යයි ඩැරල් කීවාය. "මෙතැන හරි හොඳයි."

"නෑ - සෙරෙල්ඩා, ඔයා ඇවිල්ලා මගෙ ළඟ වාඩි වෙන්න. මං කැමතියි ඔයා මගෙ ළඟ ඉන්නවට," යි ග්වෙන්ඩොලින් කීවාය.

ඇලීෂියා තියුණු බැල්මක් සෙරෙල්ඩා වෙත හෙළුවාය. සෙරෙල්ඩා ද පිළිතුරු වශයෙන් එසේ කළාය. ඇය හිස පහත් කර ගත්තේ හෝ කැලඹීමට පත් වූයේ හෝ නැත. අඩු ම වශයෙන් ඇයගේ මුහුණ රතු වී තිබුණේ ද නැත.

"එයාට ගානක් වත් නෑ," යි ඇලීෂියා සිතුවාය. එහෙත් සෙරෙල්ඩාට මෙම සිද්ධිය මහත් චිත්ත වේදනාවක් ගෙන නොදුන්නේ නොවේ. පහළ පංක්තියකට මෙසේ ඇද දමනු ලැබීම ඇයට දරිය නොහැකි නින්දවක් විය. ඇය මෙසේ නව වැනි පංක්තියෙන් අට වැනි පංක්තියට පහත හෙළනු ලැබීම කාටත් රහසක් නොවී තිබීම නිසා ඇය ලැජ්ජාව යටපත් කරගෙන

දුර්මුඛ ව තාඩන් මුහුණ දුන්නේ තමා තුළ තුබූ දැඩි ආත්මගෞරවය නිසා ය.

අවට ළමයින් තමාට කාරුණික වනු ඇතැ යි ඇ බලාපොරොත්තු නොවූවාය. එහෙත් ඔවුන් කාරුණික වී ඇය කෙරෙහි උපදවා ගන්නා ලද අනුකම්පාව නිසා ඔව වටහා ගත් ඇ ඒයින් ද පීඩා වින්දය.

“සෙරෙල්ඩා, ඔළුව උස්සාගෙන ඉන්න!” යයි ඇ තමාට ම කියා ගත්තාය. “ඔබ ඇමරිකානුවෙක්. එහි ජාතික කොඩියේ තරු හා ඉරි සිහියට ගෙන දිරිමත් වන්න!”

මේ අනුව කිසිත් ගණන් නොගත් විලසින් පෙර දින තබා සිය බඩු තැබූ ඩෙස්ක් එක වෙත ගිය ඇ ඒ මත පැන්සල් පෙට්ටිය ද පාට පෙට්ටිය ද තබා පළමු පාඩමට අවශ්‍ය පොත සොයන්නට වූවාය.

ඇයගේ මෙම හැසිරීම පංක්තියේ ළමුන්ගේ කෝපයට ද හේතු විය. ඔවුන් හොඳ හිතින් ම ඇය සුහද ව පිළිගෙන ඇයට වෙනසක් නොකර සිටීමට තීරණය කර, ඒ අනුව සූදානම් ව සිටියත්, ඇය ඒ කිසිත් නොතකා අහංකාර විලාසයෙන් පසු වීම ඔවුන් දුර්මුඛ කිරීමට හේතු විය. ඇයගේ වෙනසක් නැත. කොණ්ඩය සකස් කරමින් ඇ පෙරට වඩා චිත්ත ධෛර්යයෙන් යුතු ව පසු වූවාය.

සෙරෙල්ඩා මීට වඩා සංවේදී නොවීම ගැන ඩැරල්ට ද කරනා ගියේය. ඇය හිතේ ලැජ්ජාව, දුක හා වේදනාව යටපත් කර මේ පෙන්වන්නේ මවා ගන්නා ලද දිරියක් බව ඩැරල් වටහා ගත්තේ නැත.

පීටර්ස් මෙනෙවිය පුරුදු පරිදි කඩිමුඩියේ පංක්ති කාමරයට ඇතුල් වූවාය. මේරි ලූ දොර වැසුවාය. පංක්තිය පිරා බැලූ ගුරුවරිය “වාඩි වෙන්න!” යයි කී කල සියල්ලෝ වාඩි වූහ. ළමුන්ට නොපෙනුණ ද, පීටර්ස් මෙනෙවියගේ තියුණු බැල්මෙන් සෙරෙල්ඩාගේ මවා ගත් චිත්ත ශක්තිය බිඳ වැටිණ. ඇය පොත ගත්තේ වෙව්ලන අතින් ය. ඇයගේ කටහඬ ද වෙව්ලන ගතියෙන් යුතු විය.



පාඩම ආරම්භ විය. සෙරෙල්ඩා සිය කොණ්ඩය, නියපොතු හා ඇඳුම අමතක කර පාඩමට හිත යෙදවූවාය. ජීවිතයේ පළමු වරට ඇ ඇත්තට ම අධ්‍යාපනය ආරම්භ කළාය.

10

## බිල් සහ පීටර්ස් මෙනෙවිය

අට වැනි පංක්තියේ බොහෝ ශිෂ්‍යාවෝ දන් වාරයේ අධ්‍යාපන කටයුතුවලට හිත යොදවා මහන්සි වී ඉගෙන ගනිති. බෙටි නොමැතිකමින් ඇලීෂියාට, කෙසේ වුවද, හිතේ සන්සුන් ගතියක් නොමැත. බෙටි වෙනුවට ඩැරල් දන් ඇය හා මිත්‍රකම් පවත්වතත්, බෙටි සමග කළ හැකි දඟකාර වැඩ ඩැරල් සමග කළ නොහැකි ය. හොඳ ගති පැවතුම් ඇති, විශ්වාසවන්ත, යහපත් බාලිකාවන් වශයෙන් ඩැරල් අන් ශිෂ්‍යාවන්ට වඩා ඇලීෂියාගේ සිත් ගත්තමුදු, ඇය ද සැලී ආ කල ඇය හා පරණ පුරුදු මිත්‍රත්වය ඇති කර ගන්නා බව ඇලීෂියා දනී. ඒ නිසා බෙටිට පෙර සැලී පාසැල් නොඑන්නේ නම් මැනවි යි ඇලීෂියා සිතුවාය.

බිල් පසු වූයේ ද නොසන්සුන් ගතියෙනි. තන්ඩර් ගෙදර සිටිනා අතින් අසුන් ගැන දුකින් පසු වන බව සිතූ ඇ කොතෙකුත් ඌ බැලීමට ගියාය.

“ඔයා ඔය අශ්වයාට ඔච්චර හුරතල් කරන්නේ කොහොම ද?” යි ඇලීෂියා පිළිකුලෙන් මෙන් ඇසුවාය. “ඌට එහෙම හුරතල් කරන්න අවශ්‍ය ද?”

පීටර්ස් මෙනෙවිය බිල් කොතෙකුත් පංක්තියේ දී සිහින දකිමින් සිටින හැටි දැක කිහිප වතාවක් ම ඇය වෙත කඩා පැන්නාය. බිල් එක් එක් විෂයයට එක් එක් ආකාරයෙන් දක්ෂකම් හා දුර්වලකම් දක්වූවාය. ඇ සිය සහෝදරයන් සමග ගෙදර සිටිය දී ලතින් ඉගෙනගෙන තිබුණෙන් ලතින් භාෂාවට විශිෂ්ට දක්ෂකම් දක්වූවාය. එහෙත් ඇයගේ ප්‍රංශ දැනුම ප්‍රමාණවත් නොවිය.

එය මැම්සෙල්ගේ අප්‍රසාදයට හේතු වූයේය. ඇය ගණිතයට දක්ෂ නොවූයේ ගෙදර දී ඇයගේ සහෝදරයන්ගේ ගුරුවරයා ඔවුන්ට මිස ඇයට ගණිතය ඉගැන්වීමට නොවෙහෙසුණු හෙයිනි.

"බාලිකා විද්‍යාලවල එච්චර මැත්ස් උගන්වන එකක් නැ කියලා අපෙ ගුරුවරයා මට මැත්ස් ඉගැන්නුවේ නැ," යයි ඇ පීටර්ස් මෙනෙවියට කීවාය.

"මං එහෙම හිතනවා. ඒ හන්ද මෙහෙ දී ඔය ළමයට අමතර මැත්ස් පාඩම් ගන්න වෙයි," යයි ගුරුවරිය කීවාය.

"මට බැ, මිස්, මගේ විවේක කාලයෙන් හැම විනාඩියක් ම මට තන්ඩර් එක්ක කාලෙ ගත කරන්න ඕනැ."

තන්ඩර් යනු විල්හෙල්මිනා (බිල්) ගේ අසු බව පීටර්ස් මෙනෙවිය දත් දනී. පීටර්ස් මෙනෙවිය අසු දක ඌ ගැන උනන්දුවෙන් කතා කර ඇත. එය බිල්ගේ සතුටට හේතු වූයේය. අසු පිට යාමට බිල්ට ඇති මනා පලපුරුද්ද ද පීටර්ස් මෙනෙවිය මහත් සේ අගය කර ඇත. බිල් අසු පිට නැඟ යන විට ඇය ද අසුගේ ශරීරයේ ම කොටසක් මෙන් දිස් වෙයි. අසුන් පිටින් අන් බාලිකාවන් කිහිප දෙනා සමඟ ඇය තම අසු පිට නැඟ වටපිටාවේ සැරිසැරුවේ මහත් ආඩම්බරයෙනි. එහෙත් තමාට තනියෙන් අසු ගෙන යාමට ඉඩ නොලැබීම ගැන ඇ සිත් අමාරුවෙන් සිටියාය.

"ගෙදර ඉන්දදී මං කොච්චරවත් තනියෙන් අශ්වයා අරන් ඈතට යනවා. මං හැමදා ම වගේ අවුරුදු ගානක් එහෙම කරලා තියෙනවා. මෙහි දී ඇයි මට එහෙම ඉඩ දෙන්නෙ නැත්තෙ? තනියෙන් ගියා කියලා මට කරදරයක් වෙන්නෙ නැ," යි ඇ විරුද්ධත්වය ප්‍රකාශ කළාය.

"මං ඒ ඔක්කොම දන්නවා," යි පීටර්ස් මෙනෙවිය ඉවසිලිමත් ව පහද දෙන්නට වූවාය. "නමුත් ඔය ළමයා දන් ඉන්නේ ගෙදර නෙවේ - ඉස්කෝලේ. අනිත් ළමයි කරන්නා වගේ ඔය ළමයත් තනියෙන් නොයන්න පුරුදු වෙන්න ඕනැ. මෙහෙ රෙගුලාසිය ඒකයි. අනිත් ළමයින්ට එක නීතියකුත් ඔය ළමයට තවත් නීතියකුත් දන්න බැ."



"ඇයි බැරි!" යයි බිල් මුරණ්ඩු ලෙස ප්‍රශ්න කළාය. පීටර්ස් මෙනෙවියට තරහා ගියේය.

"ඔය ළමයා නොවේ නේ මැලෝරි ටවර්ස් පාලනය කරන්නේ! තමාට තියෙන්නේ මෙහෙ නීතිය අනුව කටයුතු කරන්න. විල්හෙල්මිනා, ඔය ළමයා තමංගෙ අශ්වයා ගැන එච්චර ම තකින්න හදනවා නම්, මට තියෙන්නේ ඔය ළමයා අශ්වයා බලන්න යන එක දවස් දෙක තුනකට තහනම් කරන්නයි."

බිල්ට තරු පෙනුණි. තම කන් අදහා ගත නොහැකි වූ විලසින් ඇ පීටර්ස් මෙනෙවිය දෙස බලාගෙන හිටියාය. ඇයගේ සර්වාංගය ම රත් වී ගියේය.

"නමුත්, මට තන්ඩර් නොදක ඉන්න බැ," යි බිල් අහිංසක වූමට තැත් කර කීවාය. "මිස් පීටර්ස් වුණත් අශ්වයන්ට ආසයි නේ. ඒ වුණත්, ඇයි මාව තේරුම් ගන්නෙ නැත්තේ? මට තන්ඩර් නොබලා ඉන්න බැ!"

"මට තේරෙනවා," යයි පීටර්ස් මෙනෙවිය ඇයට හොඳින් කරුණු පහද දෙන්නට වූවාය. "ඒ වුණාට මං ඕනෑවට වැඩිය අශ්වයන් හුරතල් කරන්ට යන්නේ නැ - ඔය ළමයා වගේ. මං උන් ගැන හිත හිතා, සිහින දක දකා, සුවඳ බල බලා, රෑ - දවාලේ හැම විනාඩිය ම උන් වෙනුවෙන් කැප කරන්නේ නැ - ඔය ළමයා වගේ. තේරුමක් ඇති ව වැඩ කරන්න. විල්හෙල්මිනා, මං ඔය ළමයා ගැන හොඳ ඉවසීමෙන් මෙච්චර කල් කටයුතු කළේ. තව දුරටත් ඔය ළමයගෙ විකාර මට බලන්න බැ. ඔය තන්ඩර් ගැන ම වෙහෙසෙන්නෙ නැතු ව, තමන්ගෙ ඉගෙනගැනීමේ කටයුතුවල යෙදෙනවා නම් හොඳයි."

එහෙත්, තන්ඩර් අමතක කිරීමක් බිල්ගෙන් සිදු නොවූ බව පංක්තියේ අනික් ළමයින්ට දක ගත හැකි විය. බිල් ලැක්රෝස් පුහුණුවීම සඳහා නොගියාය; අවට සිරි නැරඹීමේ ගමන් මගහැරියාය; පොදු කාමරයේ අමතර වැඩවල නොයෙදුණාය. ඇය එම වැඩ කරවා ගත්තේ මේරි ලූ ලවා ය.

අහිංසක, කරුණාවන්ත, බයාදු මේරි ලූ ඕනෑ ම කෙනකුට ඕනෑ ම උදව්වක් කිරීමට නිතර සූදානමින් සිටින්නිය. පොදු

කාමරයේ මල් බඳුන් සකස් කරමින් සිටි මේරි ය. දුටු ජීන්, එය ඇයගේ වාරය නොවන බව දැන, ඒ ගැන තරහින් ඇයගෙන් ප්‍රශ්න කළාය.

"ඇයි - ඔයා ඔය වැඩේ කරන්නේ? මේ සතියේ බිල්ගේ වාරය බව ලැයිස්තුවේ දක්කෙ නැද්ද?"

"මං දන්නවා, ජීන්," යයි ජීන්ගේ තියුණු හඬට බිය වී මේරි ය. උත්තර දුන්නාය. "නමුත්, බිල්ට අද්‍ත් තන්ඩර්ගෙ ඇඟ ශුද්ධ පවිත්‍ර කරන්න තියෙන හින්ද - ඒකට ගියා. ඊයේ ඌ ඇඟේ මඩ ගාගෙන - හොඳට ම."

"මට දැන් එපා වෙලා තියෙන්නෙ - මේ බිල්ගේ අශ්ව කුලප්පුව. කොච්චර වත් ඉස්කාලෙ ම තමා! පංක්තියේ ළමයි සහභාගි වෙන මොනම දේකට වත් එයා සහභාගි වෙන්නෙ නෑ. ඒ කරලා, තමංට පැවරිලා තියෙන වැඩ අනුන්ට පවරනවා. මං එයාට දෙකක් කතා කරන්නංකෝ!" ජීන් කීවාය.

පීටර්ස් මෙනෙවියට මෙන් ජීන්ට ද බිල්ගේ හිත වෙනස් කිරීමට හැකි නොවීය. බිල් මුළු ජීවිතය ම අසුන් සමග ගෙවා ඇති දැරියකි. පීටර්ස් මෙනෙවිය කියන්නා සේ, අසුන් ගැන සිතීම, සිහින මැවීම, උන්ගේ සුවඳ බැලීම, උන් ඇතිල්ලීම සහ උන්ගේ පිට උඩ යාම හැරුණු විට අන් කිසි දෙයක් කිරීමට බිල්ට නොහැකි ය.

හරි හැටියට පුහුණු වන්නේ නම්, ඇයට ලැක්රෝස් ක්‍රීඩාවේ දක්ෂ විය හැකි ය. ඇ සරඹ හා ජිම්නාස්ටික් ව්‍යායාමහි ද අති දක්ෂ වන්නිය. කාය සමබරතාවය රැකගෙන ඇය ශාරීරික අභ්‍යාසයන්හි යෙදෙන අපූරු අන්දම ගැන ජිම්නාස්ටික් උපදේශිකාව අතිශයින් සතුටට පත් ව, අන් අයට ද ඇය ගැන වර්ණනා මුඛයෙන් කතා කර ඇත.

සර්කස් සංදර්ශනවල තවටයන් මෙන් ශරීරය රෝදයක් මෙන් කරකවන්නටත්, අත් දෙකින් ඇවිදීමටත්, බලා ඉන්න අයට කැරකිල්ල හැදෙන තෙක් අත් හා කකුල් මාරු කරමින් පැන පැන යාමටත් ඇ පුදුම හපන්කමක් දක්වයි. උඩට පැන කරණම් ගසා දෙපයින් බිමට වැටීමටත් ඇ සමත් වන්නිය. එවැන්නක්



කිරීම අනතුරුදායක බැවින් ජිම්නාස්ටික් ගුරුවරිය අන් බාලිකාවන්ට එසේ කිරීම තහනම් කර ඇත. කඳ පොළොව මත සිට උඩ පැන කරණම් ගැසීමට සිසුවකු ඉදිරිපත් වූයේ ද නැත.

ගෘහස්ථ ක්‍රීඩාංගණයෙන් පිට දී පවා බිල් අත් දෙකින් ඇවිදින හැටි බැලීමට බාලිකාවෝ උත්සුක වූහ. ඉස්කාලයට නොගිය අවස්ථාවල බොහෝ සන්ධ්‍යාවන් හි ඇ තම මිතුරියන්ට මෙම හැකියාව ප්‍රදර්ශනය කර දක්වූවාය. බිල්ගේ සහජ හැකියාවන් මෙසේ බොහෝ වූයේය. එයින් ඇ උදම් නොවූවාය. ඇ නිහතමානී ලෙස තම දක්ෂකම් විදහා දැක්වූවාය. ගෘහස්ථ ක්‍රීඩාංගණයේ දී හෝ පිටත දී හෝ ඇය දැක්වූ දක්ෂකම් වලට ඇය ලැබූ ප්‍රශංසාවන්ගෙන් ඇ හිස උදුම්මා නොගත්තාය.

සෙරෙල්ඩා ද බිල්ගේ හපන්කම් ආශාවෙන් නරඹා පුදුමයට පත් වූවාය. මෙවන් සුවිශේෂ ශාරීරික කුශලතාවයක් ගැහැනු ළමයකුට තිබීම ගැන ඇයට සිතා ගත නොහැකි විය. බිල්ට ඇත්තෙන් ම පිස්සු දැයි ඇ සිතුවාය. එහෙත් ඇ බිල් ප්‍රිය කළාය. කවුරුත් ඇය ප්‍රිය කළ නමුත්, තමන් සමග විවිධ කටයුතුවලට සහභාගි නොවී, ඇය කොතෙකුත් ඉස්කාලයට ගොස් සිටීම ඔවුන්ගේ මනාපයට හේතු නොවීය.

බෙලින්ඩා තන්ඩර් චිත්‍රයට නැගුවාය. තන්ඩර්ගේ චිත්‍ර සිහිපයක් ම ඇයගෙන් නිර්මාණය විය. කාටුත් චිත්‍ර ඇඳීමට මෙන් ම සතුන්ගේ චිත්‍ර ඇඳීමට ද ඇයට තිබුණේ පුදුම නිපුණත්වයකි. තන්ඩර්ගේ චිත්‍ර දුටු බිල් අතිශයින් සතුටට පත් වූවාය.

"බෙලින්ඩා, මේ චිත්‍ර නම් අපූරුයි, අන්තිම ලස්සණයි! මේවා මට දෙන්න."

"බෑ," යයි බෙලින්ඩා කීවාය. "මට මේවා තියා ගන්න ඕනෑ - මං සත්තුන්ගෙ චිත්‍ර ඇඳලා එකතු කරනවා නේ," කියා ඇ ඒවා සිය මල්ලට දමා ගත්තාය.

"එහෙනම්, බෙලින්ඩා, මට වෙන ම චිත්‍ර ටිකක් ඇඳලා දෙන්න - මගෙ තන්ඩර්ගේ. ඔයාට පුළුවන්, බෙලින්ඩා! මං ඒවා රාමු කරලා මගෙ කන්තාඩි මේසේ උඩ තියා ගන්නං." බිල් කන්නලව් කළාය.

"දාගේ - බිල්, දනටමත් ඔයාගේ කන්තාඩි මේසේ උඩ අණ්ඩයන්ගේ එක එක ෆොටෝ හයක් විතර තියෙනවා. තේ තවත් තන්ඩර්ගෙ පින්තූරයක් තියන්න ඉඩ නෑ නේ?"

"තියෙනවා. මං ඔයා ඇඳල දෙන පින්තූරෙ ඉස්සරහින්, හරි මැද ම තියනවා. ඔයා මට කියන දෙයක් මං කරලා දෙන්නං - ඔයා මගෙ තන්ඩර්ගෙ ඩ්‍රෝවිං එකක් කරලා දුන්නොත්." බිල් යළිත් බැගෑපත් වූවාය.

"කොහෙඹමල! ඔයා මොනවා හරි කරනවා නම් කරන්නේ තන්ඩර්ට විතරයි. ඔයා ඇඟිල්ලක් උස්සලා කාටවත් මොනවා හරි කරලා දෙන්නේ නෑ. වෙන එකක් තියා, ඔයාගෙ වැඩක් වත් ඔයා කරන්නෙ නෑ - තන්ඩර්ගෙ වැඩ ඇරුණා ම."

"මං එච්චර ම නරක ද?" යි පසු බා සිටි බිල් ඇසුවාය. "මං ගැන ඔයාලා එහෙම ද සිතන්නේ?"

"ඇත්තෙන් ම - ඔව්." බෙලින්ඩා කීවාය. "ඔයාට භාරදීලා තියෙන වැඩත් ඔයා අනිත් අයට පවරනවා. ජීන් ඔයාට ඒ ගැන දෙස් පවරනවා, මං අහගෙන. ඒ වුණාට, මේරි ලූ දිගට ම ඔයාගෙ වැඩ කරලා දෙනවා. ඒ හින්ද, මං ඔයාට තන්ඩර්ගෙ චිත්‍රයක් ඇඳලා දෙන්නෙ නෑ. මොකද - මං එහෙම ඇඳලා දුන්නොත්, ඔයා කරන්නේ, ඉස්කෝලෙට නොයන වේලාවට - කොච්චර වත් ඒ චිත්තරේ දිහා බලාන ඉන්න එකයි. එතකොට - අපි කාටත් ඔයා ගැන වැඩියෙන් නරහා යනවා."

බෙලින්ඩා කතාව නතර කර දිග හුස්මක් ගත් විලාශයට බිල් හිතුවේ ඇය කුපිත වී යමක් කරනු ඇතැ යි කියා ය. එවිට බිල්ට කරුණු තේරුම් ගියේය.

"ඔව් - බෙලින්ඩා, ඔයා හරි තමා. මං අකැමති වුණත්, ඔයා කීවෙ ඇත්ත," යයි ඇ අවංක ලෙස ප්‍රකාශ කළාය. ඔයා කියන විදිහට, ඔයා මට තන්ඩර්ගේ චිත්‍රයක් ඇඳලා දුන්නොත්, මං කොච්චරවත් උඩට නැගලා ඒක දිහා බල බලා ඉඳීවි. ජීන් මට එද දෙස් නැගුවට පස්සේ, මට තේරුණා, ඒ වාගෙ ම දූක හිතුණා, මේරි ලවා මගෙ වැඩ කර ගන්නවාට. මං එයාට කියන්නම් මං ලබන සතියෙ ඉඳං මගෙ වැඩ කරනවා කියලා. එයාගෙ වැඩ වුණත් මං කරන්නම් - ලබන සතියේ."



"හරි, මං ඔයාට තන්ඩර්ගෙ ලස්සණ පින්තූරයක් ඇඳලා දෙන්නම් - ඔයා උගෙ පිට උඩ නැගලා ඉන්න විදිහට - ඔයා කැමති නම්. හැබැයි, ඔයා තමන්ගෙ වචනෙ කියන්න ඕනැ. නමුත්, ඔයා එහෙම නොකරොත්, මං ඒ පින්තූරෙ ආපහු ගන්නවා."

බිල් සිනාසුණාය. ඇ බෙලින්ඩාට කැමති ය. අයිරින්ට ද කැමති ය. ඔවුන් සිහි කල්පනාව නැති ව කොතරම් විකාර වැඩ කළත්, ඔවුන්ගේ වැඩ වලින් කාටත් විනෝදයක් ලැබිය හැකි ය. ඔවුන්ගෙන් කිසිවකුටත් හානියක් සිදු නොවේ. බිල්ට ඇති තන්ඩර්ගේ ඡායාරූප එතරම් හොඳ නැත. තන්ඩර්ගේ හොඳ චිත්‍රයක් ඇය උදක් ම පතා සිටි දෙයකි. දන් බෙලින්ඩාගෙන් තමාට එය ලැබෙනු ඇත!

බිල් මේරි ලූ ගේ වැඩ කොටස ද ලබන සතියේ කර දීමට යන බව ඇසීමෙන් ජීන් සතුටට පත් වූවාය. ඇය වෙනස් වූයේ තමා ඇයට දෙස් පැවරීමේ ප්‍රතිඵලයක් වශයෙන් යයි ඇ සිතුවාය.

බෙලින්ඩා, පොරොන්දු වූ පරිදි, තන්ඩර්ගේ ලස්සණ චිත්‍රයක් ඇඳ බිල්ට දුන්නාය. කළු පාටින් අඳින ලද එම චිත්‍රයේ දක්වුණේ, අශ්වයා පිට යාමට අඳින හීන් සකුල් සහිත දිග කලිසමකින් හා කහ පාට ජර්සියකින් සැරසී, බිල් තන්ඩර්ගේ පිට උඩ නැග සිටින අන්දම ය. බිල් බලවත් සේ ප්‍රීතියට පත් වූවාය. එම චිත්‍රය රාමු කර ගැන්ම සඳහා ඇ වහා ම මේරි ලූ සමඟ කඩ විදියට ගියාය. එහි දී ඇයට රාමුවක් මිල දී ගත නොහැකි විය. එබැවින්, කන්තාඩි මේසය තුළ වූ රාමුවකින් එහි වූ ඡායාරූපය ඉවතට ගෙන, ඒ වෙනුවට ඇ බෙලින්ඩා ඇඳ දුන් චිත්‍රය එම රාමුවට දැම්මාය.

කවුරුත් එම චිත්‍රය වර්ණනා කළහ; අගය කළහ. "බිල්, මේක මතක තියා ගන්න. මේක තව ම ඔයාගෙ නෙවේ. මං මේක ඔයාට ණයට දුන්නා කියලා හිතා ගන්න," යි බෙලින්ඩා කීවාය. "ඔයා තමංගෙ වැඩ නොකර හිටියොත් හරි, අපෙ පන්තියෙ අපිත් එක්ක කරන්න තියෙන දේවලට සහභාගි නොවුණොත් හරි, මං මේක ආපහු ගන්නවා."

පසු පටන් බිල් තමාගේ හා තම පන්තියේ වැඩ වලින් යම්කිසි තරමක් කිරීමට උනන්දු වූව ද, ඇය පීටර්ස් මෙනෙවියගේ සිත් දිනාගැනීමට තරම් වෙනස් වූයේ නැත. ඈ පන්තියේ වාඩි වී ජනේලයෙන් ඉවත බලාගෙන කල්පනාවේ යෙදීම අත් නොහළාය. තම නම විල්හෙල්මිනා බව අමතක කළාය. ඈ දවල් සිහින දකිමින්, මැම්සෙල්ගේ සහ පීටර්ස් මෙනෙවියගේ පාඩම්වලට අවධානය යොමු නොකර ඔවුන්ගේ අප්‍රසාදයට පත් වූවාය.

මැම්සෙල් ඇය ගැන තදින් ම කලකිරුණාය. "මේ මෙයාගෙ අඩු ගානේ ගරු-සරු ගතියක් වත් නෑ. මං එයාට කිව ම, 'දවල් හීන දකින්න එපා - විල්හෙල්මිනා,' කියලා, එයා ඇහුණෙ නෑ වගේ උත්තරයක් වත් නොදී ඉන්නවා. එයා කවරදාවත් ප්‍රන්ස භාෂාව ඉගෙන ගන්න එකක් නෑ. එයා දන්නෙ - ප්‍රන්ස භාෂාවේ වචන වලින් ලේ ෂෙවල් (අශ්වයා) කියන වචනෙ විතරයි - මං හිතන්නේ!" යයි ඈ පීටර්ස් මෙනෙවියට පැමිණිලි කළාය. "ඒ ළමයා මයෙ දිහා හැරිලා බලන්නෙ, මං 'තන්ඩර්' කියලා එයාගෙ අශ්වයාගෙ නම කියන කොට විතරයි. මං 'තන්ඩර්!' කිවා ම එයා ටක් ගාලා හැරිලා බලනවා. එයා පිස්සු කෙල්ලක්! ඉංග්‍රීසි කෙල්ලෝ ඔක්කොම පිස්සියෝ තමයි. නමුත් මේ ළමයා නම් පිස්සියන්ගෙන් පිස්සියක්!"

පීටර්ස් මෙනෙවිය බිල්ට දඬුවම් කරන්නට වූයේ බිල්ට ඉතාමත් නුරුස්නා අන්දමිනි. "මෙන්න - මැත්ස් පාඩමට ඔය ළමයා දුන්නු පිළිතුරු! ආයෙ සැරයක් හරියට පිළිතුරු ලියලා මට දීලා මිසක් ඔය ළමයා තන්ඩර් බලන්ට යනවා එහෙම නෙවේ!"

එසේ නැත්නම්, පීටර්ස් මෙනෙවිය මෙසේ ප්‍රකාශ කරයි. "විල්හෙල්මිනා, ඔය ළමයා අද උදේ පන්තියේ දී ඇහුම්කන් දුන්නේ නෑ. ඒ හින්ද - ඔය ළමයට අද දවසෙ ම ඉස්තාලෙට යාම තහනම්!"

බිල්ට එවිට තරහා යයි; ඈ තවත් මුරණ්ඩු වෙයි; අකීකරු වෙයි. මේ ලෝකේ කවුරුත් එපා කිවත් තන්ඩර් බලන්නට යන එක ඇය නතර කරන්නේ නැත. පීටර්ස් මෙනෙවිය එපා කියන නිසා ඇය කොහෙත් ම නොගිහින් සිටින්නේ නැත. එබැවින්, පීටර්ස් මෙනෙවිය නියම කළ දඬුවම්වලට පාත්‍ර නොවී



ඈ හිතුණු හිතුණු වේලාවට තන්ඩර් බැලීමට ගියාය. ඇයගේ මෙම නොපනත්කම් ඊත්ගේ ද අප්‍රසාදයට හේතු විය.

බිල් මෙසේ අකීකරු වෙති යි පීටර්ස් මෙනෙවිය සිහිනෙන් හෝ සිතුවේ නැත.

"මේ ලෙඩි ම ඔයා මිස් පීටර්ස්ගේ අතට ම අහු වෙයි, බිල්. එතකොට ඔයාට තරු පෙනෙයි. ඔයා නම් මහා මෝඩියක්!" යයි ඇලිෂියා කිවාය.

බිල් සහ ඇයගේ අශ්වයා නිසා ද, සෙරෙල්ඩාගේ විකාර හැසිරීම නිසා ද, අයිරීන් ගේ සහ බෙලින්ඩාගේ සිහි මද ගතිය නිසා ද, මාවිස්ගේ ඔපෙරා පිස්සුව නිසා ද පීටර්ස් මෙනෙවියට දනුණේ මුළු විද්‍යාලේ ම එපා කරපු පංක්තිය තමාට අයත් වූ ලෙස ය. "මේ ඔක්කොම තෝන් ටවර් එකේ කෙල්ලෝ!" යයි ඈ තමාට ම කියා ගත්තාය. "මට ඇත්තෙන් ම මිස් පොටිස් ගැන දුක හිතෙනවා. හවුස් මිස්ට්‍රස් වශයෙන් මේ අයගෙ නාටගම් කොහොම ඉවසනව ද දන්නෙ නෑ - මිස් පොටිස්. එයාට පිස්සු හැදෙන්නෙ නැතුව ඇති! දං මං බලන්න ඕනෑ, විල්හෙල්මිනා භූගෝල පාඩම ආයෙත් ලියලා මට ගෙනත් දෙන්නෙ කොයි වේලෙ ද කියලා. එහෙම ගෙනත් දීලා මිසක් එයා අශ්වයා බලන්ට යනවා නෙවේ!"

# 11

# ඇලිෂියාට පාර්සලයක් ලැබේ

දවස් ගෙවී ගියේය. ශීතල ගතිය තව ම පහව් නැත. පොදු කාමරයේ ගිනි උදුන ළඟ සිටිය ද, විදුලි උණුසුම් උපකරණය ළඟ සිටිය ද මාවිස්ට සීතල දරා ගත හැකි නොවීය.

"ඔයාට තියෙන්නේ ජිම්නේසියම් එකේ ඉඳන් ව්‍යායාම ගන්නයි, එහෙම නැත්නම්, ලැක්රෝස් සෙල්ලම් කරන්නයි," යයි ඩැරල් ඇයට කීවාය. ඩැරල් දන් පෙරට වඩා යෝධසම්පන්න ව හා

සතුටින් කල් ගෙවන්නීය. ඇයගේ මුහුණ රෝස පැහැයෙන් බබළන්නේය. මොලීගෙන් අමතර වශයෙන් ලැක්රෝස් පුහුණුව ලැබීමට ඉඩ ලැබෙන සෑම අවස්ථාවක ම ක්‍රීඩා පිටිවනියට යාම ඇයගේ පුරුද්ද ය. දිනෙන් දින ඇ ක්‍රීඩාවේ දියුණුවක් ලබයි. ඒ බව ඇ දනී. ඇය පන්දු අල්ලන හැටි විශිෂ්ට යයි මොලී කියා ඇත.

ග්වෙන්ඩොලින් පුරුදු පරිදි ඩැරල්ට මරවා බැලුවාය. ශීතල දරා ගත නොහැකි ව කොහොමත් ඇය සිටින්නේ මුහුණ පැඟිරි කර ගෙන ය. ගෙදර දී ලබන උණුසුම පාසැලේ එළිමහන් වාතාවරණය යටතේ ඇයට නොලැබේ. අධික ශීත නිසා ඩැරල්ගේ ඇගේ ගඩු එකක් හෝ පැදී නැති බව දකීම ඇයගේ කෝපයට හේතු විය. පින්නෙන් හා තුෂාරයෙන් පිරි එළිමහනට බැස සතුටින් ලැක්රෝස් ක්‍රීඩාවේ යෙදීමට ඩැරල් දුවගෙන යන සැටි බලා සිටීම ග්වෙන්ඩොලින්ගේ ඇහැට කටු අනිස්නාක් මෙන් විය.

බෙලින්ඩා ග්වෙන්ඩොලින්ගේ පිටුපසින් හොරෙන් හොරෙන් අවුත් ඇයට නොපෙනෙන තැනක සිට ඇයගේ රූප අඳින්නට වූවාය. තමා රවාගෙන සිටින බව ග්වෙන්ඩොලින්ට දැනුණේ නැත. බෙලින්ඩාගේ පැන්සල ඉක්මනින් ක්‍රියාත්මක විය. මාවිස් ග්වෙන්ඩොලින්ට වැලමිටෙන් ඇන්නාය.

"ආන්, බෙලින්ඩා ආයෙත් පටන්ගෙන!"

ග්වෙන්ඩොලින් වහා ම හැරී බැලුවාය; මුහුණේ තපුරු බැල්ම ඉවත් කර ගැන්මට උත්සාහ කළාය. එහෙත් ක්‍රෝධයෙන් සිටින විට රවා ගත් ගතිය ඉවත් කළ නොහැකි ය.

"බෙලින්ඩා, අහකට යන්න! ඔයා මාව අඳින්න ඕනෙ නෑ," යි ග්වෙන් නුරුස්නා ගතියෙන් යුතු ව කීවාය. "මට මගෙ පාඩුවේ ඉන්ට දෙන්න. ඔයා හොරෙන් හොරෙන් ඇවිල්ලා කරන ඔය වැඩේට මං කැමති නෑ."

"මං මේ ඔයා ගැන උනන්දුවක් දක්වනවා විතරයි. ඔයා රවන කොට නියමයි. මුළු ඉස්කෝලෙන් ම කැතට ම රවන්න පුළුවන්නෙ ඔයාට - මං හිතන්නේ. අනේ, තව හොඳට රවන්න, ග්වෙන්ඩොලින්. එතකොට මට ඔයා ලස්සණට අඳින්න පුළුවන්."



ග්වෙන් රැවීම නතර කළාය. ඊට පැහෙන්න මහන්සියක් දැරීමට ඇයට සිදු විය.. බෙලින්ඩා නියවා සිටියාය.

"අනේ - අපේ ග්වෙන්ඩොලින් හොඳට ම කරහා ගිහිං ඉන්නේ. එයාට හොඳට ම ඕනෑකම තිබුණත් කවද වත් හැකි විදිහට රවාගෙන ඉන්න - එයා රවන්නෙ නෑ නේ! කමක් නැහැ - මං වෙන දවසක බලන්නම්!"

මෙසේ කියා බෙලින්ඩා පිට ව ගියාය. කවුරුත් සිනාසුණහ. ග්වෙන්ගේ ඇස්වල කඳුළු පිරිණ. ඇයට ඕනෑ ම වෙලාවක අඬන්නට හැකි ය. බෙලින්ඩා කොපමණ නරක ද! මෙතැනින් පිට ව ගොස් කන්නාඩිය ඉදිරියේ රවා බලන්නට ග්වෙන්ඩොලින්ට සිතුණේය. එවිට, තමාගේ රැවිල්ලේ ඇති විශේෂත්වය ඇයට ම බලා ගත හැකි වේ. ඇයගේ රැවිල්ල මාවිස්ගේ හෝ බිල්ගේ හෝ එරැවිල්ලට වඩා වෙනස් නැත. එහෙත් බෙලින්ඩාට අවශ්‍ය ව ඇත්තේ ග්වෙන්ඩොලින්ට වදේ ගැහීමට ඇයගේ රැවිල්ල උපයෝගි කර ගැන්මට ය.

ලැක්රෝස් පුහුණුවෙන් පසු ඩැරල් ආපසු ආවාය. "අනේ - මේ - මං කියන්නං. මං තුන් වැනි මැච් ටීම් එකේ රිසර්ව්! මං තුන් වැනි රිසර්ව්! ඒකත් ඇති!" යි ඇ මහන්සියෙන් හා සතුටින් රතු වූ මුහුණින් යුතු ව පැවසුවාය.

"මොකද්ද රිසර්ව් කියන්නේ?" යයි සෙරෙල්ඩා ඇසුවේ, ඩැරල්ගේ ප්‍රීතියෙන් පිරි මුහුණ අනුව එය ලොකු තත්ත්වයක් යයි සිතා ය.

"ඒ කියන්නේ - මං අතිරේක ක්‍රීඩිකාවක්. මැච් ටීම් එකෙන් ගර්ල්ස්ලා තුන් දෙනෙක් නැති වුණා ම, මං ඒ තුන් වැනියාගේ තැන ගන්නවා," යි ඩැරල් පහද දුන්නාය.

"තුන් වැනි අතිරේක ක්‍රීඩිකාවට සෙල්ලං කරන්න අවස්ථාවක් ලැබෙන්නේ නෑ. ඒක කවුරුත් දන්නවා. ඒ හින්ද වැඩි බලාපොරොත්තු තියන්න එපා!" යයි ඇලිෂියා කීවාය.

"මං එහෙම ම බලාපොරොත්තු තියන්නේ නෑ," යි ඩැරල් පැවසුවාය. "ඇලිෂියා, ඔයත් මේ අමතර පුහුණුව ලබන්න

උන්නොත්, මොලි හරි හොඳයි. නුගාක් මහත්සි වෙලා ගෙනාවනවා."

"ඒ මහත කැත මොලී ද!" යි සෙරෙල්ඩා කොඳුරා ගත්තා සිටියාය. "ශී - මට නං එයා දිහා බලන්න වත් හිතක් නැහැ."

මෙවැනි දෙයක් පැවසීමෙන් සෙරෙල්ඩා කළේ මෝඩ ක්‍රියාවකි. ඩැරල් සහ ජීන් ඇතුළු අනෙකුත් ලැක්රෝස් ක්‍රීඩකාවෝ මෙයින් උරණ වූහ. මොලීගේ හැඩ-රුව කොහොම වුවත්, ඉත් වැඩක් නැත. ඇ ඉතා හොඳ ක්‍රීඩා නායිකාවකි. මැලෝරි ටවර්ස් ලේරුදු ගණනක් තිස්සේ දිනාගත් තරග සංඛ්‍යාවට වඩා තරග සංඛ්‍යාවක් ඇයගේ නායකත්වය යටතේ දිනාගැනීමට මේ දක්ෂා සමත් වී ඇත.

"එයා මහත වෙන්න පුළුවන්. නමුත් එයා කැතයි - හැඩ නෑ කියලා කියන්න බෑ. එයාට හයියෙන් දුවන්න පුළුවන් එයා ඒ වගේ ම ශක්තිමත්," යයි ඩැරල් වේගවත් ස්වරයෙන් කියා සිටියාය.

"එයා හැඩ නෑ කියලා මං කියනවා!" සෙරෙල්ඩා යළිත් කීවාය. "පෙරේද එයා තරප්පු පේළිය දිගේ පහළට බහිනවා මං දැක්කා. ඉස්සරෝ ම මට දැනුණේ හුම්කම්පාවක් වගෙයි; සද්දෙ ඇහෙන කොට, බැලින්නම්, ඒ එයාගෙ තඩි කකුල් පඩිවල වදින සද්දේ! ඔයාට මොලි හොඳ වෙන්න පුළුවන්. මට එයාගෙන් ඇති වැඩක් නැහැ. නිකං මස්ගොඩ විතරයි! හැඩ නෑ!"

"එතකොට ඔයාගෙ හැඩ විතරයි - මොළේ නෑ!" ඇලීෂියා කීවාය. "කොච්චර හොඳ ද! ඇමරිකාවට හොඳයි සෙරෙල්ඩලා! නමුත් මෙහාට වැඩක් නෑ!"

සෙරෙල්ඩා හොඳට ම ලැජ්ජා වී තොල හපා ගත්තාය. අනිත් අය හුස්ම නොහෙළා බලා සිටියහ. දෙදෙනා අතර ගැටුමක් ඇති වේ යයි ඔවුහු බිය වූහ. එහෙත් එවැන්නක් සිදු නොවිය.

"මං හිතනවා - මං විහින් ම අහගන්න දෙයක් ඒක!" යයි මුරණ්ඩු ලෙස පැවසූ සෙරෙල්ඩා නැගිට යළිත් කිසිත් නොකියා කාමරයෙන් පිට ව ගියාය.



කවුරුන් කිසිවක් නොකීහ. කවුරුත් සදු වූයේ අසහනයෙනි. සෙරෙල්ඩාට හොඳින් සිටීමට ඔවුන් තීරණය කර තිබිය දී ඇයට ඇනුම් පද කීම හරි නැති ය. අනෙක් අතට, සෙරෙල්ඩාගේ ක්‍රියා කලාපය අනුන්ගේ සිත් රිදවනසුලු ය. එනිසා ඇය එසේ අසා ගැනීම ඇයගේ වරදින් ම සිදු වන්නකි.

"කෝ, බිල්?" යයි ඩැරල් ඇසුවේ මාතෘකාව වෙනස් කිරීමට ය.

"කොහෙ ඉන්නවා කියල ද ඔයා හිතන්නේ?" බෙලින්ඩා කීවාය. "මෙලහකට ඉස්තාලයේ කැම දෙනවා ඇති!"

"මං නං හිතන්නේ නෑ," යයි ජීන් පැවසුවාය. "එහෙම කරනවා නම්, ඒක තද අකීකරුකමක්. එහෙම කරලා අහු වුණොත්, එයා මහ අමාරුවේ වැටෙයි. මං එයාට හොඳට තරුණු පහදලා දුන්නා, මිස් පීටර්ස් එක්ක හැප්පෙන්නෙ නැතුව එයා එක්ක හොඳින් ඉන්න කියලා; එයාට කීකරු වෙලා ඉන්න කියලා. නමුත් බිල් මං කියන දේ ඇහුවේ නෑ. මං ගලකට කතා කරා නම් ඔයිට වඩා හොඳයි."

"එයා කියන්නෙ තන්ඩර් ලෙඩ වෙලා කියලයි." මේරි ලූ කීවාය.

"හිතෙන් මවාගෙන!" යයි ඇලීෂියා කීවාය. "එයා එහෙම කියන්නේ, එතකොට නිතර නිතර ඉස්තාලෙට රිංගලා අශ්වයා බලන්න පුළුවන් නේ!"

"නෑ - මට නං විශ්වාසයි තන්ඩර් ලෙඩ වෙලා කියලා. එයා දනගෙනයි එහෙම කියන්නේ," යි මේරි ලූ සිහින් හඬින් කීවාය. "බිල් හරි හිතේ අමාරුවෙන් ඉන්නේ - තන්ඩර් ගැන."

"එහෙනං, එයා ඇයි මිස් පීටර්ස්ට කියලා පශු වෛද්‍යවරයෙක් ගෙන්නා ගන්නෙ නැත්තෙ?" අයිරීන් ඇසුවාය.

"එයා එහෙම මිස් පීටර්ස්ට කියන්න ගියොත්, මිස් පීටර්ස් එහෙ බව දන්නවා - කොහොම ද එයා තන්ඩර් අසනීපයෙන් බව දනගත්තේ කියලා." මේරි ලූ පැහැදිලි කළාය. "එතකොට නුඹා නෙල්වලට ගින්දර ගන්නේ!"

"ඊළඟට 'සුටු - සුසු' ගාලා ශබ්දයක් ඇවිල්ලා, මිස් පීටර්ස් දුමත් එක්ක උඩ යයි!" බෙලින්ඩා කීවාය. ඉන්පසු ඈ පැන්සල ගෙන පීටර්ස් මෙනෙවිය දුම සමග උඩ යන හැටි අඳින්නට පටන් ගත්තාය.

කවුදෝ පොදු කාමරයේ දොර අස්සෙන් හිස ඇතුළට දමා, "ඇලිමියා, ඔයාට තැපැලෙන් පාර්සලයක් ඇවිල්ලා!" යයි කීවාය.

"ජූසියි!" කියා ඇලිමියා එය භාර ගැනීම සඳහා කාමරයෙන් පිට වූයේ, "ආ - මන් දන්නවා මගෙ ගෝඩ් මදර් (මෑන්දා) මට චොකලට් එවලා! හැම වාරෙක ම මට එහෙම එවනවා," කියා ය.

ඇය පිට ව ගිය පසු චිත්‍රය අවසන් කළ බෙලින්ඩා එය වටේට යැව්වාය. සියල්ලෝ ම එය බලා සිනා හඬ නැගූහ. එම චිත්‍රයේ දක්වුණේ පීටර්ස් මෙනෙවිය දුම වටකරගෙන අහසේ පාවෙන අන්දම ය. දුම අස්සෙන් විදුලිය කොටන අන්දම ද දක්විණ.

"නියමයි!" ඩැරල් කීවාය. "මටත් ඔයාට වාගේ අඳින්න පුළුවන් නං කියලා හිතෙනවා. මට නං ඔය වගේ දෙයක් බැහැ. ඔයා නං හරි වාසනාවන්තයි, බෙලින්ඩා."

"ඔව් - අනේ, මට ඒක වත් ඇති!" යයි කියමින් බෙලින්ඩා චිත්‍රය අතට ගෙන එය තවත් අලංකාර කරන්නට වූවාය. "මට අඳින්නත් බැරි වුණා නම් මං මොනවා කරන්න ද මන්ද, මං කාලකණ්ණි වෙයි! සංගීතය බැරි නං අයිරින් වුණත් කාලකණ්ණි වෙයි!"

"මගෙ කටහඬ හොඳ නැත්නම් මාත් කාලකණ්ණි වෙයි," යයි මාවිස් එක් වූවාය.

"ඔව්, ඔයා අයිරින්ටයි බෙලින්ඩටයි වඩා දහ ගුණයක් කාලකණ්ණි වෙයි," යයි ජීන් කීවාය. "මං කියන්ට ද - ඒ මොකෝ කියලා. කටහඬ හොඳ නැත්නම්, ඔයාගෙ ගන්ට ම දෙයක් නැති හන්ද! අයිරින් - සංගීතයෙන් දක්ෂ වාගෙ ම ගණිතයටත් දක්ෂයි, ලැක්රෝසුත් හොඳට සෙල්ලම් කරනවා. එයා ඒ වගේ ම විනෝද වෙන්නත් දන්නවා - බෙලින්ඩා



වගේ. එතකොට බෙලින්ඩත් චිත්‍රකර්මයට අමතර ව තවත් තුනක් දේවලට දක්ෂයි. නමුත් ඔයා - නිකම් ම කටහඬක් විතරයි! ඒකත් නැති වෙන්න, ඔයා මෙහෙ ඉන්නව ද කියල වත් කාටත් දැනෙන්නෙ නැති වෙයි!"

"මං මොනවා කරන්න ද මගෙ හැම දේට ම වැඩිය කටහඬ හොඳ වුණාට," යයි ආත්ම තෘප්තියෙන් යුතු ව මාවිස් කීවාය. "මගෙ කටහඬ ඔයාලට කැපී පෙනෙන එක මගේ වැරැද්දක් නෙවෙයි. මං ඔපෙරා ගායිකාවක් වුණා ම - මං කරන්නේ...."

මේ වචන ටික ඇසෙත් ම, එය සංඥාවක් ලෙස ගෙන, බාලිකාවෝ මහා හඬින් කතා කරන්නට පටන් ගත්හ. මාවිස්ගේ ගිරා හඬ වැසෙන සේ මොනවා හරි හයියෙන් කතා කිරීමට ඔවුහු පුරුදු ව සිටියහ. එසේ මහා හඬින් කතා කරන ගමන් ඔවුහු ඇයගේ තරහා ගිය මුහුණත් කුඩුකේඩු බැල්මත් දෙස බලා සිනාසෙන්නට ද පුරුදු ව සිටියහ.

ඔවුන්ගේ සමච්චලය නොතකා සිටීමට ඈ හිතට ගත්තාය. "මං ටිකක් ලොකු වෙනකං හිටපල්ලා. එතකොට මට පුළුවන් මගේ කටහඬින් මට කොච්චර ලොකු දෙයක් කරන්න පුළුවන් ද කියලා කාටත් පෙන්නන්න," යි ඈ හිත යටින් කියා ගත්තාය. තමාගේ අසහාය වූ කටහඬින් මුළු ලෝකය ම අත්‍යානන්දයට පත් කිරීමට ඈ ඉටා ගත්තාය. තමාගේ පවුල මෙන් ම තමාගේ සංගීත ගුරුවරුන් ද තමාගේ කටහඬ ගැන පුදුම වනු ඇත! තමාගේ අනාගතය ගැන අනාවැකි කීමට ඔවුන් පසුබට නොවනු ඇත! ඒ කාලය එළඹෙන තෙක්, මෙම අට වැනි පංක්තියේ සාමාන්‍ය ළමයින් සමග වුව ද එකට සිට ඉවසීමෙන් කාලය ගත කළ යුතු ය!

ඇලිමියා සිය පාර්සලය ද අතැ'ති ව එතැනට ආවාය. "මේක - මං හිතුවා වගේ - මගෙ ගෝඩ් මදර්ගෙන් නෙවේ. ඒ හින්ද, බලාපොරොත්තු ඇති කරගෙන මං වටේට රොක් වෙන්න එපා. මේක සැම්ගෙන්."

සැම් යනු ඇයගේ සහෝදරයන්ගෙන් කෙනෙකි. ඔහු නියම වැදගැම්මකට නැති මගෝඩියෙකි. ඔහුගේ තක්කඩි වැඩ ගැන අසා මෙම පංක්තියේ කිසිවකු විඩාවට පත් ව නැත.

"මොනවා හරි විගඩම් සෙල්ලමක් ද - කවුරුහරි අමාරුවේ දාන්න?" යි ඩැරල් උනන්දුවෙන් ඇසුවාය. "ඇලීෂියා ඔයා හුඟක් කාලෙකින් ට්‍රික් එකක් ප්ලේ කරේ නෑ නේ. මං හිතනවා මේ එවල තියෙන්නේ හොඳ එකක් කියලා!"

ඇලීෂියා පාර්සලය විවෘත කළාය. එයින් එළියට ආවේ කුඩා පෙට්ටියකි. එය බිමට වැටුණි. බෙලින්ඩා එය අහුලාගෙන පරීක්ෂා කර බැලුවාය. එහි පිටත යමක් ලියා තිබුණි.

එහි ලියා තිබුණේ, "කිඹුහුම් අරින්න - ළමයිනේ - කිඹුහුම් අරින්න!" කියා ය.

"මොකද්ද මේකේ තේරුම?" ඩැරල් කුතුහලයෙන් ඇසුවාය. "අපි මේක ඇරලා බලමු!"

"එහෙනම්, ටිකක් පරෙස්සමින්!" කියා පාර්සලය තුළ වූ ලිපියක් අතට ගත් ඇලීෂියා, "ඕකේ තියෙන දේවල් බිමට වට්ටන්න එපා. ඒවා හුඟාක් වටින්න පුළුවන්," යයි ද කීවාය.

ඩැරල් පෙට්ටිය විවෘත කළාය. එය තුළ වූයේ අඟල් භාගයක් පමණ විෂ්කම්භය ඇති සුදු පාට පැතැලි පෙති වගයකි. "මොනව - ද මේ?" ඩැරල් කීවාය. "එතකොට මොකද්ද මේ පෙට්ටිය පිටින් ගහල තියෙන වචනවල තේරුම - කිඹුහුම් අරින්න කියලා නේ තියෙන්නේ?"

ඇලීෂියා සැමිගේ ලියුම කියවන ගමන් තනියෙන් සිනාසෙන්නට වූවාය. "මෙන් - මේක අහගන්නකෝ! සැම් නම් නියම මගෝඩිස් කෙනෙක් තමා! මේ පෙති හදලා තියෙන්නේ සැම්ගෙ පංක්තියේ ළමයෙක්! ඒ ළමයා එක එක දේවල් නිෂ්පාදනය කරන්න පුළුවන් හපනෙක්! අපට තියෙන්නේ මුඩියක් වගේ පුංචි භාජනයක් ඇතුලේ මේ පෙත්තක් තියලා, ඒක උඩට ලුණු වතුර ස්වල්පයක් වක්කරලා පෙඟෙන්න ඇරලා - එහෙම ම තියෙන්න අරින්නයි. පැය භාගයක් ගියා ම ඒ පෙත්තෙන් - දුමක් - වාෂ්පයක් වගේ දෙයක් පිට වෙනවා. ඒ වාෂ්පය නහයෙන් ඇතුළට ගියා ම - හුස්ම ගන්න කොට - නතර කරන්න බැරි තරමට කිඹුහුම් යනවලු! එහෙමයි මේකෙ තියලා තියෙන්නේ."



කවුරුත් හයියෙන් සිනාසෙන්නට වූහ. "සැම් කියනවා, එයා මේ වැඩේ කරා ලූ ඩ්‍රෝවිං මාස්ටර්ට. ඒ ගුරුවරයා හතළිස් තුන් වාරයක් කිඹුහුම් ඇරලා තියෙනවා. ළමයි ඒක ගණන් කරලා තියෙනවා. මරු ජෝක් එක නේ!" ඇලීෂියා නැවතත් සිනාසෙන්නට වූවාය.

"අපි මේ ජෝක් එක මිස් පීටර්ස්ට දමු!" යයි බලවත් ප්‍රීතියට පත් ඩැරල් යෝජනා කළාය.

පීටර්ස් මෙනෙවිය හතළිස් තුන් වතාවක් කිඹුහුම් යවන හැටි දක්නට ලැබීම ආකර්ෂණීය දර්ශනයක් විය හැකි බැවින්, කවුරුත් මෙම යෝජනාවට එකඟ වූහ. ඇලීෂියා ලියුම අග දක්වා කියවූවාය. "මේකේ ලියලා තියෙනවා, මොන ම හේතුවක් නිසා වත්, එක වරකට එක පෙත්තකට වැඩිය පාවිච්චි කරන්න එපා කියලා. මොකද කියනවා නම්, වැඩියෙන් වාෂ්ප නහයට ගියොත් ප්‍රතිඵල භයානකයි කියලා. මේකේ හැටියට මේ වාෂ්ප ක්‍රියාත්මක වෙන්නේ බිම ඉඳන් අඩි හතරකට උඩින්. ඒ හන්ද, අපි මේක පන්තියේ දී පාවිච්චි කළා ම, මිස් පීටර්ස් දිගට-හරහට කිඹුහුම් යවන්න පටන් ගත්තත්, වාඩි වෙලා ඉන්න අපට කිඹුහුම් යන්නේ නෑ."

"මේක නම් නියම ට්‍රික් එකක්! නියමයි කියන්නේ, ඇලීෂියා - කියලා වැඩක් නෑ! අපි මේ ට්‍රික් එක කොහොම හරි කරමු," යයි ඩැරල් පෙරට වඩා උනන්දුවෙන් කීවාය. "මිස් පීටර්ස් හච්ං යවන කොට මං හිනාවෙලා මැරෙයි! එයා හච්ං යවන්නෙ මහා හයියෙන්. ඉස්කෝලෙ වෙන කාටත් වඩා මහා හයියෙන්."

"කෝකට වුණත්, අපි ඕනෑවට කලින් හිනා වෙන්න හොඳ නෑ; වැඩියෙන් හිනාවෙන්නත් හොඳ නෑ; මිස් පීටර්ස්ට සැක හිතෙන්න පුළුවන්," යයි ඇලීෂියා කීවාය. "මං නං හිතන්නෙ නෑ - එයාට අපිව සැක හිතන්න පුළුවන් වෙයි කියලා - එයා විතරක් කිඹුහුම් යවද්දී!"

දැන් මුළු පංක්තිය ම මහත් ආශාවෙන් බලාගෙන සිටින්නේ එම මොහොත එළඹෙන තෙක් ය. මෙතෙක් මෙම පංක්තියේ කිසිවකු හෝ පීටර්ස් මෙනෙවිය හාස්‍යයට ලක් කිරීමට ඉදිරිපත්

ඒ නැත. මන්ද - ඇය විහිළු-තහළුවට අකැමැති, සැර ගතියෙන් යුත් තැනැත්තියක වන බැවිනි. ඇයට තරහා ගිය හොත් කැඩිලි දඬුවම් දීමට ඈ පෙළඹෙන්නීය. එහෙත් මෙම කට්ටකය නොවරදිනසුලු ප්‍රයෝගයකි!

"මේක අපට හෙට ම කරන්න පුළුවන් ද?" ඩැරල් ඇසුවාය.

"නෑ - අපි ඉමු මැත්ස් ටෙස්ට් එකක් වාගේ අපි කැමති නැති දෙයක් තියෙන දවසක් එනකං. එතකොට - මිස් පීටර්ස් හුඟාක් කිවිසුම් යවන්න පටන් ගන්න ම, එයාට විභාගෙ තියන්න බැරි වෙයි!"

## 12

## කාලය ගෙවී යයි

රෝග නිරෝධායන කාලය අවසන් වූ පසු සැලී පාසැලට ආවාය. මෙය ඩැරල්ගේ මහත් ප්‍රීතියට හේතු වූයේය. සැලී නොමැති ව ඇය කල් ගෙවුවේ සැහෙන පාළු ගතියකිනි. ඈ සැලී වැළඳගෙන පිළිගත්තාය. දෙදෙනා ම එක වර කතා කරන්නට වූහ.

"ආපහු ඉස්කෝලෙට එන්න මං කොච්චර නොඉවසිල්ලෙන් ද හිටියෙ! දන් හරි. වාරේ පටන් ගන්න කොට ම එන්න බැරි වුණ එක මගෙ හිතට හරි දුකක්! මොනවා කරන්න ද? බෝවෙන ලෙඩ හැදුණ ම නියම කාලේ ඉවර වෙනකං ම ගෙදර ඉන්න එපායැ!"

"ඕ - සැලී, ඔයා නැති එකේ පාළුව මට හොඳට දැනුණා. මට හුඟාක් ජාති තියෙනවා - ඔයාට කියන්න."

"ඔයා ලියුම්වල ලස්සණ විස්තර ලියලා එවලා තිබුණා. මං හරි ආසයි - සෙරෙල්ඩයි - අනිත් අලුත් ළමයා බිල් නේ - එයයි දක ගන්න."



පංක්තියේ කවුරුත් සැලීගේ පැමිණීම නිසා සතුටට පත් වූහ. ඇලීෂියාට පමණක් එය සතුටට කරුණක් නොවීය. සැලී නොමැති නිසා ඩැරල්ගේ ඇසුර ලබා ගැනීමට ඇලීෂියාට හැකි විය. දන් ඩැරල් සැලීගේ ඇසුර ලබන විට තමාට ඩැරල්ගේ මිත්‍රත්වය අහිමි වනු ඇත.

එනිසා ඇලීෂියා සැලී පිළිගත්තේ එතරම් සතුටින් නොවේ. එමෙන් ම තමා ඩැරල්ගේ මිතුරිය වී සිටින බව පෙන්වීමට ද ඈ උත්සාහ කළාය. ඇයගේ බලාපොරොත්තුව වූයේ ඉදිරියටත් ඩැරල්ගේ මිත්‍රත්වය තමාට ලැබෙන බව අඟවා සිටීමට ය. එහෙත් දින කිහිපයක් යන තෙක් ඇලීෂියා අමතක කර, ඩැරල් සැලී සමග පුරුදු මිත්‍රත්වය පවත්වාගෙන ගියාය.

ඩැරල්ට සහ සැලීට අන්‍යොන්‍ය වශයෙන් හුවමාරු කර ගැන්මට බොහෝ තොරතුරු තිබුණි; සාකච්ඡා කිරීමට බොහෝ කරුණු තිබුණි. සෙරෙල්ඩාගේ පැවැත්ම ගැනත්, ඇය නව වන පන්තියේ සිට අට වැනි පංක්තියට පහත හෙළන ලද අන්දම ගැනත් අසා සැලී මවිතයට පත් වූවාය. බිල් සහ ඇයගේ අශ්වයා ගැන ද, ඇය ජිම්නාස්ටික් ක්‍රීඩාවන් හී දක්වන කුශලතා ගැන ද සැලීට දනගැන්මට ලැබිණ. ඔපෙරා ගායිකාවක වීමට පුරසාරම් දොඩන මාවිස් සමග කටයුතු කිරීම පෙරට වඩා අසීරු වන බව ඈ වටහා ගත්තාය. ග්වෙන්ඩොලින් මෑතක සිට සෙරෙල්ඩා පසු පස යන අන්දම ගැන හා සෙරෙල්ඩා ඇය එතරම් ගණනකට නොගන්නා අන්දම ගැන අසා සැලීට හිනා ගියේය.

"ඕ, ඩැරල්, ආපසු ඉස්කෝලෙට එන්න ලැබුණා ම මට ඇති වුණු සන්තෝසෙ කියලා නිම කරන්න බෑ. මට ගෙදෙද්දී කොච්චර වත් මතක් වුණා පංක්තිය ගැන; මැම්සෙල් දුපොං එක්කයි, මැම්සෙල් රූෂියර් එක්කයි ඔයාලා කොහොම වැඩ කරනවා ද කියන එක ගැන; ලැක්රෝස් ක්‍රීඩාව ගැන! ඔය එක එක දේ ගැන මතක් වෙන කොට මට ඉගිල්ලිලා එන්න හිතුණා!"

"හරි, දන් ඔයා කොහොම හරි ආවා නේ!" ඩැරල් පැවසුවාය.

"ඔයා එනකං මං ඇලීෂියා එක්ක වැඩියෙන් ආශ්‍රය කළා -

පාළුව යන්නත් එක්ක. බෙටී තව ම නැති හින්ද, එයාටත් පාළුයි නේ."

ඩැරල් ඇලිෂියා සමග මිත්‍රවීම සැලීගේ සතුටට හේතු නොවීය. ඇයට ඒ ගැන ඉරිසියාවක් ඇති වූයේය. සැලීගේ එක දුර්වලකමක් තමා ඉරිසියාව. ඇය එයින් මිදෙන්නට තැත් කළ ද, එය යළි යළිත් මතු විය. ඩැරල් ඇලිෂියා හා පවත්වාගෙන ආ මිත්‍රත්වය ක්‍රම ක්‍රමයෙන් අඩු කළ ද, සැලීට අවශ්‍ය වූයේ ඩැරල්ගේ ඇසුර සම්පූර්ණයෙන් ම තමා වෙත යොමු කරවා ගැන්මට ය.

මේ අනුව, සැලී ඇලිෂියා ගැන නොතැකුවාය. ඇලිෂියා සැලී නොතකා හැරියාය. ඩැරල් මේ ගැන දුක් වූවාය. ඩැරල් බලාපොරොත්තු ව සිටියේ සැලී පාසැලට ආ කල, බෙටී එන තෙක් සැලී ද ඇලිෂියා සමග ආශ්‍රයට යොමු කර ගැන්මට ය. ඇලිෂියා සම්පූර්ණයෙන් ම අමතක කිරීම සාධාරණ නොවන බව ඩැරල්ගේ හැඟීම විය.

ඇලිෂියාගේ අලුත් ම ප්‍රයෝගය ගැන ඩැරල් සැලීට කියා සිටියාය. එහෙත් සැලී එය අනුමත කළේ නැත.

"මිස් පීටර්ස්ට එහෙම ට්‍රික් එකක් කරන එක හරි නැ නේ! අනික එයා කොහොම හරි හොරේ අල්ලාගෙන, තරහා ගිහිං මොන විදිහේ දඬුවමක් දෙයි ද දන්නෙ නැ - මුළු පන්තියට ම! කොහොමත් මං කැමති නැ - ඔය දිගින් දිගට ම කිසිඹුම් යන තත්ත්වෙකට කෙනෙක් පත් කරන්න. ඒක අනතුරුදායක වෙන්නත් බැරි නැහැ."

"අයියෝ - සැලී, මං හිතුවා ඔයත් අපි වාගේ මේ විහිළුවට කැමති වෙයි කියලා. ඒක එච්චර ලොකුවට ගණන් ගන්න දෙයක් නෙවේ. මං හිතනවා - ඔයා ඒ ට්‍රික් එකට කැමති නැත්තේ - ඒක ඇලිෂියාගේ එකක් හින්ද කියලා."

මෙයින් සැලීගේ හිත රිදුණේය. "හරි - හරි, ඔයා මං ගැන එහෙම හිතනවා නම්, හිතා ගන්න! ඔයා හිතන්නෙ, මං ඇලිෂියාට ඉරිසියයි කියලා නේ. මං එහෙම නෙවේ. මං දන්නවා ඔයා මච්චර ම ඇලිෂියාට කැමති මොකද කියලා. එයා හරි



ජොලියි, දෙනවන්තයි, විනෝදකාමියි, කඩිසරයි. ඔය හැම දෙයක් ම එයාට තියෙනවා. මට නැ නේ!"

විළඟට හිත අමාරු කර ගත්තේ ඩැරල් ය. "ඔයා හරි මෝඩ කතා නේ කියන්නේ, සැලී. ඔයා හොඳට ම දන්නවා - මං ඔයාගෙ හොඳ ම මිතුරිය කියලා. මායි ඇලිෂියයි කිට්ටුවෙන් හිටියේ - ඔයයි බෙටියි දෙන්න ම නැති හන්ද. ඒක තේරුම් අරං, අනවශ්‍ය ප්‍රශ්න මතු කරන්නෙ නැතිව ඉන්නකෝ."

"හරි - එහෙනං, මං එහෙම නොකර ඉන්නංකො." සැලී හිත හදාගෙන කීවාය. එහෙත් ඊර්ෂ්‍යාව කියන දෙයට එරෙහි ව සටන් කිරීම ලෙහෙසි කාර්යයක් නොවේ. එය පරාජය කිරීම ඊටත් වඩා අසීරු ය. කොතරම් උත්සාහ කළ ද, ඇලිෂියා කෙරෙහි ඇති වූ නුරුස්නා ගතිය සැලීගේ හිතෙන් පහ ව ගියේ නැත. ඇය ඇලිෂියාට තරහා ගතිය පෙන්වා සිටි කල, ඇලිෂියා කළේ ඇය තවත් තරහා ගන්වනු වස් ඩැරල්ට වඩාත් කුලුපග වීම ය.

"ඇයි ඇලිෂියා සැලී ඉස්සරහ දී මට මෙච්චර යහපත් වෙන්නේ!" යයි ලැක්රෝස් පුහුණුවට යද්දී ඩැරල් සිතන්නට වූවාය. "එතකොට, සැලී මොකද මච්චර ම වෙනස් වෙන්නේ! එයා ඉරිසියා බව මං දන්නවා. නමුත් ඉරිසියාව කියන දෙයට කෙනෙක්ව මච්චර ම වෙනස් කරන්න පුළුවන් ද?"

ඩැරල් ඊර්ෂ්‍යා සහගත කෙල්ලක් නොවේ. ඇයගේ ස්වභාවය එයයි. එනිසා සැලීගේ ආකල්පය ඇයට වටහා ගත හැකි නොවීය. සැලීගේ ආකල්පය මෙන් ම ඇලිෂියාගේ ආකල්පය ද ඈ විග්‍රහ කර බැලුවාය. ඇලිෂියා ප්‍රිය නොකළ සැලීට අවශ්‍ය වූයේ ඩැරල්ගේ අවධානය සම්පූර්ණයෙන් ම තමා වෙත යොමු කර ගැන්මට ය. ඇලිෂියාගේ අදහස වූයේ සැලී ආ නිසා ම, ඩැරල් සමග පැවැති තමාගේ මිත්‍රත්වය සම්පූර්ණයෙන් ම අහෝසි නොවිය යුතු බව ය. තුන් කොන් මිත්‍රත්වයක් පවත්වාගෙන යාමේ වරද කිම? බෙටී එන තෙක් ඇය බලාපොරොත්තු වූයේ එවැන්නකි.

"මට තියෙන්නේ ඔය දෙන්නා ගැන ම නොහිතා ඉන්න

එනයි," යයි ලැක්රෝස් බෝලය අතට ගෙන කරකවා වේගයෙන් වෙනත් ක්‍රීඩිකාවක වෙත යවන ගමන් ඩැරල් සිතුවාය. ලැක්රෝස් පිටියේ දුවමින්, පන්දු යවමින් හා පන්දු අල්ලමින් සිටි ඇයට මෙම මිත්‍රත්ව හමය අමතක විය.

මොලී රොතලඩිසන් ඩැරල්ගේ ක්‍රීඩා කෞශල්‍යය ගැන පැහැදුණාය. ඇය ක්‍රීඩා කරන විලාශය පමණක් නොව, මෙම ක්‍රීඩාවට ඇය තුළ වූ උනන්දුව ද ඇයගේ සිත් ගති. ඇය කිසිදු පුහුණු වාරයක් මඟහැරියේ නැත. තද ශීතල හා තද සුළං පැවතිය දී පවා ඇ පුහුණුව සඳහා පැමිණියාය. මොලීට මීට වඩා සිත් ගත් කැපවීමක් ක්‍රීඩිකාවකගෙන් බලාපොරොත්තු විය හැකි නොවීය.

"ඩැරල් රිවර්ස්, අපේ තුන් වැනි ටීම් එකේ තුන් වෙනි අතිරේක ක්‍රීඩිකාව විදිහට ඔයාව තෝරා ගෙන තියෙන්නේ. මං ඒ බව අද හවස නෝටිස් බෝඩ් එකෙත් දනවා. ඔයාට ඔපහාම් යන කොට ටීම් එකේ ප්ලේ කරන්නත් හම්බු වෙයි. ඒ හින්ද, තව ප්‍රැක්ටිස් කරන්න. මේ වාරේ හුඟක් දෙනා අසනීප වන හන්ද, ස්ථිර ක්‍රීඩිකාවෝ කිහිප දෙනෙක් ම අයින් වෙන්න බැරි නෑ," යි පුහුණුව අවසානයේ පිට්ටනියෙන් පිට ව යන ගමන් මොලී ඩැරල්ට පැවසුවාය.

"ඕ, මොලී, ඔයාට බොහොම ස්තූතියි!" යයි සතුටින් ඉපිල ගිය ඩැරල් කතා කළේ අපහසුවෙන් ය. "මං හැම ප්‍රැක්ටිස් එකකට ම එනවා. ඔයා කියන විදිහට වැඩ කරනවා - හිම වැටුණත් කමක් නෑ. ඔයා මට ලොකු සේවයක් කරන්නේ!"

"නෑ, මං හිතන්නෙ අපෙ ටීම් එක ගැන. ඔයා දක්ෂ හින්දයි ඔයාට තැන ලැබෙන්නේ. පළමු ව රිසර්ව් විදිහට ටීම් එකට ආවාම, පස්සෙ ස්ථිර තැනක් ගන්න පුළුවන්."

ඩැරල් මහත් ප්‍රීතියෙන් කල්පනා සයුරේ පීනමින් දුවගෙන පාසැල් ගොඩනැගිල්ලට ඇතුල් වූවාය. වාසනාවට මෙන් මෙදා ඇය කොරිඩෝරයේ දී මැම්සෙල්ගේ ඇඟේ හැප්පෙන්නට ගියේ නැත. නව වැනි පංක්තියේ ශිෂ්‍යාවෝ කිහිප දෙනෙක් පමණක් ඇය එනු දැක අයින් වී ඈත බේරා ගත්හ.



"ඩැරල් රිවර්ස්, ඔයාට පිස්සු ද?" ලූසි ඇසුවාය.

"නෑ, ආ - පොඩ්ඩක් වෙන්න පිස්සු තමා - මං තුන් වෙනි මැච් ටීම් එකේ තුන් වෙනි රිසර්ව් විදිහට තෝරාගෙන තියලා ආරංචි වුණාට පස්සේ. මොලී දැන් මට කිව්වා."

"ඒක හොඳයි," යයි එලන් කිව්වාය. "මගේ සුබ පැතුම්! මං තවයේ හිටියත් මට නම් කවදාවත් බෑ මැච් ටීම් එක අහලකටවත් එන්න."

එලන් සමග සිටි අනික් බාලිකාවෝ ද ඩැරල්ගේ පිටට තට්ටු කර සතුට ප්‍රකාශ කළහ. ඩැරල් තම පංක්තියේ පොදු කාමරයට කෙළින් ම ගියේ තම යෙහෙළියන්ට මෙම සතුටුදායක පුවත දන්වා සිටීමට ය.

"මේ එනවා කුණාටුව!" යයි ඇලීෂියා කිව්වාය. "අනේ, ඩැරල් විගහට දොර වහන්න. මගෙ කකුල් දැනටමත් ශීතලට හිරිවැටිලා!"

ඩැරල් දොර වසා, කියවමින්, මහමින් සහ සෙල්ලම් කරමින් සිටි තම පංක්තියේ ළමුන් අමතා, "කෙල්ලනේ, මම තර්ඩ් රිසර්ව්! මොලී ඒක දැන් නෝටිස් බෝඩ් එකෙත් දාන්න යනවා," යයි දන්වා සිටියාය.

ඩැරල් ලැක්රෝස් ක්‍රීඩාවේ හපන්කම් දැක්වීම ගැන මෙතෙක් අගයක් නොකළ ඇලීෂියා මේ අවස්ථාවේ, සැලීට විදවීම සඳහා, වහා ම ඉදිරියට පැන, ඩැරල්ගේ පිටට තට්ටු කර, ඇය මහා ජයග්‍රහණයක් කළ බවක් පිළිගත් අයුරින් සුබ පැතුවාය. ඊළඟට ජීන්, අයිරින් සහ බෙලින්ඩා ද ඇයට සුබ පැතූහ. මේරි ලූ ද සිහින් හඬින් සිය සතුට ප්‍රකාශ කර සිටියාය. සෙරෙල්ඩා සිනාසී සතුටු වූ බවක් පෙන්වා සිටිය ද, සිත යටින් ඇය සැලකුවේ එය සුළු දෙයක් ලෙස ය.

ඇලීෂියා ඩැරල් ළඟට වී සිටියේ සැලීට මහ අහුරා සිටියාක් මෙන් ය. ඩැරල් ඇලීෂියාගේ සුබ පැතුම භාරගත් හිතවත් විලාශය සැලීගේ හිත් ගත්තේ නැත. "මේ කෙහෙම්මල් ඇලීෂියා හින්ද, මට ඩැරල්ට කියන්ට තියෙන දේවත් කියා ගන්න විදිහක් නෑ," යයි ඇ තමාට ම කියා ගත්තාය.

තමා බලාපොරොත්තු වූ පරිදි සැලී සතුට ප්‍රකාශ කිරීමට ඉදිරියට නොපැමිණීම ගැන ඩැරල් පුදුම වූවාය. "ඔයාට සන්තෝෂ නැද්ද - සැලී? මේක අපේ පන්තියට ම ගෞරවයක් නේ!"

"ඇත්තෙන් ම, මං සන්තෝෂයි," යයි සැලී පැවසුයේ හදවතේ පිරී ඉතිරියාව නිසා බාල වූ සතුටකින් යුතුව ය. ඩැරල්ට ද එය තේරුණේය. තමා වාරයේ දවස් ගණනක් ගෙවී ගිය පසු පාසැලට පැමිණීමෙන් තමාගේ නිසි තැන තමාට අහිමි වූ ගතියක් සැලීට දැනිණ.

ඩැරල් පිළිබඳ දැන්වීමට එහායින් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය වූ වෙනත් දැන්වීමකින් අට වැනි පංක්තියේ ශිෂ්‍යාවෝ යළිත් කැළඹීමට පත් වූහ. ඉංග්‍රීසි ගුරුවරිය වන හිබර්ට් මෙනෙවිය 'රෝමියෝ ජුලියට්' නාට්‍යයේ පෙරහුරුවක් පවත්වන බවත්, අවේ පංක්තියේ ශිෂ්‍යාවන් කලාගාරයට රැස්විය යුතු බවත්, එහි දී ඒ ඒ චරිතයන් සඳහා සුදුසු අය තෝරා ගනු ලබන බවත් එම දැන්වීමේ සඳහන් වූයේය.

"මොනවට ද!" යි ග්වෙන්ඩොලින් එම දැන්වීම හෙළා දුටුවේ, හිබර්ට් මෙනෙවිය මීට පෙර ඇයගේ රඟපෑම් හෙළා දක තුබු බැවිනි. "මං හිතුවා එයා නාට්‍ය අමතක කරලා කියලා. නිකං කාලේ නාස්ති කිරීමක්!" යයි ග්වෙන්ඩොලින් ප්‍රකාශ කළාය.

"නෑ - එහෙම නෙවෙයි," යයි සෙරෙල්ඩා කීවාය. ඇයට මෙම දැන්වීම මහත් සන්තෝෂයක් ගෙන දුන්නේය. "රඟපාන්න ලැබෙන එක කොච්චර වාසනාවක් ද! මට ඒක ලස්සනට කරන්න පුළුවන්. මං ලේඩි මැක්බත්ගේ චරිතය රඟපෑවේ..."

"ඔව්, ඒක අපි දන්නවා. අපි ඒක කී පාරක් අහලා තියෙනව ද!" යයි ඩැෆ්නි හරස් වූවාය.

"ඩැෆ්නි ඔයත් හරි ආසා ඇති නේ ලොකු පාට් එකක් රඟපාන්න," යයි ඇලීෂියා කීවාය. "ඔයාට හිතට අමාරු එහෙම නොලැබෙන එකයි. කොහොම වුණත්, සෙරෙල්ඩා ඔය කියන තරමට රඟපාන්න දක්ෂ නම්, එයාට පුළුවන් ජුලියට්ගේ භූමිකාව



රඟපාන්න - ඔය ඇමරිකන් විදිහට වචන උච්චාරණය කරන්නෙ නැත්නම්!"

සෙරෙල්ඩා කිය වී බලා සිටියාය. "ඔයා හිතනව ද, මං කතා කරන විදිහට මට හොඳ පාට් එකක් හම්බු වෙන්නෙ නැති වෙයි කියලා?"

"ඔව්, මට හිතන්න බෑ - ෂේක්ස්පියර්ගේ ජුලියට් ඇමරිකන්කාරියක් විදිහට කතා කරයි කියල," යයි ඇලීෂියා පැවසුවාය. "කොහොම වුණත්, ඔබට හොඳට රඟපාන්න පුළුවන් නම්, ඒ පාට් එක ඔයාට නොලැබෙන්න හේතුවක් නෑ."

පසු ගිය දින කිහිපයේ මඳක් පසුබස්නා ගතියෙන් පසු වූ සෙරෙල්ඩා, රෝමියෝ - ජුලියට් නාට්‍යයේ රඟපෑමට අවස්ථාවක් පැදීගෙන එන බව දැන, යළිත් ප්‍රාණවත් වූවාය. ඇ යළිත් හැඩ-වැඩ වීමට මහත් පරිශ්‍රමයක් දැරුවාය; පැය ගණන් කන්නාඩිය ඉදිරියේ කාලය ගෙව්වාය; එමෙන් ම, ඇමරිකානු උච්චාරණයෙන් මිදී ඉංග්‍රීසිකාරියක සේ ඉංග්‍රීසි ශබ්ද කිරීම පුරුදුවීමට පටන් ගත්තාය.

මෙය පංක්තියේ ළමයින්ගේ විනෝදයට හේතු වූයේය. මීට පෙර ඉංග්‍රීසින් ඉංග්‍රීසි උච්චාරණය කරන හැටි ඇයගේ සමච්චලයට භාජනය විය. එය මෝඩ විදිහක් ලෙස සැලකූ ඇ තම උච්චාරණ ක්‍රමය වෙනස් කිරීමට නොවෙහෙසුණාය. දැන් ඇය සැමෝට ම කරදර කරන්නට වූයේ ඔවුන් කතා කරන විදිහට කතා කරන්නට තමාට ද උගන්වන ලෙස ය.

"හොඳයි - එහෙනං, "වනර්ෆුල්" කියන්නේ නැතිව "වන්ඩර්ෆුල්" කියන්න - "ඩ" යන්න බර කරලා. එතකොට, "ට්වෙනි ෆෝර්" කියන්නේ නැතිව "ට්වෙන්ටි ෆෝර්" කියලා කියන්න - "ටි" අකුරත් එකතු කරලා. "ස්ටාප්" කියලා කියන්නෙ නැතිව "ස්ටොප්" කියලා කියන්න. "ෂාප්" කියලා කියන්නෙ නැතුව "ෂොප්" කියලා කියන්න!" යයි ඩැරල් කීවාය.

සෙරෙල්ඩා ඉංග්‍රීසින් ඉංග්‍රීසි කතා කරන අන්දමට උච්චාරණය පුරුදු වීමට වෙහෙසීම පීටර්ස් මෙනෙවියගේ විමතියට හේතු වූයේය. ඇය පංක්තියේ වැඩ කෙරෙහි ද පෙරට වඩා උනන්දුවක්

දක්වීම ඇයගේ ප්‍රසාදයට හේතු වූයේය. එහෙත් තම රූ සුවුසු නුවූ ගස්වා ගැන්මට ඇය කළ විකාර පිටර්ජ් මෙකොලියගේ කෝපයට හේතු වූයේය. එමෙන් ම බාලිකාවක මෙන් තොරු නුරූපිකා ලෙස කැපී පෙනෙන්නට ඇය නිතර ම සැදී පැළඳීම ද ඇයගේ පිළිකුලට හේතු වූයේය.

"දන් මං නික්කවෝම පෙන්නන්නංකෝ මගේ හපන්කම්," යයි ජූලියට්ගේ භූමිකාව අධ්‍යයනය කරමින් ඈ තමාට ම කියා ගත්තාය. "මං හොඳ ම චිත්‍රපට නිළියක් වෙන්ට සුදුසු කියලා ජීවී නිකමට නෙවේ කියලා ඒ අයට දන් පේන්වයි!"

# 13

# සෙරෙල්ඩාගේ අවාසනාවන්ත පෙරහුරුව

පාසැල් නාට්‍ය සංවිධානය කිරීමෙහි දී හිබර්ට් මෙනෙවිය බොහෝ සෙයින් මහන්සි වූවාය. ඒ ඒ පංක්තියේ මෙයින්ට වෙන වෙන ම පුහුණුව ලබා දී ඈ ඉතා සාර්ථක ප්‍රතිඵල ඇඹුවාය. මෙවර ඇය නාට්‍ය උගන්වන්නට යන්නේ අට වැනි පංක්තියේ ළමුන්ට ය. නාට්‍ය පෙන්වීමට නියමිත ව ඇත්තේ වාර අවසානයේ ය. මෙවර ප්‍රන්ස නාට්‍යයක් රඟදක්වීමට නොලැබීම ගැන ශිෂ්‍යාවෝ සතුටට පත් ව සිටියහ. ප්‍රන්ස නාට්‍යයක් රඟදක්වීමේ දී උද්ගත වූ ප්‍රධාන ප්‍රශ්නය වූයේ මැම්සෙල්ලා දෙදෙනාගේ පරස්පර විරෝධි අදහස් ය. ඒ, එක එක චරිත සඳහා ශිෂ්‍යාවන් තෝරා ගැනීමෙහිදී ය.

"මිස් හිබර්ට් එක පාරින් ම එයාට ඕනෑ නිළියෝ තෝරා ගනියි ද?" සෙරෙල්ඩා ඇසුවාය.

"නෑ, එහෙම නෙවේ; එයා හැමෝට ම අවස්ථාවක් ලබා දෙනවා ඒ ඒ චරිතවල රඟපාලා තමන්ගේ හපන්කම් පෙන්වන්න," යයි ඩැරල් කීවාය. "එහෙම කරලා තමා මිස් හිබර්ට් සැම චරිතෙකට ම නියම සුදුස්සා තෝරා ගන්නේ.



නාට්‍යයේ හැම චරිතයක් ගැන ම හැමෝට ම එකෙක් නියම අවබෝධයක් ලැබෙනවා."

"ශී - ඒක නං වනර්නුල් - මං කියන්නේ - වන්ඩර්ෆුල්! මම ජූලියට්ගේ චරිතෙ හොඳට ඉගෙනගෙන තියෙන්නේ. ඒක හරි ලස්සණ චරිතයක්. මං ඒ චරිතේ දෙබස් ටිකක් කියන්න ද?"

"මේ - මේ - මං මේ ලැක්රෝස් ප්‍රැක්ටිස් වෙන්ට යනවා," ඩැරල් කීවාය. "ඔයා ඇලීෂියාගෙන් අහන්න. මේ වෙලාවේ එයාට වැඩක් නෑ."

එහෙත් සෙරෙල්ඩාගේ ජූලියට් භූමිකාව රස විඳීමට ඇලීෂියා කැමති නොවූවාය. ඈ පුටුවෙන් නැගිට්ටාය. "මට පොඩි වැඩකට යන්ට තියෙනවා, සෙරෙල්ඩා. මං දන්නවා ඔයාට ඒක පුළුවන් කියලා, වනර්නුල් විදිහට."

"මං අහගෙන ඉන්නං, සෙරෙල්ඩා," යයි ඇමරිකානු ශිෂ්‍යාව සතුටු කිරීමට අවස්ථාවක් ලැබීම ගැන සැහීමට පත් ග්වෙන්ඩොලීන් ඉදිරිපත් වූවාය. "අපි මියුසික් ප්‍රැක්ටිස් කරන කාමරවලින් එහෙකට යමු. එතකොට ඔයාට ඩිස්ටර්බ් වෙන්නෙ නෑ. ඔයා රඟපානවා බලන්න මං හරි ආසයි. මං දන්නවා ඔයාට හොඳට පුළුවන් කියලා. ඔයා රඟපායි හරියට - ඔයා වැඩියෙන් ම කැමති චිත්‍රපට නිළිය කවුද - මේ - ආ - ලොසී ලැක්ස්ටන් වාගේ!"

"මං ඒ වගේ ම දක්ෂ නොවෙන්න පුළුවන්!" චිත්‍රපටවල ලොසී කරන අයුරින් කොණ්ඩය ඉහළට පිරිමදිමින්, "ඔහෙ ග්වෙන්, අපි ප්‍රැක්ටිස් රූම් එකකට යමු!" යයි සෙරෙල්ඩා කීවාය.

සංගීත පුහුණු වීමේ කුඩා කාමර එකක් හෝ හිස් නොවීය. සැම කාමරයකින් ම සංගීත හඬ නික්මුණේය. අන්තිම කාමරයෙන් හඬක් නැගුණේ නැත. එහි වූයේ අයිරින් ය. ඈ සංගීත ස්වර සටහන් කරමින් සිටියාය.

"මේ අයිරින්," යයි ග්වෙන් කාමරයට ඇතුල් ව ඇයට කතා කළාය. "ඔයාට පුළුවන් ද...."

"එළියට යන්න!" යයි අයිරින් සැර වූවාය. "මං මේ වැදි... ජෝන්න නැද්ද?"

"නමුත්, ඔයා පියානෝ එක පාවිච්චි කරන්නේ නෑ නේ," සෙරෙල්ඩා කිව්වාය. "වෙන තැනකට ගිහිල්ලා ඔයාට ඕක වාදනය කරන්න පුළුවන් නේ?"

"නෑ - මට එහෙම බැහැ. තව විනාඩියකින් මට මේ කෑල්ල පියානෝ එකේ වාදනය කරලා බලන්න ඕනෑ," යයි අයිරින් යළිත් සැර වූවාය. "යන එකයි ඇත්තේ - මට වද නොදී!"

සෙරෙල්ඩා ගැස්සී සිටියාය. අයිරින් මෙ තරම් නරකා හොඳ සිටිනු ඇය මීට පෙර දක නැත. එහෙත් ග්වෙන්ඩොලීන්ට එය පුරුදු ය. අයිරින් සංගීතයෙහි ගැලී ඒ ගැන සිත මෙහෙයවා සිටින විට කිසිදු බාධාවක් ඉවසන්නේ නැති බව ඇ දන්නීය. නාද රටා සටහන් කරමින් සිටිය දී හෝ පියානෝව වාදනය කරමින් සිටිය දී හෝ කියා වෙනසක් නැති ව ඇයට එක ම නරහා යන්නේය.

"අපි යං යන්ට!" යයි ඇ සෙරෙල්ඩාට කතා කළාය.

"ඔව්, යන එකයි ඇත්තේ," යයි අයිරින් බැරෑරුම් පෙනුමක් මුහුණේ දරාගෙන කියා සිටියාය. "මගෙ ට්‍යූන් එක ලස්සනට හැදීගෙන එන කොට ම ඔය දෙන්නා කඩා වැටුණේ! හරි, යනවා!"

"අයිරින්, ඔයා මය පැන්සලෙනුයි කඩදාසියෙනුයි නේ වැඩ කරන්නේ. ඒ හින්ද කරුණාකරලා අපට මේ කාමරේ පාවිච්චි කරන්න ඉඩ දෙන්නකො," යයි සෙරෙල්ඩා ඉල්ලා සිටියාය. "මට ඕනෑ ප්‍රැක්ටිස් කරන්න - ජූලියට්ගේ දෙබස් වගයක්..."

මෙහි දී අයිරින් වියරු වැටුණාය. ඇ පැන්සල ද, කඩදාසි ද, පොත ද සෙරෙල්ඩාගේ මුහුණට ගසා දමා, දිගට හරහට ඇයට බනින්නට වූවාය. "ඔයා මහ මෝඩ තකතිරු කතාවක් නේ කියන්නේ! ඔයාගෙ කෙහෙම්මල් ඇක්ටිං වලට මං මගෙ මියුසික් ප්‍රැක්ටිස් වෙන එක අත් අරින්න ඕනෑ! මං දන්නවා ඔයා විකාර ඇඳගෙන, ඒවා ලොකුවට පෙන්නාගෙන, මහ ලොකු විසුළු නිළියක් වෙන්න දඟලනවා කියලා. ඔයාගෙ



ඔළුවෙ මොනව හරි තියෙනවා නම්, ඒවා තුන් වෙනි පන්තියේ ජරා අදහස්! ඔය දහජරාව වගෙ නොවේ, මං ඉගෙන ගන්න සංගීතේ. මෙතැනින් ගියේ නැත්තං...."

වැඩි දුරටත් අයිරින් කියන දේ අසා ගන්නට සෙරෙල්ඩා එම කාමරයේ රැඳී සිටියේ නැත. තමන් දෙස ගසා දමීමට සුදුසු දෙයක් සොයමින් ඇය කාමරය පීරා බලනු ඔවුහු දුටහ. ජනෙල් පඩියේ මල් පෝච්චියක් තිබෙනු ඔවුන්ගේ ඇසට ලක් වූයේය. කාමරයෙන් පුළුවන් තරම් ඉක්මනින් පිට වෙන තරමට ඇගට ගුණ යයි ඔවුහු වටහා ගත්හ.

"එයාට වෙන ප්‍රශ්නයක් නැත්නම්, මං හිතන්නෙ පිස්සු!" යයි සෙරෙල්ඩා කිව්වාය.

"එහෙමත් ම නෑ," යයි ග්වෙන් පිළිතුරු දුන්නාය. "එයාගෙ ඔළුවට හොඳ මූඩ් එකක් ආවා ම, එයා ප්‍රිය කරන සංගීතේ අනුව හොඳ ට්‍යූන් එකක් නිර්මාණය කරන්න - මේ ලෝකෙ පිහියක් නැති ව එයාට ඕනෑ කරන්නේ නිස්කලංක ව ඊට යෙදිලා ඉන්න. කවුරුහරි බාධා කළොත් එයාට යකා නගිනවා. මං දන්නවා - එයාට තියෙන්නේ නියම කලාත්මක කුශලතාවයක්!"

"ඇයි මට? ඒත් එහෙම නේ! ඒ වුණාට මට ඔහොම පිස්සු හැදෙන්නෙ නෑ නේ. මට නම් හිතන්න බෑ!" සෙරෙල්ඩා කිව්වාය.

"ඒක එයාගෙ හැටි," යයි ග්වෙන් පැවසුවාය. "බාධා කරා ම එයාට නරහා යනවා. අන්න! අර ලුසී! එයා ප්‍රැක්ටිස් ඉවර වෙලා - ඒ කාමරෙන් පිටවෙලා යනවා. අපි ඉක්මනින් ගිහිල්ලා ඒ කාමරේ අල්ලා ගමු!"

ඔවුහු වහා ම ගොස් එම කාමරයට ඇතුළු වූහ. ග්වෙන් එහි වාඩි වූයේ සෙරෙල්ඩා පිහවීම සඳහා, අවශ්‍ය නම්, පැය ගණනක් වුවත් අසා සිටීමට සූදානමින් ය. එයින් ඇයට සෙරෙල්ඩාගේ මිත්‍රත්වය දිනා ගත හැකි ය. ප්‍රේමයෙන් මුසපත් වූ ආවේගයක් මුහුණට ආරූඪ කරගෙන සෙරෙල්ඩා ජූලියට්ගේ භූමිකාව රඟදක්වන්නට වූවාය.

"ඔබ ඔය යන්වද යන්නේ? එළිවන්නට කල් ඇත්තේ;
ඔය ඇසෙන ගී රාවේ, රෑ කොවුලාගෙනි එන්නේ.
දෙළුම් ගසේ සිට එන ඒ ගී හඬ
ඔබ කන් තුළ රැව් පිළිරැව් දෙන්නේ;
අසන් සුහද මම ඔබහට කියමි.
රෑ කොවුලයි ඒ ගීත ගයන්නේ!"

ග්වෙන්ඩොලීන් එම රංගනයෙන් වශීකෘත වූ පරිද්දෙන් හිඳ සාදගෙන ආශාවෙන් අසා සිටියාය. සෙරෙල්ඩාගේ රංගනය හා දෙබස් ඉදිරිපත් කිරීමේ ඇති හොඳක් නරකක් ඇයට තේරුණේ නැත. එහෙත් ඇයගේ වර්ණනාව සඳහා එය වැදගත් වූයේ නැත.

"අන්තිම ඉහළයි!" යයි, හුස්ම ගැන්ම සඳහා සෙරෙල්ඩා මඳකට නතර වූ කල්හි, ග්වෙන්ඩොලීන් පැවසුවාය. "ඔයා දෙබස් ගොඩාක් ඉගෙනගෙන තියෙනවා නේ! දෙයියනේ, ඔයා ලස්සණට රඟපානවා නේ! ඔයා ඒ චරිතේ ජීවත් වෙනවා - මං කියන්නේ. ඔයාගෙ කොණ්ඩෙයි, පෙනුමයි, අංග චලනයි ජූලියට්ගේ චරිතෙට නියමෙට ගැළපෙනවා!"

"මං එහෙම ද?" සෙරෙල්ඩා අතිශයින් තෘප්තියට පත් ව ඇසුවාය. "මං දන්නවා මං රඟපාන කොට කරන්න ඕනේ මොනව ද කියලා. මම කොණ්ඩෙ කඩාගෙන ගස්සන්න ඕනේ. මම මේ මේස රෙද්ද ඇඟ වටේ ඔතා ගන්න ඕනේ. නෑ, ඒක ලොකු මදියි. මං මේ කර්ටින් එක ඇඟ වටේ ඔතා ගන්නං!" කියා සෙරෙල්ඩා තිර රෙද්ද ගලවා එය පාසැල් ඇඳුම උඩින් දවටා ගත් කල ග්වෙන් නවත් සතුටට පත් වූවාය.

ඉන්පසු සෙරෙල්ඩා කොණ්ඩය කඩා උරහිස් මතට වැටෙන්නට සැලැස්සුවාය. ඉන්පසු ඈ මේස රෙද්ද ද බඳ වටා ඔතා ගත්තාය. ආ - දැන් ඇයට දැනෙන්නේ තමා නියම ජූලියට් ලෙස ය. දෑත් ඉදිරියට විහිදා ගත් ඈ දුක්මුසු මුහුණින් යුතු ව දුක්මුසු හඬින් කතා කරන්නට වූවාය. එහෙත් එම දෙබස් ඛණ්ඩය නියම ඉංග්‍රීසි උච්චාරණයෙන් ඉදිරිපත් කිරීමට ඇය කල්පනාකාරී



වූයෙන්, එහි කෘත්‍රිම ගතියක් දක්නට ලැබිණ. ඇයට පුරුදු ස්වාභාවික කතා විලාසය වෙනුවට විකෘති විකාර කතා විලාසයක් මතු විය.

ග්වෙන්ඩොලින්ට සිනාසීමට සිතුණු නමුත්, එයින් සෙරෙල්ඩාගේ හිත රිදේ යයි බියෙන් ඈ එය පාලනය කර ගත්තාය. නාට්‍යානුසාරයෙන් ජූලියට්ගේ ශෝකාන්විත දෙබස ඉදිරිපත් කරමින් සෙරෙල්ඩා සංගීත කාමරයේ එහෙ-මෙහෙ අත ඇවිද්දය. නිල් රෙද්ද වේල් එකක් මෙන් බිම ඇදිණ. විසිරුණු කෙස් කලඹින් ඇසක් ද වැසී ගියේය.

කවුදෝ ඇතුළට එබිකම් කර බැලූවාය. ඒ හත් වැනි පංක්තියේ බෙසී ය. ඇය ආවේ සංගීත පුහුණුව සඳහා ය. එහෙත් ඉහළ පංක්තියක ළමුන් දෙදෙනකු කාමරයේ සිටිනු දැක ඈ ආපසු හැරී ගියාය. ඉන්පසු එතැනට පැමිණියේ නව වැනි පංක්තියේ ශිෂ්‍යාවකි. ඈ අවේ ළමයින් දෙදෙනා දැක බිය නොවූ නමුත්, විකාර ඇඳුමෙන් සැරසී සිටි සෙරෙල්ඩා දැක විමතියට පත් වූවාය.

"මට ප්‍රැක්ටිස් කරන්ට තියෙනවා. කෝ - මට ඉඩ දීලා එළියට යන්න!" කියා ඈ කාමරය තුළට වැදුණාය.

සෙරෙල්ඩා රංගනය නතර කළේ කෝපයට පත්ව ය. "ඔයා යන එකයි ඇත්තේ!" ඈ සැර වූවාය. "හී - පේන්නෙ නැද්ද මං මේ රිහර්සල් එක්ක යෙදිලා ඉන්නවා?"

"නෑ - මං යන්නෙ නෑ," යි නව වැන්නේ ශිෂ්‍යාව තරයේ කියා සිටියාය. "ඔය තිරේ පටලවා ගෙන ඉන්න හැටි ටිචර් කෙනෙක් දකිනකං ඔහොම ඉන්න - මොනව ද වෙන්නෙ කියලා බලන්න, සෙරෙල්ඩා බ්‍රාස්. එළියට යන එකයි ඇත්තේ, දෙන්න ම! දැනටමත් මට ප්‍රමාදයි."

අයිරින් මෙන් ප්‍රකෝපයෙන් ඇය වෙත කඩා පැනීමට සෙරෙල්ඩා සිතුවාය. ශේක්ස්පියර් නාට්‍ය පොත අතට ගත් ඈ, අයිරින් කළ විදිහට, එයින් එම ශිෂ්‍යාවට ගසා දමුවාය. අවාසනාවට මෙන්, එම අවස්ථාවේ පාලිකාව එතැනට ආවාය. සංගීත පුහුණුවීමේ කාමරවලට එබිකම් කර ළමයින් නියමිත

ලෙස පුහුණුවේ යෙදෙන්නේ දයි සොඳිසි කර බැලීම ඇ[illegible] සාමාන්‍ය පුරුද්ද ය. හිර රෙද්දකින් සහ මේස රෙද්දෙන් [illegible] කොණ්ඩය තඩාගෙන සිටි අයකු පියානෝව ළඟ වාඩි වී [illegible] යේන් සිටි ශිෂ්‍යාවකට පොතක් විසි කර පහර දෙනු [illegible] පාලිකාව මවිතයට පත් වූවාය.

ඇය අඩවත් ව තුබූ දොර ගස්සා ඇද්ද කල ඇතුළේ සි[illegible] හිදෙනා ම ගැස්සී සිටියහ. "මොකද්ද මේ? මොනව ද [illegible] ළමයි මේක ඇතුළේ කරන්නේ? ආ - මේ සෙරෙල්ඩා [illegible] ඇයි මේ කර්ටන් එක ගලවලා ඇඟ වටේ ඔතාගෙන ඉන්නේ? ඔය මේසට බල්මාද ද? එතකොට ඔය කොණ්ඩෙට මොකද වෙලා තියෙන්නේ? තිබුණට වැඩිය සිය ගුණයක් විකාර කරගෙ[illegible] නේ! ජැනට්, ඔය ළමයා දන් පුහුණු වෙන්න. ග්වෙන්ඩොලින්, ඔය ළමයා ඕක ඇතුළේ ඉන්න ඕනෙ නෑ - ඉහළ පන්තියක ළමයෙක් පුරුදු වෙන කොට. එතකොට - සෙරෙල්ඩා, [illegible] ළමයා මේ වගෙ විකාර විදිහට හැසිරෙනවා මට ආයෙ [illegible] වුණොත් මං ප්‍රින්සිපල්ට රිපෝට් කරනවා - හරි ද? [illegible] කෙනෙකුට පොත් විසි කරලා ගහන එක හරි ද? ඒ ළමයා තමාට ඉහළ පංක්තියක කෙනෙක්! ඔය ළමයා ඔය විදිහට හැසිරෙනවා නම් තවත් පහළ දලා - හයට යවන්නයි තියෙන්නේ!"

පාලිකාව එක දිගට ම දෙස් පවරාගෙන ගිය වේගයට එ[illegible] වචනයක් හෝ අතරමග දී දැමීමට ග්වෙන්ට හෝ සෙරෙල්ඩාට ඉඩ නොලැබුණේය. පාලිකාව හිත් පැරේ ජැනට් පියානෝ ස්ටූලය මතට පහත් කළාය; තිකිළියක ඇද දමන්නාක් සේ ග්වෙන්ඩොලින් කාමරයෙන් ඉවත් කළාය; ඊට පසු සෙරෙල්ඩාගේ බාහුවෙන් අල්ලා ඇය කාමරයෙන් එළියට ගත්තාය.

"ඔය ළමයා දන් මගෙ එක්ක එන්න ඕනෑ. මට බලන්න ඕනෑ - මේස රෙද්දයි හිර රෙද්දයි ඉරිල ද කියලා - ඔය ළමයා අතින්. එහෙම ඉරිලා තිබුණොත්, මගෙ ඉස්සරහ [illegible] වාඩි වෙලා ඉරුණු තැන් මහන්න ඕනෑ. එතකොට - ඔය ළමයට තමාගෙ ස්වොකිංස් හරියට එලලන්න බැරි නං, ඔය ළමයට ඇවිල්ලා ඒකත් පුරුදු වෙන්න සිදු වෙනවා."



මහත් දේ කෝපයටත් විස්මිත භාවයටත් පත් සෙරෙල්ඩාට සිදු වූයේ පාලිකාව පිටුපස කොරිඩෝරය දිගේ ඇවිදගෙන යාමට ය. හිර රෙද්ද තවමත් උරහිස වසාගෙන එල්ලී ඇත. මේස රෙද්ද තවමත් ඇගේ බඳ වටා ය. ඒවා ඉවත් කරමින් ඇවිදීම අපහසු ය. කොණ්ඩය යළි බැඳ ගැනීමට ද ඇයට ඉඩක් නැත. පාලිකාව වේගයෙන් ඉදිරියට යයි. ඇයට ද එම වේගයෙන් ම අඩිය තැබීමට සිදු විය.

පාලිකාවට අවශ්‍ය වූයේ ද ඇයට එම රෙදි ඉවත් කිරීමට හෝ කොණ්ඩය සකස් කර ගැනීමට හෝ අවකාශයක් නොතබා ඒ සැටියෙන් ම ඇය කොරිඩෝරය දිගේ ගෙන යාමට ය. එවිට අන් අයට ද ඇයගේ විකාරය දක බලා ගත හැකි ය. සෙරෙල්ඩාගේ අවාසනාවට, තෙත් ළමයින් රංචුවක් කොරිඩෝරයේ මැද දී ඇයට හමු විය. ඔවුනු විකට ඇඳුමින් සැරසුණු ඇය දක කොක් හඬලා සිනාසෙන්නට වූහ.

"එයා මොනව ද කරලා තියෙන්නේ? මේට්‍රන් එයාව කොහේ ද මේ අරන් යන්නේ? මොකද මේ සෙරෙල්ඩට වෙලා තියෙන්නේ - විකාර ඇඳුම් ඇඳගෙන, කොණ්ඩෙ තඩාගෙන?" යයි දෙලොස් හැවිරිදි ශිෂ්‍යාවන් විමතිය පළ කරමින් අවමානයෙන් යුතු ව ප්‍රකාශ කරන්නට වූ කල්හි, සෙරෙල්ඩාට පොළොව පළාගෙන යන්නට සිතිණි. ඈ බිම බලාගෙන ගියාය. ඇය වට-පිට බලා, ග්වෙන් අහලක හෝ නැති බව දුටු කල්හි පත් වූයේ මහත් අසරණ තත්ත්වයකට ය. පාලිකාවට තරහා ගිය කල ඇය සිටින පළාතකට හෝ යාමට බිය ව සිටි සෙරෙල්ඩා දන් ඇය සමග යන්නේ ඇයගේ කාමරයට ය!

තරප්පු පෙළේ නැමීමේ දී ඔවුන්ට මැම්සෙල් මුණගැසිණ. "හියැ! මේ මොකෝ? සෙරෙල්ඩා? ඔය ළමයගෙ කොණ්ඩෙ? ඇඳුම?" ඇයට ඊට වඩා කියා ගත හැකි නොවිය.

"ඔව්, මං මේ එයා අඩගහගෙන යන්නෙ, මොකද කියලා දන ගන්න තමා," යයි පාලිකාව කෙළින් ම කියා සිටියාය. පාලිකාව සහ මැම්සෙල් එකිනෙකාට උරණ ව සිටිනා දෙදෙනකු බැවින්, ඊට වඩා යමක් කීමට තනර නොවූ පාලිකාව සෙරෙල්ඩා

කුඩුව තම කාර්යය කරා වේගයෙන් ඇදුණාය. මැම්සෙල් කට අයාගෙන බලා සිටියාය.

සෙරෙල්ඩාගේ වාසනාවට මේස රෙද්දට හෝ නිර රෙද්දට හෝ හානියක් වී තිබුණු බවක් පාලිකාවට සොයා ගත නොහැකි වූයේය. මේ ඇයගේ දුකට හේතු විය. ඊළඟට ඇය කළේ සෙරෙල්ඩාගේ කොණ්ඩය අල්ලා පීරා දෙකට බෙදා කරල් දෙකකට ගෙතීම ය.

කතා කරන ගමන් ම, කොහැවනී මෙම කාර්ය කිරීමෙහි පාලිකාවට තිබූ දක්ෂතාවය ගැන මවිතයෙන් පසු වූ සෙරෙල්ඩා ඇයට ඕනෑ හැටියට තම කොණ්ඩය සකස් කිරීමට ඉඩ හැර තර බාගෙන සිටියාය. සෙරෙල්ඩා මුළු ජීවිතයට ම තම කොණ්ඩය මෙසේ දෙකට බෙදා ගොතාගෙන නැත. ඇය ඊළඟට වෙන්නේ කුමක් දැයි නොදන වාඩි වූ අසුරින් ම පසු වූයේ, නිකි-ටිකි හා රෙගුලාසිවලින් පිරි මෙම පාසැලට හිමින් දෙස් තබමිනි.

"ආ - ඔය තියෙන්නේ," යයි තමා කළ කාර්ය දෙස බලා තෑනීමට පත් පාලිකාව ගොතන ලද කරල් දෙක අගට රිබන් පටි දෙකක් බැන්දය. අඩියක් පස්සට තැබූ ඈ, "දැන් ඔය ළමයා නියම පාසැල් ශිෂ්‍යාවක් වගේ පේනවා! ලස්සනට නැත්නම් ගතියට පේනවා! මට නං හිතන්න බෑ - ඔය ළමයා අවුරුදු විස්සක ගෑනියක් වගේ ලොකුවට පේන්න ඉන්නේ ඇයි කියල!" යයි පැවසුවාය.

සෙරෙල්ඩා අසීරුවෙන් නැගිට්ටාය. ඇයට කන්නාඩියෙන් තම රුව දක ගත හැකි ය. තමා දැන් කොතරම් වෙනස් ද! තමාගේ නියම රූප විලාසය දැන් කෝ! ඇයට මේ තමා ම දැයි සිතා ගත හැකි නොවිය. දැන් තමා ද ඉංග්‍රීසි ගැමි ළමයින් මෙන් නිකම්ම බාලිකාවක් ය. පාලිකාවගේ කාමරයෙන් පැන ගත් ඈ යළිත් කොණ්ඩය තමාට ඕනෑ හැටියට සකස් කර ගැනීමට ඉවා කෙළින් ම නේවාසිකාගාරයට දුව ගියාය.

ඇයට පීටර්ස් මෙනෙවිය මුණගැසිණි. ඇය සෙරෙල්ඩා දෙස



බැලුවේ අඳුනා ගත නොහැකිව ය. සෙරෙල්ඩා මලානික සිනාවක් පා, කිසිත් නොකියා පැන ගැනීමට උත්සාහ කළාය.

"ආ - මේ සෙරෙල්ඩා නේ!" යයි පීටර්ස් මෙනෙවිය ඇස් අදහාගත නොහැකි වූ සේ පවසා සිටිය දී, තවත් කවුරුවත් හමු නොවේවා යි පතමින් සෙරෙල්ඩා කොරිඩෝරයේ කෙළවරට ගොස් නේවාසිකාගාරය තුළට පැන ගත්තාය.

ග්වෙන්ඩොලින් ඩෝමිටරිය තුළ සිටියාය. ඇය සෙරෙල්ඩා දෙස බැලුවේ අවතාරයක් දෙස බලන්නාක් මෙනි.

"මෙට්‍රන් ද කොණ්ඩේ හැදුවේ? ඔ - සෙරෙල්ඩා, දැන් නං ඔයා නියම පාසැල් ශිෂ්‍යාවක් වගේ! හිටියා වගේ නොවේ. මං අනිත් අයට කියන්න ඕනෑ - මෙට්‍රන් ඔයාගෙ කොණ්ඩෙ ගොතලා බැන්ද කියලා."

"ඔයා එක එක්කෙනාට මේ විත්තිය කියන්ට ගියොත්, මං මීට පස්සෙ ඔයාට කතා කරන්නෙ ම නෑ," යි සෙරෙල්ඩා ග්වෙන්ඩොලින් බියට පත් වන තරම් සැරෙන් කීවාය. ඉන් පසු ඈ ගොතන ලද කොණ්ඩ කැරලි දෙක ලිහා දැම්මාය. "මේ සොහොම්බල් ඉස්කෝලේ! මං නම් මෙට්‍රන්ට සමාව දෙන්නෙ ම නෑ!"

## 14

## බිල් අතට ම අසුවෙයි

කිවිසුම් යැවීමේ ප්‍රයෝගය අමතක කර දැමීමට ඇලිෂියාට පුළුවන් නොවූයේ මුළු පංක්තිය ම එය කෙසේ හෝ ක්‍රියාවේ යොදවන ලෙස නිතොර නිතොර ඇවිටිලි කළ නිසා ය. එයට අකැමැති වූයේ සැලී පමණි. එය අනතුරුදායක විහිළුවක් ලෙස ඈ දිගට ම සැලකුවාය. එහෙත් ඇලිෂියා ඒ බව නොපිළිගෙන ඇයට සිනාසුණාය.

"ඔයා ඔහොම කියන්නේ - ඒක මගෙ වැඩක් නන්දයි," යයි

ඇලීෂියා සැලීගේ මුහුණට ම කීවේ තමා ඩැරල් සමග සුහද වීම නිසා සැලී තමා තුරුස්නා බව තේරුම් ගෙන ය. ඩැ... ජීන්ගේ හෝ අයිරින්ගේ හෝ වැඩක් නම් සැලී එයට විරුද්ධ නොවන බව ද ඇලීෂියා සැලීට කියා සිටියාය.

ජීන් මෙම විහිළුවට පුද්ගලික මට්ටමින් ආශාවක් දැක්වූව ද ශිෂ්‍ය නායිකාව වශයෙන් එයට වැඩි අනුබලයක් දීමෙන් වැළකී සිටියාය. කෙසේ වුව ද, ශිෂ්‍ය නායිකාවකට වුව ද පෙස්සන්තෙ මැතර් ව ශාන්තුවරියක සේ පසු විය නොහැකි ය. මෙම විහිළුවෙන් සිද්ධ වන්නේ කුමක් දැයි දැක බලා ගැන්මට, එහෙයින් ඇයට ද ඕනෑකමක් තිබුණි.

"එන සුමානේ මැත්ස් ටෙස්ට් එකක් තියෙනවා. අන්න එතකොට තමා මේ ට්‍රික් එක දාන්න ඕනෙ! එතකොට අපට ටෙස්ට් එකෙන් බේරෙන්න පුළුවන් වෙයි කියලා මට හොඳට ම විශ්වාසයි! හා - චිං!" ඇලීෂියා කීවාය.

කවුරුත් පිනාසුණහ. ඩැරල් සිනාහව තද කරගත්තාය. පාසැල් ජීවිතය කොතරම් මිහිරි ද! ඈ එහි සෑම විනාඩියක් ම රස වින්දය. තම ඉගෙනීමේ කටයුතු මෙන් ම ක්‍රීඩා ද, මිතුරියන් හා තමා පවත්වන සමාගමය ද ඇයට සතුට ගෙන දුන්නේය. ලැක්රෝස් කණ්ඩායමේ අතිරේක ක්‍රීඩිකාවක ලෙස ඇයට ලැබුණු තැන ද මෙම සතුටට එකතු වූයේය. සියල්ල කොතරම් රසවත් අත්දැකීම් ද! මේ තමා ඇයට ගත කරන්න ලැබුණු හොඳ ම පාසැල් වාරය.

බිල් කනස්සලු ගතියෙන් පසු වනු ඩැරල්ගේ නෙතට ලක් විය. අහිංසක බිල්! ඇය මේ දුකින් සිටින්නේ තන්ඩර් තවමත් ලෙඩ ගතියෙන් පසු වන බැවිනි. බිල් එය දැන සිටිය ද, අන් අයට ඒ ගැන සෝදිසියක් නැත. ඇය මුල දී සිතූ ලෙස තන්ඩර් ලෙඩ ගතියෙන් පසු වන්නේ පුරුදු ස්ථානය මාරු වීම නිසා නොවේ. ඌ ඇත්තෙන් ම රෝගී ව පසු වෙයි. ඈ දැන් ඒ ගැන කනගාටුවෙන් පසු වෙයි. තන්ඩර් ගැන හිතන්න හිතන්න, ඇයට පංක්තියේ වැඩ ගැන හිතන්න හිතක් නොවීය. පංක්තියේ වැඩ කෙරෙහි අවධානය අඩු වන්න අඩු වන්න, පීටර්ස් මෙනෙවිය ඇය ගැන වැඩි වැඩියෙන් තරහා ගත්තාය.



"විල්හෙල්මිනා, කරුණාකර මං කියන දේ අහගන්නවා ද? විල්හෙල්මිනා, දැන් මං කී දේ නැවත කියනවා ද? විල්හෙල්මිනා, ඔය ළමයා ඔය විදිහට ජනේලෙන් එළිය බලාගෙන හීන දකා ඉන්නවා නෑ, ඔය ළමයා පන්තියෙන් එළියට යවනවා." මෙසේ ඇයගේ මුවින් කොතෙකුත් පිට වූයේ, "විල්හෙල්මිනා! විල්හෙල්මිනා!" යන්නයි.

මෙය භයංකර තත්ත්වයක් විය. බිල් දැන් අන්ත අසරණ තත්ත්වයකට පත් ව සිටින්නීය. එහෙත් කොතෙකු විමසා සිටියොත් මිස, ඇය තන්ඩර් ගැන කිසිත් පවසා සිටියේ නැත. තමා ගුරුවරියට අකීකරු වීම ජීන් අනුමත නොකරන බව ඈ දැන සිටියාය. එහෙත් තමාට ඒ හැර කළ හැකි අන් යමක් නොවීය. ඇය දිනපතා තන්ඩර් බැලීමට යා යුතු ය. දැන් එසේ යාම අත්‍යවශ්‍ය ය.

බිල්ගේ ක්‍රියා කලාපය ගැන පීටර්ස් මෙනෙවිය ව්‍යාකූලත්වයට පත් වූවාය. බිල් තම අසු ගැන මෙතරම් ඇල්මක් දක්වන්නේ නම්, ඌ බැලීමට යාම තහනම් කර තමා දුන් දඬුවම විඳ දරා ඇය ඌ බැලීමට නොගොස් සිටින්නේ මන්ද? දැන් සතියක් ම බිල් අසු බැලීමට ගියේ නැත. ඒ ගැන මැසිවිලි නැඟුවේ ද නැත. මීට හේතුව කුමක් දැයි පීටර්ස් මෙනෙවිය සිත වෙහෙසා කල්පනා කරන්නට වූවාය.

පීටර්ස් මෙනෙවියට හිතේ සැකයක් පහළ විය. බිල් තමාට අකීකරු වී ඇත් ද? එසේ විය නොහැකි ය. පීටර්ස් මෙනෙවියගේ පංක්තියේ කිසිවකු ඇයට අකීකරු වී නැත. එසේ අකීකරු වීමක් ගැන ඇයට කටයුතු කිරීමට ද සිදු වී නැත. විනය පිළිබඳව ඇය දිනාගෙන ඇත්තේ නොමැකෙන නාමයකි.

උතුරු කුලුන නේවාසිකාගාරය භාරව සිටින පොටිස් මෙනෙවිය සමග ද ඈ මේ ගැන කතා කළාය. "මට මේ විල්හෙල්මිනා මහා ප්‍රහේලිකාවක්, මිස් පොටිස්! මට ඒ ළමයා තේරුම් ගන්න බෑ. එයා පංක්තියේ ඉන්න කොට කොච්චර වත් කල්පනාවේ; කොච්චර වත් හීන දකිනවා. ඒ වුණාට එයා හොඳ සිහි බුද්ධියෙන් සවි ශක්තියෙන් ඉන්න ළමයෙක්. එයා තමාගේ අශ්වයාට පුදුම ආදරයක් තියෙන්නේ. අශ්වයා

ගැන හිත හිතා පංක්තියේ වැඩවලට ඇහුම්කන් නොදෙන හැටි, මං ඒ ළමයට අශ්වයා බලන්ට යන එක දවස් කිහිපයකට තහනම් කළා. දන් සුමානයක් ම එයා අශ්වයා බලන්ට ගිහිල්ලෙ නෑ. ඒ වුණාට පංක්තියේ වැඩ නොකර ඒ ළමයා මගෙන් නිතං දඬුවම් ලබනවා!"

ජොර්ජ් මෙනෙවිය ගැස්සී සිටියාය. යමක් පැහැදිලි ව ඔප්පු කර ගැන්මට ඈ නලෙ රැලි නංවාගෙන කල්පනා කරන්නට වූවාය. "ඒක හරි පුදුමයක් නේ! මට දිවුරලා කියන්න පුළුවන් - මං ඊයෙ ඉස්කාලය ළඟින් යන කොට, මං හොඳට ම දක්කා විල්හෙල්මිනා ඉස්කාලෙ ඇතුළෙ ඉන්නවා. මම ජනේලෙ අස්සෙන් හොඳ සෝදිසියෙන් බැලුවා. මට හොඳට ම විශ්වාසයි, ලොකු අශ්වයෙක් ළඟ ඒ හිටියෙ විල්හෙල්මිනා කියලා."

"ආ - එහෙනං - එහෙම වෙන්න පුළුවන්," යයි පීටර්ස් මෙනෙවිය කෝපය යටපත් කරගෙන අමාරුවෙන් කීවාය. "විශ්වාස කරන්න බැරි, කියන දේ නාහන අකීකරු කෙල්ල! මගේ අතට අහු වුණොත් එයා අශ්වයා ළඟට ගිහිල්ලා, මං තදින් ම ඉන්නවා - අශ්වයා ගෙදර යවන්න කියලා. ඒ වෙනුවට පාසැලට අයිති අශ්වයෙක් උඩ යන්න පුළුවන් - එයාට. මං එයාට ඉඩ දෙන්නෙ නෑ, අශ්වයා ගැන පිස්සුවෙන් පංක්තියේ ඉඳන් කල්පනා කර කර ඉන්ට. අශ්වයා හොඳ වුණත්, විල්හෙල්මිනා අකීකරු වෙන එක නරකයි!"

ඇත්තෙන් ම පීටර්ස් මෙනෙවිය විල්හෙල්මිනා ගැන මහත් කෝපයෙන් පසු වූවාය. අකීකරුකම ඇයට දරා ගත නොහැකි වරදකි. ඇය සිය කාමරයට ගියේ සැහෙන හිතේ අමාරුවෙන් යුතුව ය. විල්හෙල්මිනා මෙ තරම් රැවටිලිකාර, විශ්වාස කළ නොහැකි කෙල්ලක බව මෙතෙක් ඇය සිතුවේ නැත. අනුන් ගැන ඔබ දන්නේ කොතරම් ටික දැයි මෙයින් පැහැදිලි වේ.

දවස ගෙවී යද්දී ඇයගේ කෝපය මෝරන්නට විය. එදා දවසේ ඇය සිය පන්තියේ සිටියේ සුළු වේලාවකට පමණි. ඉතිහාස ගුරුවරිය වන කාටින් මෙනෙවිය ද, මැම්සෙල් ද, චිත්‍රකර්ම ගුරුවරිය වන ලිනී මෙනෙවිය ද, සංගීත ගුරුවරයා වන යං මහතා ද පිළිවෙළින් මෙම පංක්තියේ තම පාඩම්



ගත්හ. බිල් දෙස වැඩි උනන්දුවක් දක්වා බලා, ඇයගේ හිත හා ඉරියව් හඳුරන්නට ඇයට අවකාශයක් නොවීය.

දහවල් ආහාරයෙන් පසු, පස්වරු පංක්ති ආරම්භ වීමට පෙර, පැය භාගයක පමණ විවේක කාලයක් විය. බිල් ඉස්කාලය කරා හොරෙන් ලිස්සා යන්නේ මේ වේලාව තුළ ය. ඈ පාසැල් ගොඩනැගිල්ලේ පිටුපස තරප්පු පෙළ බැස, පැති දොරකින් වත්තට බැස, ගස් අස්සෙන් ඇති අඩි පාරක් දිගේ ඉස්කාලයට යාමට පුරුදු ව සිටියාය. මෙහි දී ලෙනෙසියෙන් කාට හෝ ඇය අසු වන්නේ නැත.

මෙද ද දහවල් ආහාරයෙන් පසු මෙම රහස් මාර්ගය ඔස්සේ බිල් තන්ඩර් බැලීමට ගියාය. ඇයගේ අඩි ශබ්දය ඇසුණු කල තන්ඩර් නාහයෙන් හඬ නඟන්නට විය. ඉස්කාලයේ විශාල දොර ඇර ඈ ඇතුළට ගියාය. එය තුළ කිසිවෙක් නොවූහ. එකිනෙකාගේ සමාගමයෙන් සතුටට පත් අසුන් හා ගසමින්, නාහයෙන් පිඹින ශබ්දය පමණි, එය තුළින් නිකුත් වූයේ.

ඈ තන්ඩර් සිටින කොටසට ගියාය. ඌ තම හිස ඇයගේ බාහුව අස්සට ඔබා, සතුටින් පිඹින්නටත් හුස්ම ඉහළට අදින්නටත් වූයේය. බිල් ඌගේ සිනිඳු නහය පිරිමදින්නට වූවාය. "තන්ඩර්, දන් උඹට හොඳ ද? කෝ මට උඹේ ඇස් දෙක බලන්න! අනේ - තන්ඩර්, ඉස්සර වගේ ලස්සණට දන් ඇස් දිලිසෙන්නේ නෑ නේ. උඹේ ඇඟ අතුල්ලන කොටත් මට අමුත්තක් දනෙනවා. ඉස්සර වගේ සිනිඳු නෑ! දන් ගොරෝසුයි. උඹට තියෙන ලෙඩේ මොකද්ද - තන්ඩර්? අනේ ලෙඩ වෙන්න එපා - මගෙ ඩාලිං තන්ඩර්! මට ඒක දරාගන්න බෑ."

තන්ඩර් නාහයෙන් පිඹ මන්දහේෂාව නැංවීය. ඇත්තෙන් ම ඌ සිටින්නේ ලෙඩින් ය. එහෙත් බිල් තමා ළඟ ඉන්නා විට ඌට එය දනෙන්නේ නැත. තම ස්වාමිදුව තමා ළඟ ඉන්නා විට අසනීපයෙන් සිටිය ද සතුටින් සිටීමට ද තන්ඩර්ට පුළුවන.

උතුරු කුලුනේ ඉහළ තට්ටුවේ කොරිඩෝරය දිගේ පීටර්ස් මෙනෙවිය ගමන් කළාය. ඇයට ඕනෑ වූයේ බිල් සොයාගෙන ඇයට කෙළින් ම කතා කිරීමට ය. අට වැනි පංක්තියේ පොදු

කාමරයේ දොර ළඟට ගිය ඇ ඇතුළට එබිකම් කර බැලුවාය. විල්හෙල්මිනා එහි නොවුවාය.

"මට විල්හෙල්මිනාට කතා කරන්න ඕනෑ. කෝ ඒ ළමයා?"

සියල්ලෝ ම ඇය සිටින තැන දැන සිටියහ. එහෙත් කාටවත් එය කියන්නට හිතක් නැත. හෙමින් සීරුවේ මෙතැනින් ලිස්සා ගොස් බිල්ට ඉස්තාලයෙන් පිට වී පොදු කාමරයට එන ලෙස දන්වීමට ඩැරල් සිතුවාය.

"මං ගිහිල්ලා එයා හොයාගෙන එන්න ද?" ඇ ඇසුවාය.

"නෑ - මං එයා හොයා ගන්නං," යයි පීටර්ස් මෙනෙවිය කීවාය. "කවුරුවත් ම දන්නේ නැද්ද - විල්හෙල්මිනා ඉන්නෙ කොහෙද කියලා?"

ශිෂ්‍යාවන්ගෙන් උත්තරයක් නැත. ඔවුන් ඇය කුපිත කරවනසුලු අන්දමේ හිස් බැල්මක් ය හෙළා සිටියේ. ඔවුන් බිල් සිටින තැන දන්නා බව ඇයට රහසක් නොවේ. ඒ බව ඔවුන් වසං කර සිටීම ඇයගේ කෝපය වර්ධනය වීමට හේතු වූයේය. ඔවුන් කේලාම් නොකියන බව ඇ දන්නීය. තමා නොසිටිය යුතු තැනක - ඒ කියන්නේ ඉස්තාලයේ - විල්හෙල්මිනා සිටින බව ඔවුන් දන්නේ නම් ඔවුන් පිසුණු බස් නොකියන බව ඇයට විශ්වාස ය.

"මං දන්නවා - විල්හෙල්මිනා ඉන්නේ ඉස්තාලයේ." පීටර්ස් මෙනෙවිය කෝපයෙන් කීවාය.

ඇ ජීන් දෙස බැලුවාය. "ජීන්, ශිෂ්‍ය නායිකාව වශයෙන් ඔය ළමයට තිබුණා විල්හෙල්මිනාට කියන්න ඔය විදිහට මෝඩ වෙන්න එපා - අකීකරු වෙන්න එපා කියලා - විශ්වාසය කඩ කරන්න එපා කියලා. ඔය ළමයා හොඳට දන්නවා මං මොනවා හරි අණක් දුන්නොත් - දඬුවමක් දුන්නොත් ඔය ළමයා ඒක පිලිපදිනවා කියලා, තමන් කෙරෙහි මං තිබ්බ විශ්වාසය කඩ කරන්නෙ නැතිව."

ජීන්ගේ මුහුණ රතු විය. ඇ මහත් අපහසු තත්ත්වයකට පත් වූවාය. පීටර්ස් මෙනෙවියට මෙසේ කතා කිරීම ලෙහෙසි ය.



එහෙත් තන්ඩර් ගැන නොසලකා සිටින සේ ශිෂ්‍යාවකට බිල්ට දන්වා සිටිය නොහැකි ය. ඇය එම කාරණය සම්බන්ධයෙන් ශිෂ්‍යාවට ඇහුම්කන් දෙන්නේ නැත.

"කවුරුත් මෙතැනින් හෙල්ලෙන්නෙ නැතිව මේක ඇතුළට ම වෙලා ඉන්න ඕනෑ," යයි පීටර්ස් මෙනෙවිය ඔවුන්ට අණ කෙළේ, අවස්ථාවක් ලදොත් ඔවුන් අතුරින් කවරකු හෝ ඉස්තාලයට ගොස් බිල්ට අනතුරු අඟවති යි සැකයෙනි. ඇයගේ අදහස වූයේ තමා ම එහි ගොස් ඇය අතට ම අල්ලාගෙන මෙය කෙළවරක් කිරීමට ය.

"හු - අහිංසක බිල්," යයි පීටර්ස් මෙනෙවිය බිල් අල්ලා ගැන්මට පිට ව ගිය කල ඩැරල් කෙඳිරි ගෑවාය. "දැන් එයා මහා අමාරුවක වැටෙන්නයි යන්නේ! මං දන්නවා මිස් පීටර්ස් පල්ලෙහාට බහින්නේ ඉස්සරහා පැත්තේ තරප්පු පෙළ දිගේ. මං පිටිපස්සේ තරප්පු පෙළ දිගේ පහළට දුවගෙන ගියොත්, මට පුළුවන් එයාට ඉස්සර ඉස්තාලෙට ගිහිල්ලා බිල්ට අනතුරු අඟවන්න. මං උත්සාහ කරලා බලන්න ඕනෑ."

අනික් අය කියනා දෙයක් අහන්න තතර නොවී ඩැරල් කාමරයෙන් එළියට පැන, කොරිඩෝරයේ සිටි පාලිකාවගේ ඇඟේ ගැවී නොගැවී දුවගෙන ගොස් පහළට බැස, පසු පස තරප්පු පෙළේ පඩි එකක් ඇර එකකට පනිමින් පැති දොරෙන් එන්නට පැන, ගස් අස්සෙන් දුව ගොස් ඉස්තාලයට වැදුණාය.

"බිල්! බිල්! විගහට හැංගෙන්න! මිස් පීටර්ස් එනවා!" ඇ තන්ඩර්ගේ කළු හිස ළඟ සිටි බිල්ට හති අරිමින් කියා සිටියාය.

එවිට ම පිටින් ඇතුළට එන අඩි ශබ්දය ඇසිණ. "දැන් ප්‍රමාද වැඩියි! ඔයා අහු වෙයි! ඔයාට හැංගෙන්න බැරි ද?"

ඩැරල් කොනක වූ පිදුරු ගොඩකට එහායින් රිංගා හැංගුණාය. ඇයගේ හදවත වේගයෙන් ගැහෙන්නට විය. බිල් සිටි තැන ම ගල් ගැසී සිටගෙන සිටියාය. ඇයගේ මුහුණ බියෙන් සුදුමැලි වී ගියේය. දොර සම්පූර්ණයෙන් ඇරගෙන පීටර්ස් මෙනෙවිය ඇතුල් වූවාය.

"ආ - එහෙනං විල්හෙල්මිනා මෙහෙ?" ඈ තරහින් කෑගැසුවා.

"මං දන්නවා ඔය ළමයා මුළු සතියෙ ම හොඳට හිතලා එහෙලා මට අකීකරු වෙලා මෙහාට හොරෙන් රිංගුවා. මං ඔය ළමයා ගැන හරි ම ලැජ්ජයි. තන්ඩර් මෙහෙ ඉන්නවා. ඔය ළමයා මේ ඉස්කෝලෙට හුරු වෙන එකක් නෑ. මට පි... හොඳට පේනවා. තන්වර්ව ගෙදර යවන්නයි වෙන්නෙ!"

"අනේ - එපා! එපා - මිස් පීටර්ස්! ඒක නම් කරන්න එපා! එපා!" බිල් කන්නලව් කරන්නට වුවාය. ඈයගේ මුහුණ රතු ඇල්ලම පවා සුදු වී ගියේය. "තන්ඩර් හොඳට ම හොඳ වෙලා. මුට අසනීපයක් නැත්නම්, මං මිස් කියන එක අහනවා. නමුත්, මූ ලෙඩ වෙලා හන්ද - මං මූ ගැන බලන්න ඕනෑ."

"මං ඔය ගැන සාකච්ඡා කරන්නෙ නෑ." යි පීටර්ස් මෙනෙවිය කෝපයෙන් කීවාය. "මං කිව දේ ඔය ළමයට ඇහුණා නේ! මං මගෙ වචනය වෙනස් කරන්ට යන්නෙ නෑ - ඔය ළමයා ඔය විදිහට අකීකරු වෙලා ඉන්න හන්ද. කරුණාකර නමක් සොමන් රූම් එකට යන්න, විල්හෙල්මිනා! තන්ඩර් ගෙදර යවන්න මං කටයුතු පිළියෙල කරලා ඔය ළමයට දන්වන්නං. ඊට පස්සෙ - නිවාඩු කාලෙ එනකං තන්ඩර්ට ආයුබෝවන් කියන්න පුළුවන්. සමහරවිට අනිද්ද ම යවන්න පුළුවන්."

බිල් ගල්ගැසී කතා කරගත නොහැකි ව සිටියාය. ඈයට කඳුළු දෙක හෝ සොලවා ගත හැකි නොවීය. ඩැරල්ට ඈය නොපෙනුණ ද ඈය පත් ව සිටි දුක්ඛිත තත්ත්වය හිතාගත හැකි විය. අනේ, අහිංසක බිල්!

"විල්හෙල්මිනා, දැන් යනවා! හා - දැන්ම ම!"

කඳුළු ඇද ඇද බිල් ඉස්තාලයෙන් පිට ව ගියාය. හිර කර ගන්නා ලද ඉකි හඬක් ඩැරල්ට ඇසිණ. තමාට පිදුරු ගොඩට එහායින් සැඟවී සිටීම හැර ඈය සනසාලීමට නොහැකි වීම කොතරම් අවාසනාවක් ද! කමක් නැත. දැන් පීටර්ස් මෙනෙවිය පිට වී යනු ඇත. ඉන් පසු ඈයට වහා ම පොදු කාමරයට දුව ගොස් බිල් සනසා ඈගේ දුක තුනී කළ හැකි ය.

එහෙත් පීටර්ස් මෙනෙවිය ඒ හා ම ගියේ නැත. බිල් ඈතට



ගිය පසු ඈය තන්ඩර් ළඟට අවුත් උට කොතරම් ආදරයෙන් කතා කළා ද යත්, ඒ කතා කරන්නේ පීටර්ස් මෙනෙවිය කියා ඩැරල්ට අදහාගත හැකි නොවීය. "ඇයි - ළමයෝ!" කියා ඈය නැඟූ හඬ ඩැරල්ට ඇසුණේය. "උඹට තියෙන අමාරුව මොකක් ද? ඇහැව හරි නැද්ද? අපි වෙට් ගෙන්නන්න ද උඹට ප්‍රතිකාර කරන්න? උඹට හුඟක් අමාරු ද, තන්වර්? ලස්සන අශ්වයා! උඹ එහෙම නේ? මෙහෙ ඉන්න හොඳ ම අශ්වයා! ඇයි - පැටියෝ!"

ඩැරල්ට ඇත්තෙන් ම තම කන් තමාට ම විශ්වාස කළ හැකි නොවීය. ඈය පිදුරු අස්සේ හිස එහෙ-මෙහෙ කළේ එ දෙස බලා ගැන්ම සඳහා විවරයක් පාද ගැනීමට ය. ඇත්තෙන් ම, තන්ඩර්ගේ ඇඟ පිරිමදිමින් එහි සිටියේ පීටර්ස් මෙනෙවිය ය. උෟ ඈයගේ අත නාසයෙන් පිරිමදිමින් හඬයෙන් ආදරයෙන් පිරි කෙඳිරිලි හඬක් නැංවුයේය. පීටර්ස් මෙනෙවිය මේ සතාට ආදරය කරන්නේ ඇයි? ඈය අශ්වයන්ට සාමාන්‍යයෙන් කැමති බව ඇත්ත ය. ඩැරල් එය දන සිටියාය. එහෙත් මෙය සුවිශේෂ ආදරයකි. ඈය තන්ඩර්ට ආදරය කළේ උෟ තමාගේ ම අසු සේ සලකා ය.

පීටර්ස් මෙනෙවිය තන්ඩර්ට සීනි ටිකක් දුන්නාය. උෟ එය තටට ගෙන අඹරන්නට විය. ඉන් පසු ඈ ඉස්තාලයෙන් එළියට ගොස් දොර වසා දැම්මාය. ඩැරල් පිදුරු ගොඩෙන් මතු වී ඇත ගොස් දොර වසා දැම්මාය. ඈ දොර වෙත ගොස් කන් දීගෙන සොලවා ගසා සිටියාය. පීටර්ස් මෙනෙවිය යන්නට ගොස් ඇත! හොඳයි!

ඈ දොර විවෘත කරගෙන එළියට ආවාය; ඉන්පසු එහෙම ම ගල්ගැසී සිටියාය. පීටර්ස් මෙනෙවිය ගොස් නැත. ඈ සසන්තුවක ලේස් එක ගැටගසමින් සිටියාය. ඈ හිස ඔසවා ඩැරල් ඉස්තාලයෙන් එළියට එන සැටි බලාගෙන සිටියාය.

ඈ කෝපයෙන් කෑලින් වුවාය. "ඔය ළමයා මොනව ද ඇතුළේ කළේ? මං විල්හෙල්මිනාට කතා කර කර ඉද්දී ඔය ළමයා දිගට ම හිටියේ මේක ඇතුළෙ ද? මං කොමන් රූම් එකෙන් පිට වෙන කොට ඩැරල් හිටියෙ ඒක ඇතුළේ නේ?

ඔය ළමයා පස්සා දෙරෙන් පැනගෙන ආව නේ - විල්කොලිනා [illegible] කියන්න, මං මෙහෙ එනවා කියලා?"

ඩැරල්ට කතා නැති විය. ඈ නිකම් ම හිස සැලුවාය.

"මං ඩැරල් ගැන පස්සෙ බලාගන්නංකෝ!" යයි වෙත [illegible] කීමට හිත හදගත නොහැකි ව ව්‍යාකූලත්වයට පත් ඈ [illegible] ගැන තමාට ම විශ්වාසයක් නැති සේ කීවාය. "මං [illegible] නෑ - මේ අපේ පන්තියට මොනවා වෙලා ද කියලා!"

# 15

## මාවිස්ට අදහසක් පහළ වෙයි

ඩැරල්ට හෝ අන් කිසිවකුට හෝ බිල් සැනසිය හැකි නොවීය. පීටර්ස් මෙනෙවිය කී ලෙස ඇය පොදු කාමරයට ආපසු ගියේ නැත. ඈ ඩෝමිටරියට ගොස් හඬා වැලපෙන්නට වූවාය. බිල් මීට පෙර වැලපී නැත. එහෙත් මේ අවස්ථාවේ ඇයට ඒ හැර කළ හැකි අන් යමක් නොවීය. ඇයගේ සහෝදරයන් හත් දෙනා ඇයට කියා ඇත්තේ පිරිමියකු මෙන් තදින් නොබිය ව සිටින ලෙස ය. ඈ ද මේ දක්වා දඩබ්බර පිරිමි ළමයකු සේ කඳුළක් හෝ හෙළීමට පුරුදු ව නොසිටියාය.

එහෙත් දන් ඇයට එසේ හිත පාලනය කරගත නොහැකි ය. ඇය පස්වරු පංක්තියට ආ කල, ඇයගේ ඇස් රතු වී තිබුණු පුංක්තියේ අය ඇය වටා රොක් වූහ. ඔවුන් ඇය සනසාලීමට නැත් කළ ද, ඈ ඔවුන් ඈත් කළාය. ඩැරල්ට ද ඇය ළඟට යන්නට හැකි නොවීය. බිල් ඇයට ස්තුති පූර්වක ව වචනයක් දෙකක් කතා කළ ද, ඇයට අවශ්‍ය වූයේ තනියෙන් සිය දුක දරාගැනීමට ය.

"මට දන්වන්න ආව එක ගැන ස්තූතියි, ඩැරල්! ඔයා කළේ ලො" දෙයක්!"



"ඒ වුණාට බිල්," යයි ඩැරල් ඇයට යමක් කීමට පැන් කළ ද, බිල් හිස පැත්තකට හරවා ගත්තේ, අයින් 'එපා' යයි කියමිනි.

"මට ඔය ගැන ආයෙ කතා කරන්න එපා! මට මගෙ තනියම ඉන්න දෙන්න - ප්ලීස්!"

පංක්තියේ ළමයින් වැඩි දුරටත් ඇයට කතා කරන්නට ගියේ නැත. ඔවුහු ඔවුනොවුනගේ මුහුණ බලා ගත්හ. බිල්ට අවශ්‍ය නැත්නම්, ඇයට උදව් කිරීමට කිසිවකුට නොහැකි ය. ඩැරල් මහත් වශයෙන් දුක් ව සිය අසුනට ගියාය. පීටර්ස් මෙනෙවිය කොයි මොහොතේ හෝ තමා ඇයගේ කාමරයට කැඳවන බව ඈ දන සිටියාය. තමාට කවර දඬුවමක් ලැබේ දයි ඇයට සිතා ගත හැකි නොවිය. ඇයට අසු වන කෙස් සියල්ල කොපමණ හොඳින් සිදු වූයේ ද! දන් ඈ ද කරදරයට පැටලී ඇත්තීය. ඇයට අවශ්‍ය වූයේ බිල්ට පිහිට වීම පමණි.

එද පස්වරුවේ පීටර්ස් මෙනෙවිය පංක්තියට ආවේ තැව පරුෂ ස්වභාවයෙන් යුතුව ය. ඇයගේ කෝපාන්විතයට පිදුරු දමන්නේ කවුද යි ඈ විමසිලිමත් වූවාය. එහෙත් සියල්ලෝ ප්‍රවේශමෙන් සිටියහ. කිසිවෙක් ඇය තරහා නොගැස්සූහ. මාවිස්, ග්වෙන්ඩොලින් සහ සෙරෙල්ඩා පවා ඇහ බෝරාගෙන සිටියහ මෙවන් තත්ත්වයක පසු වන විට ඇය ප්‍රකෝප කිරීම භයානක ය. ඇයගේ තව් මුහුණ රතු වී තිබුණි. ඇයගේ ඇස් ඇවිලෙමින් පංක්තිය දෙසට යොමු වී කැරකෙන්නට වූයේය.

එද පස්වරුවේ මුළු පංක්තියට ම බලපෑ මුස්පේන්තු ගතිය සවස් වරුවේ ඔවුන් පොදු කාමරයට වන් කල ද පහ ව නොගියේය. බිල් මුල්ලකට වී ගල් රූපයක් මෙන් නොසැලී සිටියාය. කවුරුත් නිදිමත ගතියෙන් පසු වූහ. ඔවුන් අවදි කර සිටීමට සමත් වූයේ මාවිස් ය.

කවුරුහරි හොරෙන් අසාගෙන ඇතැ යි බියෙන් මෙන් ඈ, "අනේ - මේ බලන්න!" යයි හොඳුරා සිටියාය.

ඈ කවදසියක් ඉහළට ඔසවා පෙන්වා සිටියාය. එහි සඳහන් ව තිබුණේ මෙයයි.

ඔබ සංගීතයෙහි දක්ෂ ද? ඔබට පියානෝව වාදනය කළ හැකි ද? ඔබ චිත්‍රකර්මයෙහි දක්ෂ ද? ඔබට ගී ගැයිය හැකි ද? එසේ නම් බිලිංටන් ගී ප්‍රජා ශාලාවට එන්න!

දිනය : සෙනසුරාදා, වේලාව : රාත්‍රී

එවිට අපට ඔබගේ දක්ෂතා මැන ගත හැකි ය. විශාල තෑගි - තමක් දිනා ගැනීමට ඔබට අවස්ථාව!

කුශලතා සෙවීම

බාලිකාවෝ එය කියවූහ. "ඉතිං, මේකෙං ඇති වැඩේ මොකද්ද?" ඇලිමියා ප්‍රශ්න කළාය. "මාවිස්, ඔයා හිතාන ඉන්නේ මේකට සහභාගි වෙන්න ද?"

"ඔව්, නමුත් මේක අහන්නකෝ!" යයි මාවිස් මහා ලොකු වාසිදායක රහසක් හෙළි කරන්නාක් මෙන් හීන් ස්වරයෙන් කතා කළාය. "අයිරින්ට පුළුවන් සංගීත තරගෙට ඉදිරිපත් වෙන්න. බෙලින්ඩට පුළුවන් චිත්‍ර තරගෙට ඉන්න. සෙරෙල්ඩට පුළුවන් රඟපාන්න. එතකොට - මං - මගෙ කටහඬ හොඳ හින්දා - ගායනයට පෙනී සිටින්න පුළුවන්! හිතන්න - මොන මොන තෑගි අපට දිනා ගන්න පුළුවං වෙයි ද කියලා!"

තවුරුත් පිළිකුල් සහගත ලෙස මාවිස් දෙස බැලූහ. "මාවිස්, ඔයා හිතන්නේ ඔය බාල ෂෝ එකකට පෙනී සිටින්න ඉස්කෝලෙන් ඉඩ දෙයි කියල ද?" බෙලින්ඩා ප්‍රශ්න කළාය. "ඇරත්, ඔය වගේ පහත් පෙළේ සංදර්ශනයකට කවුද මේ ඉස්කෝලෙන් සහභාගි වෙන්න කැමති? දක්ෂ අය හොයන එක ඇත්ත! නමුත් අපට ගැළපෙනව ද? බිලිංටන් වටේම වගේ ඉන්න ගමේ-ගොඩේ මෝඩ මිනිස්සු සන්තෝෂ කරන්න පවත්වන මෝඩ සංදර්ශනයක් ඕක! තුච්ඡ දෙයක් තෑගි දෙයි ඕන තං! මෝඩ වෙන්න එපා - මාවිස්."

"ඒ වුණාට - බෙලින්ඩා, සෙරෙල්ඩා, මේක මාර චාන්ස් එකක් නේ!" යයි මාවිස් පිළිතුරු දුන්නේ තමා වේදිකාව මත



නැඟ තරඟන්නන් තම මිහිරි හඬින් කුල්මත් කරනා ආකාරය ද, ඔවුන් අත්පොලසන් දී තමාට ප්‍රීතිය පළ කරන අන්දම ද, එහි දෝංකාරය වටපිටාවේ රැව්-පිළිරැව් දෙන අන්දම ද, තමාගේ නම පුවත්පත්වල පළ වන අන්දම ද හිතින් මවාගෙන ය. අනේ, මෝඩ මාවිස්! තම පුහු අහංකාරය නිසා, මෙය හුදෙක් ගමේ-ගොඩේ අයට විනෝදය ලබා දීම සඳහා පවත්වන සාමාන්‍ය සංදර්ශනයක් හා තරඟයක් බව ඇයට වටහා ගත නොහැකි වූ හැටි!

"මාවිස්, ඔයා නම් වචනයෙන් කියලා නිම කරන්න බැරි මහ මෝඩියක්!" යයි ඇලිමියා නොඉවසිලිමත් ව පැවසුවාය. "ඔයා හිතනවා ද මේ මැලෝරි ටවර්ස්වල ළමයි ඔය ජරා ෂෝ එහෙකට සහභාගි කරවන්න මිස් ග්‍රේලිං ඉඩ දෙයි කියලා? ඔය වගේ තුච්ඡ දෙයක් තැනක මැලෝරි ටවර්ස් ගර්ල්ස්ලට බාල්දු වෙලා මෝඩ විදිහට සටුත්තු වෙන්න ඉඩ දෙයි කියලා ඔයා හිතනව ද? ඔයාට මොළේ කළදක් වත් නැද්ද?"

"එයාට ඒක තේරුම් ගන්න මොළයක් තියෙන්න එපායැ!" ඩැල්නි කීවාය. මාවිස් ඩැරල් අතින් එම පත්‍රිකාව උදුරා ගත්තාය. ඩැරල් එය කියවමින් සිටියේ අවංඥ සහගත සිනාවක් පාමිනි.

"හරි - කමක් නැහැ," යයි මාවිස් කීවාය. "ඔයාලට විනෝදයක් ලබා ගන්න ඕනෙ නැත්නම්, ඔය කට්ටිය කරබාගෙන ඉන්න. මං නං හිතාන ඉන්නෙ, මේකට සහභාගි වෙන්නයි."

"නිකං - ගොන් මෝඩියක් වෙන්න එපා, මාවිස්," යයි ජීන් කීවාය. "ඉස්කෝලෙ යන කෙල්ලක් විදිහට ඔය කඩ මණ්ඩියේ වේදිකාවක් උඩ නැඟලා, සෙනඟක් ඉදිරියේ සිංදු කියන එක ගැන හිතලා බලන්න! මොන බාල්දු වැඩක් ද!"

එය මෝඩ බාල්දු දෙයක් ලෙස මාවිස්ට පෙනුණේ නැත. එය මහා ලොකු හපන්කමක් ලෙස ඇ දුටුවාය. තරඟන්නන් මහ හඬින් අත්පොලසන් දෙන හැටි ඇයට පෙනුණි. එම හඬ ඇයට ඇසෙන්නාක් මෙන් විය. ඊට ප්‍රතිචාර වශයෙන් තමා වේදිකාවේ සිට කිහිප වරක් හිස -පහත් කරන අන්දම ඇ

හිමින් තබා ගත්තාය. ඔපෙරා ගායිකාවක වීමට යන ඇයට එය හොඳ අත්දැකීමකි!

ඇය දන්වීම් කොළය සාක්කුවේ දමා ගත්තේ, ඒ ගැන කාටවත් නොදන්වා සිටි සේ ය. ඇයගේ හිතට මෙයින් යම් අදහසක් පහළ වන්නට විය.

"මං මේකට කොහොම හරි යනවා. මං මේකට යන්නේ, කාටවත් නොදැනෙන්න - හොරෙන්. මං අමතර සංගීත පාඩමකට යනවා කියලා කිවා ම කාටවත් මං ඒ අය එක්ක නොහිටියා කියලා දැනෙන එකක් නෑ. ඒ අය හිතයි, මිස්ට යං හිය සතියෙ උගන්නන්න බැරි වුණ දෙයක් මට උගන්නනවා කියලා."

මේ අදහස කදිම ය. අද බ්‍රහස්පතින්ද ය. සිකුරාද මුළු දවස ම මේ ගැන කල්පනා කර බලා, සෙනසුරාද ඇයට හිත හදගත හැකි ය. තමා කළ යුත්තේ එසේ ය.

ඇ මුළු සිකුරාද ම එසේ කල්පනාවේ යෙදී සිටියාය. බිල් තන්වර් ගැන කල්පනාවේ යෙදී සිටියාය. දෙදෙනා ම පාංසකි කාමරයේ දී එසේ සිහින දක්මේ යෙදී නොසිටින්නට කල්පනාකාරී වූහ. එද අසනීපයෙන් පසු වූ වෙනත් ගුරුවරියකගේ රාජකාරිය බාර ගැන්මට තමාට සිදු වූයෙන්, පීටර්ස් මෙනෙවියට තම පාංසතියේ ළමුන් ගැන බැලීමට ඒ තරම් කාලයක් හා විවේකයක් නොවීය. ඇය වෙනුවට මැම්සෙල් අවේ පන්තිය ගත්තාය. ඇය සිටියේ සැහැල්ලු චිත්ත ස්වභාවයකිනි. ඇ බෙහෙවින් කතා කළ අතර, ළමුන් ගැන ඒ තරම් සොදිසියෙන් නොවූවාය. ඒ නිසා බිල්ට සහ මාවිස්ට සැනසිල්ලේ සිහින දකීමට සෑහෙන ඉඩක් ලැබුණේය.

බිල් නැවතත් ඉස්කෝලයට යාමට බිය වූවාය. පීටර්ස් මෙනෙවියගේ හදවත මොලොක් වී, තමා ගත් තීරණය වෙනස් කිරීමට ඇය පෙළඹී යයි ඇ බලාපොරොත්තු ඇති කර ගත්තාය. ඇය තන්වර්ට මෙහි රැඳී සිටීමට ඉඩ හරිනු ඇත. ඒ නිසා ඉස්කෝලය පළාතට වත් නොගිහින් සිටීමට ඇ තීරණය කළාය. එවිට පීටර්ස් මෙනෙවිය ඇය ගැන දුක සිතී ඒ තරම් දරුණු දෙයක් කිරීමෙන් වැළකී සිටිනු ඇත.



පීටර්ස් මෙනෙවිය මෙතෙක් බැරල්ට කිසිවක් නොකීවාය. බැරල්ට අවශ්‍ය වූයේ ඇයගෙන් බැනුම් අසා හෝ වෙනත් දඬුවමක් විඳ හෝ මෙහි කෙළවරක් දකීමට ය. එසේ නැති ව කුමක් සිදු වේ දැයි විචිකිච්ඡාවෙන් පසු වීම ඇයගේ හිතට වධයක් වූයේය. සමහරවිට පීටර්ස් මෙනෙවියගේ දඬුවම් දීමේ එක් පිළිවෙතක් එය විය හැකි ය. බැරල් අවිනිශ්චිත තත්ත්වයෙන් දින දෙවසක් රඳවා තබා ඇයට විඳවීම ඇයගේ එක් අරමුණක් විය හැකි ය.

සෙනසුරාද එළඹිණ. මාවිස් හිත හදගෙන සිටියාය. ඇ එහි යාමට තීරණය කර සිටියාය. තමාට සංගීත පාඩමක යෙදීමට ඇති බව පොට්ස් මෙනෙවියට දන්වා සිටීමට ඇයට පුළුවන. මෙසේ විටින් විට අනියම් වේලාවල ඇයට අමතර සංගීත පාඩම් ලැබීම අමුත්තක් නොවේ. පොට්ස් මෙනෙවිය, ඒ නිසා, සැකයක් ඇති කර නොගනු ඇත. ඇය ළමයින්ට ද එසේ දන්වනු ඇත. නවයට ඇඳට යාමට මාවිස්ට ආපසු එන්නට නුපුළුවන් වනු ඇත. එහෙත් බාලිකාවන් තමා පාවා නොදෙනු ඇත. පිටුපස තරප්පු පෙළෙන් පහළට බැස ඇයට මේ ගමන යා හැකි ය!

මේ අනුව, මාවිස් සවස බස් කාල සටහන හදාරන්නට වූවාය. හයට බිලිංග්ටන් යාමට බසයක් ඇත. ඇයට එහි හතට පෙර ළඟා විය හැකි ය. සංදර්ශනය ආරම්භ වන්නේ හතයි හිතට ය. ඇයට කල් වේලා ඇති ව ශාලාවට ඇතුළු වී තමාට සිටීමට ඇති දේ සොයා බලාගත හැකි ය.

ඇ ආපසු ඒමට ඇති බස් ගැන ඊළඟට හිත යෙදවූවාය. දර්ශනයට කොපමණ වේලාවක් ගත විය හැකි ද? සමහරවිට පැය දෙකක් ඊට ගත වනු ඇත. රාත්‍රී නවයයි හිතට ආපසු ඒමට බසයක් ඇත. එය අන්තිම බසය වේ. දෙවියනි, එවිට ප්‍රමාද වැඩි ය! තමා මේ කරන්නට යන දෙය ගැන ඇයට මහත්තාපයක් ද ඇති වූයේය. රාත්‍රී අන්ධකාරයේ ආපසු බස් නැවතුම් පළේ සිට පාසැල දක්වා ඇති පාර පාරේ ද ඇයට තනියෙන් ගමන් කිරීමට ඇත. සඳ එළිය හෝ ඇත්නම්? ඇ එසේ සඳ එළිය තිබේ යයි බලාපොරොත්තු වූවාය.

සෙනසුරාදා උදේ බිල් ඩැරල් ළඟට ආවාය. "ඩැරල්, ඔයාට පුළුවන් ද මං වෙනුවෙන් බඩුවක් කරන්න? මට ආයෙ ඉඩ දෙනකං - මං ඉස්කෝලෙට යන්නෙ නෑ. සමහරවිට මිස් පීටර්ස් තන්ඩර් ගෙදර යවන අදහස වෙනස් කරන්න පුළුවං - මං එයාගෙ හිත නොරිදවා හිටියොත්. ඒ හින්ද, ඔයාට පුළුවන් ද - හීන් සැරේ ගිහිල්ලා තන්ඩර්ට කොහොම ද කියලා බලලා එන්ට?"

"ඔව්, ඇත්තෙන් ම ඔව්, මං ගිහිං බලලා එන්නං. අද උදේ අනික් අශ්වයෝ ඇවිද්දවන කොට ඒ අතර තන්ඩර් හිටියෙ නෑ. මං දැක්කා අනික් අශ්වයෝ දක්කා ගෙන යනවා - තන්ඩර් ඇරුණා ම."

"නෑ - තන්ඩර් ඉන්න විදිහක් නෑ," යි බිල් කීවාය. "මං ඇරුණා ම, වෙන කෙනෙකුට ඌ පිට උඩ යන්න ඉඩ දෙන්නෙ නෑ. එහෙනං, ඩැරල්, ඔයා ගිහිල්ලා බලලා එන්නකෝ."

ඩැරල් ගියාය. ඇයට තන්ඩර් බැලීමට යාම තහනම් වී නැත. ඒ ගැන කලින් කල්පනා නොවීම ගැන ඈ දුක් වූවාය. ඊයේ වූව ද, බිල් වෙනුවෙන් මේ ගමන යාමට ඇයට සිදුවිණ.

ඈ ඉස්තාලය ඇතුළට ගියාය. සියලු ම අශ්වයෝ එහි සිටියහ. අලුත් බලාගන්නෙක් ද ඒ වේලාවේ එය තුළ සිටියේය. ඔහු අසකුගේ පිට අතුල්ලමින් සිටියේ සිවුරුහඬලමිනි.

"ගුඩ් මෝනිං, මිස්!"

"ගුඩ් මෝනිං! කෝ තන්ඩර්? දැන් තන්ඩර්ට හොඳ ද?"

"තන්ඩර් ඉන්න තැන ම ඉන්නවා, මිස්," යයි තැම් පිටි ඔහු කෙළින් වී කීයේය. "තන්ඩර්ට එච්චර හොඳ නැහැ. මට හිතෙන්නේ - එයාට බඩේ අමාරුවක් වගේ දෙයක් තමා හැදිගෙන එන්නේ!"

"බඩේ රුදාවක්?" යයි ඩැරල් ප්‍රතිරාවය කළේ තන්ඩර්ගේ ලෙඩේ එය නම්, එය ඒ තරම් බරපතළ අසනීපයක් විය නොහැකි බව සිතමිනි. ඈ තන්ඩර් ළඟට ගියාය. ඌ හිස පහළට එල්ලාගෙන අමාරු ගතියෙන් පසු වූයේය.



"තන්ඩර්ට එච්චර හරි නෑ - නේ!" යයි ඈ ටිකක් කැළඹුණු ස්වරයෙන් ඇසුවාය. "මං හිතන්නේ එයාගෙ ස්වාමිදූව දකින්න නැති හින්ද දුකෙන් ද දන්නෙ නෑ. එයාට තන්ඩර් බලන්න එන්න ඉඩක් නෑ නේ."

"ඔව්, එහෙමත් වෙන්න පුළුවන්," යයි කුදිරකරු කීයේය. "නමුත්, මට හිතෙන හැටියට - මෙයාගෙ බඩ ඇතුළෙ අමාරුවටයි ඔහොම වේදනාවෙන් ඉන්නේ. ඉක්මනින් හොඳ නොවුණොත්, පශු වෛද්‍යවරයාව ගෙන්නන්න වෙනවා. නමුත් මට ආරංචියි තන්ඩර් ගෙදර යවන්ට යනවා කියලා?"

ඩැරල් කිසිවක් නොකීවාය. ඈ වහා ම උකුරු කුලුන කරා, බිල් සොයා, දුව ගියාය. බිල් ඩැරල් එන තෙක් උදක් ම බලාපොරොත්තු ව සිටියාය.

"තන්ඩර්ට එච්චර හරි නැහැ. ඒ වුණාට ඔයා බය වෙන්න එපා. බලාගන්න එක්කෙනා කීවෙ තන්ඩර්ට බඩේ අමාරුවක් හැදීගෙන එනවා කියලයි. ඒක එච්චර ලොකු අමාරුවක් නෙවෙයි නේ?"

බිල් බියෙන් ගැස්සී ඩැරල් දෙස බලාගෙන සිටියාය. "බඩේ රුජාව? දෙයියනේ, ඒක අශ්වයන්ට හැදෙන බරපතළ ම ලෙඩක් නේ! ඩැරල්, හිතලා බලන්න අශ්වයෙකුට කොච්චර ලොකු බඩක් ද තියෙන්නෙ කියලා. එතකොට - හිතන්න ඒ බඩ පුරා ම වේදනාවක් ඇති වුණොත්, කොච්චර අමාරුවක් ද කියලා."

"අනේ, මං ඒක දනගෙන හිටියෙ නෑ," යි ඩැරල් කීවාය. "නමුත් ඒක හුඟාක් ම බරපතළ ලෙඩක් නෙවේ නේ?"

"ඒක බරපතළයි! බරපතළ ලෙඩක් ඒක!" යයි බිල් දෑසේ කඳුළු පුරවාගෙන කීවාය. "දැන් මං මොනව ද කරන්නේ? මට ගිහිං බලන්න විදිහක් නෑ. එතකොට මං අහුවෙයි. එතකොට, තන්ඩර්ව ගෙදර නොයවා ඉන්න මිස් පීටර්ස්ට ඇති වෙන්න පුළුවන් අදහස නැති වෙන්න පුළුවන්! තන්ඩර් ගෙදර යවන එක ගැන මිස් පීටර්ස් ඊට පස්සෙ මට මොකවත් කීවෙ නෑ. සමහරවිට එයා හිත වෙනස් කරගෙන ඇති! දැන් මං මොනවද කරන්නේ?"

"දැන් මයාට මොනවත් කරන්න දෙයක් නෑ. හෙට වෙන කොට තන්ඩර්ට සුවය ලැබේවි, බිල්. ආනේ! අන්න හයියෙන් ම වහිනවා! මං මේ පිට්ටනියෙ ප්‍රැක්ටිස් වලට යන්න හිතුවා විතරයි."

බිල් මුහුණ පසෙකට හරවා ගත්තාය. වැස්ස! වැස්සත් ප්‍රශ්නයක් ද! ඈ පසෙක වාඩි වී දුක් වන්නට වූවාය. මෙබඳු හැක්කුම (ආමශූලය) අශ්වයන්ට දරුණු ප්‍රතිඵල ගෙන දෙන්නකි. තමාගේ එක් සහෝදරයකුගේ අශ්වයකු මෙම රෝගය වැළඳී මිය ගොස් ඇත. මහ රෑ මැද තන්ඩර්ට රෝගය උත්සන්න වුවහොත්? ඒ බව කවුරුත් හෝ නොදන සිටියොත්? කුදිරකාරයන් ඉස්තාලය ළඟ ම නිදගන්නේ නැත. රෑ කුමක් සිදු වේ දැයි කවුරුවත් දන්නේ නැත. හෙට උදේ බලන විට තන්ඩර් මැරී හිටියොත්?

මෙවන් බියකරු හැඟුමන්ගෙන් බිල් වධ විඳිද්දී, මාවිස් සොඳුරු හැඟුමන්ගෙන් සතුට ලබන්නට වූවාය. ඇයගේ සියලු ම සැලැසුම් දැන් සම්පූර්ණ ය. සියල්ල අවසන් වූ පසු තමා අසු වුවත් ඇයට කමක් නැත. ඒ වන විට තමා ප්‍රසිද්ධියටත් ප්‍රසාදයටත් ලක් වී හමාර ය. එවිට මැලෝරි ටවර්ස් තමා වර්ණනා කරනු ඇත!

"මාවිස් මෙහෙම හපන්කමක් කරන්න කොච්චර නිර්භීත ද!" කියා මුළු පාසැල ම පුදුම වනු ඇත. "ඔපෙරා ගායිකාවක් වීමට යන ළමයා ඔහොම තමා! නොපසුබට උත්සාහය! ධෛර්යය! පෙරට යන ගතිය! මාවිස් නම් පුදුම ළමයෙක්!" යයි කවුරුත් පවසනු ඇත!

මාවිස්ගේ පිස්සු සැලසුම ගැන එද රෑ කිසිවකුට හෝ සැකයක් තිබුණේ නැත. තමාට අමතර සංගීත පාඩමකට යාමට ඇති බව ඇය පොට්ස් මෙනෙවියට කී කල, පොට්ස් මෙනෙවිය කිසිවක් නොකීවාය. මේ හේතුව නිසා තමා රාත්‍රී ආහාරය කලින් ගන්නා බව ද මාවිස් පොට්ස් මෙනෙවියට දන්වා සිටියාය. බාලිකාවන් ඇය ඇත් ද නැද්ද යන්න ගැන සෝදිසිමත් නොවූයේ අනියම් වේලාවට ඇය සංගීතය හැදෑරීමට යං මහතා ළඟට යන බව දන සිටි නිසා ය.



"මට ලේසියෙන් ම බස් එක අල්ලන්න පුළුවන් වෙයි. කාටවත් සැක නොහිතෙන හැටියට මට මේ ගමන යන්න පුළුවන්! මං අද රෑ ආපහු ආවා ම කෙල්ලො විත මොනව ද කියන්නේ කියලා බලමුකෝ! කවුරුත් කියන්නේ මගෙ කටහඬ මිසක් වෙන ගත යුතු දෙයක් නෑ කියලා නේ! බලමු!" යයි ඈ මහත් සතුටුදායක බලාපොරොත්තු ඇති ව තමාට ම කියා ගත්තාය.

ඇයට ලෙහෙසියෙන් ම බසයට යා ගත හැකි වූයේය. ඒ වේලාවේ නද වැස්සක් තිබුණ ද, වැහි කබාය දමාගෙන ඈ මේ ගමන පිටත් වූවාය. ඇය තොප්පිය ද නොගත්තේ එහි පාසැලේ නම යොද තිබුණු බැවිනි. ඇයගේ හිස විවෘත ව තිබුණ ද, බසය බිලිංග්ටන් නාට්‍ය ශාලාව ළඟ ම නතර කරනු ලැබෙන හෙයින්, ඇයට හිස පරෙස්සම් කරගෙන එය ඇතුළට යා ගත හැකි වන්නේය.

බසය ගමන් ඇරඹිණ. ප්‍රසිද්ධිය කරා, මහජන ගෞරවාදර ලබා ගැනීම සඳහා, නව ජීවිකා වෘත්තියක ආරම්භය පතා මාවිස් පිට ව ගියාය.

## 16

## මාවිස් කොහේ ද?

මාවිස් රාත්‍රී තෑම මේසයට වාඩි වී නැති බව පොට්ස් මෙනෙවියට සෝදිසි විය. ඇය ඒ බව ප්‍රකාශ කිරීමට තැරුණත් ම, තමා අමතර සංගීත පාඩමකට යන බවත් මාවිස් සඳහන් කළ සැටි ඇයට මතක් විය. එසේ නම් ඇය රාත්‍රී ආහාරය කලින් ගන්නට ඇත. ඇය මීට පෙර ද එසේ කර ඇත. ඒ අනුව පොට්ස් මෙනෙවිය කිසිත් නොකීවාය.

බාලිකාවෝ ද මාවිස් ගැන අමුත්තක් නොසිතූහ. ඔවුන්ට ද මාවිස්ගේ කටහඬ හුරු කර ගැන්මේ අමතර පංක්ති අමුත්තක් නොවේ. තමා ගැන මහත් ගර්වයෙන් පසු වන මාවිස්ගේ කටහඬ

මිස වෙනත් ගත යුත්තක් නැති බව ඇදහූ බාලිකාවන්ට ඇය පිටියත් නැතත් එතරම් වෙනසක් නොදනේ.

බිල් නිහඬ ව මහත් දුකින් පසු වූවාය. ඇය හරි හැටි ද කෑම වත් ගත්තේ නැත. හිත හොඳ වැරල්ට ඇය ගැන බඩු දුකක් සිතුණේය. තන්වර් ගැන වේදනාවෙන් පසු වන බිල්ට දැ බලන්නට යාමට ඉඩක් නොමැති බව ඇ දන්නීය. ඇ බිල්ගේ කනට කොඳුරා මෙසේ කීවාය.

"දැන් රෑ කෑමෙන් පස්සෙ, මං හීන් සැරේ ගිහිල්ලා, තන්වර්ට කොහොම ද කියලා බලලා එන්න ද?"

බිල් එය අනුමත නොකරමින් හිස වැනුවාය. "නැ - මං කැමති නැ - ඔයා අමාරුවේ වැටෙනවා දකින්න. රෑ වුණායි පස්සෙ ඉස්තාලෙට යන එක කාටත් තහනම්."

රාත්‍රී ආහාරයෙන් පසු මාවිස් පොදු කාමරයේ දක්නට නොලැබීම ගැන ද කිසිවෙක් කතා නොකළහ. ඇලිෂියා ගුවන් විදුලි යන්ත්‍රය ක්‍රියාත්මක කළාය. බෙලින්ඩා විකාර නැටුමක යෙදුණාය. සෙරෙල්ඩා ද නැගිට ඇයට සම්බන්ධ වූවාය. සියල්ලෝ සිනාසුණහ. හිතේ ලොකුකම, පුහු අහංකාරය හා අලංකාරය නැති කල, සෙරෙල්ඩා ද සිත් ගන්නාසුලු බාලිකාවකි.

බලා සිටින්නන්ගේ අත්පොලසන් හඬින් ඇ උදම් වූවාය. "මං ඔය කට්ටියට බලන්න, රෝමියෝ ජූලියට් ප්ලේ එකෙන් කොටසක් ඇක්ට් කරලා පෙන්නන්න ද?" යි ඇ මහත් ඕනෑකමින් අසා සිටියාය. "මිස් හිබර්ට් රිහර්සල් එක දෙනකං මං හරි අමාරුවෙන් බලං ඉන්නේ!"

"හොඳයි, එහෙනං - රඟපාලා පෙන්නන්නකෝ, සෙරෙල්ඩා!" යයි ග්වෙන් වහා ම කීවාය. අනික් අය ඇයගේ රංගනය ගැන කිසි උනන්දුවක් නොදක් වූව ද, ටික වේලාවකට එය ඉවසා සිටීම සඳහා පුටුවලට බර වී පහසුවෙන් සිටියහ.

සෙරෙල්ඩා රඟපෑමට පටන් ගත්තාය. ඇ දෑත් විහිද, කටහඬ පකස් කොට, ජූලියට්ගේ භූමිකාව ඉදිරිපත් කරන්නට වූයේ ඉංග්‍රීසි උච්චාරණය එසේ ම අනුකරණයේ යෙදෙමිනි.



එහි ප්‍රතිඵලය වූයේ කෘත්‍රිම උච්චාරණය හා එයට වැඩි අවධානය යෙදීම නිසා එය විකාර විදිහේ රඟපෑමක් ලෙස දිස්වීම ය. බාලිකාවෝ මහා හඬින් සිනාසෙන්නට වූහ. ඔවුන් ඇත්තෙන් ම සිතුවේ සෙරෙල්ඩා නාට්‍යයේ කොටසක් විහිළුවට රඟපාන බව ය. ඇය එය හිතා-මතාම කරන බව ය. සෙරෙල්ඩා රංගනය නතර කර, ඔවුන්ගේ හිනාවෙන් හිත තරක් කරගෙන ඔවුන් දෙස රවා බැලුවාය.

"මොනවට ද ඔයාලා හිනා වෙන්නේ? මේක නාට්‍යයේ හුඟාක් ම ශෝකාන්විත කොටසක්!"

ඇය මෙසේ පවසන්නේ ද කවටකමට යයි සිතූ බාලිකාවෝ තවත් හයියෙන් සිනාසුණහ. "හරි, හරි, සෙරෙල්ඩා, ඔහොම රඟපාගෙන යන්නකෝ! ඒක නං නියමයි!" වැරල් කීවාය. "මං දැනගෙන ම හිටියෙ නැ - ඔයාට ඔහොම කවටකම් කරන්න පුළුවන් කියලා."

"මං කරන්නේ මේ කවටකමක් නෙවේ," යයි සෙරෙල්ඩා අමනාපයෙන් කීවාය.

"හරි - හරි, රඟපාන්නකෝ!" යයි අයිරින් ද කීවාය. "හරි - ඉන්න, මං රෝමියෝ වෙන්නං! අපි මුළු කොටස ම විහිළුවට රඟපාමු."

"මං මේ විහිළුවක් කරනවා නෙවේ. මං රඟපාන්නේ නියම විදිහටමයි. මං හිතන්නේ - මං මෙහෙම තමා ඒ දුක්ඛිත කොටස රඟපාන්න ඕනේ කියලා."

බාලිකාවෝ ඇය දෙස විමතියෙන් බැලූහ. ඇය කියන්නේ ඇත්තක් ද? මේ විදිහට රඟපාන එක හරි බව ඇ ඇත්තට ම සිතන්නී ද? එය කොතරම් අස්වාභාවික ද යත්, එය දිස් වන්නේ විකාරයක් ලෙස ය.

කිව යුත්තේ කුමක් දැයි ඔවුන්ට වටහා ගත හැකි නොවීය. කෙසේ වුව ද, මෙය දුටහොත්, හිබර්ට් මෙහෙවිය කුමක් කියනු ඇත් දැයි ඔවුනට සිතා ගත හැකි විය. තමන්ට හොඳට රඟපාන්නට පුළුවන් යයි සිතා ඉදිරිපත් වන අයට කළ යුත්තේ කුමක් දැයි ඇ හරිහැටි දන්නීය. සෙරෙල්ඩාගේ රඟපෑම අත්හිටු

දුවල ය. ඇ. අත් දෙක විහිද ශෝකාකුල භාවයක් ආරූඪ කර ගැන්මට සිය මුහුණ විකෘති කර ගත්තාය. ඇයගේ වචන උච්චාරණය කෘත්‍රිම හා අස්වාභාවික විය.

"එයාට කොහෙත් ම රඟපාන්න බෑ," යයි ඇලීෂියා ඩැරල්ට කොඳුරා කීවාය. "අපි දන් මොනව ද කියන්නෙ?"

වාසනාවට මෙන්, ඒ මොහොතේ දොර විවෘත විය. තව වැනි පංක්තියේ ශිෂ්‍යාවක් ග්‍රැමෆෝන් තැටියක් ඉල්ලා ගැන්මට කාමරයට ඇතුල් වූවාය. පංක්තියේ සියල්ලන් හා උරණ වූ සෙරල්ඩා පුටුවක වාඩි වී පොතක් කියවන්නට ගත්තාය. ඇයට මුළු පාසැල සමග ම තරහක් ඇති වූයේය. "මං මොකට මේ කෙහෙම්මල් ඉස්කෝලෙට ආව ද මන්ද? කවුරුවත් මං ගැන තැකීමක් කරන්නේ නෑ. මුළු ඉස්කෝලෙ ම එකතු කරත් මං තරං වටින්නේ නෑ!" යයි ඈ සිතුවාය.

නවයට සීනුව නාද විය. මාවිස් නාවාය. ජීන්ට ඇය නැති බව එක් වර ම දැනුණේය. "කෝ, මාවිස්? අද හැන්ද වරුවේ ම මං එයා දක්කෙ නෑ?"

"ඇයි - මාවිස් කිවෙ, එයාට එක්ස්ට්‍රා මියුසික් ලෙසන් එකකට යන්න තියෙනවා කියලා?" ඩැරල් උත්තර දුන්නාය. "ඒක මහා දිග පාඩමක් වගෙයි! හරි, මිස්ටර් යං පාඩම ඉවර කරා ම එයා එයි!"

"මිස්ටර් යං කවදාවත් මෙච්චර වෙලා ගන්නෙ නෑ," යි ව්‍යාකූලත්වයට පත් ජීන් පැවසුවාය. "මිස් පොට්ස්ට කියන්න ද, නැද්ද කියලයි මං මේ කල්පනා කරන්නේ!"

"නෑ, එපා! මාවිස් ඔය කොහෙ හරි රැඳිලා ඉන්නවා ද දන්නෙ නෑ. මිස් පොට්ස්ට කියන්න ගිහිල්ලා, එයා අමාරුවේ වැටෙන්න පුළුවන්," යයි බෙලින්ඩා කීවාය. "එයා කෙළින් ම ඩෝම් එකට එන්නත් බැරි නෑ."

එහෙත් මාවිස් ශයනාගාරයේ ද දක්නට නොවූවාය. බාලිකාවෝ නිදන්නට සැරසුණහ. ඔවුන් ඇඳන් වලට නැග ගත් පසු විදුලිය පහන් නිවා දමනු ලැබිණ. ඉන්පසු ජීන්



ඔවුනට කතාවේ යෙදීමට ඉඩ නුදුන්නාය. එහෙත් මොහොතකට පසු ඔවුන් අමතා කතා කිරීමට ජීන්ට ම සිදු විය.

"ආනේ, ඒක නෙවේ, ඔය මෝඩි - මාවිස් - අර සංගීත සංදර්ශනේට ද - මොකට ද - කියන එකට ගියාවත් ද කියලා ඔයාලට හිතෙන්නේ නැද්ද? දන්නවා නේ - අර බෙලිංටන් ශාලාවේ මොකද්ද එකක් තියෙනවා කියලා අද එයා කියන්න හැදුවෙ?"

නිශ්ශබ්දතාවයක් පැවතිණ. ඉන්පසු ඇලීෂියා කතා කළාය. "මං නං පොඩ්ඩක් වත් පුදුම වෙන්නේ නෑ! එයා එහෙ යන්න ඇති - තමංට හොඳ චාන්ස් එකක් හම්බුණා කියලා - තමංගෙ කටහඬ ප්‍රසිද්ධියේ පෙන්නන්න! එයාගෙ කටහඬ ගැන මහ ලොකුවට හිතාන ඉන්න හින්ද - එයා - කාටත් නොකියා හොරෙන් එහෙ යන්න ඇති - මං හිතන්නේ."

"ආ - එහෙනං, එයා ගැන රිපෝට් කරන්නයි වෙන්නෙ. මොනවා හරි දේකට සීමාවක් තියෙන්න එපායැ!" ජීන් මහත් තරහින් හා වගකීමෙන් යුතු ව පැවසුවාය.

"අපිට දන් ම මොනවත් කරන්න බෑ," යයි ඩැරල් සම්බන්ධ වූවාය. "කොයි මොහොතේ හරි මාවිස් ආපහු එයි! ඔය විචිත්‍ර ප්‍රසංගය ආරම්භ වෙන්නෙ කීයට ද කියලා මට මතකයක් නෑ. මං හිතනවා එයාට අටහමාරේ බස් එක අල්ලා ගන්න පුළුවන් වෙයි කියලා - ආපහු එන්න. එතකොට නවයහමාර පහු වෙලා - ටිකක් ගියා ම - මෙහෙ ඉන්න ඕනෑ. දන් නං ඊට කිට්ටුයි. - හෙට උදේ මිස් පොට්ස්ට කියන්න හිටියොත් නරක ද - ජීන්? මාවිස් - අපි හිතන විදිහට එහෙ ගිහිල්ලා තියෙනවා නං - මහ තකතිරු ගොන් දෙනක්!"

"මට තියෙන බය මේකයි," ජීන් පැවසුවාය. "මාවිස් ස්ටේජ් එකට නැගලා සිංදු කියන්ට පටන් ගත්ත ම, මුළු ශාලාව ම අප්පුඩි ගහන්නයි, චියර් කරන්නයි පටන් ගනීවි. අපි දන්නවා නේ එයාට තියෙන කටහඬ කොහොම ද කියලා. ඉතිං ඒ ආඩම්බරේට, දිගින් දිගට ම සින්දු කියන්ට පටන් ගත්තොත්, එයාට ඉස්කෝලෙත් අමතක වෙයි - ඔක්කොම අමතක වෙයි. ආවට පස්සෙ මොනවා වුණත් කමක් නෑ කියලා - එහෙ

සින්දු කිය කියා ඉඳිවි! ඊට පස්සෙ මොනව වෙයි ද කියලා මන් දන්නෑ!"

"හෙට උදේ වෙනකං බලමුකෝ," යයි ඩැරල් නිදිමතේ කීවාය. "එයා කොයි වෙලේ හරි ආවා ම - බැරුවයැ කරන දෙයක් කරන්න. හෙට උදේ රිපෝට් කරන්න - ජීන්!"

නිදන කාමරය තුළ කතා කරන හඬ ඇසී පුදුමයට පත් පොට්ස් මෙනෙවිය දොර ළඟට ආවාය. "ආ - දැන් කතාව නතර කරන්න!" යයි ජීන් අණ දෙන හඬ අසා, ඇ දොර ඇර දෙස් පවරන්නට නොසිතුවාය. යම් හෙයකින් ඇය දොර ඇරියා නම් විදුලි පහන් දල්වන එක ද ඇය අතින් සිදු වීමට තිබුණි. එවිට මාවිස්ගේ යහන හිස් බව ද ඇයට දැක ගන්නට තිබුණි. කාමරයෙන් යළි හඬක් නොනැඟුණෙන් ඇ යන්නට ගියාය.

සුවුරුත් මෙන් නින්දට ගියහ. මාවිස් එන තුරු බලා සිට ඇයට බනින්නට ජීන් සිතා ගත් නමුත්, ඇයගේ ද ඇස් පියවිණි. ඇයට ද නින්ද ගියේය. එහෙත් බිල් තවමත් අවදියෙන් ය. මාවිස් ගැන කෙරුණු කතා-බහ ඇයට ඇසුණේ නැත. ඇය තමාගේ ම කල්පනා ලෝකයේ පසු වෙමින් සිටියාය. ඇයගේ හිතට ආයේ මහත් වේදනාකාරී හැඟීම් ය. "තන්ඩර්! උඹට දැන් කොහොම ද? උඹට මාව නැතුව දුක ද?" ආදී වශයෙන් ඇ තන්ඩර්ට හිතෙන් කතා කරන්නට වූවාය. ඇයට වෙනත් ලෝකයක් නොවීය.

ඩැරල් ද නින්දට වැටී සිටියාය. බිල් නිද සිටියේ ඇයගේ ඇඳට එහා ඇඳේ ය. බිල්ගේ හිත සනසන අයුරින් නින්දට පෙර වචනයක් කතා කිරීමට ඩැරල් සිතා සිටි නමුත් ඊට කලින් ඇයට නින්ද ගියේය. දැන් අවදි ව සිටින්නේ බිල් පමණි.

මාවිස් ආපසු ආවේ නැත. දහයේ කණිසම වැදුණේය. එකොළහ ද විය. මාවිස් නාවාය. අවදියෙන් සිටින්නේ බිල් පමණි. ඇයට මාවිස් ගැන සිහියක් නැත. වේලාව දොළහ විය. බිල් ඔර්ලෝසුව දොළොස් වරක් නද දෙන හඬ අසා සිටියාය.

"මට නින්ද යන්නේ නෑ! මට නිදගන්න බෑ! මම හෙට එළිය වැටෙනකං ම මෙහෙම ඇහැරිලා ඉඳිවි. තන්ඩර්ගේ



අසනීපය කොහොම ද කියලා දැනගන්න තියෙනවා නම්! තන්ඩර්ට හොඳයි කියලා මට දැනගන්න ලැබුණොත්, මගෙ හිතට හරි! නමුත් උංට අර දරුණු බඩේ අමාරුව ඇත්තට ම තියෙනවා නම්?"

මෙසේ කල්පනාවේ යෙදෙමින් ඇ නව විනාඩි කිහිපයක් ගත කළාය. එවිට ඇයට මතක් වූයේ මෙම ගොඩනැගිල්ලේ ඉස්තාලයට කිට්ටු පැත්තේ ජනේලයක් විවෘත කළ හැකි බවයි. එම ජනේලය ඉස්තාලයට කෙළින් ම ඉහළින් ඇත්තකි. තමා එතැනට ගොස් ජනෙල් පලු විවෘත කර එළියට නැමී කන් දුන්නොත්, තන්ඩර් හොඳින් සිටී දැයි දැන ගත හැකි බව ඇයට සිතිණ. ආමශූලයෙන් පෙළෙන අශ්වයෙක් වේදනාත්මක හඬක් නංවයි. ඇයට එය අසා ගත හැකි වේ.

බිල් ඇඳෙන් බැස අත-පත ගා ඩ්‍රෙසිං ගවුම සොයා ගත්තාය. ඉන්පසු සෙරෙප්පු දෙක දමා ගත්තාය. ඇ අන්ධකාරයේ ම අත-පත ගාගෙන දොර ළඟට ගියාය. එසේ යන ගමන් ඇ ඩැරල්ගේ ඇඳේ ද ටිකක් හැප්පුණාය. එවිට ඩැරල් එක් වර ම අවදි වූවාය. ඇය සිතුවේ මාවිස් ආපසු එන බව ය.

ඩැරල් ඇඳ මත වාඩි වී "මාවිස්?" යයි කොඳුරා සිටියාය. එහෙත් පිළිතුරක් නොවීය. දොර හෙමින් විවෘත වී වැසෙන හඬ ඇයට ඇසුණේය. කවරකු හෝ එළියට ගිය බවකි ඒ! කිසිවකු ඇතුළට ආ බවක් ඉන් නොහැඟිණ. ඒ කවුරු විය හැකි ද?

ඩැරල් සිය විදුලි පන්දම ගෙන දල්වා බැලුවාය. ඇයට එක් වර ම පෙනුණේ බිල්ගේ හිස් යහන ය. බිල්ට අසනීපයක්වත් ද? එසේ නැත්නම්, ඇය ඉස්තාලයට වත් ගොස් ඇත් ද? මේ මධ්‍යම රාත්‍රියේ මහා වැස්සේ එය සිදු විය නොහැක්කකි.

ඇ දොර ළඟට ගියාය; එය විවෘත කළාය. කොරිඩෝරයට ටිකක් පහතින් හා ඈතින් යමක් තමාට පෙනෙන බවක් ඇ සිතුවාය. ඇ ඒ දෙසට පියමං කළාය.

ඉස්තාලයට මුහුණ ලා ඇති ජනේලය ළඟට ගිය බිල් එහි පලු විවෘත කරන හඬ ඩැරල්ට ඇසිණ. බිල් ජනේලයෙන් ඉදිරියට නැමී කන් දීගෙන සිටියාය.

බිල්ගේ හදවත සීතල විය. කෙදිරිගාන හඬක් සහ කකුල් බිම ගසන හඬක් ඉස්තාලයෙන් නැගී ආයේය. එය ඇස්සෙන් ම වේදනාවෙන් පෙළෙන අසතු මතු කරනා වේදනාත්මක සංඥා ය! ඒ, තන්ඩර් බවට බිල්ට සැකයක් නොවීය. තන්ඩර් නිසැකයෙන් ම බඩේ රුජාවෙන් පෙළෙන්නේය. ඌ දගලන්නේ වේදනාවෙනි. කවරකු හෝ පිහිට නොවුව හොත් ඌ මිය යනු ඇත!

ඈ ජනේලය ළඟින් මෑත් වූවාය. ඩැරල් ඇයගේ උරහිසට අතක් තැබූ කල ඈ ගැස්සී උඩ පැන්නාය.

"බිල්, ඔයා මෙතැන මොනව ද කරන්නේ?"

"ඕ, ඩැරල්, මං මේ අහගෙන හිටියේ ඉස්තාලෙන් මොනව හරි ශබ්දයක් එනව ද කියලා. ඔය ඇහෙන්නේ අශ්වයෙක් වේදනාවෙන් පිට කරන සද්දේ! මට හොඳට ම විශ්වාසයි - ඒ තන්ඩර්! මං ඌ ළඟට යන්න ඕනැ! අනේ ඩැරල්, මගේ එක්ක එන්න! මට ඔයාගෙ උදව් ඕනැ වෙයි! අනේ ඩැරල් - මට පිහිට වෙන්න!"

"හරි - මං එන්නං," යයි ඩැරල් කිවාය. "මං එන්නං!.යං ගිහිල්ලා ඉක්මනට ඇඟ වැහෙන්න මොනවා හරි දාගෙන එමු. අර, හොඳට ම වහිනවා - එළියෙ. අපිට මෙහෙම එළියට බහින්න බෑ."

තමාගේ සිරුර ආවරණය කර ගැන්මට නතර වන්නට තරම් විවේකී සිතක් බිල්ට නොවීය. එහෙත් ඩැරල්ගේ පෙරැත්තය මත ඇයට එසේ කිරීමට සිදු විය. දෙදෙනා ම ලොම් කබා, දිගු කබා හා වැහි කබාවලින් සැරසී පිටුපස තරප්පු පෙළ දිගේ පහළට බැස, පැත්තකින් වූ කුඩා දොරෙන් එළියට පැන, මහා වැස්සේ ඉස්තාලය කරා දිව ගියහ. අසතු කෙදිරි ගාන හඬ සහ කකුල් බිම ගසන ශබ්දය ඩැරල්ට ද ඇසුණේය. ආ - එය කොතරම් කටුක සංඥාවක් ද! වෙව්ලන ඇඟිලිවලින් දොර ඇරගෙන බිල් ඇතුළට ගියාය. පසෙක ලන්තෑරුමක් තිබුණේය. ඒ අසල ගිනිපෙට්ටියක් ද වූයේය. ගිනිකූරක් ගසා ගැන්මට බැරි තරමට බිල්ගේ ඇඟිලි වෙව්ලන්නට වූයේය. ඩැරල් එසේ කර ලන්තෑරුම අතට ගත්තාය.



ඉස්තාලයේ අඳුර ලන්තෑරුම් එළියෙන් මැකී යද්දී දෙදෙනාට ම සුළු සැනසීමක් ඇති වූයේය. අසුන්ගේ හා පිදුරුවල සුවඳ වඳිමින් ඩැරල් බිල් පසු පස තන්ඩර් සිටින තැනට ගියාය.

තන්ඩර්ගේ ඇස් මහත් වී ඌ බියට පත් ව සිටි සැටි පෙන්නුම් කෙළේය. ඌ වේදනාවෙන් කිසිවක් කර කියා ගත නොහැකි තත්ත්වයෙන් හිස පහළට එල්ලාගෙන සිටියේය. ඇසින් ඇසෙන ගෙරවිලි හඬ වැනි අමුතු ශබ්දයක් තන්ඩර්ගේ සිරුර තුළින් පිට වූයේය.

"ඔව්, තන්ඩර්ට බඩේ අමාරුව තමා; තත්ත්වෙ හොඳ නැ, ඩැරල්. අනේ, ඩැරල්, අපි මූට බිම වැතිරෙන්න ඉඩ තියන්න හොඳ නැ! ඒක අශ්වයන්ට හොඳ නැ - මෙහෙම ලෙඩ වුණා ම. අපි මූ කොච්චර වත් ඇවිද්දවන්න ඕනැ."

"ඇවිද්දවන්න? කොහෙද? මේ ඉස්තාලේ ඇතුළේ?" ඩැරල් පුදුම වී ඇසුවාය.

"නැ - එළියේ! ඒක තමා දැනට කරන්න තියෙන එක ම ප්‍රතිකාරේ. එහෙම ඇවිද්දවන කොට ඌ බිම වැතිරෙන්නෙ නැ. මේ බලන්න, ඌ දැන්ම ම පහත් වෙන්න හදන හැටි! මට උදව් වෙන්න ඩැරල්, මගෙ තන්ඩර් කකුල් හතරෙන් හිටවගෙන ඉන්න!"

අශ්වයකු බිම වැතිරෙන්නට හිතූ විට එය නතර කිරීම මහත් අසීරු කාර්යයකි. තන්ඩර් බිමට පහත් වීමට පටන් ගත්තේ නම් ඌ නතර කිරීම මේ දෙදෙනාට කොහෙත් ම කළ නොහැක්කකි. එහෙත් වාසනාවට මෙන්, බිමට ඇද වැටෙන්නේ නැති ව, හතර ගාතයට වෙර දී, සිටගෙන සිටිමින්, බිල්ගේ ඇගේ නාහය අතුල්ලමින් ඉන්නට තන්ඩර් මහත් වෙහෙසක් දැරීය. ඇය දකුමෙන් ඌ අමුතු ම ප්‍රාණයක්, දිරියක් හා සතුටක් ලැබූ නිසාය, ඒ!

බිල් හයියෙන් අඬන්නට වූවාය. "අනේ, තන්ඩර්, මට මොකද්ද උඹට කරන්න පුළුවන්නේ? අනේ බිමට වැටෙන්න එපා, තන්ඩර්! බිම වැතිරෙන්නෙ නැතුව ඔහොම ම හිටගෙන හිටපන්, තන්ඩර්!"

"දැන් අපිට ඕන කරන්නේ පශු වෛද්‍යවරයා මෙතැනට ගෙන්න

ගන්නයි, බිල් නැද්ද? කොහොම ද අපි එයා ගෙන්නන්නේ?" ඩැරල් කැලඹීමෙන් යුතු ව ඇසුවාය.

"ඔයාට පුළුවන් ද මෙහෙ අශ්වයකුගෙ පිට නැගලා ගිහින් වෙට් අඬගහගෙන එන්න?" පිටි අල්ලෙන් කඳුළු පිස දමමින් බිල් ඇසුවාය. "ඔයා දන්නවා නේ - වෙට් ඉන්නේ කොහෙද කියලා? ඒක එච්චර ම ඈතක් නෙවේ."

"ඒක මට පුළුවන් දෙයක් නෙවේ." ඩැරල් කීවාය. "මේ මහ රෑ, මට බෑ හරියට අශ්වයෙක් මෙහෙයවා ගෙන ගෙනි යන්න. ඔයා යන්න බිල්! මං තන්ඩර් බලාගෙන මෙතැන ඉන්නං."

"මට එක විනාඩියකට වත් තන්ඩර් දලා මෙතැනින් යන්න බෑ - දන් උංගෙ තත්ත්වෙ හැටියට," යයි කළ යුත්තේ කුමක් දැයි තේරුම් ගත නොහැකි ව බිල් පැවසුවාය. ඩැරල් කඩිනම් කල්පනා කරන්නට වූවාය.

ඇයගේ හිතට යම් අදහසක් පහළ විය. ඈ බිල්ගේ උරහිසට අත තැබුවාය. "බිල්, ඔයා මෙතැන ඔහොම ම ඉන්න. මං කොහොම හරි පිහිටක් හොයාගෙන එන්නම්. දුක් වෙන්න එපා! මං පුළුවන් තරම් ඉක්මනින් එන්නම්!"

# 17

## මැදියම් රැයේ අසු පිට ගමනක්

ඩැරල් වැස්සේ ම දුව ගියාය. ඇයට පහළ වූ අදහස බිල්ට දන්වා සිටීමට ඈ කැමති නොවූවාය. බිල් එයට එකඟ නොවනු ඇත. එහෙත් දැනට කළ යුතු එක ම ප්‍රඥාගෝචර ක්‍රියාව එය බව ඩැරල් සිතුවාය.

ඇය මේ යන්නේ පිටර්ස් මෙනෙවිය අවදි කර, ඇයට තන්ඩර් ගැන දන්වා සිටීමට ය! පිටර්ස් මෙනෙවිය තන්ඩර්ට ආදරයෙන් හා අනුකම්පාවෙන් කතා කළ සැටි තමාට ඇසුණු අන්දම



ඇයගේ සිහියට ආවේය. එමෙන් ම එට ප්‍රතිචාර වශයෙන් ඌ ඇයගේ ඇඟ නාහයෙන් පිරිමැද්ද අන්දම ද ඇයගේ මතකයට ආවේය. ඇත්තෙන් ම, මේ අවස්ථාවේ ඇය කරුණු තේරුම් ගෙන ඔවුන්ට පිහිට වීමට ඉදිරිපත් වනු ඇත. ඩැරල් පාසැල් ගොඩනැගිල්ලට ගොඩ වී පිටර් මෙනෙවියගේ කාමරය සොයා අඳුරේ එහෙ-මෙහෙ හැප්පෙමින් දිව ගියාය. තමා මේ පැමිණියේ ඇයගේ කාමරයට ම දැයි ඇයට මුල දී සැකයක් ඇති විය. කාමරය හරි ය. ඈ එහි දොරට තට්ටු කළාය.

පිළිතුරක් නොවීය. ඈ යළිත් දොරට තට්ටු කළාය. තව ම ඇතුළෙන් ප්‍රතිචාරයක් නැත. පිටර්ස් මෙනෙවිය හොඳ සැපට නිදන්නියකි. හදිසිය වැඩි බැවින්, ඩැරල් දොර විවෘත කර ඇතුළට ගියාය. කාමරය ඝන අඳුරේ ය. ඈ බිත්තිය අත ගා විදුලි පහන දල්වූවා ය.

පිටර්ස් මෙනෙවිය ගුලි ගැසී ඇඳේ නිදාගෙන සිටියාය. සැපට නිදන ඇය අවදි කිරීමට හෙණ හඬකට වුව ද බැරි ය. ඩැරල් ඇයගේ යහන ළඟට ගොස් ඇයගේ උරහිසට අත තබා සෙලවූවාය.

එවිට පිටර්ස් මෙනෙවිය එක් වර ම නැගිට සිටියාය. ඇඳේ වාඩි වූ ඈ පුදුමයට පත් ව ඩැරල් දෙස රවා බැලුවාය. "මේ මොකෝ? ඇයි මයෙ ළඟට ආවේ? මොකද්ද කාරණේ?"

මෙහි පැමිණි ලෙස, පොට්ස් මෙනෙවිය සොයාගෙන හෝ පාලිකාව සොයාගෙන හෝ යාමට ඩැරල්ට දිරියක් තිබුණි. එහෙත් මෙම කාරණයේ සුවිශේෂත්වය අනුව, ඩැරල්ට සිතුණේ අවශ්‍ය පරිදි කටයුතු කළ හැක්කේ පිටර්ස් මෙනෙවියට පමණක් බව ය. ඩැරල් සිද්ධිය විස්තර කර සිටියාය.

"තන්ඩර්ට හුගාක් අමාරුයි. ඌට ලොකු බඩේ අමාරුවක්! ඌ හිටගෙන ඉන්න බැරුව බිමට පහත් වෙන්න දඟලන හින්ද බිල්ට බයයි ඌ මැරෙයි කියලා. මිස් පිටර්ස්, බැයි ද වෙට් සර්ජන් ගෙන්වලා දෙන්න? ප්ලීස්!"

"මගෙ දෙයියනේ! මේ මහ රෑ - මෙච්චර තද වැස්සේ, මය ළමයි දෙන්නා ඉස්තාලෙට ගියා ද?" යි ඔර්ලෝසුව දෙස බලා

පීටර්ස් මෙනෙවිය ඇසුවාය. වේලාව රාත්‍රී දෙළහයි සිනාව විය. ඇ එහා ම ඇඳෙන් බිමට බැස්සාය; ඉන්පසු අසුන් පිට යාම සඳහා අඳින කලිසම ද, ජර්සිය ද, කබාය ද ඇඟ ලා ගත්තාය. ඇය සවස් වරුවේ ළමුන් සමග අසුන් පිට යමින් සිටි බැවින් මෙම ඇඳුම් රාක්කයේ උඩින් ම තිබුණි.

"ඔව්," යයි ඩැරල් පිළිතුරු දුන්නාය. "මිස් පීටර්ස් තරහා ගන්න එපා, මං මෙහෙම කිව්වට. තන්ඩර් ලෙඩේ අමාරුවට කෙඳිරි ගානවා ඇහුණා ම අපට එහෙ යන්න වුණා."

"මං තරහා ගන්නේ නෑ," යයි පීටර්ස් මෙනෙවිය කීවාය. "අද තන්ඩර් ගැන මට ම දුක හිතුණා. මම පශු වෛද්‍යවරයාට අද ටෙලිෆෝන් කළා ම එයා කිව්වා හෙට එන්නං කියලා. හරි, දන් මාත් ඔය ළමයා එක්ක ඇවිත් බලන්නං, තන්ඩර්ට මොකද කියලා."

පීටර්ස් මෙනෙවිය ඩැරල් සමග වහා ම ඉස්තාලයට ගියාය. ඇය දකුමෙන් බිල් මහත් විමතියට පත් වුවාය. එහෙත් ආපදු තත්ත්වයෙන් පසු වූ අසු මෙල්ල කර ගැන්මට පීටර්ස් මෙනෙවිය දක්වූ දක්ෂතාවය දුටු කල ඇයගේ සිතට සහනයක් දැනිණ. තන්ඩර් කුලුපග ලෙස කෙඳිරි ගාමින් නාසයෙන් ඇයගේ උරහිස පිරිමදින්නට වූයේය. පීටර්ස් මෙනෙවිය ඌට ආදරයෙන් කතා කළාය. බිල්ගේ හදවතට ඉන් මහත් සැහැල්ලු ගතියක් දැනිණ.

"මූ - මිස් පීටර්ස්, අපිට බැයි ද වෙට් දන් ම ගෙන්නා ගන්න? මට හරි හයයි තන්ඩර් බිමට පාත් වෙලා වැතිරෙයි කියලා. එහෙම වුණොත් අපට ඌ ආයෙ නැගිට්ටවා ගන්න බැරි වෙයි," යයි පීටර්ස් මෙනෙවිය කෙරෙහි මේ මොහොතේ ඇති වූ විශ්වාසයෙන් යුතු ව බිල් කියා සිටියාය.

තන්ඩර්ගේ බඩ ඇතුළෙන් ගුරු-ගුරු හඬක් නැගී ආ අතර, ඌ වේදනාවෙන් සහ භීතියෙන් කෙඳිරිලි හඬක් නැංවීය. ඌ පහත් වෙන්නට සැරසෙන ගතියක් පළ කෙළෙන්, පීටර්ස් මෙනෙවිය වහා ම ඌ ලිහාගෙන ඉස්තාලයේ එහාට-මෙහාට ඇවිද්දවන්නට පටන් ගත්තාය. ඉස්තාලයේ සිටි අනික් අශ්වයෝ මෙම අපූරු දර්ශනයෙන් විස්මයට පත් වූ සේ හිස් හරව හරවා



බලන්නට වූහ. අශ්වයෝ දෙතුන් දෙනෙක් පීටර්ස් මෙනෙවියට ආදරය ප්‍රකාශ කරමින් කෙඳිරිගාන්නට වූහ.

"ඩැරල්, ගිහිල්ලා ඔය දෙන්නගෙ පසුව වැහෙන්න ස්වෙටර්ස් දෙකක් අරගෙන එන්න. ඊට පස්සෙ, ඔය දෙන්න ම එකතු වෙලා තන්ඩර් පිට්ටනියට අරං ගිහිං රවුමෙ ඇවිද්දවන්න. මං ගිහිල්ලා වෙට්ට ටෙලිෆෝන් කරලා ආපහු විගහට එන්නං."

ඩැරල් දුව ගොස් ස්වෙටර් දෙකක් රැගෙන අවුත් එකක් බිල්ට අන්දවා අනික තම ඇඟට දමා ගත්තාය.

"හරි, එහෙනං දන් මං ගිහිං ෆෝන් කරලා එනකං තන්ඩර්ව එළියෙ ඇවිද්දවන්න!"

පීටර්ස් මෙනෙවිය පශු වෛද්‍යවරයාගේ නිවසට දුරකථනයෙන් කතා කළාය. ඔහුගේ නිවස බලාගන්නා නිදිමතේ උත්තර දුන්නේය. "කනගාටුයි, මැඩම්, වෙට් ගියා රැග්ලට් ගොවිපළට - එළදෙනක් ගැන බලන්න. වැඩ ඉවර වෙලා එහෙම නිද ගන්නවා කියලයි ගියේ. නෑ - මැඩම්, එහාට ටෙලිෆෝන් නැහැ. ඔව්, දෙස්තර මහත්තයව දන් ගෙන්වා ගන්න බැරි වෙයි. ඔව්, කනගාටුයි!"

පීටර්ස් මෙනෙවිය රිසීවරය ආපසු තබා කල්පනා කළාය. පශු වෛද්‍යවරයාට කතා කිරීමට ඇයට නුපුළුවන් විය. ඔහු ගෙන්වා ගැන්මට ක්‍රමයක් නැත. දන් කළ යුත්තේ කුමක් ද? අශ්වයාට වහා ම ප්‍රතිකාර ලබා දිය යුතු ය. බෙහෙත් පෙවිය යුතු ය. බෙහෙත් ඇත්තේ පශු වෛද්‍යවරයා ළඟ පමණි. එය ඌට පොවන්නට හැක්කේ ද ඔහුට පමණි. තන්ඩර්ගේ තත්ත්වය බරපතළ බව පීටර්ස් මෙනෙවිය තේරුම් ගත්තාය. වහා ම යමක් කළ යුතු ය.

ඇ යළිත් ඉස්තාලයට ගියාය. බිල් සහ ඩැරල් අසු පිට්ටනිය වටේ ඇවිද්දවමින් සිටියාහ. වැස්ස ඔවුන් මත කඩා හැලෙමින් තිබුණි. පශු වෛද්‍යවරයා බැහැරක ගොස් සිටියෙන් ඔහුට දුරකථනයෙන් කතා කිරීමට නොහැකි වූ බව ඇ කියා සිටියාය. බිල්ට කෙඳිරි ගැවිණි. ඇ කර කියා ගත නොහැකි තත්ත්වයකට පත් වුවාය.

"වෙට් ශිහිල්ලා රෙග්ලට් ගොවිපළට," යයි පිටර්ස් මෙනෙවිය බිල්ට දනුම් දුන්නාය. "එහාට හැතැක්ම පහක් විතර තියෙනවා - බිලිංටන් වලට යන පාරේ. මං දන්නවා - මං දන් කරන්න තියෙන මොකද්ද කියලා. මං දන් මෙහෙ වෙන අශ්වයෙක් පිට නැගලා ගිහිං එයා එක් කරගෙන එන්න ඕනෙ. ඒක තමා කරන්න තියෙන එක ම දේ."

"මොනවා - මේ - රෑ මැද - මේ වැස්සේ?" යයි තම කන් අදහා ගත නොහැකි ව මෙන් ඩැරල් අසා සිටියාය.

"ඒක එච්චර දෙයක් නෙවේ," යයි පිටර්ස් මෙනෙවිය පිළිතුරු වශයෙන් කීවාය. "තන්ඩර් කොච්චර හොඳ අශ්වයෙක් ද! ගා වෙනුවෙන් මොනවා කරත් මට ගානක් නෑ!"

ඉකි බිඳ බිඳ අඬා සිටි බිල් නිතැතින් ම මෙන් පිටර්ස් මෙනෙවියගේ අත අල්ලා ගත්තාය. "මිස් කොච්චර යහපත් ද! බොහොම ස්තූතියි, මිස් පිටර්ස්, ඔබ මෙච්චර කරුණාවන්ත කෙනෙක් කියලා මං දනගෙන හිටියෙ නෑ. මිස්ට පුළුවන් වුණොත් ඒ වෛද්‍යවරයා අඬගහගෙන එන්න!"

පිටර්ස් මෙනෙවිය ඇයගේ උරහිසට ආදරයෙන් තට්ටු කළාය. "මං මගෙ මුළු ශක්තිය ම යොදලා ඒක කරනවා. දුක් වෙන්න එපා - බිල්!"

ඩැරල් මවිතයෙන් මවිතයට පත් වූවාය. පිටර්ස් මෙනෙවිය ප්‍රථම වතාවට ඇයට බිල් කියා කතා කිරීමට තරම් සුහද වූවාය. තන්ඩර් බේරා ගැනීම සඳහා, මධ්‍යම රාත්‍රිය ද පසු වී, මේ වැස්සේ ඇය යන්නේ දුර ගමනක් ය. ඇය ඇත්තෙන් ම පුදුමාකාර ගුරුවරියකි. ඇය මෙතරම් ගුණ යහපත් කාන්තාවක බව බිල් කිසි ද නිකමට වත් සිතුවේ නැත.

"මට නං හිතා ගන්න වත් බෑ," යයි ඩැරල් අසු පිටිවතිය වඩා විශ්‍රමාන්විත ලෙස ගෙන යන ගමන් බිල්ට කීවාය. "මනු පිටින් පේනවාට වඩා මිනිස්සුන්ගේ අභ්‍යන්තරය කොච්චර වෙනස් ද!"

පිටර්ස් මෙනෙවිය ඉස්තාලයෙන් අසකු ගෙන උගේ පිට උඩ නැග අඳුරේ නොපෙනී ගියාය. බාලිකාවෝ දෙදෙනා මාරුවෙන්



මාරුවට තන්ඩර් පිරිවතිය වටේ ඇවිද්දවන්නට වූහ. මෙසේ ඇවිදින විට උටෙ යම් සහන ගතියක් දනුණේය.

"ඩැරල්, මිස් පිටර්ස් ගැන මට මෙච්චර කල් තිබුණු තරහ දුවල් මතක් වෙන කොට, මට දන් මොකද්දෝ වගේ දනෙනවා. මං දක්ක ඉතාමත් හොඳ අය එයා කියලයි මං හිතන්නේ. බොහොම කවුද මේ මහ රෑ සත්තු දොස්තර හොයාගෙන මේ මහ වැස්සේ ඔච්චර දුරක් යන්නේ! මට නං මේ ණය කොහොම වත් ගෙවන්න බැරි වෙයි. පුළුවන් ද?"

"නෑ, මං හිතන්නෙ නෑ - ඔයාට පුළුවන් වෙයි කියලා. මිස් පිටර්ස් නං පුදුම ගෑනියක්! අපෙ ළමයි හෙට මේ ගැන ඇහුව ම කොහොම පුදුම වෙයි ද!" ඩැරල් කීවාය.

පිටර්ස් මෙනෙවිය අන්ධකාරයේ අශ්වයා මෙහෙයවා ගෙන ගියාය. වැස්ස ඇය මත කඩා හැළුණ ද ඈ ඒ ගැන නොසලකා සිටියාය. ඈ සියලු කාලගුණයන්ට ඔරොත්තු දෙන නැත්තැස්සියක් වූවාය. වැස්ස, සුළඟ, හිම හා මීදුම ගැන ඇයගේ තැකීමක් නොවීය. ඈ රෙග්ලට් ගොවිපළ කරා පැමිණ එහි ගේට්ටුව හරහා ඇතුළට ගියාය. ගොවිපළේ මඩුවකින් එළියක් තිබුණේ වූයේය. පශු වෛද්‍යවරයා ගොවි මහතා සමග එහි සිටිනි යි පිටර්ස් මෙනෙවිය අනුමාන කළාය. ඈ මඩුවේ දොර ළඟට ගියාය. අශ්ව කුර ගැටෙන ශබ්දය මේ මහ රෑ මහ හඬක් නිකුත් කෙළේය.

ගොවි මහතා මවිතයට පත් වී දොර ළඟට ආයේය.

"වෙට් මෙහෙ ඉන්නව ද? මට එයාට කතා කරන්න පුළුවන් ද?" කියා පිටර්ස් මෙනෙවිය ගැඹුරු හඬින් ඇසුවාය.

"එයා ඇතුළේ ඉන්නවා," යයි ගොවි මහතා පිළිතුරු දුන්නේය. පිටර්ස් මෙනෙවිය අසු පිටින් බැස මඩුව ඇතුළට ගියාය. පශු වෛද්‍යවරයා එය තුළ විය. ඔහු එළදෙනක ළඟ දණ ගසාගෙන සිටි අතර, එළදෙන ළඟ ලස්සණ පුංචි වසු පැටව් දෙදෙනෙක් වූහ.

"මිස්ටර් ටර්න්බුල්, ඔබගෙ මෙහෙ වැඩ ඉවර නම්, ඔබට කරුණාකර මැලෝරි ටවර්ස් එන්න පුළුවන් ද? අද උදේ මං

අර වැලිහෝත් එකෙන් කීව කන්ඩර් කියන අශ්වයාට අමාරුයි, කෝලික් කියන බඩේ අමාරුව හැදිලා! ඌට වහා ම ප්‍රතිකාර අවශ්‍ය වෙලා තියෙනවා." පීටර්ස් මෙනෙවිය කීවාය.

"හරි," යයි පවසමින් පශු වෛද්‍යවරයා නැඟිට සිටියේය. "මගෙ මෙහෙ වැඩ ඉවරයි. මං හිතුවට වැඩිය කලින් ඉවර වුණා. හරි, මං දැන් එන්නං - මගෙ අශ්වයා අරගෙන. ආ - රූග්ලව්," කියා ඔහු ගොවි මහතා අමතා සිටියේය. "එළදෙන දැන් හොඳින් ඉන්නවා. ඇට හොඳ පැටව් දෙන්නෙක්! මං දැකලා තියෙන හොඳ ම පැටව්!"

පීටර්ස් මෙනෙවිය සහ පශු වෛද්‍යවරයා මැලෝරි ටවර්ස් බලා පාර දිගේ අසුන් දෙදෙනා මෙහෙයවන්නට වූහ. ඔවුන් වික දුරක් ආ කල, පීටර්ස් මෙනෙවියගේ අශ්වයා මඟ නතර වී පස්ස ගැසීය.

"ඕ - හෝ! වෝ! ඇයි මොකෝ!" යයි ඈ හඬ දුන්නාය. ඒ සමඟ ම පාර අයිනේ වැටී තිබූ යමක් ඇයට දිස් විය. එය අඳුරු පාට ය. රෑ අඳුරේ එය ඇයට පෙනුණේ යන්තමිනි.

"මිස්ටර් ටර්න්බුල්, මෙතෙන්ට එන්න!" ඈ කතා කළාය. "මට හිතෙන හැටියට අතන කවුදෝ වැටිලා ඉන්නවා. මං හිතන්නේ කාර් එකක් හප්පලා ගිහිල්ලා වගේ! නැඟිටින්න බැරි ව ඉන්නවා ඇති!"

පශු වෛද්‍යවරයා අත හොඳ එළිය දෙන විදුලිය පන්දමක් විය. ඔහු එහි එළිය දැල්විය. ගුලි ගැසී තිබුණු පොදිය වෙත එහි ආලෝක ධාරාව එල්ල විය. එය මැකින්ටෝෂ් වැහි කබායකින් ආවරණය වී තිබුණි.

"දෙයියනේ, මේ ගැහැනු ළමයෙක් නේ!" යි පශු වෛද්‍යවරයා හඬ දුන්නේය. "තුවාල වෙලා ද දන්නෙ නෑ!"

ඔහු ළමයා ඔසවා ගත්තේය. පීටර්ස් මෙනෙවිය මහත් බියට පත් ව කෑගැසුවාය. "මේ මාවිස් නේ ද! අනේ, දෙයියනේ! මාවිස්! මේ මහ රෑ, මේ පාර අයිනේ මේ වේලාවේ - මාවිස් කොහොම ද වැටිලා ඉන්නේ? මේක හිතන්න බැරි භයානක දෙයක්!"



"මෙහෙත්සි වැඩිකමට කලන්තෙ හැදිලා - මං හිතන්නේ!" පශු වෛද්‍යවරයා කීවේය. "ඇගේ ඇට කැඩිලා හරි තුවාලයක් වෙලා හරි නෑ වගේ! මෙන්, ඇස් අරිනවා."

මාවිස් නෙත් විදහා බැලුවාය. ඈ පීටර්ස් මෙනෙවිය දැක හඬන්නට වූවාය. එය දුර්වල හඬක් විය. "ඒ අය - මට සින්දු කියන්ට - දුන්නෙ නෑ! මට අන්තිම බස් එකත් මිස් වුණා. මම මේ වැස්සේ දිගට ම පයින් ආවා!"

"මේ ළමයා මොනව ද මේ දොඩවන්නේ?" යයි පශු වෛද්‍යවරයා ඇසීය. "මෙයා හොඳට ම තෙමිලා! අපි ඉක්මන් නොකළොත් මේ ළමයට නිව්මෝනියා හැදෙයි. මං මේ ළමයා මගෙ අශ්වයා පිටට ගන්නං. උදව් කරන්න. මිස්, උඩට ගන්න!"

දුකටත්, බියටත්, පීඩාවටත් පත් ව සිටි පීටර්ස් මෙනෙවිය මාවිස් පශු වෛද්‍යවරයාගේ අසු පිටට ගැන්මට උදව් කළාය. ඔහු දරිය ඉදිරියෙන් තබා අල්ලාගෙන අසු මෙහෙයවීය. ඔවුන් ගමනේ ඉදිරි කොටස ගෙවා ගත්තේ හෙමින් ය.

ඔවුහු මැලෝරි ටවර්ස් කරා ආහ. "මාවිස්ට ඇවිදගෙන යන්න පුළුවන් නම්, මං එයා කෙළින් ම මෙට්‍රන් ගාවට ගෙනියන්නං," යයි පීටර්ස් මෙනෙවිය කීවාය. "අනේ, දෙයියනේ! මොන රාත්‍රියක් ද! මිස්ටර් ටර්න්බුල් ඔබ කෙළින් ම ඉස්තාලෙට යන්න. වැරල් එක්ක එකතු වෙලා බිල් අශ්වයාව පිට්ටනියෙ ඇවිද්දවනවා."

පශු වෛද්‍යවරයා ඉස්තාලය දෙසට ගමන් කරද්දී, පීටර්ස් මෙනෙවිය අධික වෙහෙසට පත් ව හා ශීතලෙන් කැටි වී සිටි මාවිස් වත්තම් කරගෙන උතුරු කුළුනට ගෙන ගියාය. මාවිස්ට අඩිය තබා ඇවිදීමට බැරි තරම් විය. පීටර්ස් මෙනෙවියට සිදු වූයේ ඇය ඇදගෙන මෙන් ඉහළට නැඟීමට ය.

මාලිකාව අවදි වී දෙර විවෘත කළේ පුදුමයට පත්ව ය. මාවිස්ගේ තත්ත්වය දුටු කල ඈ බියට පත් වූවාය. "මේ මොකද්ද වෙලා තියෙන්නේ? මෙයා කොහෙද ගිහිල්ලා තියෙන්නේ? කොහෙ ඉඳල ද හම්බු වුණේ? හොඳට ම තෙමිලා, සීතල අල්ලලා ගල් ගැහිලා ඉන්න ඇති! දත් වෙව්ලනවා! මිස් පීටර්ස්, ඔන්න අල්මාරියේ ඉලෙක්ට්‍රික් බ්ලැන්කට් එකක් තියෙනවා. ඒක මය

හුංවී ඇඳට උඩින් දාන්න. ඒ කරලා ඇඳ රත් වෙන්න අරින්න. මගෙ ඉලෙක්ට්‍රික් කේට්ල් එකත් ඔන් කරන්න. මගෙ දෙයියනේ! මේ මොනවා වෙලාද මන්ද!"

"දෙයියො තමා දන්නේ!" යයි තමාට පවරන ලද සියලු ම වැඩ කරන ගමන් පීටර්ස් මෙනෙවිය පැවසුවාය. පාලිකාව ඉක්මනින් මාවිස්ගේ ඇඳුම් ගලවා, ඒවා පැත්තකට විසි කර, ඇයට උණුසුම් ඇඳුම් ඇන්දෙව්වාය. ඉන්පසු පීටර්ස් මෙනෙවිය ඇය යහනේ හොවා ඇය දෙපසින් උණු වතුර පිරි බෝතල් දෙකක් තැබුවාය. මේ අතර පාලිකාව උණු කොකෝ පානයක් පිළියෙල කළාය.

තමාට සිදු වූයේ කුමක් දැයි පැවසීමට මාවිස් උත්සාහ කළාය. ඇය කතා කළේ සීතල නිසා වෙනස් වූ කටහඬකිනි. "මං බිලිංටන් ගියා - එහෙ තිබුණ සංගීත තරගෙට ඉදිරිපත් වෙන්න. ඉස්කෝලේ ළමයින්ට සහභාගි වෙන්න බෑ කියලා, ඒ අය මට තරගෙට ඉන්න දුන්නෙ නෑ. මං කොච්චර වත් කන්නලව් කරා, කොහොම හරි මට ඉඩ දෙන්න කියලා. නමුත් ඒ අය ඇහුවෙ නැහැ. මට අන්තිම බස් එකත් මිස් වුණා. ඉතිං මං එහෙ ඉඳන් දිගට ම පයින් එන්න පටන් ගත්තා - මහ කළුවරේ - මහ වැස්සේ! ඒ මදිවට තද හුළඟ! මං හොඳට ම මහන්සි වෙලා - ඇදගෙන වැටුණා. මට ආයෙ නැගිටින්න බැරි වුණා. ඉතිං මං....."

"දැන් - වැඩිය කතා කරන්න එපා!" පාලිකාව කරුණාවෙන් කීවාය. "දැන් මේ කොකෝ එක උණු උණුවේ බීලා නිදාගන්න! මං එහා ඇඳේ නිදාගන්නං! එතකොට ඔය ළමයට බය වෙන්න දෙයක් නෑ."

පීටර්ස් මෙනෙවිය කාමරයෙන් පිට වී ගියේ අශ්වයකු ගැන බැලීමට ඇතැ යි යමක් කොඳුරමින් ය. මෙය පාලිකාවට ප්‍රහේලිකාවක් වූයේය. පීටර්ස් මෙනෙවිය මේ මධ්‍යම රාත්‍රිය ද පසු වී අසුන් පිට යන ඇඳුමින් සැරසී සිටින්නේ මන්ද යන බවත්, ඇයට මාවිස් පාරේ වැටී සිටිනු කෙසේ දක්නට ලැබුණේ ද යන බවත් ඇයට තේරුම් ගත නොහැකි වූයේය. දැන්



පාලිකාවට ඇති ප්‍රධාන කාර්ය මාවිස් ගැන බැලීම ය. මෙම අභිරහසේ ඉතිරි හරිය ඇයට පසු ව දැන ගත හැකි ය.

පීටර්ස් මෙනෙවිය තම මූලික කටයුත්ත කෙරෙන අන්දම ගැන බැලීමට ගියාය. බිල් සහ ඩැරල් මහත් සතුටින් හා සැනසීමෙන් යුතු ව පශු වෛද්‍යවරයා පිළිගෙන සිටි අතර, ඔහු හඳුනන තන්ඩර් ද ඔහු දුටු ගමන් නහයෙන් සිහින් හඬක් නංවා සතුට ප්‍රකාශ කර ඇත. පශු වෛද්‍යවරයා විශාල ප්‍රමාණයට බෙහෙතක් දිය කර ඌට පොවා ඇත. "ඌට කකුල් හතරෙන් ම ඉන්න සලස්වලා ඔය ළමයි දෙන්නා කරලා තියෙන්නේ ලොකු සේවයක්! ඒකෙන් සතාගෙ ජීවිතේ බේරුණා කියලා කියන්න පුළුවන්," යයි ඔහු හොඳට ම වෙහෙසට පත් ව සිටි බාලිකාවන් දෙදෙනාට කීවේය. "දැන් ඔයාලා දෙන්නා නිදාගන්ට යන්න. මං එළිවෙනකං මෙහෙ ඉඳං තන්ඩර්ට සාත්තු කරන්නං. මිස් පීටර්ස් ඉන්නවා නේ - මට උදව් කරන්න."

# 18

# පසු දින උදය

තන්ඩර් දමා යාමට බිල්ගේ අදහසක් නොවීය. එහෙත් පීටර්ස් මෙනෙවිය ආදරයෙන් හා දයාවෙන් යුතු ව ඇයට කරුණු පහදා දුන්නාය. "දැන් - බිල්, මේ කාරණේ අපට බාර දෙන්න ඕනෑ. බිල් දන්නවා අපට කරන්න පුළුවන් හැම දෙයක් ම අපි කරනවා කියලා, තන්ඩර් සුව කරන්න. දැන් ඌ හොඳට බෙහෙත බිව්ව හන්ද සනීප වෙයි. අපි අවශ්‍ය තරම් ඌ ඇවිද්දවන්නම්. එතකොට, ඔය ළමයයි ඩැරලුයි තමන්ගේ කොටස හරියට කළා නේ. ඒ වගේ ම හොඳ මහන්සියක් වුණා නේ. දැන් ඉතිං කරුණු නියම විදිහට තේරුම් ගෙන, අපි කියන විදිහට වැඩ කරන්න."

"ඔව්, මං මිස් පීටර්ස් කියන විදිහට වැඩ කරන්න ආසයි,"

කියා බිල් ඇගේ අත තදින් අල්ලා ගත්තාය. "මිස් පීටර්ස් මට කළ උදව්වට මට කවදාවත් ණය ගෙවන්න බැ. මට කවදාවත් අද රෑ මේ අත්දැකීම් අමතක වෙන්නෙ නැ. මිස් පීටර්ස් අමතක වෙන්නෙ නැ."

පීටර්ස් මෙනෙවිය බිල්ගේ පිටට ආදරයෙන් තට්ටු කළාය. "ඒක පුදුම දෙයක්. මං ආපහු කිසි දෙයක් බලාපොරොත්තු වෙන්නෙ නැ! මාත් බිල් වාගෙ ම තත්ත්වෙට ආදරෙයි. මට දැනුණා ඔය ළමයට හැගෙන්නෙ කොහොම ද කියලා. මං කන්ඩර් ගෙදර යවන්නෙ නැ, බිල්. ඔය ළමයට ලං වෙන්න මං කියා ගන්න පුළුවන්. කන්ඩර් බලන්ට එන්ට එපා කියලා කනේ දෙලා ඔය ළමයට දඬුවම් දෙන්න - වේදනාවක් දෙන්න මට ආසෙ හිතෙන එකක් නැ කියලා මං දන්නවා."

"මිස්ට ආයෙ මට දඬුවම් දෙන්න සිද්ධ වෙන හැටියට මං මට පස්සෙ හැසිරෙන්නෙ නැ," යි බිල් පැවසුවේ ලාම්පු එළියට මුහුණ බැබළෙද්දී ය. "අද ඉඳං මං තමා මිස් පීටර්ස්ගේ හොඳ ම - හොඳ ම ශිෂ්‍යාව!"

"ආන්න ඒක තමා බිල්ගෙන් මට ලැබෙන්න ඕනැ කරන උපකාරය," යයි පීටර්ස් මෙනෙවිය සිනාසෙමින් පැවසුවාය. "හරි - දන් දෙන්න ම යන්න! දෙන්න ම හොඳට මහන්සි වෙලා - නිදි මරලා - වැස්සට අහුවෙලා - සුදුමැලි වෙලා! ඔය දෙන්නා උදේ ආහාර ඇඳේ දී ගන්නත් කමක් නැ."

"නැ - මිස් පීටර්ස්, අපි ආසයි අනිත් ළමයි එක්ක කෑම ගන්න. අපිට එනකොට දන් මේ රෑ වෙච්ච සිද්ධියත් විස්තර කරන්න පුළුවන් නේ."

"හරි එහෙනං, හෙට රෑට කලින් ම නින්දට යන්ට පුළුවන් - ඕන නං! දන් එහෙනං - ගුඩ් නයිට්! ගුඩ් නයිට් හෙවේ - ගුඩ් මෝනිං! දන් පාන්දර තුනටත් ළඟයි!"

ගැහැනු ළමෝ දෙදෙනා හැප්පි හැප්පි ඇනුම් අරිමින් උතුරු කුලුන නේවාසිකාගාරය කරා ගියහ. මහන්සිය නිසා ඔවුහු වැඩි කතා-බහක නොයෙදුණහ. එහෙත් ඔවුන් මහත් සතුටට පත් වූයේ අවුරුදු ගණනක් ම මිතුරියන් වශයෙන් කල් ගෙවූ



ලෙස ය. බිල් ඇඳට ගිය පසු ඉන ම ඇඳේ වූ ඩැරල් අවතා කොටුරා සිටියාය.

"ඩැරල්, මං දන්නවා - ඔයා සැලීගේ මිතුරිය කියලා. ඒ නිසා ඔයා මට අයිති නැ. හැබැයි මං ඔයාගෙ මිතුරිය කියලා හිතන්න - සදහට ම! ඒක මතක තියා ගන්න! අද රෑ ඔයා මට කළ උදව්වට, කවද හරි මං ඔයාට මොන විදිහෙන් හරි උදව් වෙනවා!"

"ආ - ඒක හරි!" යයි නිදිමතෙන් පැවසූ ඩැරල් සැණින් නින්දට වැටුණාය.

ඩැරල් සහ සැලී කොතරම් තදින් නින්දට වැටුණේ ද යත්, පසු ද උදේ සීනුව ඔවුන්ට ඇසුණේ නැත. ජීන් ඔවුන් අල්ලා සොලවා ද ඔවුහු අනිත් පැත්තට හැරී ගුළි ගැසී නිදන්නට වන්හ.

"ඩැරල්, බිල්, මොකද්ද මේ ඔයාලට වෙලා තියෙන්නෙ? නැගිටිනවා - කම්මැලි නැති ව, නැගිටිනවා! දන් බෙල් එක ගහලා කොච්චර වෙලා ද! අපිට ඔය දෙන්නට බඩුවක් කියන්න තියෙනවා. නැගිටින්නෙ නැද්ද?" ජීන් කෑගැසුවාය.

නිවාසයේ අන් සියලු ම බාලිකාවෝ මාවිස්ගේ අතුරුදහන්වීම ගැන කතා කරමින් සිටියහ. ජීන්ට මෙය බලගතු ප්‍රශ්නයක් වූයේය. පෙර දින රෑයේ මාවිස් නිදන්නට ආවේ නැති බව ඒ අවස්ථාවේ ම පැමිණිලි කිරීමට තමා අපොහොසත්වීම ගැන ඈ පශ්චාත්තාපයට පත් වූවාය.

"දන් මං මිස් පොටිස් හමු වෙන්ට යන්ට ඕනැ. දන්ම ම යන්ට ඕනැ," යයි තමාට ම කියා ගනිමින් ඈ නේවාසිකාගාරයෙන් පිටවූවාය. එහෙත් ඒ වන විට පොටිස් මෙනෙවිය මාවිස් පිළිබඳ සිද්ධිය දනගෙන සිටියාය. ඇයට ඒ ගැන දන්වූයේ පාලිකාව ය. ග්‍රේලිං මෙනෙවිය ද එය දන සිටියාය. ජීන්ගේ ප්‍රශ්නය වූයේ මාවිස්ගේ අතුරුදන් වීම ය. එහෙත් උපස්ථානාගාරයේ රඳවනු ලැබ සිටි මාවිස්ගේ සොබා තත්වය ග්‍රේලිං මෙනෙවියගේ ප්‍රශ්නය විය. එම ප්‍රතිකාරස්ථානය භාර හෙදි සොයුරිය ඇය බලා ගත්තාය. දෙස්තර ගෙන්වා-

ඇත්තට ද පණිවුඩයක් යවනු ලැබිණ.

මාවිස් ගැන මෙම තොරතුරු පොට්ස් මෙනෙවිය ජීන්ට හෙළිකළ පසු, "එහෙනං, මාවිස් බිලිංටන් ගිහිල්ලා තියෙනවා?" යයි ජීන්ට ඉබේ ම කියවිණ.

"එහෙනං, ජීන් ඒ ගැන දන්නවා?" යයි පොට්ස් මෙනෙවිය ද ප්‍රශ්නයක් යොමු කෙළේ කෝපයෙනි. "ජීන් නම් හරිම පිදුම් ශිෂ්‍ය නායිකාවක්! ඒ ළමයගෙ හිතේ බිලිංටන් යන්න අදහසක් තිබුණ බව දැනගෙනත්, ඊයෙ රෑ නවයට ඒ ළමයා අනිත් ළමයි එක්ක නිදන්න ආවෙ නැති බව දැනගෙනත්, පැමිණිලි කළේ නැහැ! ඒක තමාගේ ලොකු නොසැලකිල්ලක්. ජීන්, මේක තේරුම් ගන්න. කේලාම් කියන එකෙයි, පැමිණිලි කරන එකෙයි වෙනසක් තියෙන එක අවබෝධ කර ගත යුතු අවස්ථා තියෙනවා. හරි ද? ඔය ළමයා ඒක දන්නවා නේ? අපට තිබුණා මාවිස් බරපතල අසනීපෙකින් බේරාගන්න - ඔය ළමයා වෙලාවට පැමිණිලි කරා නම්, මාවිස් නිදන්ට ආවෙ නෑ කියලා - ඊයෙ රෑ ම."

ජීන් සුදුමැලි වුවාය. "මට නින්ද ගියා," යයි ඈ දුර්වල විදිහේ නිදහසට කාරණාවක් ඉදිරිපත් කළාය. "අන්තිම බස් එක එනකං බලං ඉන්නයි මං හිතාන හිටියෙ. ඒ බස් එකේ මාවිස් ආවේ නැත්නම් මං හිතාන හිටියේ, ඇවිල්ලා රිපෝට් කරන්න. නමුත් මට නින්ද ගියා."

"හරි ම නිදහසට කාරණයක් නේ - ඒක!" යයි පොට්ස් මෙනෙවිය පැවසුයේ තමා ගැන ම තරහා ගනිමිනි. පෙර රැයෙහි අටේ පන්තියේ ඩෝමිටරියේ දොර ළඟට ම ගිය තමා දොර ඇර බැලුවේ නම්, මාවිස් කාමරයේ නොසිටි බව තමාට ම දැක ගන්නට තිබුණු බව ඇයට කල්පනා විය.

"අපට මාවිස් බලන්න පුළුවන් ද?" ජීන් බයෙන් බයෙන් ඇසුවාය.

"කොහෙත් ම බෑ," යි පොට්ස් මෙනෙවිය එක් වර ම උත්තර දුන්නාය. "එයාට හුඟක් අමාරුයි. ඊයෙ රෑ මහා වැස්සට හොඳට ම තෙමිලා, පාර අයිනේ වැටිලා, සෑහෙන වේලාවක් කලන්තෙ



හැදිලා ඉඳලා. දැන් ඒ ළමයට බ්‍රොන්කයිටිස්! ඒක ශ්වාසනාලය ඉදිමිලා ඇති වෙන රෝගයක්! ඒක තවත් නරක අතට හැරෙන්නෙ නැති වෙයි කියලයි අපි මේ ප්‍රාර්ථනා කර කර ඉන්නේ. එයාගෙ උගුර හොඳට ම නරක් වෙලා - කොඳුරන්න වත් බෑ."

ජීන් ආපසු ශයනාගාරයට ගියේ බියෙන් මෙන් ම තම වරද ගැන තැවුණු සිතින් යුතුව ය. අට වන පන්තියේ ළමයින් ඩැරල් වට කර ගෙන සිටිනු ඈ දුටුවාය. ඔවුන් නොඉවසිල්ලෙන් හා උනන්දුවෙන් යුතු ව කන් දීගෙන සිටියේ රෑ මැද ඩැරල් හා බිල් මුහුණ දුන් අත්දැකීමට ය. බිල් එහි නොවූවාය. අවදි වූ මෙන් ඇය ඉස්තාලයට දිව ගිය බව කිව යුතු නැත.

"මේ අහන්න...." යයි ජීන් ඔවුන්ට කතා කළාය. එහෙත් කවුරුවත් ඇයට ඇහුම්කන් දුන්නේ නැත. කවුරුත් විශ්මිත ව හඬ අයාගෙන කන් දීගෙන සිටියේ ඩැරල්ගේ මවිතකරවන සුළු කතාවට ය. ජීන් ද නිරායාසයෙන් ම එයට කන් යොමු කළාය.

"නමුත්, ඔයාලට හිතන්න පුළුවන් ද - මිස් පීටර්ස් ඔය විදිහට හිත උණු වෙන කෙනෙක් කියලා. හොඳ වෙලාවට, ඩැරල්, ඔයා කල්පනා කරලා එයා අඬගහගෙන ගියේ," යයි බෙලින්ඩා විමතිය පළ කළාය.

"ඒක නම් පුදුම රාත්‍රියක්!" ඩැරල් කීවාය. "අපි දෙන්නා තන්ඩර් අල්ලාගෙන පිට්ටනිය වටේ යන්න ඇති හැතැප්ම ගණනාවක්. දැන් තන්ඩර්ට කොහොම ද දන්නෙ නෑ!"

කොරිඩෝරය දිගේ ඉදිරියට හයියෙන් අඩිය තබාගෙන එන අයෙකි! ඈ ඩෝමිටරියට ඇතුල් වූවාය. ඒ බිල් ය. ඇයගේ මුහුණ බැබළෙන්නට විය. "ඩැරල්, ඩැරල්, මගෙ තන්ඩර්ට දැන් හොඳයි. දැන් හොඳට ඕට්ස් කනවා! කෑවට මදි වාගෙ - බලන්නෙ. උදේ හතහමාර වෙනකං වෙට් හිටියා. මිස් පීටර්ස් මේ දැන් වෙනකං හිටියා. එයා ආපහු නින්දට ගිහිල්ල ම නෑ!"

"දෙයියනේ! මිස් පීටර්ස් තං නියමයි!" යයි ඇලිෂියා කීවාය. ඇයට ද පීටර්ස් මෙනෙවියගේ අලුත් දර්ශනයක් පෙනෙන්නට

විය. "බිල්, ඒක නෙවේ, ඇයි ඔයා හරි - ඩැරල් හරි - අපිට කියන්නෙ නැත්තෙ?"

"අපි දන්නෙ නැති හින්දයි - වෙන්ට යන්නෙ මොකද්ද - අපට මුහුණ දෙන්ට වෙන්නෙ මොනවට ද කියලා. අපි හිතුවෙ තන්ඩර් ගැන විතරයි. ඩැරල් මට පුදුම විදිහට වොයම්යක් වුණා! මගෙ ලොකු බරක් එයා කරට ගත්තා! දන් තන්ඩර්ගෙ ප්‍රශ්නෙ ඉවරයි. මිස් පිටර්ස් කිව්වා එයා තන්ඩර්ව ගෙදර යවන්නෙ නැ කියලා. දන් මගෙ හිතට සන්තෝෂයි. මිස් පිටර්ස් ඊයෙ මට කළ උදව්ව මං කවරදවත් අමතක කරන්නෙ නැ."

"මොකද නැත්තෙ," යි ඇලීෂියා කීවාය. "ඔයා වාඩිවෙලා, ජනේලෙන් එළිය බලාගෙන, වෙනද වගේ හීන දකින්න ගියාම."

"නැ - මං එහෙම කරන්නෙ නැ," යි බිල් අවධාරණයෙන් කියා සිටියාය. "මාව සවුත්තු කරන්න එපා - ඇලීෂියා. මං සතුටින් හිටියට, තව ම හිතට හරි නැහැ. මං දන් දන්නවා මිස් පිටර්ස් තන්ඩර්ට ආදරෙයි කියලා. තන්ඩරුත් මිස් පිටර්ස්ට ආදරෙයි, එයාට හරි ම හීලැයි. මං දන් ඉස්සරට වැඩිය හුඟක් වෙනස්! මං මිස් පිටර්ස්ට තන්ඩර්ගෙ පිට උඩ නැගලා යන්න වුණත් ඉඩ දෙනවා."

මේ අවස්ථාවේ ජීන්ට කතා කිරීමට ඉඩක් ලැබිණ. "දන් මට ඇහුම්කන් දෙන්නකෝ!" යි පැවසූ ඈ මාවිස්ගේ සිද්ධිය විස්තර කරන්නට වූවාය. කවුරුත් ත්‍රාසයට පත් වී අසාගෙන සිටියහ.

"අනේ - දෙයියනේ!" යයි ඩැරල් එක් වර ම කියා සිටියාය. "මිස් පිටර්ස් ඊයෙ රෑ බේරා ගත්තෙ තන්ඩර් විතරක් නෙවේ - මාවිස්වත් බේරාගෙන! නමුත් මට හිතෙන්නේ - ඒ ඔක්කටොම වැඩිය මේකයි. මාවිස්ට හිතුණෙ කොහොම ද ඔච්චර හැතැප්ම ගානක් මඟ රෑ මහ වැස්සෙ තනියෙ ම එන්ට පුළුවන් වෙයි කියලා? එයා නිකං අන්ධකාරෙටත් බය කෙනෙක්!"

බිල් හා තන්ඩර් ගැන සතුටට පත් බාලිකාවෝ මාවිස් ගැන මහත් සිත් තැවුලට පත් වූහ. උදේ ආහාරය ගැන ද සැලකිල්ලක්



නොදක්වා ඇය ගැන කතා කරමින් ඔවුහු ශයනාගාරයේ ම රැඳී සිටියහ. කවුදෝ කොරිඩෝරය දිගේ දිව අවුත් කාමරයට එබී කතා කළේය. ඒ තව එක පංක්තියේ ලමයි ය.

"අනේ - මේ, ඔයාලා මේ මොන ලෝකෙ ද ඉන්නේ? කෑම කන්න එන්නේ නැද්ද? බෙල් එක ගහලා කොයි වෙලාවෙ ද? අන්න - මැම්සෙල්ට හොඳට ම තරහා ගිහිල්ලා!"

"ඕ ඩියර්! යං - යං - ඔක්කොම යං!" යයි ජීන් කීවාය. "ඉට නං, ඔළුව නිකං කැරකෙන්නා වගේ."

තන්ඩර් සහ මාවිස් පිළිබඳ පුවත පාසැල පුරා පැතිර ගියේය. දහය ම පංක්තියේ සිට පහළ ම පංක්තිය දක්වා කවුරුත් කතා කෙළේ ඒ ගැන ය. ඩැරල්ට සහ බිල්ට තමන්ගේ කතාව නැත පුනා කියන්නට සිදු වූයේය.

ඒ ඉරිදවත් වූ බැවින් පංක්ති යාමක් නොවීය. පාසැල් දේව මන්දිරයේ දී මාවිස් වෙනුවෙන් විශේෂ යාච්ඤා පැවැත්විණ. එයට සියලු ම බාලිකාවෝ සහභාගි වූහ. ඇයට කැමති ව සිටියේ ටික දෙනකු වුව ද සියල්ලෝ ඇය ගැන දුක් වූහ. ඇයගේ තත්ත්වය ටිකක් නරක අතට හැරී ඇති බවට පුවත පාසැල පුරා පැතිරී ගියේය. ඇයගේ මව්-පියනට දන්වා යවනු ලැබිණ. මේ තත්ත්වයට තමා ද වග කිව යුතු ය යන හැඟීමෙන් ජීන් ද වේදනා වින්දය.

පසු දින උදය වන විට මාවිස්ගේ තත්ත්වය යහපත් අතට හැරුණේය. මේ වන විට තන්ඩර් ද සම්පූර්ණ සුවය ලබා සිටියේය. දන් බිල් මහත් සතුටින් පසු වන්නීය. දින දෙකකට පෙර මහත් වේදනාවෙන් පෙළුණු අසතු මේ වන විට හොඳ සෞඛ්‍ය තත්ත්වයෙන් පසු වීම සිතා ගත නොහැක්කකි. දොස්තරවරුන් සහ සත්ව දොස්තරවරුන් කොතරම් පුදුම පුද්ගලයෝ ද!

සඳුද යථා පරිදි පංක්තිවලට ගිය ශිෂ්‍යාවෝ ඉගෙනීමේ කටයුතුවල යෙදුණහ. දන් මාවිස් ගැන බිය වීමට තරම් හේතුවක් නැත. ජීන්ගේ හිතට ද යම් සහනයක් ඇති විය. මාවිස් ඉක්මනින් යළි පංක්තියට එනු ඇත. එවිට එම සිද්ධිය කෙළවරක් දකිනු

ඇත. ලෙස්ලි මෙනෙවිය ඇයගේ හිතුවක්කාර ක්‍රියාව සම්බන්ධයෙන් ඇයට දෝෂාරෝපණය කරනු ඇත. මාටින් තමාට ම දැඩි දඬුවමක් කරගෙන ඇති බැවින්, ඇයට වෙනත් දඬුවමක් දෙනු නොලැබෙනු ඇත. සියල්ල යථා තත්ත්වයට පත් වනු ඇත.

ඉරු දිනයේ පීටර්ස් මෙනෙවිය හොඳ විවේකයක් ගත්තාය. සඳුදා පුරුදු පරිදි පාඩම් ගැනීම සඳහා සිය පංක්තියට පැමිණි ඇයට අමුතු වාතාවරණයකට මුහුණ දීමට සිදු විය.

මුළු පංක්තිය ම නැගිට ඔල්වර හඬ දී ඇය පිළිගත්හ. පංක්තිය දෙකට බෙදී මාරුවෙන් මාරුවට "ත්‍රී හාවී චියර්ස්!" හඬ නංවා පීටර්ස් මෙනෙවියට ප්‍රීතිය පළ කළහ. ඇයට ද සිය සතුට සඟවා ගත නොහැකි විය. ඈ සිනාසී ප්‍රතිචාර දැක්වූවාය.

"බොහොම ස්තුතියි! මගේ ළමයි බොහොම හොඳයි. දැන් පොත්වල හතළිස් එක් වැනි පිටුවට පෙරළන්න. ඇලීෂියා කරුණාකර කළු ලෑල්ල ළඟට එන්න!"

එදා උදේ ඩැරල් බිල් දෙස විටින් විට ඕනෑකමින් නෙත් යොමු කළාය. බිල් එක් වරක් හෝ ජනේලයෙන් එළිය බලාගෙන නොසිටියාය. පීටර්ස් මෙනෙවිය පැවසූ සෑම වචනයක් ම ඈ අවධානයෙන් යුතු ව අසාගෙන සිටියාය. ඈ බුද්ධිමත් ලෙස ප්‍රශ්න වලට උත්තර දුන්නාය. කළු ලෑල්ල වෙත ගොස් එහි ලිවීමේ වාරය ආ කල ඈ එය ද මැනවින් ඉටු කළාය.

"බොහොම හොඳයි, බිල්," යයි පීටර්ස් මෙනෙවිය කී කල, "ප්" ගා විස්මයෙන් ඉහළට ඇදීමක් පංක්තිය පුරා පැතිර ගියේය. බිල්ට කවදත් "විල්හෙල්මිනා" යනුවෙන් කතා කිරීම පීටර්ස් මෙනෙවියගේ පුරුද්ද විය. එහෙත් ඇය අද බිල්ට "බිල්" කියා ඇමතීමට තරම් සුහද වී ඇති සැටි පුදුම ය. බිල් සතුටු සිනාව දක්වාගෙන සිය අසුන කරා ආවාය. ඈ දැන් වෙනස් අයෙකි.

පංක්තියෙන් පංක්තියට බිල්ගේ හැසිරීම කෙරෙහි ඩැරල් උනන්දුවක් දක්වා සිටියාය. බිල් යමක් කිරීමට හිතට ගත් විට



එය නොවළහා ඉටු කරන්නියකි. ඒ අනුව, ඉගෙනීම කෙරෙහි හිත යෙදවූ කල එය ද ඈ මැනවින් ඉටු කරන්නීය. ඇය පංක්තියේ ඉහළට ම කිට්ටු කරනු ඇතැයි ඩැරල්ට පෙනී ගියේය.

"මගේ තාත්තා චරිත ශක්තිය කියලා කියන්නේ ඕකට තමා!" යයි ඩැරල් සිතුවාය. "තාත්තා හැම වේලාවෙ ම කියන්නේ කෙනෙකුට අයිති කර ගන්න පුළුවන් ශ්‍රේෂ්ඨතම ගුණය චරිතයේ ශක්තිය කියලයි. එතකොට එයාට ධෛර්යය, වීර්යය වගේ ම අධිෂ්ඨානය ඇති කර ගන්න පුළුවන්. මොන බාධක ආවත් ඕවා ජයගන්න පුළුවන්. බිල්ට ඒ ශක්තිය තියෙනවා. මං හිතනවා ආයෙ එයා හීන මව මවා ඉන්න එකක් නැති වෙයි; ජනේලයෙන් එළිය බලාගෙන ඉන්නේ නැති වෙයි. දැන් එයා පාඩම් වැඩවලට උනන්දු වෙයි. පීටර්ස් මෙනෙවිය බිල්ට කළ උපකාරයට එයාට ප්‍රති-උපකාර දක්වන්න පුළුවන්නෙ එහෙමයි."

පීටර්ස් මෙනෙවිය ද ඒ බව ඇදහුවාය. ඈ බිල් කෙරෙහි විශ්වාසය තැබුවාය. ඔවුහු දෙදෙන අන්‍යෝන්‍ය විශ්වාසයෙන් යුක්ත වූවෝය; අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුක්ත වූවෝය. දෙදෙනාගේ ම සම ලක්ෂණයන් තුබූ හෙයින් එය පුදුමයට කාරණයක් නොවීය. පීටර්ස් මෙනෙවියට ඇත්තේ පිරිමි ලක්ෂණ ය. බිල්ට ඇත්තේ පිරිමි ළමයකුගේ ලක්ෂණ ය. එළිමහන් ජීවිතයට හා අසුන් පිට යාමට දෙදෙනා ම එක සේ ප්‍රිය කළහ. එනිසා දෙදෙනා ම එක සේ අසුන්ට ආදරය කළහ. මුලින් දෙදෙනා එකිනෙකා ප්‍රිය නොකළහ. දැන් ඔවුහු තදින් එකට බැඳී සිටිති. එය බිල්ට යහපතකි.

"ඩැරල්, දවල් හීන දකිනව ද?" කියා පීටර්ස් මෙනෙවිය විමසුවාය. "ඔය ළමයා තව මොනවත් ලිව්වේ නෑ!"

ඩැරල් ගැස්සී සිටියාය. ඇයගේ මුහුණ රතු විය. බිල් දවල් සිහින දැකීමෙන් මිදීම ගැන සතුටට පත් ඩැරල් දැන් තමා ම එම වළේ වැටෙන්නට ගිය සැටි! ඈ කල්පනා ලෝකයෙන් මිදී ලියන්නට පටන් ගත්තාය.

ඈ පක්වරුවේ අලුළු නාට්‍ය පුහුණුව දීම සඳහා පීටර්ස් මෙනෙවිය කටයුතු කළාය. ඒ සඳහා ඇය තෝරා ගත් ස්ථානය වූයේ කුඩා වේදිකාවක් ඇති චිත්‍ර කාමරයයි. මේ අවස්ථාව එක කෙක් සෙරෙල්ඩා බලා සිටියේ කොළුවසිල්ලෙනි. අවස්ථාව එළඹීමෙත් පෙර ඈ සිය අසුනේ සිට "රෝමියෝ - ජුලියට්" නාට්‍යයේ දෙබසක් හඬ නොනැගෙන සේ මතුරන්නට වූවාය. ඇයගේ තොල් සෙලවෙනු දුටු පීටර්ස් මෙනෙවියට සිතුනේ ඇය ග්වෙන්ඩොලීන්ට තොල් මතුරා යමක් පවසන්නා සේ ය.

"සෙරෙල්ඩා, මොනව ද ඔය ළමයා ග්වෙන්ඩොලීන්ට කියන්නේ?" යයි ඈ සැරෙන් ඇසුවාය.

"මොකවත් නෑ - මිස් පීටර්ස්," යයි ඈ පිළිතුරු දුන්නාය.

"එහෙනං, තමන්ට ම ඔය කියා ගන්නේ මොනවා ද?" ඈ විලාව අසා සිටියාය. "උත්තර දෙන කොට හිට ගන්න දන්නෙ නැද්ද?"

සෙරෙල්ඩා නැගිට්ටාය. ඈ පීටර්ස් මෙනෙවිය දෙස බලා තමා මෙතෙක් තොල් මතුරමින් සිටි දෙය ඇයට කිවාය.

"ඔබ ඔය යන්ට ද යන්නේ?

එලිවන්නට කල් ඇත්තේ,

ඔය ඇසෙනා ගී රාවේ,

ඈ කොවුලාගෙනි එන්නේ."

ඇයගේ කටහඬ යට කරගෙන මුළු පංක්තියෙන් ම මහා සිනා හඬක් නික්මිණි. පීටර්ස් මෙනෙවිය හයියෙන් මේසයට ගසන්නට වූවාය. "සෙරෙල්ඩා, ඔය ළමයා මේක විහිළුවට ගන්න ද! දන් ඔය ඇති! අපි මේ කරන්නේ භූගෝල ශාස්ත්‍රයේ, ශේක්ස්පියර් නෙවේ! දන් වාඩිවෙලා පංක්තියේ වැඩ කරන්න!"

# 19

# පෙරහුරුව

එද දහවල් විවේකයෙන් පසු අට වැනි පංක්තියේ ශිෂ්‍යාවෝ ඇලීෂියාගේ යෝජිත උපාය ගැන මතක් කරන්නට වූහ.

"ඇලීෂියා, මං නං කැමති නෑ - ඒ ට්‍රික් එක මිස් පීටර්ස්ට කරනවාට," යයි බිල් පැවසුවාය.

"මාත් එහෙමයි," ඩැරල් කීවාය. .

"මං නං කාටවත් ඒක කරනවාට කොහෙත් ම කැමති නෑ," යයි සැලීගේ අදහස වූයේය.

"ඔයා විතරයි - ඒකට කොහෙත් ම කැමති නැත්තේ," යි ඇලීෂියා උත්තර දුන්නාය. "ඒ හින්ද ඔයා කරබාගෙන ඉන්න. අනින් අය මොනව ද කියන්නේ?"

"මං නං කැමති නෑ - දන් ඒක මිස් පීටර්ස්ට කරනවාට," යයි බෙලින්ඩා ද පවසා සිටියාය. "බිල්ගෙ අදහසටයි, ඩැරල්ගෙ අදහසටයි මාත් එකඟ වෙනවා. අපි වියර් කරලා මිස් පීටර්ස්ට ස්තුතිය ප්‍රකාශ කරලා - ඊට පහුවද මෙහෙම පල් එක දන එක හරි නෑ!"

"මට නං ඒකෙ ගානක් නෑ," යි සෙරෙල්ඩා කිවාය. එද උදේ පීටර්ස් මෙනෙවිය තමාට තරවටු කිරීම ගැන සෙරෙල්ඩා සඳු වූයේ ඇය ගැන තරහිනි. "පොඩි විහිළුවක් කරා ම ඇති තරකේ මොකද්ද? විනෝද වෙන එක නේ තියෙන්නේ. ඒක එච්චර ලොකු දෙයක් නෙවේ කියලයි මං හිතන්නේ."

"මාත් සෙරෙල්ඩා කියන දේට එකඟයි," යයි ග්වෙන්ඩොලීන් ද හඬ දුන්නාය. "ඇයි, අපි ඒ විහිළුව නොකර ඉන්නේ? ඔයා එකඟ වෙන්නෙ නැද්ද, ඩැෆ්නි, මං කියන එකට?"

"මං දන්නෙ නෑ," යයි ඇය පිළිතුරු දුන්නේ පීටර්ස් මෙනෙවිය ඊ මෑද අසු මෙහෙයවා කළ චමත්කාරජනක ක්‍රියාව ගැන සිත

යොදවා ය. "නෑ - මං නං හිතන්නෙ අපි ඒ ට්‍රික් එක කරන්න ඕනෙ මැම්සෙල්ට හරි, මිස් කාටන්ට හරි කියලයි."

"හරි! මට වෙනසක් නෑ - අපි ඒක කරන්නේ කාටද කියලා" ඇලිෂියා කීවාය. "ඩැරල්ලුයි මායි එකඟ වෙනවා - වැඩි දෙනාගෙ කැමැත්තට."

"ඩැරල්ලුයි - ඔයයි?" සැලී සිය පුදුමය හා අප්‍රසාදය පළ කළාය. "ඩැරල්ට මොකද්ද ඔය ගැන කරන්න තියෙන්නෙ? ඒක ඔයාගෙ ට්‍රික් එකක් නේ? ඩැරල්ගෙ නෙවෙි නේ?"

"ආ ඒක අපි දෙන්නා කතා කර ගත්තා විතරයි; වෙන දෙයක් නෑ," යි ඇලිෂියා ඇහට නොදැනී ප්‍රකාශ කළේ, සැලීගේ ඉරිසියාව සියල්ල ඉදිරියේ මතුවීම ගැන සතුටට පත්ව ය. ඩැරල්ගේ මුහුණ රතු විය. මෙම ප්‍රයෝගය ගැන ඇලිෂියා සමඟ කතා කිරීමෙන් ඇය සතුටක් ලැබූ බව ඇත්ත ය. එහෙත් ඊට වැඩි සම්බන්ධයක් තමා හා ඇලිෂියා අතර ඇති බවට ඇඟවීමෙන් ඇලිෂියා කළේ සැලි තරහා ගැන්වීම බව ඩැරල් දැන ගත්තාය. දෙන්නා ඕන දෙයක් කර ගත්තා දෙන් යයි ඇ සිතුවාය. තුන් දෙනාට ම මිතුරියන් ලෙස පසු විය නොහැක්කේ මන්ද? බෙටී ළඟදී ම එනු ඇත; එවිට ඇලිෂියා සැලී තරහා ගැන්වීම නතර කරනු ඇත. සැලි ඇලිෂියාට ඉරිසියා වීම සහ තරහා පෙන්වීම නතර කරනු ඇත.

"හරි එහෙනං, අපි මේ සෙල්ලම මැම්සෙල්ට කරමු," යයි අයිරින් පැවසුවාය. "මැම්සෙල් හරි හොඳයි ඔය වගෙ කට්ටකම්වලට. අපට වාර කිහිපයක දී ම බැරි වුණා - එයා අමාරුවේ දලා විනෝද වෙන්න."

"හරි, එහෙනං. අපි මේකට මැම්සෙල් අල්ලා ගමු!" යයි ඇලිෂියා කීවාය. "මයා එකඟ ද ඩැරල්? ඒකට හොඳ ම වෙලාව කෝකද කියලා අපි පස්සෙ කතා කර ගමු - විවේකයක් හම්බු වුණා ම. දන් වෙලාව හරි නේ - ආට් රූම් එකට යන්න."

සියල්ලෝ චිත්‍ර කාමරයට ගියහ. සැලී දුර්මුඛ ව පසු වූවාය. ඇයට පෙනෙන්නට හා ඇය තවත් තරහා ගැස්සීම සඳහා ඇලිෂියා ඩැරල්ගේ අතට අතක් දමාගෙන ගියේ ඇය තමාගේ හොඳ ම මිතුරිය සේ දක්වමින අයුරිනි. ඩැරල් ආපසු හැරී සැලී දෙස බලා ඇලිෂියාගේ ග්‍රහණයෙන් තම අත මුදා ගැන්මට තැත් කළාය. එහෙත් සැලී ඇය වෙත ඇඹුල් මුහුණක් පෙන්වා සුළියෙන්, ඇ සැලී වෙත නොගොස් ඇලිෂියා සමඟ ම පෙරට ගියාය.

ඩැරල් පුද්ගලික වශයෙන් අදහස් කෙළේ ශේක්ස්පියර් නාට්‍ය පුහුණුවට ගත කරන කාලය අනවශ්‍ය නාස්තියක් ලෙස ය. එහෙ - පැහැපත් සන්ධ්‍යාවේ ලැක්රෝස් පුහුණුවේ යෙදී සිටීමට කාලය යෙදවීම වඩාත් ප්‍රයෝජනවත් යයි ඇයට හැඟුණු බැවිනි. කෙසේ වුව ද, සෙරෙල්ඩා හිබර්ට් මෙනෙවියට සිය හපන්කම් පෙන්වා සිටීමට දඟලන සැටි බලා සිටීම ද විනෝදය ගෙන දෙන්නක් විය හැකි ය.

සෙරෙල්ඩා ප්‍රීතියෙන් කැලඹී සිටියාය. මෙය ඇයට ලැබෙන ඉතා අවස්ථාවකි. තමාගේ දක්ෂකම් බලා හිබර්ට් මෙනෙවිය, "සෙරෙල්ඩා, ඔය ළමයා නිළියක් වීමට උපන් හපනෙක්!" යයි පවසනු ඇත. "ඔය ළමයාට පුදුම රංගන කුශලතාවයක් තියෙනවා. ඒ නිසා තමා තමාගේ මුළු ශක්තිය ම යොදවන්න ඕනෑ - එම කුශලතාවය ප්‍රගුණ කර ගන්න. සෙරෙල්ඩාට ඊට සුදුසු ලක්ෂණ පෙනුමක් තියෙනවා. ආකර්ශණීය හැඩ-රුවක් තියෙනවා! ඒ නිසා, මේ අවුරුද්දේ ඔය ළමයාට උගන්වන්න දැකීම මට ආඩම්බරයට හේතුවක්!" යයි හිබර්ට් මෙනෙවිය ප්‍රකාශ කරනු ඇ හිතෙන් මවා ගන්නට වූවාය.

මේ ද සෙරෙල්ඩා කෙස් රොදක් නරකවා රෝල් කර හිස මුදුනේ අමුණා තිබුණ ද, එය මීට ඉස්සර දමන ලද රෝල මෙන් විශාල එකක් නොවිය. කෙසේ වුව ද, මෙම මෝස්තරය ද ඇයට තරුණ පෙනුමක් ගෙන දුන්නේය. පස්සට පීරන ලද කොටස එකට නොබැඳ විසිරී තිබෙන්නට හැර තිබුණි. මුහුණට ද අමතර හැඩ දමනු ලැබ තිබුණි. කොල් පාට කෙරී තිබුණි. තම්බුල් රෝස පැහැ ගෙන තිබුණි. ඇ පවුඩර් ද ගා තිබුණාය. කම්මුල ද ක්‍රීම් ආලේප කර තිබුණි. දිගු නිය පාට කර, පොලිෂ් කර තිබුණි. ඇය සිතුවේ තමා 'මේක්-අප්' දමන ලද නියම නිළියක් ලෙස ය.

හිබර්ට් මෙනෙවිය නාට්‍ය නිෂ්පාදකවරියකගේ ගතියක් දරා නොසිටියාය. එක පිළිවෙළකට කදිම ලෙස හැඳ-පැළඳ සිටීමට පුරුදු ඇ ඇගාට සරිලන ගවුමකින් හා කබායකින් සැරසී සිටියාය. ඇයගේ රැලි සහිත කොණ්ඩය හොඳට පස්සට පීරලා ලැම තිබුණි. ඇය පැළඳ සිටි කන්නාඩි කුට්ටම විකක් සහතයට ඇති රාමුවකින් යුක්ත විය. ඇයගේ කටහඬ මධුර ය. ඇය කතා කරන විට අසා හිටින්නට තරම් ප්‍රිය ය. කාර්යශූර ඇ ඒ ඒ චරිතයට නියම සුදුසු අය තෝරා ගැනීමට හොඳින් දන සිටියාය.

බාලිකාවන් කාමරයට ඇතුල් වෙද්දී ඇ පෝඩියමක් ව බලා සිටියාය. ඇ සෙරෙල්ඩා ගැන විකක් දන සිටියාය. ඒ, ඇය වික දවසක් නව වන පංක්තියේ සිටිය දී තමා ඇයට පාඩමක් දෙකක් උගන්වා තුබු බැවිනි. සෙරෙල්ඩා කාමරයට පිය නගද්දී ඇයගේ 'මේක්-අප්' දක ඇ මවිතයට පත් වූවාය. "අනේ - දෙවියනේ, මේ ළමයා තමං කවුරු කියල ද හිතන් ඉන්නේ?" යයි ඇයට සිතිණි.

සෙරෙල්ඩා තමා නිළියක හා චිත්‍රපට තාරකාවක ලෙස සිතා සිටින බව හිබර්ට් මෙනෙවිය දන නොසිටියාය. ඒ ගැන කවුරුත් හෝ ඇයට පවසා ද නැත. ඇය ඒ ගැන දන සිටියේ නම්, ඇය සෙරෙල්ඩා ගැන වඩාත් ඉවසිලිමත් ව හා වඩාත් කාරුණික ව කටයුතු කරනු ඇත; ඇයගේ දර්ශනයෙන් මෙතරම් විස්මයට හා කලකිරීමට පත් නොවනු ඇත.

මෙදින පුහුණු කටයුතු ගොඩාක් කිරීමට ඇත. යම් යම් හේතූන් නිසා මෙම කාර්යය දෙවරක් කල්දැමීමට සිදු විණි. හිබර්ට් මෙනෙවිය, එනිසා, මෙදින ඉක්මනින් පුහුණුව දීමට ඉටා ගත්තාය. ඇ නාට්‍ය පිටපත් ළමුන් අතර බෙද දුන්නාය.

"හරි - දන්, කවුරුහරි මේ නාට්‍යයේ කලින් රඟ පාලා තියෙනව ද?"

කිසිවෙක් එසේ රඟ පා නොසිටියහ. සෙරෙල්ඩා ඉදිරියට අවුත් යමක් කියා සිටියාය. ඇ නියම ඉංග්‍රීසි උච්චාරණය අනුකරණයෙහි උත්සුක වූවාය. "මිස් හිබර්ට්, මං ෂේක්ස්පියර්ගේ

මැක්බත් නාට්‍යයේ ලේඩි මැක්බත්ගේ චරිතය රඟපාලා තියෙනවා එක සැරයක්."

"ආ!" කියා හිබර්ට් මෙනෙවිය සෙරෙල්ඩාගේ කොණ්ඩා මෝස්තරය දෙස බැලුවාය. "සෙරෙල්ඩා, ඔය ළමයගෙ ඔය කොණ්ඩා සැරසිල්ලට නම් මං කැමති නැහැ. ඔය විකාර ඉස්ලෙ කවව උඩ තියාගෙන ආයෙ මගෙ පංක්තිවලට නම් එන්න නෑ!"

සෙරෙල්ඩා මුහුණ රතු කරගෙන පස්සට වූවාය.

"කවුරුවත් මේ නාට්‍ය කියවලා තියෙනව ද?" යි ගුරුවරිය ඇසූ කල ඩැරල් සහ මේරි යූ අත් ඔසවා සිටියහ. සෙරෙල්ඩා ද එසේ කළාය.

"කවුරුහරි මේ නාට්‍යයේ චරිතවලින් කිසිවක් දන්නවා ද? බේස් දෙබස්වලින් යමක් ඉගෙන ගන්න කාට හරි උනන්දුවක් තියෙනවා ද?"

සෙරෙල්ඩා නැවතත් ඉදිරියට ආවාය. "ප්ලීස්, මිස් හිබර්ට්, මං ජුලියට්ගේ දෙබස් ඔක්කොම දන්නවා. හැම එකක් ම දන්නවා. මට ඒ ඔක්කොම කියන්න පුළුවන් කියලා හිතෙනවා; දන් වුණත් පුළුවන්. ජුලියට් ගේ කොටස හරි ම වනර්ෆුල්. මං ඒක හොඳට පුරුදු වෙලා තියෙනවා."

"ඔව්, සෙරෙල්ඩාට හොඳට පුළුවන් - ජුලියට්ගෙ චරිතය," යයි ග්වෙන්ඩොලීන් අලගු තැබුවාය. ඊට කෘතඥතාව පුදමින් සෙරෙල්ඩා ඇයට සිනාවක් පෑවාය.

"බොහොම හොඳයි. සෙරෙල්ඩා ඒ චරිතය ඉගෙන ගන්න හුඟාක් මහන්සි වෙලා තියෙන හන්ද, අද එයාට පුළුවන් ජුලියට්ගෙ චරිතෙ කරන්න," කියා අනික් අය දෙස ගුරුවරිය බැලුවේ රෝමියෝගේ චරිතයට සුදුසු පිරිමි පෙනුමක් ඇති අයකු සොයා ගැනීමට ය. ඇයගේ ඇස් බිල් ළඟ නතර විය.

"ආ - ඔය ළමයා හොඳයි! මොකද්ද නම - ආ, විල්හෙල්මිනා! ඔය ළමයට පුළුවන් අද රෝමියෝ වෙන්ට. එතකොට - ඩැරල්, ඔබට පුළුවන් නර්ස්ගෙ චරිතෙ ගන්ට. එතකොට - "

මෙසේ ඒ ඒ වර්ණ වලට සුදුසු අය ඇය විසින් තෝරා ගනු ලැබූ පසු, එසේ තෝරා ගනු ලැබුවෝ තම නාට්‍ය පිටපත් දෙස බලා දෙබස් කියවමින් රඟපෑමට සූදානම් වූහ.

"එච්චර හරි නෑ," යයි මුල් පිටු අනුව දෙබස් කියා රඟපාන්නට ඉදිරිපත් වූ කිහිප දෙනා ගැන සෑහීමට පත් නොවූ හිබර්ට් මෙනෙවිය, "සෙරෙල්ඩා, දන් ජූලියට්ගෙ චරිතෙ පටන් ගන්න පිටුවට පෙරළලා පටන් ගන්න! ඔය ළමයා ලෑස්ති ද?" කියා ඇසුවාය.

ඇය ලෑස්ති ද යන්න ප්‍රශ්නයක් නොවීය. ඇය විස්සුම් නැති ව මේ බලාගෙන ඉන්නේ ඒ සඳහා ය! එම රංගනය දන් ඇයගේ ඇඟ පුපුරාගෙන එළියට ඒමට සූදානමින් සිටී! ඇයගේ ඇට - මස් - නහර පුරා ජීවත් වන්නේ ජූලියට් ය. අහිංසක ජූලියට්!

සෙරෙල්ඩා රඟපෑම පටන් ගත්තාය. ඇ නෘත්‍යාකාරයෙන් දෙබස් ඉදිරිපත් කරන්නට වූවාය. ඇ එහාට මෙහාට පාවෙමින්, ඇවිදිමින්, පනිමින් සහ හිස පිටු පස්සට පහත් කරමින් තම රූ සපුව විදහා දක්වන්නට වූවාය. ඇය සිතින් මවා ගත්තේ තමා ඉතාමත් රූමත් හා ප්‍රියවචන තරුණියක ලෙස ය.

"නතර කරනවා - සෙරෙල්ඩා!" හිබර්ට් මෙනෙවිය නොඉවසිල්ලෙන් හා වික්ෂේපයෙන් යුතු ව හඬ දුන්නාය. එහෙත් සෙරෙල්ඩා නොවේ රංගනය නතර කළේ. බලාන සිටි කවුරුත් "හිකි - හිකි" ගා සිනාසෙද්දී ඇ දිගට ම වාගාඩම්බර කරනය කරගෙන ගියාය. අයිරින් නහයෙන් අමුතු ශබ්දයක් නැගුවාය. එවිට හිබර්ට් මෙනෙවිය අයිරින් දෙස රවා බලා සෙරෙල්ඩාට හයියෙන් කතා කළාය.

"නතර කරනවා සෙරෙල්ඩා - ඔය අදෝනාව!"

සෙරෙල්ඩා රංගනය හා විලාපය නතර කර හිබර්ට් මෙනෙවිය දෙස හිස් බැල්මක් හෙළා සිටියේ ඇය කෝපාවිෂ්ට ව සිටිනු තේරුම් ගත නොහැකිව ය.

"සෙරෙල්ඩා, ඔය විදිහට හැසිරෙන්න ලැජ්ජාවක් - බියක් තමන්ට නැද්ද - මං කියන්නේ?" යයි හිබර්ට් මෙනෙවිය සැරෙන් කතා කළාය. "මුළු පංතිය ම යකා නටවන්න නේ සෙරෙල්ඩා හදන්නේ! ෂේක්ස්පියර්ගේ නාට්‍ය පුහුණුවක දී ඔහොම විකාර විදිහට ද හැසිරෙන්නේ? මේ ළමයින්ට නම් මේක විහිළුවකට ගෙන හිනාවෙන්න පුළුවන්. නමුත්, මට බැහැ. දන් ඔය ළමයා විකාර කරලා කීවේ කොච්චර ලස්සණ දෘශ්‍ය කාව්‍ය පද ද? එහෙකොට ඔය විදිහට අහ පසහ වීසි කරලා නටන එක හොඳකමක් කියල ද තමන් හිතුවේ? මායම් වෙලා වගේ හිස ඔහොම පස්සට ගස්සන එක මේ නාට්‍යයට අවශ්‍ය ද? ඔය ළමයා දන්නේ නැද්ද ජූලියට් කියන්නේ තරුණ, මෘදු, කොමළ පුද්ගල චරිතයක් කියලා? සෙරෙල්ඩා හදන්නේ ජූලියට් කියන ඒ චරිතා කතා නායිකාව විකාර විත්‍රපට නිළියක් කරන්න නේ!"

සෙරෙල්ඩාට මෙම ප්‍රහාරය තදින් ම වැදුණේය. ඇය කිසි සේත් බලාපොරොත්තු නොවූ ප්‍රතිචාරයකි මේ. රෝස පාට ගාන ලද කම්මුල් පවා සුදට හැරෙන සේ ඇ සුදුමැලි ව ගියාය.

පංතියේ ළමයින් යළිත් සිනා හඬක් මතු කළෙන්, හිබර්ට් මෙනෙවිය සිය කෝපය තව දුරටත් සෙරෙල්ඩා වෙත එල්ල කළාය.

"එතකොට සෙරෙල්ඩා ඔය විකාර විදිහට සැරසිලා ආවෙ ඇයි? ඔය මූණෙ අතුල්ලලා තියෙන ආලේපය හන්ද ඔය ළමයා කොච්චර විකාර විදිහට ද පේන්නේ! මිස් පීටර්ස් ළඟට ඔය ළමයා ඔය විදිහට යනව ද? මයෙ එක්ක ඔය කෝලම් හරි නෑ. අනිත් එක ඔය ළමයා හොඳට හිතේ තියා ගන්න - සවදවත් තමන්ට නිළියක් වෙන්ට බෑ කියලා. ඒක ඔය ළමයගෙ ඇගේ නෑ. ඔය විදිහට දඟලන එකෙන් වෙන්නෙ තමන් නිකම් ම අගිණ්ට වෙන එකයි. දන් ගිහිල්ලා - මූහුණ හෝදලා - කොණ්ඩෙ හරි ගස්සාගෙන එන එකයි ඇත්තේ!"

සෙරෙල්ඩාට දනුණේ තමා නිකම් ම හුළං අරින ලද බැලූනයක් ලෙස ය. තමාගේ අභිමානය හා ආත්ම ශක්තිය නිකම් ම දිය වී යන බවක් ඇයට හැඟිණ. ඇය දෙර ළඟට පස්සෙන් පස්සට ගොස් කාමරයෙන් එළියට ගියාය. සමහර ශිෂ්‍යාවන්ට ඇය

ගැන දුක සිතුණේය.

මෙම සුපුරිසමෙන් පසු අනික් ශිෂ්‍යාවෝ බියෙන් බියෙන් තම දෙබස් කිණ්ඩ පිළිවෙලින් කියවන්නට වූහ. තමා සෙරෙල්ඩාට මිනුවට වඩා සැර වූ බවත්, අකාරුණික වූ බවත් වටහා ගත් හිබර්ට් මෙනෙවිය, එයට වන්දි ගෙවීමක් වශයෙන් අනික් ළමයින්ගේ දෙබස් උච්චාරණය අගය කරන්නට වූවාය. "ඇලීෂියා, ඔය ළමයා හොඳයි. මේරි ලූ, ඔය ළමයගෙ කටහඬ හොඳයි. තව ටිකක් ඔළුව උස්සලා කෙළින් කියා ගන්න පුරුදු වුණොත් ලස්සණට තියෙයි. වැරල්, ඔය ළමයගෙ උත්සාහයත් හොඳයි. හරි, ඊළඟ දවසේ චරිත මාරු කරලා පුරුදු වෙන්න බලමු."

"මිස් හිබර්ට්, මං ගිහිල්ලා බලන්න ද සෙරෙල්ඩාට කොහොම ද කියලා?" යයි ග්වෙන්ඩොලින් බියෙන් බියෙන් ඇසුවාය. "මිස් හිබර්ට් එයා ඇත්තට ම හිතාන හිටියෙ එයාට රඟපාන්න උපන් හපන්කමක් තියෙනවා කියලා. දැන් එකකොට, මේ නාට්‍යයේ රඟපාන්න මිස් හිබර්ට් එයාට ඉඩ දෙන්නෙ ම නැද්ද?"

"මං ඔය පොඩි කොටසක් එයාට දෙන්න පුළුවන් - එහෙ මෙහෙ ඇඹරෙන්නෙ නැතුව රඟපාන්න තියෙන," යයි හිබර්ට් මෙනෙවිය පිළිතුරු දුන්නාය. "නමුත් ලොකු රෝල් එකක් නම් දෙන්නෙ නෑ. ග්වෙන්ඩොලින්, ඔය ළමයට වුණත් තේරෙන්න ඇති, සෙරෙල්ඩාට රඟපෑම ගැන පොඩ්ඩක් වත් අවබෝධයක් නැති විත්තිය. ඒ ගතිය කවදාවත් ඇති වෙන එකක් නෑ. හරි, ගිහිල්ලා - එයා හම්බුවෙලා - කියන්න - ඇවිල්ලා මාව හම්බු වෙන්න කියලා - ඒ ළමයට. මට එයාට කතා කරන්න ඕනෑ. හරි - දැන් පන්තිය ඉවරයි."

අනෙක් ළමෝ ශබ්ද නොකර පිට ව ගියහ. දුප්පත් සෙරෙල්ඩා! දැන් ඇය කුමක් කරනු ඇත් ද!

"මං හිතන්නෙ එයා මේකත් හිතට ගන්නෙ නැති විදිහට - ගානක් නැති විදිහට පෙන්නයි, හරියට අපෙ පන්තියට පහළ දම්මට පස්සෙ හැසිරුණ විදිහට," යයි ඇලීෂියා කීවාය. "එයාට මෙහෙම පල් වුණා කියලා ගණනක් නෑ. පරණ විදිහට ම, කිසිත් නොවුණ විදිහට ඉඳීවි - ලෝකෙ තමන්ට ම ඇරුණා වාගෙ - අනික් අයට ඒකෙ තැනක් නැතුවා වාගේ!"

සෙරෙල්ඩා නාට්‍ය කාමරයේ සිටිය දී ග්වෙන්ඩොලින් විසින් දක්නා ලදී. ඈ මුහුණ සෝදා ආලේපයක් ඉවත් කර කොණ්ඩය [illegible] පීරා බැඳ සිටියාය. එහෙත් ආපසු හිබර්ට් මෙනෙවිය [illegible] යාමට ඈ පසුබට වූවාය.

"සෙරෙල්ඩා, මිස් හිබර්ට් කිව්වා ඔයාට ඇවිල්ලා එයාව හම්බු වෙන්න කියලා," ග්වෙන්ඩොලින් කීවාය. "එයා ඔයාව [illegible] දෙවල්වලට මට නං දුකයි. හරි - නරකයි නේ?"

"මට ඇත්තට ම රඟපාන්න බැයි ද ග්වෙන්?" සෙරෙල්ඩා ඇසුවාය. ඇයගේ තොල් වෙව්ලන්නට විය.

"ඇත්ත ම කියනවා නම් - ඔයා එච්චර ම හොඳට කරේ නෑ," යයි ග්වෙන්ඩොලින් පසු බා සිට කීවාය. "ඔයා නිකං [illegible] චරිතයක් රඟපාන විදිහක් තමා පෙන්නුවේ. ඔයා විකට චරිතයකට නම් නියමෙට හිටී - සෙරෙල්ඩා!"

කිසිත් නොකියා සෙරෙල්ඩා චිත්‍ර කාමරයට ගියාය. ග්වෙන් [illegible] සිතන්නේ ඇයට රඟපෑමට නොහැකි ලෙස ය! ඇය කොතරම් නැතට රඟපෑවා ද යත්, ඇය ලක් වූයේ විහිළුවට ය. ඈ මෙයින් කම්පා වූවාය; බලාපොරොත්තු සුන් වී අසරණ වූවාය; හිබර්ට් මෙනෙවිය යළි කුමක් කියාවි දැයි බිය වූවාය.

එහෙත් හිබර්ට් මෙනෙවිය අනපේක්ෂිත ලෙස කරුණාවන්ත වූවාය. "මට දැනගන්න ලැබුණා, සෙරෙල්ඩා, ඔය ළමයගෙ බලාපොරොත්තුව නිළියක් වෙන්න කියලා; ප්‍රසිද්ධ නිළියක් වෙන්න කියලා. නමුත් - ළමයෝ, එහෙම වාසනාවක් පිහිටලා තියෙන්නේ ටික දෙනෙකුට විතරයි. ඔය ළමයට ඒ කුශලතාවය නෑ. අනික් එක, හැම සාර්ථක නිළියකට ම අවශ්‍ය තවත් දෙයක් සෙරෙල්ඩට නෑ."

"මොකද්ද ඒ?" සෙරෙල්ඩා සෙමින් ඇසුවාය.

"මේකයි, සෙරෙල්ඩා! වෙනත් චරිතෙකට තමන් ඇතුල් වෙන්න ඕන නම් නියම විදිහට - ඔය ළමයා ඉස්සරෝම තමන් ගැන අමතක කරන්න ඕනෑ - සම්පූර්ණයෙන් ම! තමන්ගෙ පෙනුම, තමංගෙ බලාපොරොත්තු, අභිමානය, රඟපෑමෙන් තමන් ලබන ආඩම්බරය, ආශ්වාදය ආදී ඔය හැම ආශාවක් ම තමං අමතක

කරන්න ඕනෑ. ඒක කරන්න පුළුවන්නෙ, තමං ගැන ලොකුවට නොහිතන, ලුච්චල චරිත ලක්ෂණයක් නැති, හොඳ පරිමිත් අවබෝධයෙන් යුක් චරිතයක් ඇති කෙනෙකුට විතරයි. කෙනෙකුගෙ චරිතෙ වාමි, සියුම්, පිරිසිදු වන තරමට, එයාට වෙන චරිතෙකට ආවේශ වෙලා, නියම විදිහට රඟපාන්න පුළුවන් වෙනවා; ඕනෑ ම චරිතයක් හොඳට රඟපාන්න පුළුවන් වෙනවා. සෙරෙල්ඩා තමං ගැන ඕනෑවට වැඩිය හිතනවා නෙවේ! සෙරෙල්ඩා රඟපෑවේ සෙරෙල්ඩගෙ ම චරිතෙ! හරි ද? දන් විසකට ඉස්සර සෙරෙල්ඩා රඟ පෑවේ ජූලියට්ගෙ චරිතෙ ඒකෙනුත් සෙරෙල්ඩගෙ හොඳ පැත්ත නෙවෙයි!"

"මට කවදාවත් හොඳට රඟපාන්න බැරි වෙයි ද?"

"මං හිතන්නෙ නෑ," යි හිබර්ට් මෙනෙවිය මෘදු ලෙස පැවසුවාය. "එහෙම දක්ෂකම් තියෙන කෙනෙක් දක්ෂ ම මට ඒක එක වැර ම කියන්න පුළුවන්. ඔය ළමයට වෙලා තියෙන්නේ - තමා ආශා කරන - මෝඩ විදිහට අගය කරන - අදහන නිළියන් අන්ධ ලෙස අනුකරණය කරන්න ගිහිල්ලා - නිකම් ම සවුන්තු වෙන එකයි! ඇයි තමන්ට බැරි - වෙන කවුරුවත් වෙන්න යන්නෙ නැතුව - මොහොතකට හරි තමන් ම වෙන්න? ඔය එක එක්කෙනා අනුගමනය කරන එකයි, අනුකරණය කරන එකයි නතර කරන්න. පංක්තියේ අනික් ළමයි වාගෙ ඉන්න! මේ පාසැලේ ඉගෙන ගන්න, සෙල්ලං කරන්න ආට ළමයෙක් විදිහට හිතන්න!"

"ඔව්, ඒක තමා මට කරන්න බැරි වුණේ!" යයි සෙරෙල්ඩා දුක්මුසු ව කීවාය. ඇයගේ නෙතින් මතු වූ කඳුළක් කම්මුල දිගේ පහතට කඩා හැළුණේය.

"ආන්න එහෙම සාමාන්‍ය පාසැල් ශිෂ්‍යාවක් විදිහට ඉන්න උත්සාහ කරලා බලන්න - එතකොට ජීවිතය කොච්චර සුන්දර ද - සැහැල්ලු ද කියලා තමන්ට ම තේරෙයි. ඔය ළමයා නිළියක් වෙන්න හිතට අරන් ඉන්න බව මං දනගෙන හිටියා නම්, මං අච්චර සැරට කතා කරන්නෙ නෑ. මං හිතුවෙ ඔය ළමයා නිකම් ම විකාරයක් කරනවා කියලයි."

සෙරෙල්ඩා චිත්‍ර කාමරයෙන් පිට වුවාය. දන් කළ යුත්තේ

...ක් දැයි ඇයට සිතා ගත හැකි නොවිය. තමා විහිළු ... සමච්චලයට හා හාස්‍යයට ලක් වූ බවක් ඇයට තේරුම් ගියේය. ... ඒ පැමට හිතක් ඇයට ඇති නොවිය. ඇයට අවශ්‍ය ... කරාකු හෝ නොවී, අනුන්ගේ සැලකිල්ලට හා විමසිල්ලට ... නොවී සිටීමට ය. එච්චර කිසිවකු තමා ගැන උනන්දුවක් ... දැක්වූ ඇත! කිසිවකු තමාගේ හිත නොරිදවනු ඇත!

... ඩියාවේ දී ඇ අන් අය හා එක් වුවාය. ඇය තමාගේ ... ගිය ද අනුනට නොදනෙන සේ ය. පොට්ස් මෙනෙවිය ... බැලුවාය. ඇය හඬමින් සිටි බවක් ඇයට පෙනුණේය. ... අද තමයි, මේ වගෙ දෙයක් මං දක්කෙ! දන් සෙරෙල්ඩා ... ළමයි වාගෙ වෙලානයි යන්නේ. නියම පාසැල් ශිෂ්‍යාවක්! ... දන් මැලෝරි ටවර්ස්වල බලපෑම සෙරෙල්ඩට ලැබෙන ...යි!"

## 20

## ඇලීෂියාගේ විහිළුව

දවසක් දෙකක් ගත විය. තවමත් අසනීපයෙන් පසු වූ මාවිස් ...ස්ථානාගාරයේ ම පසු වූ හෙයින්, අන් බාලිකාවන්ට ඇය ... බලා ගැන්මට නොහැකි වූයේය. එහෙත් ඇය ටිකින් ටික ... අතට හැරෙමින් සිටින බව සැල වූයෙන් ඔවුන්ට එය ... වූයේය. ඔවුහු මල් සහ පොත් ආදිය ඇය වෙත ... සෙරෙල්ඩා ඇමරිකානු 'ජිග්-සෝ' ක්‍රීඩා උපකරණයක් ... වෙත යැව්වාය.

බිල් මෙන් ම ඩැරල් ද මධ්‍යම රාත්‍රී සිද්ධියේ මතකයන්ගෙන් ... වෙද්දී, බිල්ගේ පංක්ති වැඩ ගැන පීටර්ස් මෙනෙවිය සැහීමට ... සිටියාය. බිල් ඒ තරම් ප්‍රගතියක් පෙන්වූයේ නැති ... ද, ඇය පූර්ණ අවධානයක් යොදා ඉගෙන ගැනීමට ...සෙන බව ගුරුවරියට පෙනී ගියේය. සෙරෙල්ඩා ද ... ගනීමේ කටයුතු ගැන පෙරට වඩා උනන්දුවක් දක්වන්නට

වූවාය. තමාට අමතර පුහුණුව ලබා දෙන ලෙස ඇ මැඩම්සෙල්ගෙන් ඉල්ලා සිටියාය.

සෙරෙල්ඩා මෙතෙක් තම හිතේ රැව් දුන් අභිලාෂයන් ගැන කල්පනා කර බැලුවාය. ඒ අනුව, චිත්‍රපට නිළියක වීමේ අපේක්ෂාව ඇ නියත වශයෙන් ම හිතෙන් බැහැර කළාය. චිත්‍රපට නිළියක ලෙස තම රුව හැඩ ගස්වා ගැන්ම ද ඇයට එපා විය. ඇයට හිතුණේ පුළුවන් තරම් අනිත් ළමයින් ලෙස පෙනී සිටීමට ය. ඒ අනුව, තමා මෙතෙක් කළ විකාර විලාසිතා හා මෝස්තර ඔවුන්ගේ හිත්වලින් බැහැර වනු දකින්නට ද ඇයට වුවමනා වූයේය. පුළුවන් තරමින් පංක්තියේ අනිත් ළමයින් අනුකරණයේ යෙදීමට ඇ උත්සුක වූවාය.

"සෙරෙල්ඩාට දන් වෙලා තියෙන්නේ මොකද්ද, අනේ?" යයි බෙලින්ඩා අයිරීන්ගෙන් විමසුවාය. "එයා මෙහෙ ආ මුල් දවස්වල අපට ඉහළින් මහ ලොකුවට කැපී පේන්න නොකරපු දෙයක් නෑ. අපිව නිකං සුළු විදිහට අරන් එයා හිටියේ නිකං මහා ජාතියේ විදිහට. දන් එයා හැම දේට ම අපිව කොපි කරන්න හදනවා. අපි කතා කරන විදිහට, අපි අරක මේක කරන විදිහට එයත් කරන්න මහන්සි වෙනවා. දන් එයා හිතන්නේ අපි "වනර්ෆුල්" කියලයි!"

"දන් එයා ඉස්සරට වැඩිය හොඳයි," යයි ඉස්සරහා මේසයට තට්ටු කරමින් අලුත් නතුවකට තාලයක් යොදන්න වෙහෙසෙන ගමන් අයිරින් පිළිතුරු වශයෙන් කීවාය. "ටම් - ටම් - ටී - ටම්. ඔව්, ආන්න එහෙමයි, ඒකට තාලෙ ගැළපෙන්නෙ. දන් මං සෙරෙල්ඩට කැමතියි. ඇත්තට ම ඔව්."

"ආන් - බලන්න! ග්වෙන්ඩොලින් ආයෙත් රවාගෙන ඉන්න හැටි!" යයි බෙලින්ඩා පහත් ස්වරයෙන් කීවාය. "මට මේ පාර එයා රවාගෙන ඉන්න හැටි අඳින්න පුළුවන්. ලස්සණයි නේ, රවාගෙන ඉන්න හැටි?"

බෙලින්ඩා තමා දෙස ඕනෑකමින් බලාගෙන ඉන්න හැටි ග්වෙන්ඩොලින් දුටුවාය. එම බැල්මේ අරමුණ ද ඇ වටහා ගත්තාය. ඇ වහා ම මුහුණ සකස් කර ගත්තාය. "ඔයා මාව



ඇන්ද නං, මම ඒ කටුසිය ඉරලා දනවා," යි ඇ ඇවිසුවාය.

"අනේ, ග්වෙන්, තව විනාඩි භාගයක් රවා ගෙන ඉන්න! එතකොට මට ඇති." බෙලින්ඩා පින්සෙන්ඩු වූවාය. එහෙත් ග්වෙන් කාමරයෙන් පිට වූවාය. බෙලින්ඩාටත් ඇයගේ පත්‍ර පැන්සලටත් ඉඩක් නොදී, දොරෙන් එහාට ගිය සඳ ඇ යළිත් එම පුපුරුණු රැව්ල්ලෙන් මුහුණ ආලෝකමත් කර ගත්තාය.

"මං අර නිව්ව විහිළුව - අපි මේ සිකුරාද කරමු ද?" සියා ඇලිෂියා ඩැරල්ට කීවාය. "අද උදේ මං අහගෙන මැඩම්සෙල් කොඳුරනවා - එද ටෙස්ට් එකක් තියන්න ඕනෑ කියලා."

"අනේ - එහෙනං, අපි එදට ඒක කරමු," යයි ඩැරල් මහත් උද්දෝගයෙන් පැවසුවාය. සැලී අසල සිට මුහුණ තරක් කර ගන්නා අන්දම ද ඇ දුටුවාය. "අනේ - සැලී, මයත් කැමතියි තියන්නකෝ - මේ ජෝක් එකට. අපි කාටත් ඒකෙන් හොඳට හිනා වෙන්න පුළුවන්. කාටවත් මේකෙන් හානියක් වෙන්නෙත් නෑ."

"මං කලින් ම කියලා නේ තියෙන්නේ - මං කොහොමත් ම මේකට කැමති නෑ කියලා. මං හිතන්නේ මේක මහා මෝඩ ට්‍රික් එකක් කියලයි. ඒ වගේ ම අනතුරුදායක වෙන්නත් පුළුවන්. මට හිතන්න බැහැ, කෙනෙක් කිඹුහුම් ඇරගෙන ඇරගෙන ගියා ම - නතර වෙන්නෙ ම නැතුව, ඒක එයාට හානියක් නොවෙයි කියලා. එයාට කොච්චර අපහසුවක් දනෙයි ද එහෙම ගොඩාක් කිඹුහුම් යන්න ගියා ම? ඔයාලට ඕන නම් කරන්න! හැබැයි - මං නැහැ!" යයි සැලී මුහුණ තවත් තරක් කරගෙන කීවාය.

"වැඩේ කනවා!" යයි ඇලිෂියා ඩැරල්ට පමණක් ඇසෙන්නට හෙමින් කීවාය. ඩැරල් සුසුමක් හෙළුවාය. හුදෙක් සැලී සතුටු කිරීමට පමණක් පස්සට අඩිය තැබීමට ඩැරල්ට පුළුවන්කමක් නොවීය. සැලී ඇලිෂියාට ඉරිසියා කිරීම ඩැරල්ගේ හිතට වධයක් විය. බෙට් මේ සතියේ අග - සමහරවිට සිකුරාද - පාසැලට එනු ඇත. එවිට ඇලිෂියා ඩැරල්ගෙන් ඈත් වී ඇය සමග පුරුදු මිත්‍රත්වය පවත්වාගෙන යනු ඇත. එවිට සැලිගේ ඉරිසියාව පහ වනු ඇත. බෙට් පාසැල් නැවිත් දන් සති හයකි. වාරයෙන්

භාගයක් ම ඈ පාසැලට නාවාය. කක්කල් කැස්ස සුව වී ඇරඹී නිරෝධායන කාලයෙන් පසු ඇයට මුහුද අයිනේ විවේකයක් ද ගත කිරීමට සිදු විය. ඇයගේ රෝගය එතරම් බරපතළ වී තිබුණු නිසා ය ඒ. වාරය අවසන් වීමට තව ඇත්තේ සති තුන හතරක් පමණි. කාලය පියාඹන ඉක්මන! දන් මේ මාර්තු මාසය ය. පැසැල් වත්තේ දනවමත් කහ පාට ඩැෆඩිල් මල් පිපීගෙන එයි.

ඇලීෂියා සහ ඩැරල් ඔවුන්ගේ සැලසුම සකස් කළහ. "ලුණු වතුරේ පොඟවලා, අපි ඒ පෙත්ත මැම්සෙල්ට පිටි පස්සේ රාක්කේ ගැට්ට අයිනේ තියමු." ඇලීෂියා කීවාය. "අපි බලමු සිකුරාද පන්ති කාමරේ ලෑස්ති කරන්න තියෙන්නේ කාට ද කියලා, පන්ති පටන් ගන්න ඉස්සර. ආ - ඔයාට නමා අතුගාලා ලෑස්ති කරන්න තියෙන්නේ. එහෙම නේ ඩැරල්? එහෙනං, වැඩේ ලේසියි. ඔයාට ම ඔය කිව විදිහට ඒ පෙත්ත මං කිව විදිහට තියන්න පුළුවන්! වැඩේ ලේසියි!"

"හරි - මං කරන්නං," යයි ඩැරල් එකඟ වූවාය. කිවිසීමට පටන් ගත් විට මැම්සෙල් මවිතයට පත් වන අන්දම සිතමින් ඈ සිනා හඬ නංවන්නට වූවාය.

සෙළවර දිනය එළඹියේය. රසායනික පෙත්ත ද ලුණු වතුර කවන ලද මුහුදු හතු (ස්පොන්ජ්) කැල්ලක් ද අතැති ව ඩැරල් පංක්ති කාමරයට වැදුණාය. රාක්ක ගැට්ට මත පෙත්ත තැබූ ඈ ස්පොන්ජ් කැල්ල මිරිකා ඒ මත ලුණු වතුර බිංදු කිහිපයක් දම්මාය. ප්‍රයෝගය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන්නේ එපමණි.

බාලිකාවෝ සියල්ල රීළඟට පංක්ති කාමරය තුළට ආහ. ඔවුහු ඩැරල් දෙස බලා ඇස් බැම් උස්සා සිටියහ. ඈ සිනාමුසු ලෙස හිස ඉහළට-පහළට සෙලවූවාය. ඉන්පසු සියල්ලෝ කිසිත් නොදන්නා සේ තම තමන්ගේ අසුන්වල වාඩි වී, පාඩම ගැන්මට මැම්සෙල් එන තෙක්, නොඉවසිලි සිතින් වුව ද, සන්සුන් බවක් දක්වා වාඩි වී සිටියහ.

පුරුදු සතුටු මුහුණ දක්වාගෙන මැම්සෙල් පංක්ති කාමරයට ඇතුළු වූවාය. "අසේ - වූ මෙ ඔන්ෆොං! වාඩි වෙන්න - මගෙ



ළමයිනේ! අද අපට බොහොම වැදගත් වැඩක් තියෙනවා - වැදගත් එකක්!"

මුළු පංක්තියෙන් ම නැගී ආයේ "ජ්" ගා ඉහළ අදින ශබ්දයකි.

"නිශ්ශබ්ද වන්න! ඔය ළමයින්ට ඔනේ - මිස් පොට්ස් ඇතුළට ඇවිල්ලා මොකද්ද මේ සද්දෙ කියලා ප්‍රශ්න කරනවා අහගන්න ද? දන් මං ප්‍රශ්න කිහිපයක් ලියනවා - කළු ලෑල්ලෙ. ඔය ළමයි ඒවාට උත්තර සපයන්න ඕනෑ - තමංගෙ පොත්වල."

ඈ කළු ලෑල්ල ළඟට ගොස් ලියන්නට සැරසුණා පමණි. වාෂ්පයේ පළමු රැල්ල ඇයගේ නාහයට වැදුණි. එය අදෘශ්‍යමාන වාෂ්පයේ ලේශයක් පමණි.

මැම්සෙල්ට නහය කිතිකැවෙන ගතියක් දැනුණේය. ඈ තම සිරුර අත ගා ලේන්සුව සොයන්නට වූවාය. "කෝ, මගෙ ලේන්සුව? මගෙ නහය කහනවා!"

"මැම්සෙල්ගෙ ලේන්සුව ඔන්න පටියෙ ගහලා තියෙනවා," යයි ඇලීෂියා කීවේ, අයිරින් ඕනෑවට කලින් පුපුරා සිනා නොවෙති යි පතමිනි. අයිරින් ඒ වේලාවේ සිටියේ අමාරුවෙන් සිනාව තද කරගෙන ය.

මැම්සෙල් ද පුපුරා යන ගතියක් මුහුණින් පළ කළාය. ඈ වහා ම ලේන්සුව අතට ගෙන නහයට තද කර ගත්තාය. එහෙත් ඇයගෙන් නිකුත් වීමට ගිය මහා කිඹුහුම නතර කිරීමට පුළුවන් ලේන්සුවක් නැත. මැම්සෙල් කොයි වේලේ වුව ද කිවිසින්නේ මහා හඬක් නංවා ය. එහෙත් මෙවර එය මහා පිපිරීමක් විය.

"අ - චූස් - ෂූ - ! ආ - " මැම්සෙල් හඬ නැගුවේ ලේන්සුවෙන් නහය තළමිනි. "සමාවෙන්න ළමයිනේ, මට ඒක නතර කර ගන්න බැරි වුණා!"

සිනා හඬ පාලනය කර ගැන්ම සඳහා ඒ වන විටත් අයිරින් හිස ඩෙස්ක් එකෙන් පහළට නමා ගෙන සිටියාය. ඇලීෂියා ඇය දෙස තරහින් බැලුවේ තම ප්‍රීතිය සඟවාගෙන ය. මැම්සෙල් දෙවන වරට කිවිසුම් යවන විට අයිරින් කෙසේ හැසිරෙයි ද!

ආ! එය දත් පිට වීමට ආසන්න ය! මැම්සෙල් කඩිමුඩියේ ලේන්සුවට අත යැවුවාය. "ඕ - ලා - ලා - ආයෙත් කිඹුහුමක් එන්නයි යන්නේ! මට හෙම්බිරිස්සාව හැදුණේ නැත්තං ඇති! ආ - චූස් - ෂූ - ඌං - ඌං ඌං - !"

අයිරින් පුපුරා ගියාය. බෙලින්ඩා ද එසේ ය. තමාගේ ම කිඹුහුමෙන් ගැස්සී සිටි මැම්සෙල් ඒ දෙන්නා දෙස බිරවා සිටියාය.

"අයිරීන්, බෙලින්ඩා, තවත් කෙනෙක් අමාරුවේ ඉන්නකොට හිනාවෙන්න හොඳ නෑ - ආ - චූස් - ෂූ - ඌං - ඌං - ඌං!"

දන් ඇලීෂියාට වුව ද සිනහව සඟවා ගැනීමට පුළුවන් වූයේ නැත. ඩැරල් පුටුවේ පස්සට ඇඟ බර කොට හිස ඇල කළේ, තද කර ගන්නා ලද සිනහව නිසා හිසේ පැත්තක් කකියන්නට වූ බැවිනි. සැලී පවා සිනාවක් පා සිටියාය. ඇයට ද එය සඟවා ගත නොහැකි විය.

"හා - චිං!" මැම්සෙල් තවත් කිඹුහුමක් ඇරියාය. ඈ කැරකී පුටුව මත පතිත වූවාය; ලේන්සුවෙන් නළල පිස දමන්නට වූවාය. "මට මීට ඉස්සර කවදාවත් මෙහෙම කිඹුහුම් ගිහිල්ලා නෑ," යි ඈ කීවාය. "හොඳයි, මං මේ විදිහට කිඹුහුම් යවනවා අහලා තියෙනව ද? නෑ - නේ - ආ - චූ - - - - ස් - ෂූ - - - - !"

මෙවර එම පිපිරීම කොතරම් බලගතු වූයේ ද යත්, අහිංසක මැම්සෙල් පුටුවත් සමග සෙලවෙන්නට වූවාය. දන් මුළු පංක්තිය පුරා ම එක ම සිනා හඬකි. ග්වෙන් පුටුවෙන් බිමට වැටෙන තරමට පහන් වූවාය. ඇය නැගිට සිටිද්දී අයිරින් බිම පෙරළී සිනාසෙන්නට වූවාය. සිනා හඬත් සමග මතු වූ ලොකු කඳුළු බිංදු බොහෝ ළමයින්ගේ කම්මුල් දිගේ වැගිරෙන්නට වූයේය.

කිඹුහුම් යාම දන් නතර වී ඇත් දැයි සිතමින් මැම්සෙල් කළු ලෑල්ල දෙස හැරී බැලුවාය. දන් නම් එය නතර වී ඇති පාට ය! ඈ හෙමින් පුටුවෙන් නැගිට කළු ලෑල්ල ළඟට ගියාය. එහෙත් නහසය යළි පොපියන්නට වූයේය. ඈ ලේන්සුව තද කළාය. එහෙත් වැඩක් වූයේ නැත. "ආ චූ - ස් - ෂූ - - !"

මැම්සෙල් යළිත් පුටුව මත ඇදගෙන වැටුණාය. මේ වේලාවේ



පොට්ස් මෙනෙවිය දොර ඇරගෙන කාමරයට ඇතුළු වූවාය. ඇය අත කඩදාසි ගොන්නකි. "ඕ, මට සමාවෙන්න, මැම්සෙල්! මේ කඩදාසි - මැම්සෙල් එහෙ දලා ඇවිල්ලා - " යයි කතා කිරීමට පටන් ගත් ඈ මුළු පංක්තිය ම නතර කර ගත නොහැකි සිනාවකින් මුසපත් වී සිටිනු දක නතර වූවාය. මෙහි සිද්ධ වන්නේ කුමක් ද?

ඈ මැම්සෙල් දෙස බැලුවාය. මැම්සෙල් ද පිළිතුරු වැල්මක් හෙළුවාය. ඇයට අවශ්‍ය වූයේ කාරණය පහද දීමට ය.

"ආ - චූ - ස් - ෂූ - - - - " යයි මෙවර මැම්සෙල්ගෙන් පිට වූ කිවිසුම් හඬ පොට්ස් මෙනෙවිය දොරෙන් එළියට යැවීමට තරම් බලගතු විය. එහෙත් නොසැලී සිටි පොට්ස් මෙනෙවිය මැම්සෙල් ළඟට කිට්ටු වෙද්දී ළමෝ සිනාව අමාරුවෙන් පාලනය කරගෙන අසුන්වල කෙළින් වී සිටියහ. ඇය ඉක්මනින් ආපසු යතැ යි ඔවුන් බලාපොරොත්තු වූ නමුදු, එය එසේ නොවිය. මැම්සෙල් අපහසුවෙන් හා වේදනා ගතියෙන් පසු වන බව දනී. පොට්ස් මෙනෙවිය ඇය ළඟට ම ගියාය. "මේ කිඹුහුම් යන එක නතර කර ගන්න බෑ - " යයි මැම්සෙල් පවසද්දී ඇයට තවත් කිඹුහුමක් ගියේය.

අදිසි වාෂ්ප රැල්ලක් පොට්ස් මෙනෙවියගේ නහසය සොයා ආවේය. ඇය යමක් පැවසීමට මුව විවෘත කළා පමණි, සිය නහසය කිතිකැවෙන ගතියක් ඇයට දනුණි. ඈ ලේන්සුව සොයා ඇඟ වටා අතපත ගාන්නට වූවාය.

"ආ - ටිස් - ෂූ - !" ඈ ද කිවිසුම් ඇරියාය. අයිරින් යළිත් පුපුරා යන හඬින් සිනා ගොබයක් පිට කළාය. පොට්ස් මෙනෙවිය ඇය දෙස රවා බැලුවාය.

"අයිරීන්, ඔය ළමයා හිතන් - ආ - ටිස් ෂූ - - - - - !" පොට්ස් මෙනෙවිය කිඹුහුමක් පිට කළාය.

"ආ - චූස් - ෂූ - - - - - - !" මැම්සෙල්ගේ පිළිතුර විය. "මිස් පොට්ස්, මොකද්ද මේ - මට මේක නතර කර ගන්න ම බෑ! මං - ආ - චූස් - ෂූ - - - - !"

පොට්ස් මෙනෙවිය එක දිගට ම කිවිසුම් තුනක් පිට කළේ,

ඒ අකාරයුරු එක ද වචනයකුදු පිට කර ගැන්මට අසමත්ව ය. ඒ සමග ම යම් නිසි සැකයක් ඇයට පහළ වන්නට වූයේය. ඇ කොක්හඬලා සිනාසෙන පංක්තිය දෙස විමසිල්ලෙන් බැලුවාය.

"ජීන්, ඔය ළමයා මේ පන්තියේ ශිෂ්‍ය නායිකාව නේ? මේසේ මොනව හරි - මගඩියක් - ආ - චිජ් - ෂු - - - - !"

ජීන් පසු බා සිටියාය. මුළු පංක්තිය ම පාවා දිය හැක්කේ කෙසේ ද?

වැඩි දුරටත් ප්‍රශ්නවලට ගොදුරු වීමෙන් ජීන් වළක්වාලමින් මැම්සෙල් මහා බලගතු කිවිසුමක් පිට කළාය. ඒ සමග ම ඇ පුටුවෙන් ද ඇදගෙන වැටුණාය. "මට සනීප නෑ! මීට ඉස්සර මං කවදාවත් මෙහෙම කිඹුහුම් යවලා නෑ! මට හොඳට ම සනීප නෑ. ආ - චුස් - ෂු - - - - !"

මේ වන විට කිඹුහුම් දෙක තුනක් පිට පිට ම යවන්නට වූ පොට්ස් මෙනෙවිය ද නැතිගෙන සිටියාය. ඇ පහත් වී මැම්සෙල් ඔසවා ඇයට ආපසු පුටුවේ වාඩි වීමට උදව් කළාය. "ඔය ජනේලය ඇරලා දලා, මෙහාට එන්න කියන්න!" යි ඇ ඩැරල්ට අත දිගු කර කීවාය. "මැම්සෙල්ට ඇත්තට ම සනීප නෑ!"

ඩැරල් ද බියට පත් වූවාය. ඇය ජනේලය විවෘත කරද්දී, මේරි ලූ පාලිකාව සොයා දිව ගියාය. මැම්සෙල්ගේ කෙලවරක් නැති කිඹුහුම් යාම ගැන මේරි ලූ හති අරිමින් කළ ප්‍රකාශයෙන් අවුල් වූ සිතින් යුතු ව පාලිකාව දුවගෙන ආවාය. මැම්සෙල්ගේ පාණ්ඩු පාට මුහුණ දුටු ඇය ඇයගේ අත අල්ලාගෙන ඇය පුටුවෙන් එසවූවා පමණි, පෙත්තෙන් නැඟුණු අදිසි හුමාලය තවත් බිල්ලක් ගත්තේය. පාලිකාවට ද කිවිසුමක් ඇති විය. ඇ එය ඉක්මනින් පිට කළාය. පොට්ස් මෙනෙවිය ද ඊට පිළිතුරු කිඹුහුම් දෙකක් පිට කළාය. මැම්සෙල් තවත් එකකට සූදානම් වූවාය. එවිට පාලිකාව මැම්සෙල් කාමරයෙන් පිටතට ගෙන ගියාය. පොට්ස් මෙනෙවිය ද ඔවුන් පිටුපස ගියේ මැම්සෙල්ට වැඩි ආපදාවක් සිදු නොවන බව සැක හැර දැන ගැන්මට ය.

කොතරම් බිය වී නැතිගෙන සිටිය ද, මෙම වැඩිහිටියන්



තිදෙනා සමූහ ගායනයක යෙදෙන්නා සේ තරඟයට කිවිසුම් යවමින් කාමරයෙන් පිට ව ගිය පසු, බාලිකාවෝ යළිත් සිනා හඬ නංවන්නට වූහ. එය ඔවුන්ට තව දුරටත් තද කර ගත හැකි නොවීය. "ඔයා තව විකෙන් මිස් පොට්ස්ගේ ප්‍රශ්නෙට අනුවෙනවා - ජීන්," යයි ඇලිෂියා පැවසුවාය. "ඔයා නූලෙන් බේරුණේ! අපි හිතමු - එයා ආයෙත් ප්‍රශ්න කරන්නෙ නැති වෙයි කියලා."

"මං හිතනවා, මැම්සෙල්ට ඇත්තට ම අමාරුවක් වෙන්නෙ නැති වෙයි කියලා," යයි ඩැරල් බිය වී පැවසුවාය. "එයාගෙ මුහුණ නම් එච්චර හරි නෑ - මෙහෙන් ගෙනියන කොට. මට හිතෙනවා අර පෙත්ත එතැනින් අරගෙන ජනේලයෙන් එළියට විසි කරන්න, මිස් පොට්ස් ආපහු එන්න ඉස්සරින්, ඒක එයාට අහු වෙන්න ඉස්සරින්."

ඩැරල් එම පෙත්ත එළියට විසි කළාය. ඒ අවස්ථාවේ ඇයට ද කිඹුහුමක් ගියේය. ඉන්පසු මුළු පංක්තිය ම කවුරුන් හෝ ඇතුළට එන තෙක් සන්සුන් ලෙස සිටියහ.

"මැම්සෙල්ට කොහෙත් ම හොඳ නෑ," යි කියාගෙන පොට්ස් මෙනෙවිය පංක්ති කාමරය ඇතුළට ආවාය. යළිත් කිඹුහුම් යති යි බියෙන් ඇ ලේන්සුව සූදානම් ව තබාගෙන සිටියාය. "මැම්සෙල් ඇඳට යැව්වා - හොඳට ම වෙහෙස වෙලා හිටිය හින්ද. නමුත්, පුදුම වැඩේ - හරි ම පුදුම වැඩේ කියන්නේ, අපි මේ කාමරයෙන් පිට වුණා විතරයි, අපි කාටවත් කිඹුහුම් ගියේ නෑ. දැන් ජීන් කරුණාකර මේක අපට පහද දෙනවා ද? එහෙම නැත්නම්, ඇලිෂියා? ඔය ළමයට පුළුවන් මේක පහදලා දෙන්න. මට හිතෙනවා - වෙන කාටවත් වැඩිය ඔය ළමයා මේ ගැන දන්නවා කියලා."

කිව යුත්තේ කුමක් දැයි ඇලිෂියාට හිතා ගත හැකි නොවීය. ජීන් ඇයට වැළමිටෙන් ඇන්නාය. "හා - හරි - දැන් ඔයා කියන්න!"

ඇලිෂියා මෙම මගඩියේ සියලු විස්තර හෙළි කළාය. රවාගෙන සිටි පොට්ස් මෙනෙවියට එම කතාව ගොත ගසමින් ප්‍රකාශ කර සිටීම ඇලිෂියාට විහිළුවක් නොවීය.

"මට දන් තේරෙනවා - මේක ඇලිම්යාගේ කසකිරු මෝඩ මගඩියක් කියලා. මං දනගෙන ඉන්න තිබුණෙ, මේ පන්තියේ ළමයි මෙහෙම දඩබ්බර වැඩ කරනවා කියලා. මේ පන්තියේ හැම ළමයෙක් ම මේ මගඩි වැඩේට සම්බන්ධ ද?"

"සැලිගෙ සම්බන්ධයක් නෑ," යි ඩැරල් වහා ම කීවාය. "එයා මේකට එකඟ වෙන්න බෑ කීවා. එයා විතරයි මේ වැඩේට විරුද්ධ වුණේ!"

"මුළු පංක්තියේ ම ඉන්නේ එක ම සිහි බුද්ධිය තියෙන ළමයයි!" පොට්ස් මෙනෙවිය ප්‍රකාශ කළාය. "හරි, බොහොම හොඳයි, සැලී හැරුණා ම ඔය ළමයි ඔක්කොටම අහිමි වෙනවා - ඊළඟ වරු නිවාඩුව. ඒක - මං හිතන්නේ - මේ බ්‍රහස්පතින්ද. එතකොට, ඔය ළමයි මැම්සෙල්ගෙන් සමාව අරගෙන, මේ වාරේ ඉතුරු හරියේ දෙගුණයක් මහන්සි වෙලා ප්‍රන්ස භාෂාව ඉගෙන ගන්න ඕනෑ."

## 21

## මාවිස් සහ සෙරෙල්ඩා

නියම විහිළුවක් යයි සතුටින් සිතාගෙන සිටි ප්‍රයෝගය මුළු පංක්තියට ම වේදනාත්මක කෙළවරක් ගෙන දුන්නේය. "මං හිතනවා ඒ පෙත්ත සාමාන්‍ය ඊවාට වැඩිය සැරට හදලා තියෙන්න ඇති!" යයි ඇලිම්යා දෙම්නස් සහගත ව ප්‍රකාශ කළාය.

"මං කීවේ!" යයි සැලි උදම් වුයේ නැත. මෙය ඇයගේ යහ ගුණයක් ලෙස ඩැරල් දුටුවාය. "ඔය කට්ටිය වගේ මාත් මගේ වරුවේ නිවාඩුව නොගෙන දඬුවම විඳින්නම්!" යයි තිමට තරම් ඈ පන්තිය වෙනුවෙන් කැප වූවාය. "මං ඔය සෙල්ලමට විරුද්ධ වුණ එක ඇත්ත, ඩැරල්. ඒ වුණාට මං කවුරුත් එක්ක දඬුවම බෙදා ගන්න කැමතියි."



"ඔයා නම් පුදුම කෙල්ලක්!" කියා ඩැරල් තම අසින් ඇයගේ අත දවටා ගත්තාය. "අපි යං: පල්ලෙහාට ගිහිං බලමු, තෝට්ස් හෝඩි එකේ වැදගත් යමක් තියෙනව ද කියලා. අද ඒව තියෙනවා ඉහළ පන්ති දෙකක් අතරේ වාදයක්, මං හිතන්නේ ඒ කොල්ලො ඔළු ගෙඩි හප්පාගෙන වාද කරන හැටි අපට බලා ගන්න පුළුවන්."

ඔවුහු දෙදෙනා දන්වීම් පුවරුව කරා ගියහ. හවයේ පන්තියේ බාලිකාවක් ද දන්වීම් පුවරුව කියවමින් සිටියාය. ඒ එලන් ය. "හලෝ ඩැරල්, මෙන්න මගේ සුබ පැතුම්!" ඈ කීවාය.

"ඇයි - මොකට ද?"

"මොකට ද කියලා අහන්නේ - තුන් වෙනි මැච් ටීම් එකට ඔයා සෙල්ලම් කරනවා නේ - මේ බ්‍රහස්පතින්ද," යි එලන් කීවාය. "ටීම් එකේ තුන් දෙනෙක් ලෙඩ හින්ද සෙල්ලං කරන්නේ නෑ. ඒ හින්ද රිසර්ව් තුන් දෙනා ම සෙල්ලං කරනවා. ඔයත් එක් කෙනෙක් නේ. නැද්ද?"

"ආ - නේ, කොච්චර හොඳ ආරංචියක් ද!" කියා සතුටින් ඉපිල වට-පිට බලන්නට වූ ඩැරල් එක් වර ම දුර්මුඛ වූවාය. "ආ - මට මිස් පොට්ස් ලබන බ්‍රහස්පතින්ද සෙල්ලම් කරන්න දෙයි ද? එද මැච් එක සෙල්ලං කරන්නෙ කොහොම ද, අපිට මිස් පොට්ස් දඬුවමක් දීලා තියෙද්දී, වරුවෙ නිවාඩුව නැති කරලා, අපෙ පන්තියට වැඩ කරන්න කියලා. ඔයා හිතනව ද සැලි, මිස් පොට්ස් මට ඉඩ දෙයි කියලා - ක්‍රීඩා තරඟෙට ඉදිරිපත් වෙන්න?"

"ඔයා මේ මොනව ද කියවන්නෙ, ඩැරල්?" එලන් ඇසුවාය. ඩැරල් ඇයට සිද්ධිය විස්තර කර කීවාය.

"ආ - නේ, එහෙම නං ඔයාට කණ්ඩායමේ සෙල්ලම් කරන්න ලැබෙන්නෙ නැති වෙයි. මැච් ටීම් එකේ සෙල්ලං කරන එක කොච්චර ලොකු වැදගත් දෙයක් වුණත්, දඬුවම අහක් කරන ජාතියේ ගෑනියක් නෙවේ - මිස් පොට්ස්," එලන් පවසා සිටියාය.

ඩැරල්ට කෙඳිරි ගැවුණේය. "චා, කොච්චර තරක අවාසනාවක්

ද! මට ලැබුණු පළමු චාන්ස් එක - මට නැති වෙච්ච හැටි! අනේ, සැලි, මාත් ඔයා එක්ක එකතු වෙලා, ඇලිම්යාගේ විගඩම් වැඩෙන් අයින් වෙලා හිටිය නම් කියලා දැන් හිතෙනවා."

එය ඇත්තෙන් ම ඩැරල්ට වැදුණු බලවත් පහරක් වූයේය. ඇය කොතරම් කනස්සලු ගතියෙන් පසු වූයේ ද යත්, සැලිට එය බලා සිටිය නොහැකි විය. සැලි පොට්ස් මෙනෙවියගේ කාමරය කරා ගොස් දොරට තට්ටු කර එහි ඇතුල් වූවාය.

"ප්ලීස්, මිස් පොට්ස්, මේ බ්‍රහස්පතින්ද ඩැරල් තේරිලා ඉන්නවා අපෙ තුන් වෙනි ලැක්රෝස් ටීම් එකේ සෙල්ලම් කරන්න. ඒ වුණාට - අද සිද්ධිය හන්ද, එද වරුවෙ නිවාඩුව එයාට ලැබෙන්නෙ නෑ - පංක්තියෙ වැඩ කරන්න වෙන හන්ද - දඬුවමක් විදිහට. එයාට හරි හිතට අමාරුයි, මේ ගැන. මිස් මට කිව්වා නේ මම ඒ විහිළු වැඩේට සම්බන්ධ වුණේ නැති හන්ද, මට ඒ නිවාඩුව ගන්න පුළුවන් කියලා. මං එදට වැඩ කරන්නං! ඒ නිවාඩුව ඩැරල්ට දෙන්න බැයි ද මිස් - මැච් එකේ සෙල්ලං කරන්න?"

"බොහොම කාරුණික අදහසක්, සැලි! නමුත් මට ඒක කරන්න බැහැ. ඩැරල් ඒ දඬුවම විඳින්න ඕනැ - පන්තියේ අනික් ළමයි වාගේ. මැච් එකේ සෙල්ලං කරන්න අවස්ථාවක් එයාට නොලැබෙන්නෙ එයාගෙ ම වරදින්," යයි පොට්ස් මෙනෙවියගේ පිළිතුර විය.

සැලි දුකින් ආපසු ආවාය; තමා පොට්ස් මෙනෙවියගෙන් ඉල්ලා සිටි දෙයත්, ඇයගෙන් ඊට ලැබුණු පිළිතුරත් ඩැරල්ට කියා සිටියාය. ඩැරල්ගේ හිත උණු වූයේය. "ඕ, සැලි, ඔයා නම් හරි ම පරිත්‍යාගශීලී ළමයෙක්! නියම මිතුරියක්! ඔයාට බොහොම ස්තුතියි!"

සැලි මුදු සිනාවක් පා සිටියාය. ඇයගේ මාත්සර්යාධික හැඟීම පහ වී ගියේය. තමා ඇලිසියාට ඉරිසියා කිරීමෙන් කළේ මෝඩකමක් බව ඇයට තේරුම් ගියේය. මින් ඉදිරියට එ වැනි අදහසක් හිතේ ඇති කර ගැන්මෙන් වැළකීමට ඈ ඉටා ගත්තාය. ඈ ඩැරල්ගේ අත සියතින් වෙලා ගත්තාය.



"මෙච් ආපහු ඇවිල්ලා, ඇලිසියා එක්ක යාළුකම පවත්වන්න පුළුවන් ගත්තකං මං ආශාවෙන් ඉන්නේ." සැලි කීවාය.

"මාත් එහෙමයි," යයි ඩැරල් ද හිතට අවංක ව කීවාය. "එයා අපි දෙන්නා එක්ක තුන් කොන් මිත්‍රකමක් ඇති කරගන්න දඟලන එකට මට තරහා යනවා. අපි එයාට අනු නොවී අපෙ පාඩුවේ ඉමු."

සැලි සතුටට පත් වූවාය. එහෙත් තමාගේ වරුවක නිවාඩුව ඩැරල්ට පරිත්‍යාග කිරීමට නොලැබීම ගැන ඈ කණගාටු වූවාය. අහිංසක ඩැරල්! ඇයට අහිමි වීමට යන්නේ කොතරම් වටිනා අවස්ථාවක් ද! එවැනි වාසනාවක් කාලයකින් ලැබෙන්නේ නැත.

මවුහු හෙද සොහොයුරිය හමු වී මාවිස් ගැන තොරතුරු විමසා සිටියහ. "දැන් සැහෙන්න හොඳයි. ඒ වුණාට කටහඬ ගිහිල්ලා! නිකං 'ක්‍රෝක්' ගාන විදිහේ කපුටු හඬක් තමා දැනට තියෙන්නේ. පව් - මාවිස්! එයා හරි හිතේ අමාරුවෙන් ඉන්නේ. හෙට එයා බලන්ට අමුත්තෙකුට ඉඩ දෙන්න පුළුවන්. එයා ඉල්ලා හිටින්නේ සෙරෙල්ඩාවයි. ඔය දෙන්නට පුළුවන් සෙරෙල්ඩාට කියන්න - තේ වලින් පස්සෙ මාවිස් බලන්ට යන්න කියලා," යි ඈ කියා සිටියාය.

ඩැරල් සහ සැලි මවිතයට පත් ව ඔවුනොවුනගේ මුහුණු බලා ගත්හ. සෙරෙල්ඩා! මාවිස්ට සෙරෙල්ඩා ඕනැ කරලා තියෙන්නේ මොන කෙහෙම්මලකට ද?

මාවිස් පසු වූයේ මහත් දුකෙනි. තමාගේ මිහිරි කටහඬ අහිමි වීම ගැන දැන ගත් විට ඈ මහත් භීතියට පත් වූවාය. ඇයට ඉතිරි ව ඇත්තේ ඇයට ආවේණික වූ කටහඬ වෙනුවට ගොරෝසු කපුටු හඬකි. "ඕ සිස්ටර්, මට ආයෙ කවදාවත් සින්දු කියන්න බැරි වෙයි ද?" ඈ මහත් කැළඹීමෙන් යුතු ව ඇසුවාය.

"ටික කාලයක් යනකං බැරි වෙයි." හෙද සොයුරියගේ පිළිතුර වූයේය. "පස්සෙ, ආපහු තිබුණ විදිහට හරි යයි. මාවිස්, ඔයා දැන ගන්න ඕනැ - තමන් තදබල ලෙස උගුරෙ අමාරුවෙනුයි, පපුවෙ අමාරුවෙනුයි පෙළුණා කියලා - එද රෑ වැස්සට තෙමිලා, හුළං වැදිලා, ශීත අල්ලලා හැදුණු අසනීපෙ හැටියට. තව

අවුරුද්දක් දෙකක් යනකං සින්දු කියන්න උගුර වෙහෙසන්න හොඳ නෑ. වෛද්‍ය විශේෂඥයා කියන හැටියට - එහෙම සින්දු කියන්න ගිහිල්ලා උගුරට හානියක් වුණොත්, සදහට ම කටහඬ නරක් වෙන්න පුළුවන්. එතකොට කොහෙත් ම සින්දු කියන්න බැරි වේවි."

මාවිස් සිය දෑසින් ගලා ගිය කඳුළු නිදහසේ වෑක්කෙරෙන්නට ඉඩ හැරියාය. ඒවා පිස දමා ගැන්මට හෝ සිහියක් ඇයට නොවිය. කටහඬ නෑ! අවුරුද්දක් දෙකක් යන තෙක් සින්දු කියන්නට නෑ! ඊට පසු ව කුමක් සිදු වේ දැයි සිහිය නොහැකි ය. ඇයට කිසිදු ඔපෙරා ගායිකාවක විය නොහැකි ද! උගුරේ අමාරුව! පසුවේ අමාරුව! ගායිකාවක මහ හැරිය යුතු ම ආබාධයන් ඒවා ය!

"මේක - ඉහිං, මගේ ම වැරැද්ද! මං මොකට ද එද ඊ මහ වැස්සේ හොරෙන් ඒ ගමන ගියේ?" මාවිස් වැලපුණාය. "මං හිතුවෙ - මං ඒ කළේ ලොකු හපන්කමක් කියලා. අනිත් කවුරුවත් හිතුවෙ ඒකෙ අනිත් පැත්ත. සෙරෙල්ඩා විතරයි මාව තේරුම් ගන්න පුළුවන් කෙනෙකුට ඉන්නේ. එයා ජනප්‍රිය චිත්‍රපට නිළියක් වෙන්වයි යන්නේ. එයා දන්නවා ගායිකාවක් හරි නිළියක් හරි ජනප්‍රිය වෙන්න කොච්චර ආශාවෙන් ඉන්නවා ද කියලා. මිනිස්සුන්ගේ ප්‍රශංසාව, අත්පොලසන් හඬ ලබන්න කොච්චර ආශාවෙන් ද අපි දෙන්නා හිටියේ!"

මේ අනුව, ඇයට අමුත්තකු දන් පිළිගත හැකි බව පැවසූ හෙද සොහොයුරිය, ඇය කැමති කවරකු දැයි විමසා සිටි කල, ඇය තෝරා ගත්තේ සෙරෙල්ඩා ය. ඇයට තම හිතේ ඇති දෑ නොවළහා පැවසිය හැකි ය. සෙරෙල්ඩා සියල්ල තේරුම් ගෙන ඇයට අනුකම්පා කරනු ඇත!

සෙරෙල්ඩා මාවිස් එතරම් ප්‍රිය නොකළ නමුත්, මාවිස් අන් සියල්ලන් අතුරින් තමාට ප්‍රමුඛත්වය දීම ගැන විමතියටත් සතුටටත් පත් වූවාය. ඈ මාවිස් බැලීමට ගියාය. ඇය ගියේ පලතුරු සහ පැණි රස කෑම මෙන් ම, ඇයට ළඟ දී ඇමරිකාවෙන් ලැබුණු පොතක් ද රැගෙන ය. සෙරෙල්ඩා තවදත් තෑගිලි ය.



මාවිස්ගේ ස්වභාවය දුටු සෙරෙල්ඩා කම්පාවට පත් වූවාය. "දෙවි වෙන්න!" යයි මාවිස් බැරැවී හඬින් පැවසුවාය.

"ඔයාගෙ කටහඬට මොකද වුණේ?" යයි බියට පත් ව සෙරෙල්ඩා ඇසුවාය.

"මට - ඒක නැති වුණා! සමහරවිට - සදහට ම වෙන්නත් - බැරි නෑ!" කැඩී කැඩී ඉස්මතු වූ කපුටු හඬින් මාවිස් උත්තර දුන්නාය. "ආනේ, සෙරෙල්ඩා, මං නම් ගොන් මෝඩියක්! මට හොඳට ම විශ්වාසයි ඔයා ඇරුණා ම වෙන කවුරුවත් මාව විශ්වාස කරන්නෙ නෑ කියලා!"

හති අරිමින්, උගුර පාදමින්, සිය රළු හඬ සකස් කර ගැන්මට අසාර්ථක වෙහෙසක් දරමින්, මාවිස් එද රෑ තමා මුහුණ දුන් සිද්ධිය සම්පූර්ණ වශයෙන් සෙරෙල්ඩාට විස්තර කර සිටියාය. "ඒ අය මට සින්දු කියන්ට දුන්නෙත් නෑ. ඒ හන්ද මගෙ මුළු මහන්සිය ම අපතේ! අනේ - සෙරෙල්ඩා, මගෙ කටහඬ නැති ව මං මොනවා කරන්න ද? මං මැරෙයි! මැරෙන එක හොඳයි! අනිත් කවුරුත් කියන්නෙ, කටහඬ නැත්නම්, මගෙ ගන්න ම දෙයක් නෑ කියලා නේ! මවු, ගන්න ම දෙයක් නෑ කියල තමා!"

"වැඩිය කතා කරන්න එපා, මාවිස්," යයි දොරෙන් ඇතුළට හිස දමා හෙද සොයුරිය කීවාය. "ඒ වෙනුවට ඔයා කතා කරන්න - සෙරෙල්ඩා."

ඒ අනුව සෙරෙල්ඩා කතා කරන්නට පටන් ගත්තාය. ඇයට කතා කිරීමට ඇත්තේ කුමක් ද? ඇයට හදිසියේ ම නුවණ පහළ විය. මාවිස්ට පැවසීමට වැදගත් යමක් කල්පනා විය. මැලෝරි ටවර්ස් හි ගත කළ මෙම මුල් වාරයේදී ම ඇයට යම් යම් දේ ඉගෙන ගැන්මට ලැබී ඇත. රඟපෑමට ගොස් තමා ලද අසාර්ථකත්වයෙන් ඇය විශේෂ පාඩමක් ඉගෙනගෙන ඇත. තමා උගෙන ගත් සියල්ල ඈ මාවිස්ට කියා සිටියාය.

ෂේක්ස්පියර් නාට්‍ය පුහුණුවේ දී සිදු වූ දේ කියා පෑම ඇයට ලෙහෙසි කාර්යයක් නොවිය. එහෙත් තමා කියාගෙන ගිය දේ

සාවධානව අසා හිතව ගැන්මට මාවිස් උනන්දුවක් දක්වා සිටි හෙයින්, සෙරෙල්ඩා සියල්ල නොවළහා විස්තර කර සිටියාය.

"ඉතින් - මාවිස්, මගෙ තත්ත්වය ඔයාට වැඩිය භයානකයි! ඔයාට නං සහජ හැකියාවක් තිබුණා. මට එහෙම දක්ෂකමක් කොහෙත් ම තිබුණේ නෑ. ඔයා ආඩම්බර වුණේ ඇත්ත වශයෙන් ම ඔයාට තිබුණු දෙයක් ගැන. මං ආඩම්බර වුණේ නිකං හිතේ මවා ගත් - මට නොතිබුණු දෙයක් ගැන. ඒ කොහොම වුණත්, දැන් මං ඇත්ත අවබෝධ කරගෙන සැහීමට පත් වෙලා ඉන්නවා. කොහොම වුණත්, අපෙ නියම තත්ත්වෙ දනගෙන ජීවත් වෙන එක වඩාත් නුවණට හුරුයි නේ. නැද්ද? අපි පාසැල් ශිෂ්‍යාවන් විසක් අනාගත චිත්‍රපට නිළියන් හරි, ඔපෙරා ගායිකාවන් හරි නෙවෙයි නේ! මට දනුණා වගෙ ඔයාටත් දනෙන්න ඕනෑ - කල්පනා කරලා බැලුවම. ඔයාගෙ කටහඬ ටිකකට තමන්ට අහිමි වුණු හන්ද - දැන් ඔයාට තමාගෙ නියම තත්ත්වෙ අවබෝධ කරගෙන, ඒ හැටියට කල් ගෙවන්න පුළුවන්," යයි සෙරෙල්ඩා කියා සිටියාය.

"අනේ - සෙරෙල්ඩා," කියා මාවිස් සිය ඇමරිකානු යෙහෙළියගේ අත වටා අතක් යැවූවාය. "ඔයා මට කොහොම පිහිට වුණා ද කියලා ඔයා ම දන්නෙ නෑ. මං හිටියෙ මං ගැන ම මහත් හිතේ දුකෙන්. මං හිතුවෙ නෑ - මීට ඉස්සර මේ මට වුණු විපත වාගෙ දෙයක් තවත් කෙනෙකුට සිද්ධ වෙලා තියෙනවා ද කියලා. දැන් බැලුවා ම ඔයාට වෙලා තියෙන්නෙත් මට වෙච්ච ඇබැද්දිය වගේ ම දෙයක් තමා!"

සෙරෙල්ඩා කිසිවක් නොකීවාය. අන් සියල්ලන් අතුරින් මාවිස්ට ම තමාගේ පාපොච්චාරණය ඉදිරිපත් කිරීමට සිදුවීම ඇයගේ ආත්ම ගරුත්වයට සෑහෙන හානියක් වූයේය. එහෙත්, කොතරම් වැරදි තිබුණත්, සෙරෙල්ඩා අනූන්ට හොඳ හිතක් දක්වන්නියකි; පරිත්‍යාගශීලී හැඟුම්න්ගෙන් සැදි බාලිකාවකි. එනිසා, තමාට හා තමාට පමණක් මාවිස්ගේ සිත් තැවුල මකා දැමීමට පුළුවන් බව ඇ වටහා ගත්තාය. තමාගේ දුර්වලකම හා අසාර්ථකත්වය නොසඟවා හෙළි කිරීමට ඇය සිතුවේ එයින් මාවිස්ගේ දුක තුනී කිරීමට හැකි බව දනගෙන ය.



හෙද සොහොයුරිය නැවතත් හිස ඇතුළට දම්මාය. මාවිස් පෙරට වඩා සතුටු මුහුණක් දරාගෙන සිටීම දක්ම ඇයටත් සතුටට හේතු වූයේය. ඈ කාමරය ඇතුළට ආවාය. "සෙරෙල්ඩා, ඔයා මාවිස්ගෙ හිත හදලා තියෙනවා. දැන් එයා හිටියට වැඩිය හුඟක් වෙනස් වෙලා. ඔය දෙන්නා හොඳ මිතුරියෝ කියලා මං හිතනවා," යයි ඈ පවසා සිටියාය.

මාවිස් විමසිලිමත් ව සෙරෙල්ඩා දෙස බැලුවාය. "ඔව්," යයි සෙරෙල්ඩා වචනය බර කොට උත්තර දුන්නාය. "අපි හොඳ යෙහෙළියෝ!"

"හරි - තව විනාඩි දෙකක් ඉඳලා, සෙරෙල්ඩාට යන්න පුළුවන්," යයි පවසා හෙද සොයුරිය පිටව ගියාය.

"මං අනිත් අයට පෙනෙන්න සලස්වන්නං - මම නිකම් ම තටහඬක් විතරක් නොවේ කියලා," යයි මාවිස් ගොරෝසු හඬින් ප්‍රකාශ කළාය. "සෙරෙල්ඩා, ඊකට ඔයා මට උදව් කරනවා නේ? ඔයා මයෙ එක්ක යාළුයි නේ? මං යාළු වෙන්න තරම් එච්චර කෙනෙක් නොවේ. ඒක මං දන්නවා. නමුත් ඔයාට වෙන මිතුරියක් නෑ නේ? එහෙම ඉන්නවා ද?"

"නෑ," යයි සෙරෙල්ඩා පැවසුයේ එසේ පැවසීමට සිදු වීම ගැන ලැජ්ජාවෙනි. "මට කියන්න තියෙන්නෙත් මිතුරු වීමට තරම් මාත් එච්චර කෙනෙක් නෙවේ කියලයි. මං නිකං වැදගැම්මකට නැති කෙනෙක්! අපි දෙන්න ම දනට එහෙම වෙන්න ඇති! අපි එකිනෙකාට පිහිට වෙමු. දැන් මං යන්ට ඕනෑ. ගුඩ් බායි! මං හෙටත් එන්නං!"

22

## සියල්ල සමථයකට පත් වෙයි

කිඹුහුම් යාමේ රෝගයෙන් ඉක්මන් සුවය ලද මැම්සෙල් පසු දින ම පංක්තියේ ඉගැන්වීමට ආවාය. මේ සිද්ධියට හේතුව

අටේ පන්තියේ ළමයින් විසින් කරන ලද ප්‍රයෝගකාරී ක්‍රියාවක් බව පොට්ස් මෙනෙවිය ඇයට පහද දුන් කල ඇයට මුලින් ම හට ගත්තේ කෝපයකි.

එහෙත්, විහිළු තේරුම් ගැනීමේ ඇය සතු විත්ත ප්‍රකෘතිය ක්‍රම ක්‍රමයෙන් ඇයගේ හිත පහන් කිරීමට සමත් වූයේය. තමා මෙන් ම පොට්ස් මෙනෙවිය හා පාලිකාව ද මෙම උගුලට අසු වූ සැටි මෙනෙහි කල ඇ තමාට ම සිනාසුණාය.

"නමුත්, වැඩියෙන් ම කිඹුහුම් ඇරියෙ මමයි," යයි ඇ තමාට ම කියා ගත්තාය. "අහා - අර එන්නේ - මැම්සෙල් රූෂියර්. මං එයාට කියන්න ඕනෑ - අපට වෙච්ච ඇබැද්දිය ගැන."

මැම්සෙල් දූපොං මෙම කිඹුහුම් යැවීමේ උපක්‍රමයට තමා අසුවීම ගැන මැම්සෙල් රූෂියර්ට කීවාය. ඇඹුල් මුහුණක් ඇති මැම්සෙල් රූෂියර් කිසි සේත් එම කවටකම අනුමත නොකලාය. ඇයට තරහා ගියේය.

"මේ ඉංග්‍රිසි කෙල්ලෝ! ඔයා ප්‍රින්සිපල්ට රිපෝට් කරා ද මේ ගැන! මේ ඔක්කටෝ ම - වෙන වෙන ම දඩුවම් දෙන්න ඕනෑ!"

"ආ - නෝ, ඕනෑ නෑ. මම මිස් ග්‍රේලිංට පැමිණිලි කරන්ට ගියේ නෑ. එහෙම හිතුවේත් නෑ. මං එහෙම දෙයක් කරන්නෙ බරපතල දෙයක් වුණා ම විතරයි." මැම්සෙල් දූපොං පිළිතුරු දුන්නාය.

"එතකොට ඔයා කියන්නෙ, මේක බරපතල දෙයක් නෙවේ කියල ද?" මැම්සෙල් රූෂියර් නොසැහීමට පත් වී ප්‍රශ්න කළාය. "ඔයා මේක ගණන් නොගෙන ඉඳී - මං දන්නවා. ඒ ළමයිට කොහොම වත් දඩුවම් නොකර ඉඳී. ඒකත් මං දන්නවා! අර ඇලීෂියා කියන දඟකාර කෙල්ල - එතකොට අර පිස්සු හටන - අයිරීන් - එතකොට ඊටත් නරක - බෙලින්ඩා - ඔය ඔක්කෝට ම හොඳ දඩුවම් දෙන්න ඕනෑ! එතකොට තමා ඒ අය හැදෙන්නෙ."

"ආ - ඒ ඔක්කෝටි ම දඩුවම් දීලා තමා තියෙන්නෙ," යයි මැම්සෙල් දූපොං මෙම කතාව ඉක්මනින් කෙළවරක් කිරීමට



ඉටා කීවාය. "ඒ අයට ලැබෙන්න තියෙන වරුවෙ නිවාඩුව නැති කරලා - ඒ වරුවෙත් ඉගෙන ගන්න නියම කරලයි තියෙන්නෙ."

"ඒක සුදුසු දඩුවමක් නෙවේ," යයි මැම්සෙල් එම පිළිතුරෙන් ද සෑහීමට පත් නොවී කීවාය. "ඔයා විනය පවත්වගෙන යන්න හරියට දන්නෙ නෑ, මැම්සෙල් දූපොං. මං කොච්චරවත් ඒක ඔයාට කියලා තියෙනවා."

"ඔව්, මං එහෙම තමා," යයි මැම්සෙල් තරහින් පැවසුවාය. "ඔයාට විහිළුවක් තේරෙන්නේ නැද්ද? විනෝදයක් ලබන්න තේරෙන්නෙ නැද්ද? හාස්‍ය කියලා දෙයක් තේරෙන්නෙ නැද්ද?"

"නෑ - මට තේරෙන්නෙ නෑ තමයි." මැම්සෙල් රූෂියර් දැඩි ලෙස කියා සිටියාය. "මොකද්ද මේ ඉංග්‍රිසි කාරයෝ මහ ලොකුවට අගේ කරන 'හාස්‍ය' කියන දේ? මේ සිද්ධියේ ඇති හාස්‍යයක් හරි විහිළුවක් හරි නෑ. ඔයාට ඒක තේරෙන්න ඕනෑ, මැම්සෙල්."

මැම්සෙල් රූෂියර් මෙම සිද්ධිය වඩ වඩාත් බරපතල ලෙස දක්වද්දී, මැම්සෙල් දූපොං එය වඩ වඩාත් හාස්‍යජනක ලෙස දකින්නට වූවාය. කෙළවර ඇය සිත හද ගත්තේ තමා බාලිකාවන් සමග එක් වී එහි හාස්‍ය රසය බෙද ගත යුතු යයි කියා ය.

පංක්තියේ ළමයින්ට දෙන ලද දඩුවම ඉවත් කිරීමට ඇත් නම් යයි සිතෙන තරමට ඇයගේ හිත පහන් වූයේය. එහෙත් එම දඩුවම පැනවූ පොට්ස් මෙනෙවිය එය ඉවත් කිරීමට කොහෙත් ම කැමති වූයේ නැත. "ඒක නං කොහෙත් ම කරන්න බෑ. ඔහොම ලාමක වෙන්න එපා - මැම්සෙල්. ඔය වගෙ දේවල්වලට ඉඩ දෙන්න හොඳ නෑ."

"ඔව්, හොඳ නෑ තමයි," යයි මැම්සෙල් එකඟ බවක් පළ කළේ හිතට ආ අලුත් අදහසක් ගැන ද කල්පනාකාරීව ය. "ඔය නරක කෙල්ලො ටික මේ බ්‍රහස්පතින්ද හවස් වරුවේ මගෙ ළඟට එවන්න, මිස් පොට්ස්. මං ඒ අයට මුළු හවස් වරුවෙ ම වැඩක් දෙන්නං."

"ඔව්, ඒක හොඳයි," යයි පොට්ස් මෙනෙවිය ඇයගේ අදහසට

එකඟ වූවාය. මැම්සෙල් අවශ්‍ය වේලාවට ළමයින්ට කදින් සිටින බව දත් පොටිස් මෙනෙවිය, "ඒ අය දිගට ම වැඩක යොදවන්න!" යයි කියා සිටියාය.

"මං ඒ ළමයි ඇවිදින්න එක්ක යනවා!" යයි මැම්සෙල් හිතේ කියා ගත්තාය. ඈ ඇවිදින්න යාමට කිසිදු රුචියක් නොදැක්වූව ද, බාලිකාවන් ඊට ආශා කරන බැවින්, ඔවුන්ගේ සිත් සතුටු කිරීමට මෙම 'දඬුවම' දීම යෙහෙකැ යි සිතුවාය. එහෙත් බ්‍රහස්පතින්ද මධ්‍යාහ්න කාලයේ මහා වැස්සක් පටන් ගත්තේය. ලැක්රෝස් ක්‍රීඩා තරගය මෙන් ම ඇවිදින්නට යාම ද අවලංගු වූයේය.

ක්‍රීඩාවට සහභාගි වන්නන්ගේ නම් ලැයිස්තුවට පහළින් දැන්වීම් පුවරුවේ අලුත් දැන්වීමක් දක ඩැරල් එය කියවන්නට වූවාය. "ක්‍රීඩා තරගය අවලංගුයි. වෙනත් දිනයක් පසු ව දැනුම් දෙනු ලැබේ."

"මේ බලන්න!" යයි ඈ සැලීව එම දැන්වීම පෙන්වා සිටියාය. "මැච් එක කැන්සල් කරලා. අද මැච් එක තියෙනව නම්, මට ඒකෙ සෙල්ලං කරන්න නිවාඩු නොලැබෙන හින්ද - කොච්චර හිතට දුකක් ද! ඊළඟ දවසෙ මට සෙල්ලං කරන්න ඉඩක් හම්බු වෙයි ද දන්නෙත් නැ. මොකද, දැන් අසනීපෙන් ඉන්න ළමයි ඒ වෙන කොට හොඳ වෙලා හිටියොත්, අතිරේක ක්‍රීඩිකාවන්ට තැනක් හම්බු වෙන්නෙ නැ නේ!"

එද පස්වරුවේ අනිත් පංක්තිවල ළමයි වරුවක නිවාඩුව භුක්ති විඳිමින් විකාර ක්‍රීඩාවල යෙදීමටත්, ඉන් පසුව සිනමා දර්ශනයක් නැරඹීමටත් ප්‍රධාන ශාලාවට ගියහ. අපේ ළමයි පමණක් දඬුවම් විඳීමට හෙවත් ඉගෙනගැනීමට සිය පංක්ති කාමරයට ගියහ.

මැම්සෙල් ඔවුන් බලාපොරොත්තු ව එහි සිටියේ මුහුණ පුරා රැඳි සිනහවකින් යුතුව ය. "අනේ, අහිංසක ළමයි! ඔය ළමයින්ට අද හවස් වරුවෙත් ඉස්කෝල් වැඩ කරන්න දඬුවමක් ලැබුණෙ මට කිඹුහුම් ගිය හන්ද නේ! හරි ඔය ළමයින්ට දැන් මං දෙන්නෙ ප්‍රන්ස චාන්ස් එකක්! මම ග්‍රැමෆෝන් එකයි, රෙකෝඩ් වගයකුයි



අරන් ඇවිල්ලා තියෙන්නේ. මං දැන් ඔය ළමයින්ට කියලා දෙන්නං, හොඳ ප්‍රන්ස ගැමි නැටුමක්. ප්‍රන්සයේ ළමයි කවුරුත් මේ නැටුම දන්නවා."

මහත් පුදුමයට හා සතුටට පත් බාලිකාවෝ සුඹු සුඹු ව මේස් සහ පුටු අයින් කර, කාමරයේ ඉඩ පාද ගන්නට වූහ. නමනට අහිමි වූ වරු නිවාඩුවේ තමන් කරන්නේ කවර විදිහේ වැඩක් දැයි බලා ගැන්මට පොටිස් මෙනෙවිය හෝ පීටර්ස් මෙනෙවිය හෝ එන්නේ නම් හොඳ යයි ඔවුහු සිතූහ. ඔවුන් කාමරයට එබිකම් කර බැලුවොත් ඔවුන්ගේ මුහුණු කෙසේ වෙනස් වෙයි ද කියා බලා ගැන්මට ද ආශාවක් ළමුන්ට ඇති විය.

එහෙත් මෙම ගුරුවරියන් දෙදෙනාගෙන් කවරකු හෝ මේ පැත්තේ නොඑන බව මැම්සෙල් දැනගෙන සිටියාය. පීටර්ස් මෙනෙවිය මෙම සවස් වරුවේ බැහැරක ගොස් ඇත. පොටිස් මෙනෙවිය හය වන පන්තියේ ශිෂ්‍යාවන් සමග ප්‍රධාන ශාලාවේ ය. මැම්සෙල්ට දැන් ප්‍රශ්නයක් නැත!

"වෙරළ පැහැපත්!" යයි මැම්සෙල් ප්‍රීතියෙන් යුතු ව කීවාය. ළමෝ සතුටින් සිනා හඬ නැංවූහ. "මැම්සෙල් අදහස් කරන්නේ 'වෙරළ පැහැදිලියි' කියල නේ?" ජීන් කීවාය.

"දෙක ම එකයි!" මැම්සෙල් පැවසුවාය. "දැන් පටන් ගන්න! දැන් රවුමට ඉන්න - ප්ලීස්. දැන් ඔය ළමයි නට නටා රවුමෙ යන්න, මං මේ නැටිය වාදනේ කරන කොට. මං ඊට පස්සෙ කියලා දෙන්නං කියන්න ඕනැ සිංදු....."

මේ විදිහට මැම්සෙල් අපේ පන්තියේ බාලිකාවන්ට විනෝදමත් කාලයක් ලබා දුන්නාය. එය ඇත්තෙන් ම ප්‍රීතිමත් සන්ධ්‍යාවකි! ළමෝ සිත් සේ ප්‍රීති වූහ. "මැම්සෙල් නම් නියමයි!" ඩැරල් කීවාය. "හරිම ජාති!"

අවසානයේ සියල්ලෝ ම මැම්සෙල්ට සතුට හා ස්තුතිය පළ කර සිටියහ. "මැම්සෙල් හරි ම ස්පෝට්!"

මැම්සෙල් සතුටින් ඉල්පා ගියාය. ළමයින් "ස්පෝට්" යන්නෙන්

අදහස් කරන්නේ කුමක් දැයි ඇ හරියට තේරුම් නොගත්තාය. එහෙත් එය තමා අගය කිරීමට යෙදූ වචනයක් බව ඇයට පැහැදිලි විය.

"ඔය ළමයි මට කිවුහම යන්න සැලැස්සුවා. මම ඔය ළමයින්ට හති වැටෙන්න සැලැස්සුවා!" යයි හති අරිමින් සිටි ශිෂ්‍යාවන් දෙස දහසාර සිනාවක් පා ඇ කීවාය. "දැන් අපි එකයි - නේ!"

"නිදහස්!" යයි ජීන් කීවාය.

"මං මිස් පොට්ස්ට කියන්නං, මං ඔය ළමයින්ට හති වැටෙනකන් වැඩ දුන්නා කියලා - අද පස්වරුවේ! පව්! ඔය ළමයින්ට දැන් බඩගිනිත් ඇති නේ? තේ වේලාවත් හරි නේ ද?"

පංක්තියේ අනික් ළමයින් මෙන් සෙරෙල්ඩා ද මෙද විනෝදයක් ලැබුවාය. මෙම පස්වරුවේ තමාට මෙ තරම් විනෝදශ්වාදයක් ලැබීමට පුළුවන් වීම ගැන ඇ පුදුමයට පත් වූවාය. මීට සතියකට පෙර මෙවන් එක්වීමක් නිකම් ම බොළඳ ක්‍රියාවක් ලෙස සැලකීමට තරම් තමාගේ ම ලෝකයේ තනි වී සිටි ඇය මෙවැන්නකට සහභාගි වීමට තිබුණේ උදසීන ලෙස හා එය තමාගේ තරමට නොහොබිනා දෙයක් ලෙස සලකා ය.

"අද නම් මං හොඳට විනෝද වුණා," යයි සෙරෙල්ඩා සිතුවාය. නැටුමේ දී අවුල් වූ කොණ්ඩය අතින් පස්සට කර සකසා ඇ එය සද කර බැඳ ගත්තාය. "ඉස්සර මං කොච්චර මෝඩ විදිහට ද මං ගැන හිතාගෙන, විකාර විදිහට හැසිරුණේ. ළමයි මට හිනා වුණු එක පුදුමයක් නොවේ."

හදිසියේ ම තම අතීත ප්‍රතිරූපය ඇයගේ මතකයට ආයේය. තරුණියක සේ පෙනී සිටීමට තමා මහන්සි ගත් සැටිත්, ලොයි ලැක්ස්වන් නම් චිත්‍රපට නිළියගේ විකාර විලාසිතා හා මෝස්තර අනුකරණයෙහි තමා වෙහෙසුණු සැටිත්, ඇයගේ විදිහට කොණ්ඩය උඩට රෝල් කරගෙන තමා පම්බවලයට භාජනය වූ සැටිත්, අනෙක් පාසැල් ශිෂ්‍යාවන් සැහැල්ලු කර හා සහන් නොට සැලකීමට තමා පෙළඹී සිටි සැටිත් ඇයට මැවී පෙනෙන්නට විය. එවා ගැන මතක් වූ කල ඇයට දරා ගත නොහැකි ලැජ්ජාවක් ඇති විය.

"නියම පාසැල් ශිෂ්‍යාවක් වගේ කල් ගෙවන එක කොච්චර විනෝදයක් ද! හිතට කොච්චර සැහැල්ලුවක් ද! මං ලොයි වගේ ඉන්ට හිතන්නෙ නැති ව, මගේ හැටියට ම ඉන්න එක කොච්චර සතුටක් ද! මං කොච්චර අමණ විදිහට ද ඉස්සර හිටියේ! මං මාවිස්ටත් අන්තයි! එයාට අඩු ගණනේ හොඳ කටහඬක් වත් තිබුණා."

මාවිස් ක්‍රම ක්‍රමයෙන් සුවය ලබාගෙන ආවාය. සෙරෙල්ඩා තමා බැලීමට එන තෙක් ඇ ආශාවෙන් මඟ බලාගෙන සිටියාය. අට වන පන්තියේ කිහිප දෙනෙක් ම මේ වන විට මාවිස් බැලීමට ගොස් සිටියහ. එහෙත් අන් කවරකුට වඩා සෙරෙල්ඩා දැකීමට මාවිස් පුල පුලා සිටියාය. සෙරෙල්ඩා ප්‍රිය මනාප යෙහෙළියක සේ ඇ සැලකුවාය. තමා ඉගෙන ගැනීමට තුබූ පාඩමක් ඉගෙන ගැනීමට සෙරෙල්ඩා සමත් වීම ගැන ද ඇ ඇය අගය කළාය. තමාගේ කිසි අගයක් නැතැයි සැලකූ සෙරෙල්ඩා තමා අගය ඇති අයකු ලෙස තවත් අයකුගේ සැලකිල්ලට ලක්වීම ගැන සැනසීමක් ලැබුවාය. තමාගේ මිහිරි කටහඬ ගැන මහත් සේ උදම් වී සිටි මාවිස් ද දැන් බොහෝ දුරට වෙනස් වී සිටියාය. චාම් හා ස්වාභාවික ගති පැවතුම්වලට හුරු වූ ඇ අන් අය ගැන සැලකිල්ලක් හා උනන්දුවක් දක්වන්නට වූවාය.

"මං මීට පස්සෙ මගෙ කටහඬ ගැන වර්ණනා කරන්ට යන්නෙ නැ - කවදවත්," යයි මාවිස් සෙරෙල්ඩාට පැවසුවාය. "ආයෙ මං කියන්ට යන්නේ නැ - මං ඔපෙරා ගායිකාවක් වුණා ම කියන හැල්ල. සමහරවිට මම එහෙම බුද්ධිමත් විදිහට ඉඳලා මං ගැන පුරාජේරුවට කතා නොකර හිටිය ම - මගේ කටහඬ ගැන ඕනෑවට වඩා නොහිතා හිටිය ම, මට හරි යන්නත් පුළුවන්."

"ඔයාගෙ කටහඬ ආයෙත් හරි යයි! මං එහෙම හිතනවා," යයි සෙරෙල්ඩා කීවාය. "ඔයත් මං වාගේ ඒ මෝඩ අදහස් ඈත් අරින්න උත්සාහ කළ එක හොඳයි, මාවිස්. දැන් අපි නිකම්

ම ඉස්කෝලේ ළමයින්ගේ තත්ත්වෙට බැහැලා ඉන්නෙ. ඊට වැඩිය හිතන්න පුළුවන්කමක් අපට නැහැ. නමුත්, ඔයා හිතලා බලන්න, අපිත් අනික් අය වාගෙමයි - ඒ අයගෙ තලේට අපිත් අයිති වෙනවා කියලා අපට හිතන්න පුළුවන් එක කොච්චර සන්තෝෂයක් ද කියලා."

"මට මැම්සෙල් ගැනයි, අර කිඹුහුම් ගිය කතාවයි ආයෙත් කියන්න," යි මාවිස් උදක් ම ඉල්ලා සිටියාය. "ඔයා ඒක කියලා - මාව හොඳට හිනා ගැස්සුවා නේ. ඔයා ඔය වගේ කතා කියන කොට හරි ලස්සනයි - සෙරෙල්ඩා!"

ඇත්තෙන් ම සෙරෙල්ඩා එසේ ය. ඇයට හරි හැටි රඟපෑමට නොහැකි වුව ද, යමක් රස කර හිනා යන විදිහට ප්‍රකාශ කර, අසන්නන්ගේ අවධානය තමා වෙත යොමු කර ගැන්මේ දක්ෂකමක් ඇත. අනුන් සිනාවෙන් මුසපත් කිරීමේ හැකියාවක් ඇයට ඇත. සෙරෙල්ඩාගේ නියම දක්ෂකම එය බව ඇලීෂියාගේ පුද්ගලික මතය විය. එහෙත් ඒ බව ඇයට අඟවා නොසිටීමට ඇලීෂියා හිතට ගත්තාය. තමා අන් අයට වඩා "වතර්නුල්" යන හැඟීම යළිත් ඇයට ඇති වීමට ඉඩ දිය යුතු නැතැ යි ඇලීෂියා කල්පනා කළාය.

සෙරෙල්ඩා මාවිස් වෙනුවෙන් පරිත්‍යාගශීලී ව සිය කාලය මිඩංගු කළ සැටි කාගේත් ප්‍රසාදයට හේතු වූයේය. හිබර්ට් මෙනෙවිය ඇයගේ දුර්වලකම් පෙන්වා දුන්නේ ඇයගේ හිත රිදෙන අන්දමට ය; අන් අය ඉදිරියේ ඇය දරුණු ලෙස සමච්චලයට භාජනය වන ලෙස ය. එහෙත් සෙරෙල්ඩා ඉන් මානසික වශයෙන් පසුබට නොවී, තම වැරදි හා අඩු-පාඩු වටහා ගෙන, ජීවිතය නිසි අයුරු හැඩ ගස්වා ගන්නට දරන ප්‍රයත්නය ඔවුන්ගේ පැසසුමට ලක් විය.

"මං නං හිතුවෙ නෑ, මේ විදිහේ නිහතමානී ගුණ ලක්ෂණයක් සෙරෙල්ඩාට තිබුණා කියලා," යයි ඩැරල් සැලීට පැවසුවාය. "මං හිතුවෙ එයා පුම්බපු බැලූන් බෝලයක් වගේ ඉදිමෙච්ච, නිකම් ම හිස් මළුවක් තියෙන අහංකාර කෙල්ලක් කියලයි. මිස් හිබර්ට් ඒ බැලූන් බෝලෙට කටුවකින් ඇන්න ම, මං හිතුවෙ නිකම් ම එයාගෙ හුළං බැහැලා, එයාගෙ මොකවත්



ඉතිරි වෙන්නෙ නැති වෙයි කියලයි. දන් බැලූව ම ඉස්සරට වැඩිය එයාගෙ කොච්චර වටිනාකමක් තියෙනව ද! මං නං දන් සෙරෙල්ඩාට කැමතියි. ඔයා මොකද කියන්නේ?"

"මං කවදත් හිතුවෙ සෙරෙල්ඩා හොඳ නිර්ලෝභී ගුණ යහපත් කෙනෙක් විදිහටයි. එයාගෙ කරුණාවන්ත ගතියට මං ආශා කළා. හැබැයි, එයාගෙ විකාර දේවල් මට දකගන්න ලැබුණේ නෑ නේ - මං කල් ගිහිල්ලා ඉස්කෝලෙට ආව හින්ද."

"මටවි දන් ආපහු ඇවිල්ලා හින්ද - ඒක මට ලොකු සන්තෝෂයක්. ඔයාටත් එහෙම නේ?" ඩැරල් කීවාය. "ඇති යන්තං - දන් ඇලීෂියාට එයාගෙ ගජ මිතුරිය ඉන්නවා නේ - ඕනෑ ම දේකට! අපි දෙන්නත් එක්ක ඇලීෂියාට එච්චර ම ළඟින් ආශ්‍රය කරන්න බෑ. අනේ, බිල්ටත් යාළුවෙක් ඉන්නව නම් කොච්චර එකක් ද! එයා තනියෙන් ම නේ ඉන්නේ!"

"බිල් එක්ක තුන් කොන් මිතුරුකමක් පවත්වන්න අපට අමාරුවක් වෙන එකක් නෑ. එහෙම එක්කට මං කැමතියි. නමුත්, එයාට ඇත්තට ම කියනවා නම්, කවුරුවත් එක්ක යාළු වෙන්න ඕනකමක් නෑ. මිතුරියකගෙ තැන තමා තන්ඩර් අරන් තියෙන්නේ. නැද්ද, ඩැරල්?"

"ඔව්, එහෙම තමයි," යයි ඩැරල් පැවසුයේ ඒ වර්ෂාවෙන් පුන් අන්ධකාර රාත්‍රියේ බිල් සහ තමා ලද අත්දැකීම සිහියට නංවා ගනිමිනි. "ඒ කොහොම වුණත්, විටින් විට අපි එයා කිට්ටුවෙන් ආශ්‍රය කරමු. ඒක එයාට සහනයක්! ඒ වගේ ම එයා ආශ්‍රය කරන්න පුළුවන් විදිහේ සැහැල්ලු කෙනෙක්."

මේ අනුව, ඩැරල්ගේ සහ සැලීගේ ඇසුර ලද බිල් ඉන් සතුටට පත් වූවාය. ඩැරල් එද රෑ තමාට කළ උදව්වට තමා ඇයට ණය ගැති බව ඈ අමතක නොකළාය. "මං ඒක අමතක කරන්නේ නෑ," යයි ඈ නිතර සිහියට නංවා ගත්තාය.

බිල් දන් පසුවන්නේ ඉමහත් සතුටිනි. තන්ඩර් නියම සුවය ලබා ඇත. ඩැරල් සහ සැලී ඇයට හිතවත් ය. පන්තියේ වැඩ ද ඈ හොඳින් කරගෙන යයි. පිටර්ස් මෙනෙවිය විශිෂ්ට ය!

බිල් වාම් ගති පැවතුම් ඇත්තියකි; කෙලින් නොවලහා කටයුතු කරන්නියකි. පුහු ආටෝපයක් නැති ඈ ඉතා විශ්වාසවන්ත ලෙස කටයුතු කරයි. මේ කාරණා නිසා පීටර්ස් මෙනෙවිය ඇය ප්‍රිය කරයි. පීටර්ස් මෙනෙවියට ඇත්තේ ද බිල්ට සමාන ගති ලක්ෂණයන් ය. මේ අනුව මෙම පංක්තිය භාර ගුරුවරිය හා බිල් අතර හොඳ අවබෝධයක් ඇති වූයේය. මෙය දෙදෙනාට ම යහපතක් වූයේය.

"මං දන් මෙහෙ ඉන්නෙ හරි ආසාවෙන්," යයි බිල් ඩැරල්ට කීවාය. "මට මෙහෙ එන්න ඕනකමක් තිබුණෙ නැහැ. නමුත්, දන් හිතෙනවා - ආව එක කොච්චර දෙයක් ද කියලා."

# 23

# වාරය හොඳින් අවසන් වෙයි

පාසැල් වාරය අවසාන වීගෙන ආයේය. මේ ගැන ඩැරල්ගේ හිතේ හැඟීම් පුරුදු පරිදි දෙකට බෙදී ගියේය. "මං ගෙදර යන්න හරි ආසයි; ඒ වගේ ම මැලෝරි ටවර්ස්වල ඉන්නත් ආසයි," යයි ඈ සැලීට පැවසුවාය.

"ඔයාට ලෝක දෙකක් ම තියෙන එක ලොකු වාසනාවක්!" සැලී කීවාය. "මටත් එහෙම තමා. මං ගෙදර ඉන්න ආසා වගේ ම ඉස්කෝලෙ ඉන්නත් ආසයි. මේක හොඳ වාරයක් නේ - නැද්ද ඩැරල්?"

"ඔව්. නමුත් මේ වාරේ මට එක බලාපොරොත්තුවක් ඉටු වුණේ නෑ. ඔච්චර ප්‍රැක්ටිස් වෙලත්, අමතර පුහුණුව ලබලත්, මොලී මට ඔච්චර උදව් කරලත්, මට හම්බු වුණේ නෑ නේ - මැච් ටීම් එකේ සෙල්ලම් කරන්න!"

"අර කැන්සල් කරපු මැච් එක වෙන දවසක සෙල්ලං කරා ද?"

"නෑ - අනිත් ඉස්කෝලෙට - ඒකට නිවාඩු දවසක් හම්බු වෙලා නෑ නේ." ඩැරල් පැවසුවාය. එන සුමානෙ ඉස්කෝලෙ

වීගෙනවා. ඒ හින්ද ඒ මැච් එකට අවස්ථාවක් ලැබෙන්නෙ නෑ - දත්. මට පොඩ්ඩකට හරි මේ වාරේ තරකක් වුණේ ඒ මැච් එක ගහන්න නොලැබුණ එකයි. ආ - ඔයා එන්න කාලයක් ගත වුණ එකත් මගේ හිතට කරදෙව දැනුණා."

"අද දවස හරි ලස්සණයි නේ!" යයි දහවල පාසැල් භූමියේ ඇවිදින ගමන් ඩැරල් අමතා සැලී පැවසුවාය. කහ පාට ඩැෆඩිල් මල් වත්ත පුරා පිපී දිලෙමින් තිබුණි. මේ මාර්තු සුළඟට ඒවා එක තාලයකට වැනෙමින් තිබුණේය. "දවල් කෑමට තව පැය භාගයක් තියෙනවා. අපි මොනව ද දැන් කරන්නේ?"

"අපි ලැක්රෝස් පිට්ටනියට යං," යයි ඩැරල් යෝජනා කළාය. "එහෙ ලස්සණට ඇති! මට දිගට ම එක තැන ම වාඩි වෙලා ඉඳලා එපා වෙලා. පිට්ටනියෙ ටිකක් එහෙ-මෙහෙ අත දුවලා සෙල්ලම් කරා ම ඇහැට හොඳයි."

සැලීට ඇත්තෙන් ම ක්‍රීඩාවේ යෙදීමට අවශ්‍යතාවයක් නොවීය. මෙම වාරයේ ක්‍රීඩාවන්ගෙන් ඇයට දක්කම් පෑමට පුළුවන්කමක් නොවීය. ඒ, කල් ගත වී පාසැලට පැමිණීම නිසා ය. එහෙත් ඩැරල්ගේ මුහුණෙන් දක්වුණු උනන්දුව දුටු ඈ තම ආශාව පසෙක දමුවාය.

"හරි, ඉන්න මං ලැක්රෝස් පිති අරගෙන එනකං. ඔයා ගිහිල්ලා බෝලයක් ඉල්ලගෙන එන්න," කියා සැලී පිට වුවාය.

යළි පිට්ටනියේ දී එක් වී දෙදෙනා බෝලය විසි කරමින්, අල්ලමින් සහ දුවමින් ක්‍රීඩා කරන්නට වූහ. පිට්ටනියේ වූයේ ඒ දෙදෙනා පමණි. ඒ අසලින් ගිය මොලී ඩැරල් පුහුණු වෙමින් සිටිනු දක ඇයට සිනාවකින් සංග්‍රහ කර සිටියාය. ඩැරල් කොතරම් කැප වී, මහන්සි වී පුහුණු වන ළමයෙක් ද! ඇය හිතට ගත් දෙයක් නොපසුබට ව ක්‍රියාවේ යොදවන කඩිසර බාලිකාවකි. මොලී එවැන්නියන්ට කැමති ය.

ඈ ඩැරල්ට කතා කළාය. "ආ ඩැරල් හොඳ ලස්සණට සෙල්ලං කරනවා නේ! ඔයා දන්නවා ද අපි බාවෙස්ටර් එක්ක එන සුමානෙ සෙල්ලං කරනවා නේ. ඇති යංතං ඒ කැන්සල් කරපු මැච් එක නිවාඩු දෙන්න ඉස්සර සෙල්ලං කරන්න ලැබෙන

එක! මං හිතුවෙ නෑ - මේ වාරෙ ම දිනයක් ලැබෙයි කියලා - මෙහෙම. බාවෙස්ටර් ඉස්කෝලේ අපට අද දන්වලා එවලා තියෙන්නේ එන බ්‍රහස්පතින්ද - ඒ කියන්නේ - අපට නිවාඩු දෙන දට කලින් ද - අපෙ එක්ක සෙල්ලං කරංට එනවා කියලා.”

“ආ - නේ, ඇත්තට!” ඩැරල්ගේ උනන්දුව වැඩි විය. “අනේ මොලී, රිසර්ව්ලා තුන් දෙනා අතරට මාත් ඉඳියි ද? අනේ කියන්න ‘ඔව්’ කියලා!”

“ආ - ගිය පාර මැච් එක තිබුණා නම්, ඔයාට රිසර්ව් විදිහට ඉන්න නෙවේ - සෙල්ලම් කරන්න ම තිබුණා. එද තුන් දෙනාට ම ප්ලේ කරන්න ඉඩ තිබුණා. නමුත් මට ආරංචියි, ඔයා, ඔයාලා පන්තියේ අයත් එක්ක මොකද්දෝ තෝවි වැඩක් කරලා - වරුවෙ නිවාඩුව නැති කර ගත්තා කියලා. ඉතිං එද මැච් එක තිබුණත්, ඔයාට සෙල්ලං කරන්න හම්බු වෙන්නෙ නෑ නේ.”

“ඔව්, ඒක ඇත්ත,” යි ඩැරල් කීවාය. “නමුත් ඊට පස්සෙ පිස්සු වැඩක් කෙරුණෙ නෑ, මොලී. මේ පාරටත් මාව රිසර්ව් එකට දනවා නේ? මේ පාර සෙල්ලම් කරන්න මට බලාපොරොත්තුවක් තියා ගන්න නම් බැරි වෙයි, අසනීප වුණු අය දන් සනීප වෙලා ඉන්න හන්ද. ඒත් කමක් නෑ - රිසර්ව් එකේ හිටියත් ඒක ලොකු දෙයක් නේ!”

“ඒක ඇත්ත,” යි මොලී පිළිතුරු වශයෙන් කීවාය. “මම මැච් එකට ඉන්න අයගෙ අලුත් ලැයිස්තුවක් හදනවා. ඔයා රිසර්ව් ලැයිස්තුවේ ඉන්නත් පුළුවන්, නැති වෙන්නත් පුළුවන්. මට පොරොන්දු වෙන්න බෑ. මේ සඳුද මං ඇවිල්ලා බලාගෙන ඉන්නංකො - අවේ අයයි නවයේ අයයි ලැක්රෝස් සෙල්ලම් කරන හැටි. බාවෙස්ටර් මැච් එකට ඒ අයගෙන් ටික දෙනයි මට තෝරා ගන්න තියෙන්නේ. ඒ හින්ද, ඉතාමත් හොඳින් සෙල්ලම් කරලා පෙන්නන එක තමන්ට අයිති දෙයක්!”

“මොලී නම් නියමයි නේ,” යි මොලී පිට ව ගිය පසු, මුහුණ රතු කරගෙන ඩැරල් සැලීට පවසා සිටියාය..

“ක්‍රීඩා නායිකාව වශයෙන් එයා බොහොම හොඳයි,” යි ඩැරල් තරම් මොලීට වඩා වැඩි නොසිටි සැලී කීවාය. “කොහොම වුණත්, සඳුද - මොලී බලාගෙන ඉන්න කොට - එයා හොඳට සෙල්ලං කරන්න. එතකොට, අමතර ක්‍රීඩිකාවන්ගෙ ලැයිස්තුවට ආයෙමත් ඔයාව එන්න පුළුවන් වෙයි.”

සඳුද ඩැරල් හොඳින් සෙල්ලම් කළාය. ඈ කඩිසර ලෙසත් ජවසම්පන්නවත් ක්‍රීඩා කළාය. පන්දු ඇල්ලීමෙහි ඈ මහා නිපුණත්වයක් ප්‍රදර්ශනය කළාය. පන්දුව මාරු කිරීමේ දී ආත්මාර්ථකාමී නොවූවාය; ගෝලයේ නිවැරදි ඉලක්කයට පන්දුව යොමු කළාය. මොලී පිට්ටනියේ පසෙක සිට සියල්ල සෝදිසිමත් ව තරඹා සිටියාය. ඒ ඒ ක්‍රීඩිකාවන්ගේ ඒ ඒ ඉරියව් විනිශ්චය කර ගැන්මට ඈ ඒ ඒ තැන්වලට කඩිසර ව දුව ගියාය.

තුන් වැනි තරග කණ්ඩායමට අයත් වන ක්‍රීඩිකාවන්ගේ නම් ලැයිස්තුව එද රෑ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීමට නියමිත ව තිබුණේය. තරග කණ්ඩායම් ලැයිස්තුවට පහළින් අමතර ක්‍රීඩිකාවන්ගේ නම් ලැයිස්තුව ප්‍රදර්ශනය කෙරෙනු ඇත. දැන්වීම් පුවරුව වෙත ගොස් තමාගේ නම අමතර ක්‍රීඩිකාවන්ගේ ලැයිස්තුවේ ඇත් දැයි බැලීමට මහත් චකිතයක් ඩැරල්ට ඇති වූයේය.

ඇත්තෙන් ම ඇයගේ නම ඊට ඇතුළත් විය යුතු ය. නවයේ පන්තියට අයත් ක්‍රීඩිකාවන් බොහෝමයකට වඩා හොඳින් ඈ සෙල්ලම් කළාය. අවේ පන්තියේ සියලු ම ක්‍රීඩිකාවන්ට වඩා හොඳින් ඈ සෙල්ලම් කළාය. ඈ බලාපොරොත්තු ඇති ව වුව ද බියෙන් බියෙන් අමතර ක්‍රීඩිකා ලැයිස්තුව දෙස බැලුවාය.

ඇයගේ නම එහි නොවීය! බලාපොරොත්තු සුන් ව ඈ එම ලැයිස්තුවට අයත් නම් තුන යළි කියවා බැලුවාය. ඇයගේ නම ඊට ඇතුළත් ව නැත! තුන් වැනි තැන හෝ ඇයට ලැබී නැත. එය ඈ මුල දී ලබා තිබූ ස්ථානයයි. මෙවර ඩැරල් අමතර ක්‍රීඩිකාවකගේ තැන ගැන්මට සුදුසු බව හෝ මොලීට දැනී නැත! කොතරම් බලාපොරොත්තු සුන්වීමක් ද!

සැලී ඇය වෙත දුවගෙන ආවාය. “ඩැරල්, ඔයාගෙ නම

තියෙනව ද? ඔයා රිසර්ව් ලැයිස්තුවේ ඉන්නව ද?"

ඩැරල් හිස වැනුවාය. "නෑ, මේ පාර නෑ. ඕ, සැලී, මට නං හරි හිතට අමාරුයි!"

සැලීට ද එය හිත අමාරු වීමට කාරණයක් වූයේය. ඈ ඩැරල්ගේ අත දවවා ගත්තාය. "තරක වෙලාව! කමක් නෑ! අයෙත් ට්‍රයි කරන්න!"

"මටත් නිකං, සෙරෙල්ඩාට දුනුණා වගෙ දැනෙනවා. බාවෙස්ටර් එක්ක තරග කරන ටීම් එකේ රිසර්ව් ප්ලේයර් කෙනෙක් වෙන්ට මං ලොකුවට හිතාගෙන හිටියා," යයි මදක් වෙව්ලන හඬින් ඩැරල් පැවසුවාය. "මට හොඳ වැඩේ!"

"ආ, එහෙම කියන්නෙපා," යි සැලී ඈ සනසන්නට වූවාය. "ඔයා සෙල්ලම් කරපු විදිහට ඔයා පස්ට් රිසර්ව්. වෙන්නත් සුදුසුයි. ඔව් ඩැරල්, ඔයා එච්චර හොඳට සෙල්ලං කළා. ඔයාට හොඳ ප්‍රැක්ටිස් එකක් තියෙනවා."

"ඔහොම කියන කොට මගෙ හිත තවත් අමාරු වෙනවා, සැලී, එච්චර හොඳට සෙල්ලං කරලත් තැනක් නැත්තෙ මොකද කියලා," යි ඩැරල් කීවාය. දෙදෙනා ම පොදු කාමරයට ගියහ. මාවිස් ලෙඩ සුව වී අවුත් සෙරෙල්ඩා සමග සිටිනු පළමු වරට දෙදෙනාට ම දක ගත හැකි වූයේය.

"හලෝ, මාවිස්!" සැලී විශ්මය පළ කළාය. "මං හිතුවෙ ඔයා අපෙ එක්ක ඉන්න හෙටයි එන්නෙ කියලා. ඔයා අපෙ ළඟට ආයෙත් ආව එක ගැන මට හරි ම සන්තෝෂයි."

"ඔයාව සන්තෝසෙන් පිළිගන්නවා!" ඩැරල් කීවේ තම කනස්සල්ල අමතක කිරීමට උත්සාහ ගනිමිනි. "ඔයාට හොඳ වුණ එක කොච්චර සන්තෝසෙට කාරණයක් ද! දන් කොහොම ද?"

"හොඳයි," යයි මාවිස් වෙනස් වූ හඬින් පිළිතුරු දුන්නාය. එද ඈය සතු ව තිබූ හීන් මිහිරි හඬ දන් නැත. දන් ඇයගේ හඬ ගොරෝසු ය; අමිහිරි ය. අන් අය දන් එයට හුරු වී ඇතත්, මාවිස්ට තම කටහඬ දරා ගත හැකි නොවීය. එහෙත් ඈ ඒ ගැන මැසිවිලි නොනැඟුවාය. "මටත් ලෙඩ හොඳ වෙලා ආපහු එන්න ලැබුණ එක ගැන හරි සන්තෝෂයි. සිස්ටර් මට හොඳ කරුණාවෙන් සැලකුවා. එහෙ - සැනටෝරියම් එකේ - නැම පහසුකමක් ම ලැබුණා. නමුත් ඉස්කෝලෙ ඇතුළෙ තියෙන සද්ද - බද්දයි, විනෝදෙයි නැතුව මට මහා පාළුවක් දැනුණා."

මාවිස් මෙසේ කියා නැස්සාය. "දන් ම එක පාර වැඩියෙන් කතා කරන්න එපා!" යයි සෙරෙල්ඩා අවවාද කළාය. "ඔයා දන්නවා නේ, සිස්ටර් මට ඔයාව බාර දුන්නේ, අද රෑට ඔයා හොඳ සෞඛ්‍ය තත්ත්වයෙන් මේට්‍රන් ළඟට ගෙනියලා පෙන්නන්න කියලා. ඔයා අපේ ඩෝම් එකට ආයෙත් නිදා ගන්න ගෙනියන්න ඉස්සර වෙලා."

"නෑ - මට කිසි අමාරුවක් නෑ," යි මාවිස් එවිට කීවාය. "නෑ - මට කිසි... රිසර්ව් ලිස්ට් එකේ ද? සෙරෙල්ඩා මට කීවා, "ඩැරල්, ඔයා රිසර්ව් ලිස්ට් එකේ ද? සෙරෙල්ඩා මට කීවා, ඔයාට රිසර්ව් එකේ තැනක් ලැබෙන එක ෂුවර් කියලා. මං ආසයි ආයෙත් මැච් එකක් බලන්න."

"නෑ - මේ පාර මං රිසර්ව් එකට අරන් නෑ," කියා ඩැරල් පසෙකට වූවාය. සෙරෙල්ඩා පුදුමයෙන් හා දුකෙන් බලාගෙන සිටියාය.

"හී - ඒ මොකෝ?" යයි සෙරෙල්ඩා කී විට සැලී ඈය දෙස රවා බැලුවේ ඒ ගැන වැඩි දුරටත් ඈය කතා නොකළ යුතු බවට අඟවමිනි. ඩැරල්ට ඒ ගැන කතා කිරීම දුකට හේතුවකි. මොලී මෙවර ඈය අමතර ක්‍රීඩිකාවන්ගේ ලැයිස්තුවෙන් ඉවත් කර ඇත්තේ මන්ද යි ඩැරල්ට වටහා ගත හැකි නොවීය. එය අසාධාරණයක් ය!

ඩැරල් කාමරයෙන් එළියට ආවාය. සැලී ඈය සමග එළියට ආවේ නැත. ඩැරල්ට සිත හද ගැනීම සඳහා තනියෙන් සිටීමට අවශ්‍ය වේ යයි ඈ සිතුවාය.

කොරිඩෝරය දිගේ අඩි ගැටෙන හඬ නැඟී ආයේය. දෙර විවෘත කරගෙන පොදු කාමරයට ඇතුළු වූයේ අවේ පංක්තියේ ඉහිරි ශිෂ්‍යාවන් ය. "කෝ - ඩැරල්? කෝ - ඩැරල්! මගෙ දෙයියනේ, එයා නෝටිස් බෝඩ් එක දක්ක ද?"

"ඔව්, දකලා - ඔන් හිතේ අමාරුවේ ඉන්නවා," යයි සැලි පිළිතුරු දුන් කල, ප්‍රීතියෙන් යුතු ව කඩා වැදුණු කෙල්ලෝ මහත් විමතියෙන් සැලි දෙස බැලූහ.

"හිත අමාරු වෙලා?" ඇලීෂියා ප්‍රතිරාවය කළාය. "ඇයි හිත අමාරු කර ගත්තේ - සන්තෝසෙන් මේ කාමරේ පුරා නටන්නෙ නැතුව?"

දන් පුදුමයට පත් වීමේ වාරය සැලිට ය. "ඇයි මෝඩියේ, ඩැරල් සන්තෝසෙන් නටන්න ඕනේ - එයා රිසර්ව් ලැයිස්තුවට වත් අරන් නැති කොට - ?"

එයට ඇලීෂියා පිළිතුරු දෙමින්, "එයා කොහොම ද රිසර්ව් ලැයිස්තුවට අයිති වෙන්නේ - ගොන් මෝඩියේ - එයා ටීම් එකට ම අරන් තියෙන කොට!" යයි කීවාය.

"ඔව්, ඩැරල් ඇත්තට ම ලැක්රෝස් මැච් ටීම් එකට ම අරන්," යයි බිල් සතුටින් එක් වූවාය. "කොච්චර ගෞරවයක් ද - එයාට විතරක් නෙවේ - මුළු පන්තියට ම!"

සැලි හුස්ම ඉහළට ඇද්දය. "දෙයියනේ, ඩැරල් බලලා තියෙන්නේ රිසර්ව් ලිස්ට් එකේ තියෙන නම් තුන විතරයි. ටීම් එකේ නම් බලලා නෑ! හරි ම මෝඩියක් නේ!"

"කෝ එයා?" ඇලීෂියා නොඉවසිලිමත් වූවාය.

"මේ ඉන්නේ!" යයි දොර ළඟ සිට බෙලින්ඩා හඬ දුන්නාය. "ඩැරල් මෙහාට එන්න!"

ඩැරල් ඇතුළට ආවාය. ඇයගේ මුහුණ තවමත් දුක්මුසු ස්වභාවයක් දරීය. කැළඹුණු ස්වභාවයෙන් පසු වූ පංක්තියට අයත් බාලිකාවන් දෙස ඇය බැලුවේ පුදුමයෙන් යුතුව ය. "ඇයි, මොකෝ?" ඇ ඇසුවාය.

අයිරින් ඇයගේ පිටට තට්ටු කර, "ඩැරල්, ඔයා ඔන්න නෝටිස් බෝඩ් එකේ - මැච් ටීම් එකේ!" යයි කීවාය.

ඩැරල් එය විශ්වාස කළේ නැත. අනික් අය පොරකාගෙන ඇය වටා රොක් වන්නට වූහ. ඔවුහු මහා හඬින් කතා කරන්නට වූහ.

"ඔයා ටීම් එකේ! තේරෙන්නෙ නැද්ද - මෝඩියේ?"

"ඔයා රිසර්ව් නෙවේ! ඔයා අපෙ ටීම් එකේ! බාවෙස්ටර් ටීම් එකට විරුද්ධව ක්‍රීඩා කරනවා!"

"බලාපල්ලකෝ - එයා ගොළු වෙලා ඉන්න හැටි! ඩැරල්, ඔයා රිසර්ව් ලැයිස්තුව විතරක් නේ ද බැලුවේ? මැච් ටීම් එකේ ප්ලේ කරන අයගෙ ලිස්ට් එක බැලුවෙ නෑ නේ ද? නියම මුරු දෙනක්!"

ඩැරල්ට හදිසියේ ම ආලෝකයක් පහළ විය. ඇ ඇලීෂියාගේ දෑතින් ම අල්ලා ගත්තාය. ඇගේ මුහුණ ප්‍රීත්‍යාලෝකයෙන් බබළන්නට විය. "ඇලීෂියා, ඔය කියන්නෙ ඇත්ත ද? මං ටීම් එකේ ද? දෙයියනේ, මම ඒ ලැයිස්තුව බැලුවේ නෑ නේ! මට බලන්න කල්පනාවක් වුණේ නෑ - රිසර්ව් ලිස්ට් එකේ නම හොයිබුණා ම!"

ඉන්පසු කාමරය තුළ ප්‍රීතිවීම්, කෑගැසීම් හා සුබපැතීම් හඬ ඉහළට නැගී ආයෙන්, මේ ඝෝෂාව කුමක් දයි සොයා බැලීමට හා මාවිස්ට එය කෙසේ බලපා ඇත් දයි දැක බලා ගැන්මට පාලිකාව ඇතුළට එබිකම් කළාය.

මාවිස් මෙම කාලගෝට්ටියට හොඳින් මුහුණ දී සිටියාය. ඇ ඩැරල්ගේ පිටු පසට තට්ටු කොට, "බොහොම හොඳයි! බොහොම හොඳයි!" යයි සිය ගොරෝසු හඬ නොතකා ප්‍රීතිය ප්‍රකාශ කළාය. ඇයගේ මුහුණ පුරා සොම්නස පැතිරී තිබුණි. ඇය ද පසු වූයේ අන් බාලිකාවන් මෙන් උද්‍යෝගයෙන් යුතුව ය.

නාවන් නොපෙනෙන්නට පාලිකාව සිනාමුසු මුහුණින් යුතු ව පිටත් ව ගියාය. "එක ළමයෙක් ටීම් එකට අරං කියලා, මුළු පංක්තිය ම සන්තෝස වෙන හැටි! ඔහොම තමා පාසැල් ජීවිතය! කොච්චර සැහැල්ලු ද! කොච්චර විනෝදජනක ද!" යයි ඇ තමාට ම කියා ගත්තාය.

එම මොහොත ඩැරල්ට විශේෂ සතුටක් ගෙන දුන්නකි. එවන් ජයග්‍රහණයක් මීට පෙර තමා ලබා නැතැ යි ඇයට හැඟුණේය. මොහොතකට පෙර බලාපොරොත්තු සුන් ව, මහත් කනස්සලු

ස්වාභාවයෙන් පසු වූ ඇය දන් පසු වන්නේ කොතරම් ප්‍රීතියෙන් ද! මුළු පංක්තිය ම ඇයගේ සතුට බෙදගෙන ජය හඬ නගද්දී ඇයගේ ඇස්වල කඳුළු පිරී ගියේය. "පංක්තියේ ළමයි මට කොච්චර ආදරේ ද!" ඈ වඩාත් සතුටට පත් වූවාය. "මේ බ්‍රහස්පතින්ද මං හොඳට සෙල්ලං කරනවා! අපට බාවෙස්ටර් පරද්දන්න පුළුවන් නම්! අවුරුද්දකින් අපට ඒ ටීම් එක පරද්දන්න බැරි වෙලයි තියෙන්නේ!"

ඇය නොඉවසිල්ලෙන් බලාපොරොත්තු වූ එම දිනය උද විය. එය පැහැපත් හිරු එළියෙන් යුත් ලස්සණ දවසකි. ක්‍රීඩා තරගයක් පැවැත්වීමට ඉතාමත් යෝග්‍ය දිනයකි. ලැක්රෝස් තරගය පවත්වනු ලබන්නේ පාසැල් ක්‍රීඩා පිටියේදී ම බැවින් පාසැලේ කාටත් එය නැරඹිය හැකි වේ. නිවාඩු දෙන්නේ පසු දිනයේ ය. වාර විභාගය ද අවසන් වී ඇති බැවින් කවුරුත් පසු වන්නේ විවේක සිතින් ය. බාවෙස්ටර් කණ්ඩායම තම පාසැල් බස් රථයෙන් මැලෝරි ටවර්ස් භූමියට ළඟා වූ කල ඔවුන් පිළිගැනීමට බාලිකාවෝ සමූහයක් රැස් වී සිටියහ. ඉන්පසු ඔවුහු අසුන් අල්ලා ගැන්මට පිටිය කරා දිව ගියහ.

ඩැරල් වකිතයෙන් ගැහෙන්නට වූවාය. ඒ ගැන ඇයට ම තරහා ගියේය. ඈ හිත සන්සුන් කර ගැන්මට අදිටන් කළාය. එහෙත් කෝල ගතිය පහ නොවූයේය. මොලි ඇය ළඟට අවුත් ඇයට සිනාවකින් සංග්‍රහ කළාය. "සබ කෝලය ද? ඔය වකිතය පිට්ටනියට ගියා ම නැති වෙයි! බලන්න බොරු ද කියලා!"

මොලි කී දේ හරි ය. ලැක්රෝස් පිත්ත අතැති ව පිට්ටනියට වන් කල ඇයගේ සිත් හි කලබල ගතියට තැනක් නොවීය. අභියෝගය ඉදිරියේ එඩිතර ගතිය මතු විය. ඩැරල් ප්‍රීතියෙන් යුතු ව පිට්ටනිය පුරා දහලන්නට වූවාය. දන් ඇත්තේ තරගය ඇරඹෙන තෙක් පවත්නා නොඉවසිල්ල පමණි. ඇයට ක්‍රීඩා කිරීමට ඇත්තේ පෙරමුණේ ය. තම ප්‍රතිපාක්ෂික ක්‍රීඩිකාව දෙස ඈ බැලුවාය. ඈ හොඳ උස මහත සවිමත් කෙල්ලකි. ඇය තමාට වඩා වේගයෙන් දිවිය හැකි ක්‍රීඩිකාවක ලෙස ඩැරල්ට පෙනී ගියේය.

ඇත්තෙන් ම, ඇයට වේගයෙන් දුවන්නට පුළුවන් විය. එමෙන්

ම, ඩැරල් වෙත එවන ලද පන්දුව, ඇයට ඉහළින් උඩ පැන සැණින් අල්ලා ගැනීමට තිහිප වරක් මෙම ප්‍රතිවාදී ක්‍රීඩිකාවට පුළුවන් වූයේය. ඩැරල් ද මුළු සවිය යොද ඇය හා සටන් කිරීමට සමත් වූවාය.

"ප්ලේ අප්, ඩැරල්, ප්ලේ අප්!" යයි තරගය නරඹමින් සිටි අවේ පන්තියේ බාලිකාවෝ හඬ දෙන්නට වූහ. ඩැරල් වඩාත් දිරිමත් ව, තමා වෙත එවන ලද පන්දුව අල්ලාගෙන දිව්වාය. "නියමෙට පාස් කරා! නියමෙට ඇල්ලුවා! ප්ලේ අප් - මැලෝරි ටවර්ස්!"

බාවෙස්ටර් පිල ගෝලයක් ලබා ගත්හ. ඊළඟ ගෝලය මැලෝරි ටවර්ස් පිලට ය.

"හාෆ් ටයිම්!" කෙටි විරාමයක් සඳහා තරගය නතර විය.

"වන් ඕල්!" දෙපිලට ම ගෝලය බැගින් හිමි වී ඇත.

ලිහන් මත තබන ලද දෙහි පෙති ක්‍රීඩිකාවන් වෙත පිරිනැමිණ. මොලී ඩැරල් ළඟට අවුත් උපදෙස් දෙන්නට වූවාය.

"ඩැරල්, ඔයා අනිත් ප්ලේයර්ව හොඳට මහන්සි කරවනවා. එහෙම තමා කරන්න ඕනේ. එයා අමාරුකාරී! ඒ වුණාට එයාට ඔයාට ඉස්සර මහන්සි දනෙනවා. හොඳට බලාගෙන ඉඳලා - පැනලා බෝලෙ අල්ලන්න! එයා හොඳට මහන්සි කරවන්න! බෝලෙ කැතරින්ට පාස් කරන්න - දුවන ලෙවල් එකට! කැතරින් ඔයාට පාස් කරයි. එතකොට ෂූට් කරන්න! හරි ද?"

"ඔව්, ඔව්, මොලී," යයි ඩැරල් දෙහි පෙත්ත හපමින් කතා කරන්නට වූවාය. "මං මුහුණ දෙන ක්‍රීඩිකාව හුඟාක් දහලනවා. එයා ඉක්මනින් මහන්සි කරවන්න මට පුළුවන්. කැතරින්ටත් කියන්න මං පාස් කරලා එවන බෝලේ මට ම එවන්න කියලා - මං ලෑස්ති පිට ඉන්නවා බලලා."

"හරි! ඔන්න විසිල් එක ගැහුවා. දන් වැඩියෙන් ම ෂූට් කරන්න තියෙන්නෙ ඩැරල්ට! ගුඩ් ලක්!" කියා මොලී පිට්ටනියෙන් ඈත් වූවාය. නරඹන්නෝ ජය ඝෝෂා නගන්නට වූහ.

"ජ්ලේ අප් - මැලෝරි ටවර්ස් - ජ්ලේ අප්!"

මැලෝරි ටවර්ස් ක්‍රීඩිකාවෝ දක්ෂ ලෙස ක්‍රීඩා කරන්නට වූහ. ඩැරල් සහ කැතරින් අතර පන්දුව හුවමාරු වූයේ විදුලිය වේගයෙනි. දෙදෙනා මාරුවෙන් මාරුවට පන්දුව අල්ලා ගත්තේ ප්‍රතිවාදීන්ගේ ග්‍රහණයට නතු වීමට කිසි සේත් ඉඩ නොතබා ය.

කැතරින් විසින් විදින ලද පන්දුව ගෝලය තුළට එල්ල විය. දන් මැලෝරි ටවර්ස් ලැබූ මුළු ගෝල සංඛ්‍යාව දෙකයි! බාවෙස්ටර් කණ්ඩායම නව පණක් ලද්දක් සේ වඩාත් කඩිසර ව හා වෙහෙස නොබලා ක්‍රීඩා කරන්නට වූහ. ඔවුහු ද දෙවන ගෝලය ලබා ගත්හ. දන් දෙපිල ම ගෝල දෙක බැගින් ලබා ඇත. තව ඇත්තේ විනාඩි පහලොවකි.

"ජ්ලේ අප් - මැලෝරි ටවර්ස් - ජ්ලේ අප්!"

වේලාව ඉක්මනින් ගෙවී යන බව ඩැරල්ට දනිණ. දෙපිලට ම ගෝල දෙක ය! තරගය තීරණාත්මක ය. කාලය අවසන් වීමට පෙර මැලෝරි ටවර්ස් තවත් ගෝලයක් ගත යුතු ය. කැතරින් විසින් එවන ලද පන්දුව නිවැරදි ව අල්ලා ගත් ඇ එය ලැක්රෝස් පිත්ත අග ඇති දලෙහි රඳවාගෙන ඉදිරියට දිව ගියාය. ඇයගේ ප්‍රතිවාදී ක්‍රීඩිකාව ඇයට හරස් වූවාය. ඩැරල් ඇය මගහැර ඉදිරියට වේගයෙන් ඇදුණාය.

"ඔහොම යන්න - ඩැරල්! ෂූට්! ෂූට්!" යයි බාලිකාවෝ හඬ දුන්හ. එහෙත් ගෝලයට දුර වැඩි ය. එහෙයින් ඩැරල් පන්දුව කැතරින්ට යොමු කළාය. අවාසනාවට මෙන් කැතරින්ට එය ග්‍රහණය කළ හැකි නොවීය. පන්දුව බිම වැටී රෝල් වූයේ ය. එය විරුද්ධ පිලට අත් විය. බාවෙස්ටර් පිල මැලෝරි ටවර්ස් ගෝලය කරා පන්දුව වේගයෙන් ගෙන ගියහ.

මැලෝරි ටවර්ස් ගෝල් රකින්නිය දක්ෂ ලෙස පන්දුව රැක ගත්තාය.

"හුරේ! ඒ පාරත් රැක ගත්තා!"

දන් පන්දුව බාවෙස්ටර් ගෝලය දෙසට ඇදී යයි. ඩැරල් අනර්ඝ ලෙස පන්දුව අල්ලා ගත්තේ ප්‍රතිවාදී පිලේ ක්‍රීඩිකාවට ඉහළින් උඩ පැන ය.



14

"නියමයි ඩැරල්! ඉස්සරහට යන්න!" බලා සිටියෝ ඇය දිරිමත් කළහ. ඩැරල් බාවෙස්ටර් ගෝලය කරා දිව ගියාය. කැතරින් ඇය හා සමගාමී ව හා සමාන්තර ව තරගය ඉදිරියට ගෙන ගියාය. දන් පන්දුව ඩැරල් අතේ ය. එය බාර ගැනීමට කැතරින් සූදානම් ය. තමාට අභියෝගයක් ළඟින් ම එල්ල වෙද්දී, ඩැරල් පන්දුව කැතරින් වෙත එල්ල කළාය. එය ඉතා නිවැරදි වූ කිරීමක් විය. කැතරින් පන්දුව අල්ලා ගත් නමුත්, ඇයට ද ප්‍රතිවාදී ක්‍රීඩිකාවන්ගෙන් එල්ල වූයේ දඩි අභියෝගයකි. ඩැරල් සූදානමින් සිටින බව ඇස් කොනකින් දුටු කැතරින් පන්දුව ඇය වෙත විසි කළාය.

පන්දුව නිවැරදි ව ඇය කරා නොගිය ද, ඩැරල් පන්දුව කරා පැන එය රැක ගත්තාය. පිත්තේ දල තුළට වන් පන්දුව රැක ගෙන හතුරු පිලේ ආක්‍රමණිකයන් උපායශීලී ව මගහරිමින් ඩැරල් ගෝලය කරා ළංවන්නට වූවාය.

නරඹන්නියන් අතුරින් මහා ඝෝෂා හඬක් නිකුත් විය. "ෂූට්! ෂූට්! ෂූට්!"

ඩැරල් එල්ල බලා බෝලය විද්දය. එය ඇයගේ මුළු ශක්තිය ම යොද ගෝලය වෙත නිසි ඉලක්කයට ම යොමු කිරීමක් විය. බාවෙස්ටර් ගෝල් රකින්නිය පෙරට පැන පන්දුව රැකීමට දඩි ප්‍රයත්නයක යෙදුණාය. පන්දුව ඇයගේ පා ආවරණයේ වැදී, ගෝල් කණුවේ ද වැදී, පෙරළී ගොස් ගෝලය කෙළවරේ දලේ වැදුණේය.

"ගෝල්!!!"

නැගී ආයේ කන් බිහිරි කරවන තරමේ ප්‍රීති ඝෝෂාවකි. "නියමයි - ඩැරල්! කමෝන් ඩැරල්! වෙල් ඩන් - ඩැරල්!"

"හුරේ! ගෝල් තුනට දෙකයි!"

ඒ සමග ම තරගාවසාන නළා හඬ නිකුත් විය. කණ්ඩායම් දෙක ඔවුනොවුනට ආචාර දක්වීමට පෙළ ගැසුණහ. ඩැරල් සතුටින් හා කැළඹීමෙන් යුතු ව ගැහෙන්නට වූවාය. ඈ මැලෝරි ටවර්ස් ලැක්රෝස් කණ්ඩායමේ තරග කළාය. ජයග්‍රාහී ගෝලය ලබා ගත්තේ ද ඇය ය!

"නියමෙට සෙල්ලං කරා - ඕයා - පුංචි කෙල්ලේ!" යයි මොලී ඇයට සුබ පැතුවාය. "ඔයා හොඳ ලස්සණට සෙල්ලං කළා. ඒක නම් බොහොම ලස්සණ ගෝල් එක!"

කණ්ඩායම් දෙකට පිරිනමන ලද්දේ ලොකු තේ පැන් සංග්‍රහයකි. ඩැරල් එයට සහභාගි වීම සඳහා ගියේ ප්‍රීතියෙන් උතුරා ගිය හදවතින් යුතුව ය. මෙය ඇයගේ ජීවිතයේ වැදගත් අවස්ථාවකි. අපේ පංක්තියේ ළමෝ ඇය වට කර ගත්හ. ජයග්‍රාහී ගෝලය ලබා ගත්තේ තම පංක්තියේ සහෝදර ශිෂ්‍යාවක යයි උදම් වූ ඔවුහු ඇයගේ උරහිසට තට්ටු කර, ඇයට ප්‍රශංසා කරන්නට වූහ.

එද සවස ඩැරල්ට මහන්සියත් සතුටත් එක සේ දැනුණේය. මහන්සිය පරයා සතුට ඉහළ නැගී ආයේය. මේ ගැන පවසනු ලැබූ කල, මව, පියා සහ ෆෙලිසිටි නංගී කුමක් කියනු ඇත් ද? ඔවුන් හෙට ම දක්නට ලැබීම කොපමණ වාසනාවක් ද! හෙට ම ඔවුනට මෙය දැන ගත හැකි ය. ඔවුනට එය දන්වන තෙක් ඩැරල්ට ඉවසුමක් නැත.

අපේ පංක්තියේ සියලු ම බාලිකාවෝ ඩැරල්ගේ සතුට බෙදා ගත්හ. ඇය පොදු කාමරයට ඇතුල් වෙද්දී ඔවුහු මල්වරහඩ නැගූහ. ඩැරල් ඔවුන් ඉදිරියේ සිටගෙන සිටියේ මුහුණ රතු කරගෙන, විස්මිප්ත වූ ලෙස ය.

"ඩැරල් කොච්චර නිහතමානී ළමයෙක් ද! එයා කිසි උඩඟුකමක් නැති හින්ද නේ, තමන්ගෙ නම තියෙනවා ද කියලා කණ්ඩායම් ලැයිස්තුවේ වත් බැලුවෙ නැත්තෙ. ඒ වුණාට කොහොම ද අන්තිම ගෝල් එක ගත්තු ලස්සණ!" යයි අයිරින් හඬ නගා කීවාය. ඇය සතුට ප්‍රකාශ කිරීම සඳහා ඩැරල්ගේ පස්සා පැත්තට කොතරම් තදින් ගැසුවේ ද යත් ඩැරල්ට කැස්සක් ද පිට විය.

වාරයේ අන්තිම දවස උදා වූයේය. සියලු ම ගමන් මලු හා ට්‍රන්ක් පෙට්ටි අසුරනු ලැබිණ. ඉතිරි ව තිබුණේ අන්තිම මොහොතේ මෝටර් රථවලට පැටවීමට ඉතිරි කරන ලද බඩු - මුට්ටු පමණි. ඔවුනොවුන්ගෙන් සමුගැනීම් සිදු විය. ලිපිනයන් හුවමාරු කෙරුණේය. බොහෝ ලිපිනයන් ඒ මොහොතේ අස්ථාන ගත විය. ආ ගිය අතක් සොයා ගත නොහැකි වූ බෙලින්ඩා ගැන පාලිකාව සොයා බලන්නට වූවාය. එසේ ම අතුරුදහන් වූ අයිරින් කොධිබ දයි පොට්ස් මෙනෙවිය සොයා බලන්නට වූවාය. අති මහත් කලබලයක් හා ඝෝෂාකාරී කත්වයක් පාසැල් භූමිය පුරා පැතිර ගියේය. පාසැල කරා දුව ඇති මාවතේ මෝටර් රථ අතර අසුන් හත් දෙනකු පිට නැගී සිටි ළමෝ හත් දෙනෙක් ඉදිරියට එනු දක්නා ලදහ.

"බිල්, මගෙ දෙයියනේ! ආන් - ඔයාගෙ අයියලා මල්ලිලා එනවා!" යයි ඩැරල් හඬ නැගුවාය. එහෙත්, බිල් තන්ඩර් එළියට ගැන්මට ඉස්තාලයට ගොස් සිටි බැවින් ඔවුන් අතර නොවූවාය. මොහොතකට පසු ඈ අසු පිට නැග විදුහල ඉදිරියට ආවාය; අසුන් පිට නැග පාසැල් භූමියට ඇතුළු වන සහෝදරයන් දුටු සතුටින් කෑගැසුවාය.

"මාව එක්කං යන්න ද ආවේ? තන්ඩර් දිහා බලන්න! කොහොම ද - දන්? තන්ඩර්, ආන් උඹෙ යාළුවො ඇවිල්ලා! උඹට දන් හරි සන්තෝෂයි නේ!"

පළමුවෙන් ම පාසැල් භූමියෙන් පිට වූයේ දුම්රියේ ගමන් ගන්නා ළමයින් ය. ඉන්පසු ටිකක් සාමකාමී ගතියක් ඇති විය. කවුදෝ තමාගේ සූට් කේසය අරන් ඇතැ යි මැසිවිලි නගමින් අයිරින් එහෙ-මෙහෙ අත දහලන්නට වූවාය. ග්වෙන් රවාගෙන කැරකෙන්නට වූයේ තමා කැන්දන් යාමට තව ම ගෙදරින් කවුරුවත් ඇවිත් නොසිටි බැවිනි. විදුහලෙන් අන්තිමට පිටවන්නිය වීමට ඇය කැමති වූයේ නැත. දිග ඇර ගත් කටු සටහන් පොතක් සහ පැන්සලක් අතැති ව බෙලින්ඩා ඇය වටේ කැරකෙන්නට වූවාය.

"ග්වෙන්, මේක මගේ ලාස්ට් චාන්ස් එක! තව ටිකක් වැඩියෙන් රවාගෙන ඉන්න - මට අඳින්න!"

ඩැරල් සිනාසුණාය. බෙලින්ඩාගේ මව සහ පියා මෝටර් රථයට වී ඇය එන තෙක් බලා සිටිය දී, ඇය මෙසේ කෝලම් නටතු හැටි!

යෙහෙළියන්ගෙන් සමු ගනිමින් සෙරෙල්ඩා ඉදිරියට මතු වූවාය. මෙහි පැමිණි දිනයේ සිටියාට වඩා දැන් ඇය කොතරම් වෙනස් ද. පාසැල් කොප්පිය කිසි ම දවසක පළඳින්නේ නැහැ යි කී ළමයා අද එය හිස ලා ගෙන සිටියාය. "ගුඩ් බායි! ඊළඟ වාරේ ආයෙත් හමුවෙමු. මෙහෙ නම් 'එනර්පුල්!' මට හුඟාක් සන්තෝෂයි මැලෝරි ටවර්ස් එන්න ලැබීම ගැන. ශී - එන වාරේ ආයෙත් එන්න තියෙන එක ගැන ඊටත් වැඩිය සන්තෝෂයි!"

"ගුඩ් බායි!" යයි මෝටර් රථයට නගින ගමන් මාවිස් රළු හඬින් කීවාය. "ලබන වාරේ හමු වෙමුකො!" කියා ඈ සැමට අත වැනුවාය.

බිල් සහ ඇයගේ සොහොයුරෝ අසුන් පිට නැඟ අශ්වාරෝහක බලඇණියක් සේ පිට ව ගියහ. මැම්සෙල් දූපොං ඒ දෙස මවිතයෙන් බලා සිටියාය. "ප්‍රන්සයේ නම් ඔහොම දෙයක් දකින්න නෑ," යි ඈ ප්‍රකාශ කළාය. "මය බිල් - මං හිතන්නෙ, ගෙදෙද් දී එයාගෙ නිදන කාමරේ පැත්තක අශ්වයාට නිදගන්න දෙනවා ඇති!"

ඩැරල් හඬ නගා සිනාසුණාය. නාන කාමරයේ ජලය පිරිසිදු කිරීමට ගන්නා ලුණු කුඩු පෙට්ටියක් අතැති ව ඉන් එළියට ආ බෙලින්ඩා මැම්සෙල්ගේ ඇගේ හැප්පුණා ය. ලුණු කුඩු පෙට්ටිය බිමට වැටිණ.

කොළ පාට කුඩු බිම ඉහිරී වලාවක් සේ ඉහළ නැගී පැතිරී ගියේය. එයින් උද්වහනය වූයේ සැර සුවඳකි.

"දැන් බෙලින්ඩා, මම - " යයි යමක් කියන්නට පටන් ගත් මැම්සෙල් මුව අයාගෙන නතර වූවාය. ඈ සිය මහත බඳ අතගාන්නට වූයේ ලේන්සුව සොයා ගැන්මට ය. පොට්ස් මෙනෙවිය සහ පීටර්ස් මෙනෙවිය ඈතුල් වෙද්දී, මැම්සෙල් මෙතෙක් තද කරගෙන සිටි කිඹුහුම මහා හඬකින් පුපුරා ගියේය. එය ඇයගෙන් නිකුත් වූ ඉස්තරම් ම කිඹුහුමක් වූයේය.

"ආ - චූ - උ - උ - උ - ස් - - - - - ෂූ - උං - උං - උං!"

"අනේ - දෙයියනේ!" යයි බියට පත් පොට්ස් මෙනෙවිය කීවාය. "මේ වගේ කිඹුහුම් යවන කෙනෙක් මං - "

"ආ - චු - - - - " යයි මැම්සෙල් යළිත් ආරම්භයක් දෙන්නට වූ අතර, පොට්ස් මෙනෙවිය ආවරණයක් සොයා දිව ගියාය.

ඩැරල්ට සහ සැලිට සිනා නතර කර ගත හැකි නොවීය. ඔවුන්ට අතීත සිද්ධිය මතක් වූයේය. ඩැරල් හදිසියේ අසල සිටි යෙකුගේ කුඩය අතට ගෙන දිග ඇරියාය.

"දැන් බය නැතුව කිඹුහුම් අරින්න, මැම්සෙල්," යයි පවසමින් ඈ පොට්ස් මෙනෙවිය හා පීටර්ස් මෙනෙවිය වැහෙන්න කුඩය අල්ලා ගෙන සිටියාය. "මට පුළුවන් ඔක්කොම බේරා ගන්න!"

ඩැරල් සොයාගෙන පඩි පෙළ දිගේ උඩට එමින් සිටි ඇයගේ මව මෙම දර්ශනය දැක මවිතයට පත් වූවාය. ඩැරල් වහා ම කුඩය බිම තබා, සිය මව වෙත දුවගෙන ආවාය. "ආ - නේ, අම්මා ආවා! මං හිතුවෙ - එන්නෙ ම නැති වෙයි ද කියලයි! සැලි ඔයා ලැස්ති ද? ගුඩ් බායි මැම්සෙල්! ගුඩ් බායි පොට්ටි! ගුඩ් බායි මිස් පී! ගුඩ් බායි මේට්‍රන්! ලබන වාරේ හමුවෙන්නං! මේ වාරේ නම් නියමයි!"

"ගුඩ් බායි!" පාලිකාව කීවාය. "හොඳට ඉන්න!"

"ගුඩ් බායි!" යයි පොට්ස් මෙනෙවිය හා පීටර්ස් මෙනෙවිය එක හඬින් පැවසූහ. "නිවාඩු කාලේ කියවන්ට තියෙන ඒවා අමතක කරන්න එපා!" පීටර්ස් මෙනෙවිය මතක් කළාය.

"ආ - චූස් - ෂූ - - - - " යයි මැම්සෙල් සුබ පැතුවාය. ඈය පෙරට අඩිය තැබූ විට විවෘත කුඩයේ හැපී වැටෙන්නට ගිය නමුත්, ග්වෙන් ඈ අල්ලා ගත්තාය.

මෝටර් රථය පිට ව ගියේය. ගේට්ටුව පසු කරන තෙක් ඩැරල් දිගට ම අත වනන්නට වූවාය. ඉන්පසු ඈ මහත් සන්තුෂ්ටියෙන් යුතු ව ආසනයේ හේත්තු වූවාය.

"අම්මා, තාත්තා, දන්නවා ද - ඊයේ බාවෙස්ටර් විද්‍යාලෙත්

එක්ක මැලෝරි ටවර්ස් ප්ලේ කරපු ලැක්රෝස් මැච් එකට මාත් හිටියා නේ! මාත් මැච් ටීම් එකේ ප්ලේ කළා. ජයග්‍රාහී ගෝල් එක ගත්තෙ - මං - අම්මා!"

සැලී සතුටින් අසාගෙන සිටියාය. ඩැරල් පසු වන්නේ කොතරම් සතුටින් ද! ඈ කොතරම් සතුටින් මෙම වාරය ගත කළා ද! මෙය ඇයට වාසනාව උදා කළ වාරයකි. මෙම වාරය කෙළවර වීම ඇයට දුකකි. එහෙත්, ඊළඟට එළඹෙන්නේ ග්‍රීෂ්ම වාරයයි, ඊළඟට සරත් වාරයයි; ඊළඟට ශීත වාරයයි. ආ - වාරයෙන් - වාරයට - වාරයෙන් වාරයට - ඉදිරියට කොපමණ කල් පාසැල් යාමට ඇත් ද!

"ඔන්න, දන් මේ වංගුවෙන් මැලෝරි ටවර්ස් වැහෙනවා, අන්තිමට බලා ගන්න ඩැරල්!" සැලී හදිසියේ ම කීවාය. ඩැරල් විදුරුව පහත් කර මෝටර් රථයෙන් එළියට හිස දමා බැලුවාය.

"මැලෝරි ටවර්ස්, මං ගිහිල්ලා - විගහට එන්නං!" යයි ඈ පිය පාසැල දෙස බලා හඬ නැගුවාය. "ටික දවසකට ආයුබෝවන්! මං ආපහු විගහට එනවා!"